323 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 323 - இல. 06
Volume 323 - No. 06

2025 නොවැම්බර් 21වන සිකුරාදා
2025 நவம்பர் 21, வெள்ளிக்கிழமை
Friday, 21st November, 2025

# පාර්ලිමේන්තු විවාද
## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
## (HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා මාර්ගෝපදේශ [තීරුව 1129]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1131-1149]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

පුත්තලම මූලික රෝහලේ පුරප්පාඩු සහ කාර්ය මණ්ඩල සමාලෝචනය [තීරුව 1150]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [දොළොස්වන වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 124, 216, 331 (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම්); ශීර්ෂ 149, 303 (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී. [තීරු 1158-1309]

**කල් තැබීමේ යෝජනාව:**

කින්නියා ප්‍රා.ලේ. කොට්ඨාසයේ ලුණු නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම [තීරු 1309-1314]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

வாய்மூல விடைக்கான வினாக்களுக்கான வழிகாட்டல்கள் [ப: 1129]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1131-1149]

**தனி அறிவித்தல் மூல வினா:**

புத்தளம் ஆதார வைத்தியசாலையிலுள்ள வெற்றிடங்களும் ஆளணி மீளாய்வும் [ப: 1150]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பன்னிரண்டாம் நாள்]:**

[தலைப்புக்கள் 124, 216, 331 (கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல்); தலைப்புக்கள் 149, 303 (கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1158-1309]

**ஒத்திவைப்புப் பிரேரணை:**

கிண்ணியா பிரதேச செயலாளர் பிரிவில் உப்பு உற்பத்திக்கான வசதிகளை மேம்படுத்தல் [ப: 1309-1314]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Guidelines on Questions for Oral Answers [Col. 1129]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1131-1149]

QUESTION BY PRIVATE NOTICE:

Vacancies and Cadre Revision of Base Hospital, Puttalam [Col. 1150]

APPROPRIATION BILL, 2026 – [Twelfth Allotted Day]:

Considered in Committee – [Heads 124, 216, 331 (Rural Development, Social Security and Community Empowerment); Heads 149, 303 (Industry and Entrepreneurship Development)] [Cols. 1158-1309]

ADJOURNMENT MOTION:

Improvement of Facilities for Salt Production in Kinniya DS Division [Cols. 1309-1314]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 21වන සිකුරාදා***
*2025 நவம்பர் 21, வெள்ளிக்கிழமை*
*Friday, 21st November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා මාර්ගෝපදේශ
### வாய்மூல விடைக்கான வினாக்களுக்கான வழிகாட்டல்கள்
### GUIDELINES ON QUESTIONS FOR ORAL ANSWERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අසනු ලබන ප්‍රශ්න වඩාත් විධිමත්ව හා ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීමට හැකිවනු වස් සකස් කරන ලදුව, 2025 නොවැම්බර් 18 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ භාෂාත්‍රයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා සභාමේසය මත තබා ඇති බව මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

ඒ අනුව, මින් ඉදිරියට වාචික පිළිතුරු අපේක්ෂා කරනු ලබන ප්‍රශ්න ඉදිරිපත් කිරීමේදී මෙම මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2459/46 of 24th October, 2025.

I move that these Regulations be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022/2023 සහ 2023/2024 වර්ෂ සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2024 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඌව පළාත් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු අනුර කරුණාතිලක මහතා]

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිහාල් ගලප්පත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
Hon. Speaker, I present,

(1) a petition from Mr. A.M.H.K. Alagiyawanna of No. 16, Baduwatta, Narangaspitiya, Kirindiwela; and

(2) a petition from Mr. W.P. Vijitha Perera of No. 17/3, First Lane, Lakshapathiya Road, Rawathawatta, Moratuwa.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### වවුනියාව දිස්ත්‍රික්කයේ මදගුවෛත්තකුලම්හි ආර්ථික මධ්‍යස්ථානය: විස්තර
### வவுனியா மாவட்டத்தில், மதகுவைத்தகுள பொருளாதார மத்திய நிலையம்: விபரம்
### ECONOMIC CENTRE AT MADAGUWAITHTHAKULAM IN VAVUNIYA DISTRICT: DETAILS

1086/2025

**1. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) එවකට ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් වවුනියාව දිස්ත්‍රික්කයේ ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා 2015 වර්ෂයේදී යෝජනාවක් ඉදිරිපත් කරන ලද බවත්;

(ii) ඒ අනුව රුපියල් මිලියන 263ක් වියදම් කර කඩ කාමර 52කින් යුත් ආර්ථික මධ්‍යස්ථානයක් වවුනියාව-මහනුවර ප්‍රධාන මාර්ගයේ මදගුවෛත්තකුලම්හි 2018 වර්ෂයේදී ඉදි කරන ලද බවත්;

(iii) ඉදි කිරීමෙන් පසුව වර්ෂ 7ක් ගත වී ඇතත් මේ දක්වා එය විවෘත කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(iii) එහි ඇති කඩ කාමර 52 බෙදා දෙන පදනම කවරේද;

(iv) මේ වන විට තොග එළවලු වෙළෙඳාමේ නිරත වී සිටින වෙළෙඳුන්ට ඉහත කඩ කාමර ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா மாவட்டத்தில் பொருளாதார மத்திய நிலையமொன்றை அமைப்பதற்கு, அப்போதைய கிராமியப் பொருளாதாரம் பற்றிய அமைச்சினால் 2015ஆம் ஆண்டில் முன்மொழிவொன்று சமர்ப்பிக்கப்பட்டது என்பதையும்;

(ii) அதன்படி, 2018ஆம் ஆண்டில் வவுனியா-கண்டி பிரதான வீதியில் உள்ள மதகுவைத்த குளத்தில் 52 கடைகளைக் கொண்டதொரு பொருளாதார மத்திய நிலையம் ரூ. 263 மில்லியன் செலவில் நிர்மாணிக்கப்பட்டது என்பதையும்;

(iii) மேற்படி மத்திய நிலையம் நிர்மாணிக்கப்பட்டு 7 ஆண்டுகள் கடந்துள்ளபோதிலும் இதுவரை அக்கட்டிடம் திறக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி பொருளாதார மத்திய நிலையத்தைத் திறப்பதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(iii) அங்குள்ள 52 கடைகளைப் பகிர்ந்தளிக்கும் அடிப்படை யாது என்பதையும்;

(iv) தற்போது மொத்த மரக்கறி விற்பனையில் ஈடுபட்டுள்ள வியாபாரிகளுக்கு மேற்படி கடைகள் வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Is he aware that -

(i) the former Ministry of Rural Economy submitted a proposal in 2015 to establish an Economic Centre in Vavuniya District;

(ii) accordingly, an Economic Centre with 52 stalls was constructed in 2018 at Madaguwaiththakulam, along the Vavuniya -Kandy Main Road at a cost of Rs. 263 million; and

(iii) although seven years have passed since its construction, it has not been opened to date?

(b) Will he inform this House -

(i) the measures that will be taken in this regard;

(ii) the timeline for the opening of the aforesaid Economic Centre;

(iii) the basis on which the 52 stalls available there, will be distributed; and

(iv) whether the aforesaid stalls will be provided to the traders who are currently engaged in wholesale vegetable trading?

(c) If not, why ?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) 2025.09.03 දින වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කර ඇත.

(ආ) (i) සහ (ii)

2025.09.03 දින වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කර ඇත.

(iii) මෙම ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාර පරිශ්‍ර ලබා දීම පිළිබඳව අංක අමප/21/0556/323/18 හා 2021.04.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව වවුනියාව තොග වෙළෙඳ පොළෙහි තොග වෙළෙඳාම් කරන ලද සුදුසුකම් සපුරා ඇති තොග වෙළෙඳුන් සඳහා කඩ කාමර 35ක් ලබා දී ඇත. ඉතිරි කඩ කාමර ප්‍රදේශයේ ගොවි සංවිධාන සඳහා හා දිස්ත්‍රික්කය තුළ අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙමින් ලබා දීමටත්, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ සභාපතිගේ ඉල්ලීම පරිදි තොග එක්රැස් කිරීම හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා කඩ කාමර 02ක් ලංකා සතොස ආයතනයට ලබා දීමටත් බලාපොරොත්තු වේ.

(iv) ලබා දී ඇත.

(ඇ) අදාළ නැත.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய கேள்விகளுக்குப் பதில் வழங்கியமைக்கு நன்றி!

கௌரவ சபாநாயகர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிகக் கேள்வி - உண்மையாகவே இது கேள்வியல்ல, ஒரு பிரேரணை. கமத்தொழில், கால்நடை வளங்கள் காணி மற்றும் நீர்ப்பாசன அலுவல்கள் பற்றிய அமைச்சின் கடந்த ஆலோசனைக் குழுக் கூட்டத்தில் - கௌரவ பிரதி அமைச்சர் உபாலி சமரசிங்ஹ அவர்களும் அதில் கலந்து கொண்டிருந்தார் - நான் கமத்தொழில் அமைச்சரிடம் விண்ணப்ப மொன்றைச் செய்திருந்தேன். அந்தப் பொருளாதார மத்திய நிலையத்துக்கு ஒரு நாளைக்கு 5,000 கிலோகிராமுக்கும் மேற்பட்ட மரக்கறிகள் கொண்டுவரப்படுகின்றது. அவற்றைப் பாதுகாக்கும் வசதிகள் அங்கு இல்லாதபடியால், பெருமளவு மரக்கறிகள் வீணாகிப் போகின்றது. ஆனபடியால், மரக்கறி களைப் பாதுகாத்து வைப்பதற்காக இந்த வருடத்துக்குரிய வரவு செலவுத்திட்ட ஒதுக்கீட்டில் அந்த மத்திய நிலையத்தில் குளிரூட்டும் அறையொன்றை அமைக்குமாறு கேட்டிருந்தேன். பிரதி அமைச்சருடன் கலந்தாலோசித்து அதனைச் செய்ய முடியுமெனச் சொல்லப்பட்டது. அதனை விரைவில் அமைத்துத் தருவீர்களா? என்பதோடு, இந்தப் பொருளாதார மத்திய நிலையத்தின் நிர்வாகம் இப்போது அரசாங்க அதிபரின்கீழ் இருக்கின்றது. அதனைத் தொடர்ந்தும் அவ்வாறே கொண்டுசெல்வது அங்குள்ளவர்களுக்குப் பிரயோசனமாக இருக்கும் என்று நினைக்கின்றேன்.

அத்தோடு, எங்களுடைய co-operative sectorஇன்கீழ் வருகின்ற co-operative training school ஒன்று பூந்தோட்டத்தில் இருக்கின்றது. 2009ஆம் ஆண்டிலிருந்து குறித்த co-operative training school, போதைவஸ்துப் பாவனையால் பாதிக்கப் பட்டவர்களுக்கான புனர்வாழ்வளிக்கும் நிலையமாகச் செயற்பட்டு வருகின்றது. நான் வட மாகாண சுகாதார அமைச்சராக இருந்தபோது தாபிக்கப்பட்ட புனர்வாழ்வு நிலையம், பூவரசங்குளம் வைத்தியசாலையில் இருக்கின்றது. நீங்கள் குறித்த தேவைக்காக அதனைப் பயன்படுத்தலாம். ஆகவே, நீங்கள் எப்போது இந்த co-operative அபிவிருத்தி அமைச்சுக்குச் சொந்தமான co-operative training schoolஇல் இருந்து, அவர்களை வெளியேற்றிப் பொருத்தமான இடத்துக்குக் கொண்டுசெல்வீர்கள்? என்பதை என்னுடைய முதலாவது மேலதிக கேள்வியாகக் கேட்கின்றேன்.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, එතුමා අහන අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙකයි. අපි ඒ ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කරලා තිබෙන්නේ දැනට අවුරුදු 7කට විතර කලින්. ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කරලා අවුරුදු 7ක් විතර ගත වෙලා තිබුණා, වැඩ අවසන් කළාට පසුවත් විවෘත කරන්නේ නැතිව. ඒ නිසා අපි සැප්තැම්බර් මාසයේ 03වෙනි දා එම ආර්ථික මධ්‍යස්ථානය විවෘත කළා. විවෘත කළාට පස්සේ අපි ඒක පවත්වාගෙන යනවා. එතුමාගේ පැත්තෙන් අපි කල්පනා කරනවා, දැනට අපි ඉලක්ක කරගත් එකට අමතරව යම් තැනක ශීතාගාරයක් හදන්න පුළුවන්ද කියලා. ඇත්තටම අපේ අරමුණ තමයි, කෘෂි භෝග මිලදී ගත්තාට පස්සේ ඒවා විනාශ වීම වළක්වා ගැනීම. ඒ සඳහා ශීතාගාර ගොඩ නැඟුවේ නැත්නම් ඒක කරන්න බැහැ. ඒ නිසා අපේ අරමුණක් තිබෙනවා, ශීතාගාර ගොඩ නඟන්න. මේ අවුරුද්දේත් ඒ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.

ඊට අමතරව, ඔබතුමා සමුපකාරයට අදාළ පුහුණු මධ්‍යස්ථානයක් පිළිබඳ ප්‍රශ්නයක් ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ සමහර ගොඩනැඟිලි හදලා තිබෙනවා, හැබැයි ඒ ගොඩනැඟිලි ඒ හදපු අරමුණ වෙනුවෙන් පාවිච්චි වෙලා නැහැ. සමහර ඒවා හදලා අත්හැරලා දාලා තිබෙනවා. ඔබතුමා කියන

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

විධියට පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් විධියට තිබෙන එක, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති, අපේ උපාලි සමරසිංහ මැතිතුමා සමුපකාර නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මැදිහත් වෙලා ඒක සමුපකාර දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කරමින් තිබෙන්නේ. ඉදිරියේදී ඔබතුමාගේ ඒ අපේක්ෂාව වෙනුවෙන් එය පවරා ගන්නවා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே!

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவை கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்கள் கேட்பார்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරෙහි සඳහන් වුණා, ශීතාගාර පහසුකම් පිළිබඳව, ඒ වාගේම මේ ආර්ථික මධ්‍යස්ථාන හරහා කෙරෙන ක්‍රියාවලිය පිළිබඳව. ඇත්ත වශයෙන්ම අපි බලාපොරොත්තු වෙන්නේ, ගොවි ජනතාවගේ ඒ නිෂ්පාදනවලට නිසි මිලක්. හැබැයි, පසුගිය කාලයේත්, අද දවසේත් ඇත්ත වශයෙන්ම මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා, බී ලූනු, ලොකු ලූනු, අර්තාපල්, වට්ටක්කා ඇතුළු තවත් භව භෝග රාශියකට වාගේම වී නිෂ්පාදනයට නිශ්චිත මිලක් ලබා දෙන්න.

මේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ඇත්ත වශයෙන්ම පටන් ගත් තැන ඉඳලාම ගොවියා අමාරුවේ වැටෙනවා, කලට වේලාවට පොහොරවලට සල්ලි නොලැබීමෙන්. එක පැත්තකින් නිශ්චිත මිලක් ලැබෙන්නේත් නැහැ, අල, ලූනු, වට්ටක්කා ඇතුළු තවත් භවභෝග වගාකරන ගොවීන්ට වාගේම වී වගාව කරන ගොවීන්ට. අපි මේ කථා කරන මොහොතේත් කන්නය පටන් අරගෙනයි තිබෙන්නේ. නමුත් පොහොරවලට සල්ලි නැහැ. ඔබතුමන්ලා කොහොමද මේ ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්නේ? මම ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ නිෂ්පාදන චක්‍රය, නිෂ්පාදන ක්‍රියාවලිය තුළ කලට වේලාවට පොහොර සහනාධාර මුදල් ටික ලබා දෙන්න කියලා. ඒක මිනිසුන්ගේ අතට යන්න ඕනෑ. ගිය කන්නයේත් බොහෝ දෙනෙකුට ලැබුණේ වගා කටයුතු අවසන් කළායින් පස්සේ. ඒ වාගේම නිශ්චිත මිලක් ලබා දෙන වැඩ පිළිවෙළ මීට වැඩිය නිවැරැදි ආකාරයට ක්‍රියාත්මක කරන්න ඕනෑ. රජයට ඒක කරන්න හැකියාවක් නැහැයි කියන එක ව්‍යවස්ථාදායකයේ ඉන්න අපි නොවෙයි කියන්නේ. අපිත් මෙතැනත් කියනවා. මහ පාරේ ඉන්න ගොවි ජනතාව, මහ පොළොවට පය ගහලා ඉන්න ගොවි ජනතාව තමයි කියන්නේ. මේකට උත්තරයක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අහන මුල් ප්‍රශ්නයට අදාළව තමයි අතුරු ප්‍රශ්නය ඇසිය යුත්තේ.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
ගරු කථානායකතුමනි. විපක්ෂ නායකතුමා ඒ ප්‍රශ්නය අහන විධියෙන්ම අපට පෙනෙනවා, එතුමා හිතන්නේ මොකක්ද කියලා. විපක්ෂ නායකතුමා මේ රටේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය ඇතුළේ අවුරුදු ගණනාවක් හිටපු කෙනෙක්; කෘෂි කර්මාන්තය පිළිබඳව අදහසක් තිබෙන කෙනෙක්. හැබැයි, ගොවිතැන් කරලා ගොවියා අමාරුවේ වැටිච්ච වෙලාවක කිසිවක් නොකරපු කෙනෙක්. ගොවියෝ ඕනෑ තරම් අමාරුවේ වැටිලා තිබෙනවා. අද නොවෙයි, ගරු කථානායකතුමනි. දඹුල්ලේ ලොකු ලූනු ගොවියා, නුවරඑළිය, වැලිමඩ අල ගොවියා මීට කලින් අවුරුදු ගණන් පෝලිම්වල උද්ඝෝෂණය කරපු කට්ටිය බව අපි දන්නවා. ප්‍රශ්න විසඳලා තිබුණා නම් මෙහෙම වෙන්නේ නැහැ නේ. අපි දැන් මේ ප්‍රශ්න, විශේෂයෙන් වී ගොවිතැනට අදාළ ප්‍රශ්න විසඳන්න මැදිහත් වෙලා ඉන්නවා. මෙතුමා දන්නේ නැති වුණත්, අපි පසුගිය මහ කන්නයේ වී කිලෝව රුපියල් 120 ගණනේ මිලදී ගත්තා, ගරු කථානායකතුමනි. යල කන්නයේත් අපි රුපියල් 120 ගණනේ මිලදී ගත්තා. මෙතුමන්ලාගේ කාලයේ වසා දමා තිබුණු සතොස සතු වී ගබඩා සියල්ල අපි අලුත්වැඩියා කරලා ගත්තා. අරගෙන වී මෙට්‍රික් ටොන් ලක්ෂ 50ක් වාගේ විශාල ප්‍රමාණයක් මිලදී ගත්තා. දැන් ඒවා කොටලා සතොස හරහා බෙදා හැරීමේ කටයුත්තත් කරනවා.

ගරු කථානායකතුමනි, මෙතුමා අහන ප්‍රශ්නයට අපි මේ අවුරුද්දේ අය වැය තුළිනුත් විසඳුම් දීලා තිබෙනවා. ශීතාගාර හදන කටයුත්ත කරලා තිබෙනවා. මෙතුමන්ලා 2019 වසරේ පටන්ගෙන අතහැර දමා තිබුණු ශීතාගාරය හදන කටයුතු, ඒ ඔක්කෝම කරලා අපි ආර්ථික මධ්‍යස්ථාන හරහා වී මිලදී ගෙන ගබඩා කරනවා. හැබැයි තිබෙන ප්‍රශ්නය මේකයි. රටක ගොවිතැනින් ලැබෙන අස්වැන්න විධිමත් ප්‍රමිතියකින් තොරව මිලදී ගැනීම අපි කරන්නේ නැහැ කියලා මෙතුමන්ලා දන්නේ නැහැ. උදාහරණයක් විධියට, මේ දවස්වල ඔබතුමාට වුණත් දකින්න පුළුවන්කම තියේවි, වෙළෙඳ පොළේ ලොකු ලූනු තිබෙනවා. අපි දඹුල්ලෙන් මිලදී ගන්නා ලොකු ලූනු වෙළෙඳ පොළට ඇවිල්ලා සති දෙකක් යන්නත් කලින් නරක් වෙලා තිබෙනවා. එම නිසා ප්‍රමිතියට අනුව හදන්න කියලා අපි දැනුම් දීලා තිබෙනවා. ප්‍රමිතියට අනුව හදනවා නම් අපි මේ ජනවාරි මාසයේ ඉඳලා මිලදී ගැනීම ආරම්භ කරනවා. ඒ මිලදී ගැනීම අපි කරනවා, ඒ සඳහා නිශ්චිත මිලක් දෙනවා. මෙවර ලොකු ලූනුවල නිෂ්පාදන වියදම කිලෝ එකකට රුපියල් 90යි කියලා ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය අපට දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව අපි ලොකු ලූනු කිලෝවක් රුපියල් 130ට මිලදී ගන්න පටන් ගත්ත එක දැන් රුපියල් 145 දක්වා වැඩි කරලා තිබෙනවා. හැබැයි, අදාළ ප්‍රමිතියට අනුව හදන ලොකු ලූනු තමයි අපට රුපියල් 145ට මිලදී ගන්න වෙන්නේ. ලබන අවුරුද්දේ targets වැඩි කරලා කිලෝ එකක මිල රුපියල් 150ට වැඩි කරලා මිලදී ගන්නවා. මෙතුමන්ලාට බැරි වුණු බොහෝ දේවල් අපි කරනවා. එම නිසා අපි මෙතුමාට කියනවා, ඔබතුමන්ලා එළියේත්, පාරේත් ඕනෑ එකක් කරන්න, ඇතුළේත් කරන්න. හැබැයි, අපේ ආණ්ඩුව ගොවි ජනතාවගේ ප්‍රශ්න හඳුනන ආණ්ඩුවක් නිසා අපි මේ ප්‍රශ්නය විසඳනවා. ශීතාගාර හදලා, ගබඩා හදලා, විධිමත් විධියට මිලදී ගැනීම් කරලා අපි මේ කටයුත්ත අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1102/2025- (3), ගරු සුරංග රත්නායක මහතා - [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 3 -1305/2025- (1), ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා - [සභා ගර්භය තුළ නැත.]

## මුලතිව්, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල සිද්ධ වෛද්‍ය සේවාව සපයන වෛද්‍ය මධ්‍යස්ථාන: වෛද්‍ය පුරප්පාඩු

## முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் சித்த மருத்துவ சேவையை வழங்கும் மருத்துவ நிலையங்கள்: மருத்துவர்களுக்கான வெற்றிடங்கள்

## MEDICAL CENTRES PROVIDING SIDDHA MEDICINE IN MULLAITIVU, MANNAR AND VAVUNIYA DISTRICTS: DOCTOR VACANCIES

1362/2025

**4. ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව්, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල සිද්ධ වෛද්‍ය සේවාව සපයන වෛද්‍ය මධ්‍යස්ථාන එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වෛද්‍ය මධ්‍යස්ථානවල අනුමත සේවක සංඛ්‍යාව අනුව, දේශීය වෛද්‍යවරුන් සඳහා දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත දිස්ත්‍රික්ක තුනෙහි දේශීය වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බවත්, උතුරු පළාතේ අනෙකුත් ප්‍රදේශවල දේශීය වෛද්‍යවරුන්ගේ අතිරික්තයක් පවතින බවත් දන්නේද;

(iv) එසේ නම්, වන්නි දිස්ත්‍රික්කයේ ජනතාවට දේශීය වෛද්‍ය සේවාව විධිමත්ව ලබා ගත හැකි වන පරිදි දේශීය වෛද්‍යවරුන් සඳහා පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

(v) නව පත්වීම් ලබා දෙන තෙක් පුරප්පාඩු වැඩි වශයෙන් පවතින ඉහත දිස්ත්‍රික්කවලට අනෙකුත් ප්‍රදේශවල අතිරික්තව සිටින වෛද්‍යවරුන්ට කඩිනමින් ස්ථාන මාරු ලබා දී වෛද්‍ය වෘත්තික ව්‍යාප්තිය විධිමත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் சித்த மருத்துவ சேவையை வழங்கும் மருத்துவ நிலையங்களின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அத்தகைய மருத்துவ நிலையங்களுக்காக அங்கீகரிக்கப்பட்டுள்ள ஆளணியின் அடிப்படை யில், சுதேச மருத்துவர்களுக்காக தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி மூன்று மாட்டங்களிலும் சுதேச மருத்துவர்களின் பற்றாக்குறை காணப்படு வதையும், வட மாகாணத்தின் ஏனைய பிரதேசங் களில் சுதேச மருத்துவர்களின் எண்ணிக்கை மிகையாக உள்ளதையும் அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், வன்னி மாவட்ட மக்கள் சுதேச மருத்துவ சேவையை சீராகப் பெற்றுக்கொள்ளக் கூடிய வகையில், சுதேச மருத்துவ ஆளணி வெற்றிடங்களை நிரப்புவதற்காக மேற் கொள்ளப்படும் துரித நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) புதிய நியமனங்கள் வழங்கப்படும் வரை வெற்றிடங்கள் அதிகமாக காணப்படுகின்ற மேற்படி மாவட்டங்களுக்கு, ஏனைய பிரதேசங் களில் மிகையாக உள்ள மருத்துவர்களை உடனடியாக இடமாற்றம் செய்து மருத்துவ ஆளணிப் பரவலாக்கத்தைச் சீராக்குவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the names of the medical centres which provide services of Siddha medicine in each of the districts of Mullaitivu, Mannar and Vavuniya, separately;

(ii) the number of vacancies currently existing for indigenous doctors in each of the said districts, as per the approved carder of those medical centres, separately;

(iii) whether he is aware that there is a shortage of indigenous doctors in the said three districts while there is a surplus of such doctors in the other parts of the Northern Province;

(iv) if so, the immediate measures that will be taken to fill the vacancies existing in the Vanni District for indigenous doctors so that the people of the said district could properly access the indigenous medical service; and

(v) whether steps will be taken for the expansion of the medical profession by transferring surplus doctors from other areas to the above-mentioned districts expeditiously, where there are many vacancies, until new appointments are made?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(අ) (i)

| දිස්ත්‍රික්කය | වෛද්‍ය මධ්‍යස්ථානය |
|---|---|
| වවුනියාව | ආයුර්වේද මූලික රෝහල - වවුනියාව ග්‍රාමීය ආයුර්වේද රෝහල - නෑදුන්කර්නි ග්‍රාමීය ආයුර්වේද රෝහල - සෙට්ටිකුලම් ග්‍රාමීය ආයුර්වේද රෝහල - ඉරට්පෙරියකුලම් ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - මඩුකන්ද ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - වවුනියා නගරය |
| මුලතිව් | දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - මුලතිව් ග්‍රාමීය ආයුර්වේද රෝහල - යෝගපුරම් ග්‍රාමීය ආයුර්වේද රෝහල - මුල්ලියවලායි ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - වැලිඔය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - විසුවමඩුව |
| මන්නාරම | දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - මන්නාරම ග්‍රාමීය ආයුර්වේද රෝහල - තල්වුප්පඩු ග්‍රාමීය ආයුර්වේද රෝහල - පෙරියමඩු ග්‍රාමීය ආයුර්වේද රෝහල - පේසලායි ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - මඩු |

(ii) එක් එක් දිස්ත්‍රික්කය අනුව දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙසේයි.

| දිස්ත්‍රික්කය | ආයතනය | තනතුරු නාමය | | |
|---|---|---|---|---|
| | | ආයුර්වේද වෛද්‍ය නිලධාරි | | |
| | | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
| | ආයුර්වේද මූලික රෝහල - වවුනියාව | 10 | 09 | 01 |
| | ග්‍රාමීය ආයුර්වේද රෝහල - නෑදුන්කර්නි | 01 | 01 | 00 |
| වවුනියා | ග්‍රාමීය ආයුර්වේද රෝහල - චෙඩ්ඩිකුලම් | 02 | 01 | 01 |
| | ග්‍රාමීය ආයුර්වේද රෝහල - ඉරට්ටපෙරියකුලම් | 02 | 02 | 00 |
| | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - මඩුකන්ද | 01 | 01 | 00 |
| | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - වවුනියා නගරය | 01 | 01 | 00 |
| | එකතුව | 17 | 15 | 02 |
| | දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - මුලතිව් | 05 | 05 | 00 |
| | ග්‍රාමීය ආයුර්වේද රෝහල - යෝගපුරම් | 01 | 01 | 00 |
| මුලතිව් | ග්‍රාමීය ආයුර්වේද රෝහල - මුල්ලියවලායි | 01 | 02 | -01 |
| | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - වැලි ඔය | 01 | 01 | 00 |
| | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - විසුවමඩු | 01 | 01 | 00 |
| | එකතුව | 09 | 10 | -01 |
| | දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - මන්නාරම | 05 | 06 | -01 |
| | ග්‍රාමීය ආයුර්වේද රෝහල - තල්වුපාඩු | 02 | 01 | 01 |
| මන්නාරම | ග්‍රාමීය ආයුර්වේද රෝහල - පෙරියමඩු | 02 | 02 | 00 |
| | ග්‍රාමීය ආයුර්වේද රෝහල - පේසලායි | 01 | 01 | 00 |
| | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - මඩු | 01 | 01 | 00 |
| | එකතුව | 11 | 11 | 00 |

(iii) වවුනියාව, මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්ක තුනෙහි ආයුර්වේද වෛද්‍ය නිලධාරි පුරප්පාඩු ප්‍රමාණය සමස්තයක් ලෙස සලකා බැලීමේදී නව ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමත් සමඟම මේ වන විට ඒ පුරප්පාඩු සම්පූර්ණ කරලා තිබෙනවා.

(iv) ගරු මන්ත්‍රීතුමනි, අපි 2025 නොවැම්බර් 03 දිනැතිව ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 303කට අලුතෙන් පත්වීම් ලබා දුන්නා. මෙයින් 41ක් උතුරු පළාතට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ 41දෙනා පළාත් සභාවට 36ක් හැටියටත්, රේඛීය අමාත්‍යාංශයේ රෝහල්වලට 5ක් හැටියටත් තමයි අනුයුක්ත කරලා තිබෙන්නේ. ඇත්තටම අපි ඒ තැන්වල තිබෙන පුරප්පාඩුවලටත් වඩා ලබා දීලා තිබෙනවා.

(v) නව පත්වීම් ලබා දීමත් සමඟ ආයුර්වේද වෛද්‍ය වෘත්තික ව්‍යාප්තිය විධිමත් වී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු තුරෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, சுதேச மருத்துவத் துறைக்கு இம்மாதம் தங்களால் 303 மருத்துவர் நியமனங்கள் வழங்கப்பட்டுள்ளமைக்கு, நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, வட மாகாணத்திற்கான 36 மருத்துவர் நியமன முன்மொழிவுகளில் 29 மருத்துவர் முன்மொழிவுகள் வன்னி மாவட்டத்துக்குக் கிடைத்துள்ளன. முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் நிலவிய பெரும்பாலான சுதேச மருத்துவர் வெற்றிடங்கள் தற்பொழுது நிரப்பப்பட்டுள்ளன. அதற்காக வன்னி மாவட்டத்தைச் சார்ந்த பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மேலுமொரு, குறைபாட்டினையும் தெரிவிக்கின்றேன். முல்லைத்தீவு மாவட்டத்திற்கான ஐந்து சித்த மருத்துவ சேவை வழங்கும் மருத்துவமனைகளிலும் மொத்தமாக அனுமதிக்கப் பட்ட ஆளணி 63 ஆகும். தற்போது இங்கு 35 பணியாளர் வெற்றிடங்கள் உள்ளன. கிட்டத்தட்ட 45% ஊழியர் அணியுடனேயே முல்லைத்தீவு மாவட்ட சித்த மருத்துவ அலகுகள் பணிபுரிந்து வருகின்றன. நாங்கள் இந்தத் தகவல்களை உரிய வகையில்தான் பெற்றிருந்தோம். குறித்த மருத்துவமனைகளில் 2025இன் முதல் எட்டு மாதங்களிலும் சராசரியாக மாதாந்தம் 1,000 நோயாளிகளுக்கு மேற்பட்டோர் சிகிச்சை பெற்றுச் சென்றுள்ளனர். குறித்த மருத்துவ மனைகளில் இன்னும் அதிகமான நோயாளிகளை உள்ளீர்த்துச் சேவையை வழங்குவதிலுள்ள முதன்மையான மட்டுப்பாடு, அங்குள்ள ஆளணிப் பற்றாக்குறையே ஆகும்.

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினா: சுதேச மருத்துவத்துறையில் தரமான மருத்துவ சேவை வழங்கலுக்கு மிகவும் இன்றியமையாத சுகாதாரத் தொழிலாளர்கள், சுகாதார உதவியாளர்கள், சுகாதார தூய்மைப் பணியாளர்கள், மர்த்தனவியலாளர்கள் உள்ளிட்ட ஊழியர் வெற்றிடங்கள் வன்னி மாவட்டத்தில் மட்டுமன்றி வட மாகாணம் முழுவதும் காணப்படுகின்றது. அந்த மருத்துவ சேவை வழங்கலின் தரத்தை அதிகரிப்பதற்கு, மேற்படி சேவை நிலையங்களில் உள்ள ஆளணி வெற்றிடங்களை 2026ஆம் ஆண்டில் பகுதியளவிலேனும் நிரப்புவதற்கான வாய்ப்பு உள்ளதா?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ඔබතුමා කියන කාරණය ඇත්ත. ඒ කියන්නේ, කාලයක් තිස්සේ බඳවා ගැනීම් සිදු නොකිරීම නිසා ආයුර්වේද, සිද්ධ, යුනානි රෝහල්වල, වෛද්‍ය මධ්‍යස්ථානවල සමස්තයක් වශයෙන් කාර්ය මණ්ඩලයේ හිඟයක් පැවතුණා. අපි ඒ පුරප්පාඩු පිළිබඳව සලකා බැලුවා. මම ඔබතුමාට කිව්වා, අපි වෛද්‍ය නිලධාරින් 304ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගත්තත් 303යි ආවේ කියලා. ඒ වාගේම එම රෝහල්වලට අවශ්‍ය හෙදියන්, ඖෂධ සංයෝජකයන් කඩිනමින් බඳවා ගන්නත් අපි කටයුතු කරනවා. අරක්කැමියන්ගේ පවා හිඟයක් ඒ ස්ථානවල තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍ය කාර්ය සහායකයන්ගේ හිඟයක් ද පවතිනවා. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් පත් කර තිබෙන නිලධාරි කමිටුවට අපි මේ ප්‍රශ්න යොමු කරලා තිබෙනවා. මම හිතනවා, කඩිනමින් ඒ අයත් බඳවා ගන්න පුළුවන්කම ලැබෙයි කියලා. ඒ නිසා ආයුර්වේද, සිද්ධ, යුනානි රෝහල්වල පවතින කාර්ය මණ්ඩලයේ හිඟයට ඉතාම ඉක්මනට විසඳුමක් ලැබේවි.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
நன்றி, அமைச்சர் அவர்களே! என்னுடைய இரண்டாவது மேலதிக வினா:

வட மாகாண எல்லைக்குள், 2025.06.20ஆம் திகதிய பதிவின் அடிப்படையில், யாழ்ப்பாணத்தில் 5.1 ஏக்கர் அளவில் 4 மூலிகைத் தோட்டங்களும், கிளிநொச்சியில் 100 ஏக்கர் அளவில் ஒரு மூலிகைத் தோட்டமும், வவுனியாவில் 7 ஏக்கர் அளவில் 3 மூலிகைத் தோட்டங்களும், முல்லைத்தீவில் 7.67 ஏக்கர் அளவில் ஒரு மூலிகைத் தோட்டமுமாக கிட்டத்தட்ட 119.78 ஏக்கர் மொத்த அளவைக் கொண்ட 9 மூலிகைத் தோட்டங்கள் காணப்படுகின்றன. மேற்படி மூலிகைத் தோட்டங்களினூடாக வட மாகாணத்தின் 45% மூலிகைத் தேவைகள் தீர்க்கப்படுவதாக வட மாகாண சுதேச மருத்துவத் திணைக்களம் குறிப்பிடுகின்றது. இருப்பினும், முல்லைத் தீவிலுள்ள மூலிகைத் தோட்டம் தற்பொழுது பராமரிப்பின்றிக் காடு வளர்ந்து, கால்நடைகள் நடமாடும் வகையில் காணப்படு கின்றது. பெரும்பாலும் ஏனைய மூலிகைத் தோட்டங்களிலும் முழுமையான விளைச்சலைப் பெற இயலாதுள்ளது. இதற்கான மூல காரணம் மேற்படி மூலிகைத் தோட்டங்களைப் பராமரிப்பதற்கான ஆளணிப் பற்றாக்குறையே ஆகும். அதுபோல், வட மாகாண சுதேச மருத்துவத் துறையில் தற்பொழுது ஏற்றுக்கொள்ளப்பட்ட ஆளணிக்கு அமைவாக மருத்துவமனைகளில் சிற்றூழியர்களின் வெற்றிடம் பெருமளவில் காணப்படுகின்றது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය කෙටි කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
எனக்கு இன்னும் 20 செக்கன்கள் தாருங்கள்!

இத்தோட்டங்களைப் பராமரிப்பதற்கான ஊழியர் நியமனங்களையோ அல்லது மருத்துவமனைகளுடன் இணைந்திருக்கும் மூலிகைத் தோட்டங்களைப் பராமரிக்கும் வகையில் சுதேச மருத்துவமனைகளுக்கான சிற்றூழியர் நியமனங்களையோ வழங்கினால், அது சுதேச மருத்துவ சேவை வழங்கலின் தர மேம்பாட்டுக்கு வலுச்சேர்ப்பதோடு, மூலிகைத் தோட்டங்களின் வினைத்திறனான பராமரிப்புக்கும் வழிகோலும். மேற்படி சூழ்நிலை மேம்பாட்டுக்கான வாய்ப்புகள் 2026இல் மேற்கொள்ளப்படுமா?

கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, எனக்கு உங்களை நன்றாகப் பிடிக்கும். காரணம், எனக்குத் தெரிந்தளவில் நீங்கள் உங்களுடைய வேலைகளை ஒழுங்காகச் செய்து வருகின் றீர்கள். உண்மையிலேயே, அமைச்சரவையில் உள்ளவர்களில் இரண்டாவது நிலையில் நான் உங்களை மனதில் வைத்திருக்கின்றேன், உங்களது மிகத் திறமையான சேவை வழங்கலின் காரணமாக. நீங்கள் இந்த விடயத்தையும் செய்வீர்கள் என்று எதிர்பார்க்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි, ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍යවල හිඟය. පසුගිය කාලයේදී වැඩිපුරම අවධානය යොමු වෙලා තිබුණේ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට මිසක් දේශීයව නිෂ්පාදනය කිරීමට නොවෙයි. පෞද්ගලික අංශයත් එතරම් වැඩි පෙලඹීමකින්, නැඹුරුතාවකින් ලංකාව ඇතුළත ඖෂධ නිෂ්පාදනයට යොමු වෙන්නේ නැහැ. ඒ නිසා සිද්ධ, යුනානි ආයුර්වේද රෝහල් ආශ්‍රිතව ඖෂධ නිෂ්පාදනාගාර වැඩිදියුණු කිරීමටත්, ඒවාට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත්, උපකරණ ලබා දීමටත් රජය කටයුතු කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, කයිතඩි සිද්ධ ශික්ෂණ රෝහල ආශ්‍රිතව හදලා තිබෙන ඖෂධ නිෂ්පාදනාගාරයේ ගොඩනැඟිල්ල හොඳට තිබෙනවා. නමුත්, උපකරණවල හිඟයක් පවතිනවා. ඒ උපකරණ ටික ලබා දෙන්න ඊළඟ අය වැයෙනුත් අපි මුදල් වෙන් කරනවා.

ඊළඟ එක තමයි, ඔසු උයන් පිළිබඳ කාරණය. අපි මෙවර අය වැයෙනුත් යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, ඒවායේ තිබෙන පහසුකම් යම් ප්‍රමාණයක් වැඩිදියුණු කළා. මෙවර 2026 අය වැයෙනුත් අපි ඔසු උයන් සංවර්ධනය සඳහා මුදල් වෙන් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. අපේ බලාපොරොත්තුව තිබෙන්නේ මේ තිබෙන ඔසු උයන් භාවිත කරලා ඖෂධ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමයි. දැන් අලුත්වැඩියා කටයුතුවලට මුදල් යෙදවුවා වාගේම අපට ඊළඟ අවුරුද්දේත් ඉතුරු ටික සම්පූර්ණ කර ගන්න පුළුවන්කම ලැබේවි. ඒ අනුව අපි උතුරු පළාතේත්, නැඟෙනහිර පළාතේත් තිබෙන මේ ඔසු උයන් සහ ඖෂධ නිෂ්පාදනාගාර පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1468/2025- (1), ගරු වානක මාදුගොඩ මහතා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## රැකියා විරහිත උපාධිධාරීන්: රැකියා සැපයීම
## வேலையற்ற பட்டதாரிகள்: வேலைவாய்ப்புகளை வழங்கல்
## UNEMPLOYED GRADUATES: PROVISION OF JOBS

1102/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සුරංග රත්නායක මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சுரங்க ரத்நாயக்க சார்பாக)
(The Hon.Gayantha Karunathilleka on behalf of the Hon. Suranga Rathnayaka)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2025.01.01 දින වනවිට ශ්‍රී ලංකාවේ රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්තමාන රජය විසින් උපාධිධාරීන්ට ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එම රැකියා සංඛ්‍යාව එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ඉදිරි වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට පවතින රජයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2025.01.01ஆம் திகதியளவில் இலங்கையில் வேலையற்ற பட்டதாரிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தற்போதைய அரசாங்கம் பட்டதாரிகளுக்கு வழங்கியுள்ள வேலைவாய்ப்புகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி வேலைவாய்ப்புகள் ஒவ்வொரு துறை வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) வேலையற்ற பட்டதாரிகளுக்கு வேலைவாய்ப்பு களை வழங்கும் எதிர்கால வேலைத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் அரச ஆசிரியர் சேவையில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவ்வெற்றிடங்களை நிரப்புவதற்காக துரித வேலைத்திட்டமொன்று வகுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of unemployed graduates in Sri Lanka as at 01.01.2025;

(ii) number of jobs that have been granted to graduates by the present Government;

(iii) number of the jobs referred to above, separately according to each field or sector; and

(iv) future plan to be adopted in granting employment to unemployed graduates?

(b) Will she also inform this House -

(i) the number of government teacher vacancies existing at present;

(ii) whether an expeditious course of action has been made to fill the vacancies; and

(iii) if so, what the course of action is?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයේ 2024 වාර්ෂික වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව 42,254කි.

(ii) මේ වනවිට බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් උපාධිධාරී තනතුරු සංඛ්‍යාව 12,309කි. එම බඳවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අමාත්‍යාංශ මට්ටමින් මේ වනවිට සිදු කරගෙන යනු ලබයි. තවද, ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් 25,000ක ප්‍රමාණයක් බඳවා ගැනීමට වර්තමාන රජයේ ඉදිරි

සැලැස්මක් තිබේ. ඒ අනුව උපාධිධාරීන් 37,309කට රැකියා ලබා දීමට රජයේ සැලැස්ම ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබයි.

(iii) ඇමුණුමෙහි** දක්වා ඇත.

(iv) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීම සම්බන්ධයෙන් රජයේ ඉදිරි සැලැස්ම අනුව, රජයේ සේවයේ තනතුරුවල පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතුව විධිමත් ක්‍රමවේදයක් හරහා බඳවා ගැනීම සිදු කරනු ලබයි. තවද, උපාධිධාරීන්ට ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළව අභියාචනාධිකරණයේ පැවතුණු නඩුවේ අවසන් තීරණය නිල වශයෙන් ලැබුණු පසු ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීමට නියමිතය. තවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා පුළුල් කිරීමේ සැලැස්ම ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට වර්තමාන රජය විසින් කටයුතු කරනු ලබයි.

(ආ) (i) 2025.05.31 දිනට සියලුම ජාතික හා පළාත් පාසල්හි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වේ.

| පළාත් පාසල් / ජාතික පාසල් | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික පාසල් | | 1501 |
| පළාත් පාසල් | බස්නාහිර | 4,630 |
| | දකුණ | 2,513 |
| | මධ්‍යම | 6,318 |
| | වයඹ | 2,990 |
| | ඌව | 2,780 |
| | උතුරු මැද | 1,568 |
| | නැඟෙනහිර | 6,613 |
| | සබරගමුව | 3,994 |
| | උතුර | 3,271 |
| එකතුව | | 36,178 |

(ii) ඔව්.

(iii) ඉදිරියේදී සිදු කිරීමට නියමිත බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

(a) දිවයිනේ ජාතික පාසල්වල විද්‍යා, ගණිත, තාක්ෂණ විෂයයන්, විදේශ භාෂා හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය යටතේ වන විෂයයන් සඳහා පවතින අපොස (උසස් පෙළ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා 2024.07.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව වැඩ භාර නොගැනීම මත ඇති වී ඇති පුරප්පාඩු 353ක් සඳහා දෙවන වටය යටතේ ඉදිරි මාස 2 තුළදී බඳවා ගැනීම සිදු කිරීමට නියමිතය.

(b) එමෙන්ම, අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/24/0693/601/047 හා 2024.04.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව "සැමට ඉංග්‍රීසි" වැඩසටහන යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් සිදු කරන ගුරුවරු 2,500ක් බඳවා ගැනීමට ද නියමිතය.

(c) අංක 2233 හා 2021.06.18 දිනැති ගැසට් නිවේදනය අනුව දිවයිනේ ජාතික පාසල් සඳහා විදේශ භාෂා ඉගැන්වීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් 92 සඳහා නැවත ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම මත එම පරීක්ෂණය 2025.08.19 දින පැවැත්වූ අතර, ඒ අනුව ඉතුරු පුරප්පාඩු සඳහා ප්‍රංශ, ජපන්, චීන, කොරියන්, ජර්මන් හා හින්දි යන විෂයයන් 6 සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

(d) දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය අත්හිටුවමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදී. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 77/2023 හා 88/2023 දරන නඩු 2025.08.06 දිනැතිව නිෂ්ප්‍රභ කරන ලද අතර, අංක 78/2023 හා 95/2023 දරන නඩුවලට අදාළව නීතිපති මඟින් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව, විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්කරුවන්ගේ උපරිම වයස අවුරුදු 40 යන්න වයස අවුරුදු 45 දක්වා මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි දීර්ඝ කිරීමට යටත්ව එම නඩු කටයුතු අවසන් කර ඇත. ඒ අනුව, එකී තීන්දු ප්‍රකාරව එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අවසන් බැවින් අදාළ විභාගය පැවැත්වීමට කටයුතු කළ යුතු වුවද, මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළව අභියාචනාධිකරණයේ පැවතුණු CA 92/2023 (Writ) නඩුවේ අවසන් තීරණය නිල වශයෙන් ලැබුණු පසු විභාගය පැවැත්වීමට නියමිතයි. ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු ප්‍රකාරව රජයේ සේවයේ නියුතු උපාධිධාරීන් හා සෙසු උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව වෙන වෙනම විභාගයක් පැවැත්වීම සම්බන්ධයෙන් 2025.10.08 දිනැතිව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා 2025.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර, එම තීරණය සම්බන්ධ උක්ත නඩු තීන්දුව නිල වශයෙන් ලැබුණු පසු ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

## කුණ්ඩසාලේ, මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය: විස්තර

குண்டசாலை, மத்திய செயற்கை முறை சினைப்படுத்தல் நிலையம்: விபரம்

CENTRAL ARTIFICIAL INSEMINATION CENTRE, KUNDASALE: DETAILS

1305/2025

**3. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා (ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා වෙනුවට)**

(மாண்புமிகு மஞ்சுள சுரவீர ஆரச்சி - மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம சார்பாக)

(The Hon. Manjula Suraweera Arachchi on behalf of the Hon. (Prof.) L.M. Abeywickrama)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2020 සිට 2025 දක්වා -

(i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ඇති කුණ්ඩසාලේ, මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ ගව ශුක්‍රාණු ලබා ගැනීමට භාවිත කරන ලද පිරිමි ගවයන් සංඛ්‍යාව;

(ii) ඉහත මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන ලද ගව ශුක්‍රාණු ප්‍රමාණය සහ ආනයනය කරන ලද ගව ශුක්‍රාණු ප්‍රමාණය;

(iii) එම මධ්‍යස්ථානයේ කෘත්‍රිම සිංචනය මඟින් බිහි වී ඇති ගව පැටවුන් සංඛ්‍යාව;

(iv) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පිරිමි ගවයන් සංඛ්‍යාව;

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) අභිජනනය සඳහා ශුක්‍රාණු ලබා ගැනීමට පිරිමි ගවයන් ආනයනය කිරීම වෙනුවට ගව ශුක්‍රාණු ආනයනය කිරීමේ වාසි කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2020ஆம் ஆண்டு தொடக்கம் 2025ஆம் ஆண்டு வரையில் -

(i) கால்நடை உற்பத்திகள் மற்றும் சுகாதாரத் திணைக்களத்தின்கீழ் காணப்படுகின்ற குண்டசாலை, மத்திய செயற்கை முறை சினைப்படுத்தல் நிலையத்தில் மாடுகளின் விந்தணுக்களைப் பெற்றுக்கொள்வதற்காகப் பயன்படுத்தப்பட்ட காளை மாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி நிலையத்தில் உற்பத்தி செய்யப்பட்ட மற்றும் இறக்குமதி செய்யப்பட்ட காளை மாடுகளின் விந்தணுக்களின் அளவு யாது என்பதையும்;

(iii) மேற்படி நிலையத்தில் செயற்கை முறை சினைப்படுத்தல் மூலமாக உருவாக்கப்பட்டுள்ள பசுக் கன்றுகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட காளை மாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

ஆண்டுவாரியாக வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இனப்பெருக்கத்துக்கு விந்தணுக்களைப் பெற்றுக் கொள்வதற்கு காளை மாடுகளை இறக்குமதி செய்வதற்குப் பதிலாக காளை மாடுகளின் விந்தணுக்களை இறக்குமதி செய்வதன்மூலமாகக் கிடைக்கும் நன்மைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House, separately for each year from 2020 to 2025, the -

(i) number of bulls used to obtain bovine semen at the Central Artificial Insemination Centre in Kundasale, which operates under the Department of Animal Production and Health;

(ii) quantity of bovine semen produced at the said Centre and the quantity of bovine semen imported;

(iii) number of calves born through artificial insemination at the said Centre; and

(iv) number of bulls imported to Sri Lanka?

(b) Will he also inform this House of the advantages of importing bovine semen for breeding purposes instead of importing bulls to obtain semen?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) තෝරා ගත් කිරි ගව රැළෙහි කාර්ය සාධන ඇගැයීමේ ව්‍යාපෘතිය යටතේ - PPRS - දේශීය ගොවිපොළ සතු වූ ඉහළ කිරි නිෂ්පාදන විභවතාවක් සහිත එළගව දෙනුන්හට ආනයනික අධිශීත ගව ශුක්‍ර භාවිතයෙන් උපත ලැබූ වසු පැටවුන් ශුක්‍ර දායක පුං ගවයින් ලෙස තෝරා ගෙන ඇත.

ගව ශුක්‍රාණු ලබා ගැනීමට භාවිත කරන ලද පිරිමි ගවයන් පිළිබඳ තොරතුරු

(2020 - 2025)

| වර්ෂය | පුං ගවයින් සංඛ්‍යාව |
|---|---|
| 2020 | 14 |
| 2021 | 13 |
| 2022 | 11 |
| 2023 | 10 |
| 2024 | 14 |
| 2025 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා | 12 |
| එකතුව | 74 |

(ii) නිෂ්පාදනය සහ ආනයනය කරන ලද ගව ශුක්‍ර වඩි පිළිබඳ තොරතුරු

(2020 - 2025)

| වර්ෂය | නිෂ්පාදනය කළ අධි ශීත ගව ශුක්‍ර වඩි සංඛ්‍යාව | වර්ගය | ආනයනය කළ ගව ශුක්‍ර වඩි සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| 2020 | 185,869 | - | - | - |
| 2021 | 138,824 | සාහිවාල් | 2,992 | 2,992 |
| 2022 | 189,425 | ජර්සි | 1,000 | 1,000 |
| 2023 | 107,930 | සාහිවාල් | 18,549 | 38,703 |
| | | ගිරොලැන්ඩා | 5,000 | |
| | | ජර්සි (ලිංග නිර්නිත) | 3,438 | |
| | | ජර්සි | 4,566 | |
| | | ෆ්‍රීශියන් | 1,000 | |
| | | ගීර් | 5,000 | |
| | | නිලිරවි | 1,000 | |
| | | මූරා | 150 | |
| 2024 | 216,292 | ගීර් | 2,500 | 2,500 |
| 2025 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා | 251,735 | ජර්සි | 2,000 | 2,000 |
| එකතුව | 1,090,075 | | 47,195 | 47,195 |

(iii) කුණ්ඩසාලේ පිහිටි මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මඟින් නිපදවා දිවයින පුරා පැතිරී ඇති පශු වෛද්‍ය කොට්ඨාස 337ක් සඳහා ගව ශුක්‍ර වඩි බෙදා හැරීම තුළින් වාර්තා වී ඇති පැටවු උපත් සංඛ්‍යාව පහත පරිදි වේ.

කෘත්‍රිම සිංචනය මඟින් වාර්තා වී ඇති පැටවු උපත් පිළිබඳ තොරතුරු

(2020 - 2025)

| වර්ෂය | පැටවු උපත් සංඛ්‍යාව |
|---|---|
| 2020 | 56,049 |
| 2021 | 60,101 |
| 2022 | 65,492 |
| 2023 | 64,003 |
| 2024 | 66,378 |
| 2025 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා | 54,813 |

(iv) 2020 සිට 2025 දක්වා කාලය තුළදී ශ්‍රී ලංකාවට ශුක්‍ර දායක පුං ගවයින් ආනයනය කර නැත.

(ආ) **ගව ශුක්‍ර ආනයනයේ ඇති වාසි වන්නේ,**

- විවිධ වර්ගයේ ගව ශුක්‍ර මෙන්ම එකම වර්ගයකට අයත් විවිධ සතුන්ගේ ශුක්‍ර ආනයනය කිරීමට හැකි බැවින් ශ්‍රී ලංකාවට ඉහළ නිෂ්පාදන විභවතාවක් සහිත නව ජාන හඳුන්වා දීමට හැකි වීම.
- ශ්‍රී ලංකාව තුළ ලිංග නිර්නිත ගව ශුක්‍ර නිෂ්පාදන පහසුකම් නොමැති වීම හේතුවෙන් ලිංග නිර්ණය කරන ලද ගව ශුක්‍ර ආනයනය සඳහා අවස්ථාව ලැබීම.

**ගව ශුක්‍ර ආනයනයේ ඇති අවාසි වන්නේ,**

- ආනයනය කරනු ලබන සාමාන්‍ය ගව ශුක්‍ර වඩියක මිල රුපියල් 1,000 සිට රුපියල් 3,500ක් අතර වීම - ආනයනය කරනු ලබන රට සහ සතුන්ගේ වර්ගය අනුව - සහ ලිංග නිර්නිත ගව ශුක්‍ර වඩියක මිල රුපියල් 8,000 සිට රුපියල් 12,000 අතර වීම- ආනයනය කරනු ලබන රට සහ සතුන්ගේ වර්ගය අනුව -. 2024 වර්ෂය තුළදී දේශීයව නිෂ්පාදනය කරනු ලබන ගව ශුක්‍ර වඩියක අවසන් නිෂ්පාදන වියදම රුපියල් 315ක් - සේවක වැටුප්, ගබඩා කිරීමේ වියදම් සහ බෙදා හැරීමේ වියදම් සහිතව - වූ අතර, ආනයනිත ගව ශුක්‍ර වඩි සඳහා එහි ආනයනිත වියදමට අමතරව සේවක වැටුප්, ගබඩා කිරීමේ වියදම් සහ බෙදා හැරීමේ වියදම් ද ඇතුළත් විය යුතුය. ඒ අනුව ඉහළ ආවස්ථික පිරිවැයක් සහිතය.
- දේශීයව නිෂ්පාදිත ආනයනිත සාමාන්‍ය ගව ශුක්‍ර වඩි ගොවීන් සඳහා නිකුත් කරනු ලබන්නේ රුපියල් 100ක් වැනි සහන මිලකට වන අතර, ලිංග නිර්නිත ගව ශුක්‍ර වඩි ගොවීන් සඳහා නිකුත් කරනු ලබන්නේ රුපියල් 190ක් වැනි සහන මිලකටය. ඒ අනුව ආනයනය කළ ගව ශුක්‍ර වඩි භාවිතයේදී රජයට විශාල පිරිවැයක් දැරීමට සිදු වේ.

**සතුන් ආනයනය කිරීමේ වාසි**

- අඩු නිෂ්පාදන පිරිවැයක් සහිතව නිෂ්පාදනය කිරීමේ හැකියාව ලැබීම.
- වාර්ෂික නිෂ්පාදනය සැලකීමේදී සැලකිය යුතු අතිරික්තයක් ඇති වීම සිදු වන බැවින්, එම අතිරික්තය තවත් විශාල කාලයක් භාවිතයට ගත හැකි වීම. අධිශීත ගව ශුක්‍ර වඩි නිවැරදිව ගබඩා කිරීම තුළ ඕනෑම කාලයක් ගව ශුක්‍ර මිය යාමෙන් තොරව කල් තබා ගත හැකිය. ඒ අනුව උදාහරණයක් ලෙස ශුක්‍ර දායක පුං ගවයෙකුගේ සරු කාලය අවසන් වීමෙන් හෝ මිය යාමෙන් පසුව ද, වසර ගණනාවක් ගත වනතුරු එම ගවයාගේ ශුක්‍ර අභිජනන ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි වීම. ඒ අනුව ආන්තික පිරිවැය රුපියල් 16.79ක් වැනි ඉතා අඩු අගයක් ගනී.

(ඇ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, 31වන ස්ථාවර නියෝගය යටතේ ඔබතුමාගේ මාර්ගෝපදේශය හොඳයි; ඒක ඉතාම වටිනවා. හැබැයි, තව කාරණයක් තිබෙනවා. අපි මන්ත්‍රීවරු හැටියට ඔබතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. අපි Table Office එකට තමයි ප්‍රශ්න භාර දුන්නේ. අටවන පාර්ලිමේන්තුව තමයි මම නියෝජනය වෙන්නේ. එතකොට, ඒ දීපු පිළිවෙළට තමයි ප්‍රශ්න න්‍යාය පුස්තකයට ඉදිරිපත් වුණේ. නමුත් ඒක බැහැර වුණා, නවවන පාර්ලිමේන්තුවේදී. ඒක බැහැර කළේ, ඔය Table Office එකේ හිටපු නිලධාරියා. එතුමා විශ්‍රාම ගිහිල්ලා, දැන් ඉන්නේ සභානායක කාර්යාලයේ. එතුමා ඒ ආණ්ඩුවට ඕනෑ විධියට මේ ප්‍රශ්න යොමු කළා. දැන් මේ ආණ්ඩුවත් යන්නේ ඒ විධියට. ඒ නිසා ඔබතුමාගෙන් මාර්ගෝපදේශයක් අපි ඉල්ලනවා. සෑම මන්ත්‍රීවරයෙක්ම ප්‍රශ්න අහන එකට අපි බාධා කරන්නේ නැහැ; ඒක මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකමක්. නමුත් පිළිවෙළක් තිබුණා. අපේ නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා දන්නවා, මන්ත්‍රීවරු ප්‍රශ්නය දුන්නාම ඒ පිළිවෙළට තමයි කටයුතු කළේ කියන එක. නමුත්, දැන් ඒක වෙන්නේ නැහැ. ඒක වෙන්නේ නැතුව, ප්‍රශ්න තෝරනවා, ආණ්ඩුවට වදින්නේ මොකක්ද, නැද්ද කියලා. ඒක නවවන පාර්ලිමේන්තුවේදී තමයි සිද්ධ වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් සොයා බලා වැඩකටයුතු කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

එතුමා විශ්‍රාම ගිහිල්ලා දැන් ඉන්නේ සභානායක කාර්යාලයේ. ඒ නිසා ප්‍රශ්න සම්බන්ධයෙනුත් හොඳ මාර්ගෝපදේශයක් හදලා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පුත්තලම මූලික රෝහලේ පුරප්පාඩු සහ කාර්ය මණ්ඩල සමාලෝචනය
### புத்தளம் ஆதார வைத்தியசாலையிலுள்ள வெற்றிடங்களும் ஆளணி மீளாய்வும்
### VACANCIES AND CADRE REVISION OF BASE HOSPITAL, PUTTALAM

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
அனைவருக்கும் காலை வணக்கம்!

கௌரவ சபாநாயகர் அவர்களே, மதிப்புக்கும் அன்புக்குமுரிய கௌரவ சுகாதார அமைச்சர் நளிந்த ஜயதிஸ்ஸ அவர்களிடம் பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)க்கு அமைவாக கேள்வி கேட்பதற்கு அனுமதி யளித்தமைக்கு நன்றி!

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு கட்சியின் தலைவர் என்ற வகையில், அடக்கி ஒடுக்கப்பட்ட சிறுபான்மை இன மக்களின் கடைசிக் குரல் எனும் அடிப்படையில், தமிழ், முஸ்லிம் மக்கள் செறிந்து வாழ்கின்ற புத்தளம் பிரதேசத்தில் இருக்கும் ஆதார வைத்தியசாலை தொடர்பாகக் கடந்த தினங்களில் மாண்புமிகு சனாதிபதி அவர்களாலும் புத்தளத்தைப் பிரதிநிதித்துப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர் ஒருவராலும் மக்களுக்குத் தெரியப் படுத்தப்பட்ட விடயங்களுடன் தொடர்புபட்டதாக, பொறுப்பு மிக்க அரசாங்கத்தின் மதிப்புமிக்க சுகாதார அமைச்சர் என்ற வகையில் பின்வரும் 11 கேள்விகளுக்கான உண்மையான பதில்களை கௌரவ அமைச்சரிடம் எதிர்பார்க்கின்றேன்.

1. புத்தளம் மாவட்டம் மற்றும் அதனை நேரடியாக இணைக்கும் மாவட்டங்களிலுள்ள ஆதார வைத்திய சாலைகள் எவை?

2. புத்தளம் ஆதார வைத்தியசாலை தற்போது எந்தப் பிரிவாக வகுக்கப்படுகின்றது. Type B ஆ? Type A ஆ?

3. அது type A ஆகத் தரமுயர்த்தப்பட்டிருந்தால், அவ்வாறு தரமுயர்த்தப்பட்ட திகதி, அதற்குரிய அமைச்சரவைப் பத்திரம் மற்றும் gazette பத்திரத்தின் விபரங்களைத் தரமுடியுமா?

4. புத்தளம் ஆதார வைத்தியசாலைக்கு நிரந்தரமான நிர்வாக அதிகாரி ஒருவர் - Permanent MS - இருக்கின்றாரா? அவருடைய பெயர் என்ன?

5. புத்தளம் வைத்தியசாலைக்கு நிரந்தர accountant இருக்கின்றாரா? அவருடைய பெயர் என்ன?

6. புத்தளம் வைத்தியசாலையில் காணப்படுகின்ற வைத்தியர்களின் பற்றாக்குறை எவ்வளவு?

7. புத்தளம் வைத்தியசாலையில் கடைசியாக எப்போது cadre revision செய்யப்பட்டது? அதன் பின்னர் செய்யப்படாமைக்கான காரணம் என்ன?

8. புத்தளம் வைத்தியசாலையை, மாவட்டப் பொது வைத்தியசாலையாகத் தரமுயர்த்துவதாக மாண்புமிகு சனாதிபதி அவர்களால் வாக்குறுதி வழங்கப்பட்டதாக அறிகின்றேன். அந்த வாக்குறுதி உண்மையாக இருந்தால், சுகாதார அமைச்சின் திட்டமிடல் பிரிவால் வெளியிடப்பட்ட cadre norms அடிப்படையில், அதனை மாவட்டப் பொது வைத்தியசாலையாக மாற்றுவதற் குத் தனித்தனியே எத்தனை மேலதிக வைத்தியர்கள் வேண்டும்? எத்தனை மேலதிக தாதியர்கள் வேண்டும்? எத்தனை மேலதிக சிற்றூழியர்கள் வேண்டும்?

   இது தொடர்பாக சுகாதார அமைச்சினுடைய Planning Departmentஆல் தரப்பட்டிருக்கின்ற cadre norms அடிப்படையிலான பதிலையே எதிர்பார்க்கிறேன்.

9. இலங்கையிலிருந்து வைத்தியர்களும் விசேட வைத்தியர்களும் தினமும் வெளியேறிக் கொண்டிருக் கின்ற இந்த நிலைமையில், தங்களால் இந்த ஆளணியை எவ்வாறு நிரப்ப முடியும்? எப்போது நிரப்ப முடியும்?

10. ஆதார வைத்தியசாலை ஒன்றினை, மாவட்டப் பொது வைத்தியசாலையாக மாற்றுவதற்கு எந்த ஆளணி வளமும் இல்லாத இந்த நிலையில், வெறுமனே பெயர்ப் பலகையை மாற்றினால் போதும் என்று உங்களுடைய பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கேட்கின்றார். தயவுசெய்து அவருக்கும் அவர் சார்ந்த புத்தளம் மக்களுக்கும் உண்மை நிலையைச் சொல்வீர்களா?

11. அவ்வாறு தங்களால் cadre revision செய்யப்பட்டு, மாவட்டப் பொது வைத்தியசாலையாக அது மாற்றப்படுமாக இருந்தால், அதற்கு எனது மனமார்ந்த வாழ்த்துகளைத் தெரிவித்துக்கொண்டு, சரியான விதத்தில் எப்போது இந்த நடவடிக்கை நடைபெறு மென்ற திகதியைக் குறிப்பிட முடியுமா? என்று கேட்க விரும்புகிறேன்.

பொறுப்புமிக்க அமைச்சர் என்ற வகையில் இவற்றுக்கான பதில்களை வழங்குவீர்கள் என்று நம்பிக்கையுடன் தமிழ் மக்களின் யாழ். மாவட்டப் பிரதிநிதி வைத்தியர் இ. அர்ச்சுனா ஆகிய நான் இக்கேள்விகளை முன்வைக்கிறேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මම බැලුවා පුත්තලමේ ප්‍රශ්නය මොකද ඔබතුමා අහන්නේ කියලා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. පුත්තලම දිස්ත්‍රික්කයට සෘජුවම සම්බන්ධ වන මූලික රෝහල්

   A කාණ්ඩයේ රෝහල් - 01 (පුත්තලම)

   B කාණ්ඩයේ රෝහල් - 03 (ආණමඩුව/කල්පිටිය/මාරවිල)

2. පුත්තලම මූලික රෝහල A කාණ්ඩයේ මූලික රෝහලකි.

3. පුත්තලම රෝහල A කාණ්ඩයට උසස් කර ඇත්තේ 2005.05.11 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක 02-61/2005 අනුවය. ඇමුණුමෙහි දක්වා ඇත.*

4. ගරු කථානායකතුමනි, මම හිතන විධියට, මේ ප්‍රශ්නයේ පරිවර්තන දෝෂයක් තිබෙනවා. මට එවා තිබෙන ප්‍රශ්නයේ තිබෙන්නේ, පරිපාලන නිලධාරියෙක් ඉන්නවාද කියලා විමසලා. නමුත් ගරු මන්ත්‍රීතුමා අදහස් කරන්නේ, MS ගැන. පරිපාලන නිලධාරියෙක් ස්ථිරව ඉන්නවා. නමුත් වෛද්‍ය අධිකාරි වශයෙන් වැඩ බලන නිලධාරියෙක් තමයි ඉන්නේ.

5. ස්ථිර ගණකාධිකාරිවරයෙකු නැත. පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයේ ගණකාධිකාරිතුමිය වන ඩබ්.ජී.එන්.පී.සී. ජයසේන මහත්මිය විසින් රාජකාරි ආවරණය කරනු ලබයි.

6. එය මූලික රෝහලක්. එම නිසා අනුමත සංඛ්‍යාව 95යි. දැනට ඉන්නේ වෛද්‍යවරු 83යි. ඒ අනුව පුරප්පාඩු 12ක් පවතිනවා.

7. පුත්තලම රෝහලේ අවසන් වරට කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදු කරන ලද්දේ 2017 වර්ෂයේදීයි. පුත්තලම රෝහලේ විතරක් නොවෙයි, සමස්ත රෝහල් පද්ධතියටම එම වසරේ තමයි කළේ. 2024 - 2025 වර්ෂයන්ට අදාළව සෞඛ්‍ය අංශයේ සියලු කාර්ය මණ්ඩල සමාලෝචනයන් මේ වන විටත් සිදු කරමින් පවතිනවා.

---

***පිළිතුරු අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

8. අංක 01-18/2020 හා 2020.03.03 දිනැති පොදු චක්‍රලේඛය පරිදි දිස්ත්‍රික් මහ රෝහලක පැවතිය යුතු පහසුකම් අනුව කාර්ය මණ්ඩලය ප්‍රතිමාන - cadre norms - අනුගමනය කරමින් අවශ්‍ය කාර්ය මණ්ඩලය ගණනය කරනු ලබනවා.

ගරු කථානායකතුමනි, එතුමා අහන්නේ, ජනාධිපතිතුමා පොරොන්දුවක් දීලා තිබෙනවා, ඒ අනුව අපි කාර්ය මණ්ඩලය වැඩි කරන්න සැලසුම් කරලා තිබෙනවාද කියලායි. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් 2020දී නිකුත් කළ චක්‍රලේඛයෙන් ජාතික රෝහලක සිට PMCU එක දක්වා අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා තිබෙනවා.

9. මේකෙදි වෛද්‍යවරුන්ගේ සහ විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟය ගැනයි අහන්නේ. මෙම කාර්ය මණ්ඩලය නැවත පුරවන්න පුළුවන්ද කියලාත් අහනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

අපේ cadre norms දන්නවා නේ. Cadre norms අනුව කොච්චර ඕනෑද කියලායි මම අහලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මම කියන්නම්.

වෛද්‍ය වෘත්තිකයන් විදෙස්ගත වුවද, අඛණ්ඩව බඳවා ගැනීම් හා පුහුණු කිරීම් සිදු කර පුරප්පාඩු සම්පූර්ණ කරන අතරම, දැනට පවත්නා මානව සම්පත කළමනාකරණය මඟින් සෞඛ්‍ය සේවාව අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යාම සිදු කරනු ලබනවා. තවද, වෛද්‍ය නිලධාරීන්ගේ හිඟයක් ඇති වීම වැළැක්වීමේ අරමුණින් සියලු වෛද්‍යවරුන්ගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කළා.

තවද, විශේෂඥ වෛද්‍ය හිඟය මඟ හරවා ගැනීම සඳහා දැනට විදෙස් පුහුණුව ලබන විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ පුහුණුව අවසන් වීමෙන් පසුව පුරප්පාඩු පවතින රෝහල් වෙත -සමහර විට Board certifications එකට ඉස්සෙල්ලා වුණත්- අනුයුක්ත කිරීම කරනවා.

10. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයෙන් අහන්නේ කාර්ය මණ්ඩලයේ හිඟයක් පවතිද්දීත් නාම පුවරුව පමණක් වෙනස් කිරීම ගැන. නාම පුවරුව වෙනස් කළේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මම කිව්වේ, බෝඩ් එක විතරක් වෙනස් කරලා කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැහැ. මම ඒක නොකරන බව ඔබතුමා දන්නවා.

කුමන කාණ්ඩයකට අයත් රෝහලක් වුවද ඊට ඉහළ කාණ්ඩයකට upgrade කිරීමේදී ඊට අදාළ නිර්ණායක සලකා බලනු ලැබේ.

ඒ කියන්නේ, මා කලින් සඳහන් කළ චක්‍රලේඛය අනුව තමයි අපි එම කටයුතු සිදු කරන්නේ.

11. දැනට "A" ශ්‍රේණියේ මූලික රෝහලක් වන පුත්තලම රෝහල එම කාණ්ඩයේ පැවතිය යුතු සේවා හා පහසුකම් මෙන්ම කාර්ය මණ්ඩලයද සම්පූර්ණ කිරීමෙන් පසුව එම රෝහල උත්ශ්‍රේණිගත - upgrade - කිරීම පිළිබඳව සලකා බලනු ලබනවා.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
*Annex tabled:*

General Circular Letter No:- 02-61/2005

My No:- HPJ/25/2005
Ministry of Healthcare, Nutrition and Uwa-Wellassa Development,
"Suwasiripaya",
No. 385,
Baddegama Wimalawansa Mawatha,
Colombo - 10.
11th May 2005

All Provincial Secretaries of Health,
All Provincial/ Deputy Provincial Directors of Health Services,
All Directors of Teaching Hospitals,
All Heads of Decentralized Units/ Specialized Campaigns,
All Medical Superintendents of Provincial & Base Hospitals,
All DMOs/MOICs of District Hospitals, Peripheral Units, Rural Hospitals, CD&MHs and CDs.

**Hospital Re-Categorization**

Reference is made to the Cabinet decision No: 02/0658/118/057 dated 22. 04.2002 on the above subject.

The Ministry of Healthcare, Nutrition and Uva-Wellassa Development has taken action to group all government hospitals according to the proposed re-categorization plan. This will enable development of these hospitals in uniform manner in order to provide equitable service to all Districts and Provinces.

Please ensure the future development plans are in compliance with the attached re-categorization plan.

Dr. Nihal Jayathilaka,
Acting Secretary,
Ministry of Healthcare, Nutrition and Uva-Wellassa Development

Encl.

**Table 1 – Re-Categorization of Hospitals**

| Province | District | Teaching Hospital | Provincial General Hospital | District General Hospital | Base Hospital Type A | Base Hospital Type B |
|---|---|---|---|---|---|---|
| Western | Colombo | NHSL<br>CSTH<br>SIGH<br>LRH<br>DMH<br>CSHW<br>CI-Maharagama<br>MH Angoda<br>MH-Mullariyawa<br>DI-Colombo | | | BH Awissawella<br>BH Homagama<br>Colombo East (IDH) | |
| | Kalutara | | | GH Kalutara | BH Horana<br>BH Panadura | PU Pimbura |
| | Gampaha | CH Welisara<br>CN TH<br>Rehabilitation Hospital Ragama | | BH Negambo<br>GH Gampaha | BH Wathupitiwela | DH Kiribathgoda* |
| Southern | Galla | TH Karapitiya<br>TH Mahamodara | | | DH Elpitiya<br>BH Balapitiya | DH Hiniduma |
| | Matara | | | GH Matara | | BH Kamburupitiya<br>DH Deniyaya(to be relocated at Kotapola) |
| | Hambantota | | | BH Hambanthota | BH Tangalle | DH Thissamaharama<br>DH Walasmulla |
| Sabaragamuwa | Ratnapura | | GH Ratnapura | | BH Embilipitiya | DH Kahawatta<br>BH Balangoda<br>DH Kalawana |
| | Kegalla | | | BH Kegalla | | DH Karawenalla<br>DH Mawanella<br>DH Warakapola* |
| Central | Kandy | TH Kandy<br>TH Peradeniya<br>Dental Hospital Peradeniya | | BH Nawalapitiya | | BH Gampola<br>DH Teldeniya |
| | Matale | | | BH Matale | BH Dambulla | DH Hettipola |
| | Nuwara-Eliya | | | BH Nuwara-Eliya | DH Dikoya | DH Rikillagaskada |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| | | TH | | DGH | A | B |
|---|---|---|---|---|---|---|
| North Western | Kurunagala | | GH-Kurunagala | | BH Kuliyapitiya | DH Galgamuwa BH Nikawaratiya DH Polpitigama |
| | Puttlam | | | BH Chilaw | BH Puttalam | BH Marawila |
| Uva | Badulla | | GH Badulla | | BH Mahiyanganaya BH Diyathalawa | DH Welimada |
| | Monaragala | | | BH Monaragala | | DH Wellawaya DH Siyabalanduwa |
| North Central | Anuradapura | | GH Anuradapura | | | DH Kabethigollawa DH Thambuththegama DH Padaviya |
| | Polonnaruwa | | | GH Polonnaruwa | | DH Welikanda BH Madirigiriya |
| North | Jaffna | TH Jaffna | | | BH Point Pedro DH Thelippalai | DH Kayts DH Chvakachcheri |
| | Vavuniya | | | GH Vavuniya | | DH Chettikulum |
| | Mannar | | | BH Mannar | | |
| | Kilinochchi | | | DH Kilinochchi | | |
| | Mullaitivu | | | DH Mullaitivu | | DH Mankulam |
| | Ampara | | | BH Ampara | BH Kalmunai (North & South as one unit) | BH Dehiathtakandiya DH Mahaoya DH Pothuvil BH Akkaraipattu |
| East | Batticaloa | | GH Batticaloa | | | DH Valachchenai DH Kalawanchikudi |
| | Trincomalee | | | GH Trincomalee | BH Kantale | DH Muttur |

*To be developed first as A&E Unit and later consider the possibility of them to be upgraded as Type B Base Hospitals

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමා, සමස්තයක් හැටියට ගත්තොත්, පුත්තලම මූලික රෝහල "A" ශ්‍රේණියේ රෝහලක්. එය දිස්ත්‍රික් මහ රෝහලක් හැටියට උසස් කළ යුතු බවට අදහසක් අපට පවතිනවා. අපේ රටේ තිබෙන සියලු දිස්ත්‍රික්කවලින් දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයේ දිස්ත්‍රික් මහ රෝහලක් නැති එකම දිස්ත්‍රික්කය පුත්තලම දිස්ත්‍රික්කයයි. ඒ වාගේමයි, පුත්තලම දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය. අනෙක් පැත්තෙන් ගත්තොත්, වෙනත් දිස්ත්‍රික්කවලින් ජනතාව පැමිණීම ආදි සියලු කාරණා සලකා බැලුවාට පසුව, එය දිස්ත්‍රික් මහ රෝහලක් බවට උසස් කිරීම සඳහා වන positive සාධක ඕනෑ තරම් තිබෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අපේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම මේ වන විට අවසන් අදියරේයි පවතින්නේ. ඒකට සමාන්තරව අපි Strategic Master Plan එක හදනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට දළ අදහසක් කියන්නම්. දැනට පවතින "A" ශ්‍රේණියේ මූලික රෝහල් 4ක් දිස්ත්‍රික් මහ රෝහල් දක්වා උසස් කිරීමේ යෝජනාවක් අප අතර තිබෙනවා. ඒ මොනවාද කියන එක මම හෙළිදරව් කරන්න යන්නේ නැහැ. හැබැයි මතක තියා ගන්න, අවශ්‍ය කරන පහසුකම් ක්‍රමානුකූලව ලබා දීමකින් තොරව කිසිම රෝහලක බෝඩ් එක පමණක් upgrade කරන්නේ නැති බව. පළමුව, අවශ්‍ය කරන ගොඩනැඟිලි පහසුකම් ලබා දෙනවා. ඒ වාගේම, අවශ්‍ය කරන මානව සම්පත ක්‍රමානුකූලව ලබා දෙනවා. මොකද, දිස්ත්‍රික් මහ රෝහලක් සහ "A" ශ්‍රේණියේ මූලික රෝහලක් අතර පරතරය විශාලයි. "A" සහ "B" මූලික රෝහලකට වඩා DGH එකක් කරනවා නම් ඒකට ලොකු සම්පත් ප්‍රමාණයක් ඕනෑ. මම පිළිගන්නවා පුත්තලම මූලික රෝහල "A" ශ්‍රේණියේ එකක් බව. නමුත්, එහි මූලික රෝහලකට අවශ්‍ය කරන පහසුකම් ටිකවත් තවම සම්පූර්ණ වෙලා නැහැ.

සමස්තයක් හැටියට, ඊළඟ අවුරුද්දේදී රුපියල් බිලියන 31ක් මූලික රෝහල් 82 දියුණු කිරීම සඳහා යොදවා තිබෙනවා. ඒවා තිබෙන්නේ දැනට පළාත් සභා යටතේයි. වැඩි අවධානයක් යොමු කරලා ඒවායේ ඉදි කිරීම් කටයුතු සිදු කරනවා; කාර්ය මණ්ඩලය වැඩිපුර ප්‍රමාණයක් ලබා දෙනවා. Cadre norms upgrade කරන නිසා ඒකේ ප්‍රශ්නයක් වෙන්නේත් නැහැ. ඒ අනුව ඒ කටයුතු කඩිනම් කරනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, රටේ අනෙක් ජනතාවගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට වේවි. නමුත් මම කියන්න කැමැතියි, මහ ජනතාවගේ, අපේ දේශපාලන නියෝජිතයන්ගේ සියලු ඉල්ලීම් පරිදි, වැඩි වශයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඊළඟ දස අවුරුදු සැලැස්මට අනුකූලව තමයි මේ කටයුතු සිදු කරන්නේ කියන එක. ඔබතුමා මේ ප්‍රශ්නය අහලා, එය තහවුරු කර ගන්න තල්ලුවක් දීපු එක ගැන බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

කෙටි පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද, ගරු කථානායකතුමා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, කෙටි පැහැදිලි කිරීමක් කරගන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, මම මේක සිංහලෙන් කියන්න ඕනෑ. ඇත්තටම, ගිහිල්ලා කථා කරලා මොකක් හරි විසඳා ගන්න පුළුවන් ආණ්ඩු පක්ෂයේ ඇමති කෙනෙක් ඉන්නවා නම්, මෙතුමා විතරයි. මම ඒක papersවලත් ලියලා තිබෙනවා. ඇත්තටම මට සතුටුයි, මේ වාගේ උත්තරයක් දීපු එකට. අපට ලොකුම ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් MS නැති එක, මගේ යාළුවා "ලසා" තමයි ඉන්නේ. "ලසාව" තියාගෙන ඔබතුමන්ලා DGH එකක් කරනවා කියන්නේ හිතා ගන්නවත් බැරි වැඩක්. ඒ නිසා කරුණාකරලා permanent MS කෙනෙක් දෙන්න. ඊට පස්සේ Accountant කෙනෙක් කොහොම හරි හොයලා දෙන්න. ඇමතිතුමා, ඒක කරන්න පුළුවන්ද?

මට මේකටත් උත්තරයක් දෙන්න. ඔයගොල්ලෝ දාලා තිබෙනවා නේ, projects කියන එක යටතේ මුදල් වෙන් කිරීම්. මේ තිබෙන්නේ ඒ ලේඛනය. මේකේ 2026 අවුරුද්දට පුත්තලම රෝහලට යම්කිසි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? මම මේක බැලුවා. මේකේ එහෙම එකක් නැහැ. ඇමතිතුමනි, ඔබතුමන්ලාට වෙන කොහේ හෝ සල්ලි ඉතිරි වුණොත්, ඒක ඒ hospital එකට යොදවන්න කියලා තමයි මම ඉල්ලන්නේ. මම මේක study කරලා බැලුවා. මේකේ පුත්තලම රෝහලට සල්ලි වෙන් කරලා නැහැ. ඒ නිසා 2026දී බැරි වුණොත් 2027දීවත් ලොකු සල්ලි ප්‍රමාණයක් ඒකට යවන්න. ඒක අනිවාර්යයෙන්ම කරන්න කියලා මම ඉල්ලනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔතැන අපි ඇත්තටම සඳහන් කර තිබෙන්නේ රේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල් සහ විශේෂ ව්‍යාපෘති හැටියටයි. උදාහරණයක් විධියට, අපි චීන මූල්‍යාධාර මත හදන රෝහල් 13ක් තිබෙනවා. එතැන තිබෙන්නේ පළාත් සභාවලට අයත් ප්‍රාදේශීය රෝහල්. කල්පිටිය, මීරිගම වාගේ තැන් දෙකක් තමයි අපට දැන් විවෘත කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ. ඊට අමතරව, පළාත් සභාවට අයිති මූලික රෝහල් තිබෙනවා. මූලික රෝහල් වැඩිම ප්‍රමාණය අයිති පළාත් සභාවට නේ. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදීත් කිව්වා, මූලික රෝහල් 82හි

සංවර්ධනය පිණිස වන පස් අවුරුදු වැඩ පිළිවෙළක පළමු වසරේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 31,000ක් වෙන් කර තිබෙනවා කියලා. ඒ අනුව දැන් පළාත් සභා විෂය භාර අමාත්‍යාංශය විසින් ඒ ඒ පළාතට අවශ්‍ය කරන මුදල් ප්‍රමාණය වෙන් කර තිබෙනවා. මුදල් කොමිසම ඒ රෝහල්වලට අවශ්‍ය කරන මුදල් ප්‍රමාණය පිළිබඳව සාකච්ඡා කරමින් පවතිනවා. ඒ අනුව, අනිවාර්ය වශයෙන්ම අපි ඒ මුදල් ටික ලබන අවුරුද්දේ වෙන් කරනවා මූලික රෝහල් සංවර්ධනයට. එහිදී අපි upgrade කරන්න බලාපොරොත්තු වන රෝහල් කිහිපයට වැඩි ප්‍රමුඛතාවක් ලබා දෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මේ විෂයටම අදාළව ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කරවා ගැනීමකට අවසර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු ඇමතිතුමනි, දැන් පොළොන්නරුවේත් මේ ප්‍රශ්නයම තිබෙනවා. මැදිරිගිරිය රෝහල මූලික රෝහලක් විධියට නම් කරලා තිබෙනවා. ඒ වාගේම හිඟුරක්ගොඩ රෝහලත් මූලික රෝහලක් විධියට නම් කරලා තිබෙනවා. අරලගංවිලත් මූලික රෝහලක් තිබෙනවා. හැබැයි ගරු ඇමතිතුමනි, මැදිරිගිරිය රෝහලේ විතරයි මූලික රෝහලක ගුණාංග ටික තිබෙන්නේ. හිඟුරක්ගොඩ සහ අරලගංවිල රෝහල්වල මූලික රෝහලක් විධියට කිසිම පහසුකමක් නැහැ; වෛද්‍යවරු නැහැ. ඒ නිසා විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය හිඟුරක්ගොඩ සහ අරලගංවිල රෝහල් කෙරෙහිත් යොමු කර අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මම ඒ ගැන කියන්නම්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නම් කියන්න දෙයක් නැහැ.

මේ මන්ත්‍රීවරු කවුරුත් පිළිගන්නට ඕනෑ, අපේ රටේ රෝහල් උසස් කිරීමේදී - upgrade කිරීමේදී - ඒවා සිද්ධ වෙලා තිබෙන්නේ විද්‍යානුකූල පදනමකින්ම නොවෙයි කියන එක. අපි මූලික රෝහලක්, "B", "A" කාණ්ඩයේ හෝ දිස්ත්‍රික් මහ රෝහලක් බවට පත් කරනවා නම් අනිවාර්ය අවශ්‍යතාව වන්නේ ඒකට අදාළ කරන විශේෂඥ වෛද්‍ය සේවාවන් අපට සැපයිය හැකිද නොහැකිද, ඒකට අවශ්‍ය කරන පහසුකම් අපට පවතිනවාද, අවශ්‍යතාව කුමක්ද කියන එකයි. තමන්ගේ ආසනයේ මූලික රෝහලක් හදා ගැනීමේ අවශ්‍යතාව දේශපාලන අධිකාරියට තිබෙන්න පුළුවන්. නමුත්, රටේ ජාතික සැලැස්මට අනුව තමයි අප ඒ කටයුතු සිදු කළ යුතු වන්නේ. කොහොම වුණත්, ඒ මූලික රෝහල් 82ට අවශ්‍ය කරන පහසුකම් අපි පියවරෙන් පියවර ලබා දෙනවා. ඒක තමයි කරන්න පුළුවන්කම තිබෙන්නේ; එකක්වත් අත් හරින එක නොවෙයි. හැබැයි, අපි මෙතැනින් ඉස්සරහට රෝහල් upgrade කිරීමේදී නම් ඒ පිළිබඳ කාරණා කිහිපයක් කෙරෙහි දැඩිව සැලකිලිමත් වෙනවා. ඉන් පළමුවැනි එක, ජනගහන ව්‍යාප්තිය. දෙවැනි එක, භූගෝලීය අවශ්‍යතාව. තුන්වැනි එක, අපේ ජාතික සැලැස්මට එය කොතරම් අනුකූලයිද කියන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026 - කාරක සභා අවස්ථාව, දොළොස්වන වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 20]*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 20]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 20th November]*
*[HON. SPEAKER in the Chair.]*

**124 වන ශීර්ෂය.- ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.280,700,000

**தலைப்பு 124.- கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 280,700,000

HEAD 124.- MINISTER OF RURAL DEVELOPMENT, SOCIAL SECURITY AND COMMUNITY EMPOWERMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 280,700,000

**149 වන ශීර්ෂය.- කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,453,800000,

**தலைப்பு 149. - கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,453,800,000

HEAD 149.- MINISTER OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,453,800,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 124, 216 සහ 331; කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 149 සහ 303. සලකා බැලීම, පූර්ව භාග 10.30 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.45]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2026.11.21 සිකුරාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 124, 216, 331 සහ 149, 303 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ අපේ රටේ අනාගත දියුණුව වෙනුවෙන් ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශයේ ඇමතිවරයා හැටියට කටයුතු කරන ඇමතිතුමා විශාල ප්‍රශ්න රාශියකට මුහුණ පාමින් සිටින බව අපට පෙනෙනවා. මේක කියද්දී මට කාරණයක් මතක් වෙනවා. මැච් ගහන කොට එළියේත් කට්ටියක් මැච් ගහනවා, හැබැයි මැච් එක ගහන්න එළියේ හිටපු කට්ටියට භාර දුන්නාම බැට් එකයි, බෝලයයි අරගෙන පිච් එකට ගියාට එළියේ ඉන්න කොට කිව්වා වාගේ මැච් එක ගහන්න අමාරුයි. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඒ වාගේ දෝ කියලා හිතෙනවා ඔබතුමා මේ අමාත්‍යාංශය කරගෙන යන ආකාරය දිහා බලද්දී. මේ කියන කාරණය අපි ඔප්පු කරන්නත් එපායැ.

ගරු ඇමතිතුමනි, මම මීට සුළු මොහොතකට කලින් දැක්කා ඔබතුමාගේ සීනි කඩේ - දුඹුරු සීනි කඩේ - වැඩේ ගැන මුහුණු පොතේ පළ වෙච්ච දෙයක්. රුපියල් 350යි, තමුන්නාන්සේගේ සීනි කඩයේ දාලා තිබෙන සීනි මිල. හැබැයි, සෙවනගල සීනි සමාගමේ සීනි කිලෝවක පැකට් එකේ බැලුවාම, එහි මිල රුපියල් 375යි, ගරු ඇමතිතුමා. වෙළෙඳ පොළේ මිල අඩුයි. එතකොට ඔබතුමා එතැනම අසාර්ථක වෙලා නේද? කොකා ඉගිලෙන කොට සුදුයි. හැබැයි, කොකා මඩේ ඉන්න කොට මඩ පාටයි. ඒ දෙකෙන් කෝකද ඔබතුමාට කියන්නේ? ඉගිලෙන කොකා කියන්නද? මඩේ ඉන්න කොකා කියන්නද? කන්නේම, මඩ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අපත් එක්ක විපක්ෂයේ සිටිද්දී ඔබතුමා කෙරෙහි ලොකු බලාපොරොත්තුවක් තිබුණා, ඔබතුමාගේ හැඩය, කථාව, යෝජනා සම්බන්ධයෙන්. 'මේ රට සුඛිත මුදිත කරන ඇවිදින පුස්තකාලය' කියන කාරණය එදා පැහැදිලිව පෙනෙන්නට තිබුණා. නමුත්, අද ඒක ගිලිහී යන තැනට පත් වෙමින් තිබෙනවා. එහෙම ගිලිහී යන්න දෙන්න එපා, රට වෙනුවෙන්. මොකද, හඳුන්නෙත්ති කියන චරිතය මේ ආණ්ඩු බලය හදන්න රටේ හුඟු මහත් ජනතාවට විශාල බොරු ගොඩක් නම් කිව්වා. ඒවා බොරු නොවෙයි කියන යථාර්ථය පෙන්වා දෙන්න පුළුවන් හොඳම අමාත්‍යාංශය තමුන්නාන්සේට ජනාධිපතිතුමා භාර දීලා තිබෙනවා.

තව කාරණයක් තිබෙනවා. ජනාධිපතිතුමා ඊයේ තංගල්ලේ පැවති රැස්වීමේදී කිව්වා, පාතාලය සහ කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය සියයට සියයක්ම මඩිනවා කියලා. ඔබතුමා කියන්නේ මොකක්ද? "පාතාලය සහ කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය සියයට සියයක් මඩින්න බැහැ. වෙඩි තියන වෙනත් රටවල් නැද්ද?" කියලා ඔබතුමා ඇහුවා. එහෙම කළොත් පොලීසියේ නිලධාරින්ගේ රස්සාව නැති වෙනවා කිව්වා. එතකොට ජනාධිපතිතුමා සහ ඔබතුමා කියන්නේ කථා දෙකක්. ජනාධිපතිතුමාගේ අදහස, සභාපතිතුමාගේ බලාපොරොත්තුව, අපේ බලාපොරොත්තුව ඉටු නොවන තැනට ගෙනියන්න පුළුවන් වැඩ පිළිවෙළක ඔබතුමා හිටගෙන ඉන්නවාද කියන සැකය තිබෙනවා.

ඊළඟට, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ තමුන්නාන්සේ යටතේ කළ යුතු බොහොම වැදගත් කාර්යභාරයක් තිබෙනවා, ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමනි. මේ රටේ දිළිඳුභාවයට පත් වෙච්ච, යමක් කමක් නැති, අසරණ වෙච්ච, රෝගාතුර වෙච්ච විශාල පිරිසකගේ ජීවිත සවිබලගැන්වීමේ වගකීම ඔබතුමාට භාර දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ අතරින් ආයතන කිහිපයක් ගත්තොත්, ජාතික සමාජ සංවර්ධන ආයතනය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, වකුගඩු අරමුදල, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික අරමුදල ඔබතුමාට අයත්ව තිබෙනවා. ඔබතුමා යටතේ තිබෙන අනෙක් ආයතන ගණන කියන්න කලින් ඔබතුමා මේ කාරණයට සාධාරණයක් කළාද? ජාතික ජන බලවේගයේ ජයග්‍රහණය වෙනුවෙන් ආබාධිත තැනැත්තන් කළ කාර්යය වෙනුවෙන්, ඒ අයට කළ ප්‍රමුඛම කාරණයක් හැටියට පාර්ලිමේන්තුවට මන්ත්‍රීතුමෙක් ගෙනාවා. මම එතුමාට ගෞරව කරනවා, ඒ පැමිණීම පිළිබඳව. හැබැයි, මේ හැන්සාඩ් වාර්තාවක් බ්‍රේල් ක්‍රමය යටතේ කියවා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද? ඒක කරන්න ඔබතුමා අසාර්ථක වුණාද කියා මම අහනවා.

ඊළඟට, දැශ්‍යාබාධිත භාරකාර අරමුදල පුනරුත්ථාපනය කිරීම, සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල, ජීවනෝපාය සංවර්ධන වක්‍රිය අරමුදල, සමෘද්ධි අරමුදල තිබෙන්නේත් තමුන්නාන්සේ යටතේ. ඇති නැති පරතරය නැති කරන්න පුළුවන්, දුගීභාවය තුරන් කරන්න පුළුවන් ඉතා විශාල කාර්යභාරයක් ඔබතුමාට තිබෙනවා. රටේ ජනතාවගේ ආරක්ෂකයා හැටියට ඉන්නේ තමුන්නාන්සේ. නමුත් ඔබතුමා මොකක්ද කියන්නේ? ඔබතුමා අමාත්‍යාංශයේ සියලු කාරණා දකින්නේ යාචක මානසිකත්වයෙන් නම්, ඒ යාචක මානසිකත්වය හරහා මේ රට ගොඩගන්න බැහැ කියන කාරණය අසරණ වෙච්ච සියලු කඳවුර සවිබලගැන්වීමේ වගකීම භාර දීලා තිබෙන ඇමතිවරයා කියනවා නම් ඒක බරපතළ කාරණයක්. ඒ නිසා ගරු ඇමතිතුමනි, එහෙම ප්‍රකාශ කරන එක වැරැදියි. ඒක නිවැරැදි කරන්න ඕනෑ. දෙන්න ඕනෑ පුද්ගලයාට දෙන්න ඕනෑ. සමහරු හිටියා, සල්ලි තියාගෙන යාචකකමේ ගියා. තමුන්නාන්සේලා පසුගිය කාලයේ කිව්වා, "යට ඇඳුමත් අපි ඉල්ලාගෙන ඇන්දා" කියලා. හැබැයි, අද බලනකොට තියාගෙන තමයි ඒවා ඉල්ලා ගෙන තිබෙන්නේ. වලව්වේ යාචක සංස්කෘතිය තිබිලා තිබෙන්නේ තමුන්නාන්සේලාට. ඇයි එහෙම කියන්නේ, ගරු සුජීව සේනසිංහ මැතිතුමනි? "අපි වලව්කාරයෝ. අපට තිබුණා" කියනවා නේ. හැබැයි, කෙහෙල් කැනත් අරගෙන ගිහිල්ලා; දෙන කරවල ටිකත් අරගෙන ගිහිල්ලා. සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් ඇමතිවරයා කියනවා, "අපේ රටේ සමාජය යාචක මානසිකත්වයෙන්, හිඟන මානසිකත්වයෙන් එහාට ගන්න බැහැ" කියලා. එහෙම වෙන්න දෙන්න එපා. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රකාශය පිළිබඳව ඔබතුමාට චෝදනා තිබෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමාට ඒක වැරැදිලා කියවුණාද, ඔබතුමාගේ අමාත්‍යාංශයේ දිග පළල පිළිබඳව දන්නේ නැතුව කිව්වාද කියලා.

ගරු ඇමතිතුමනි, ඒ වැඩ පිළිවෙළට යොදවා ගන්න පුළුවන් සාධනීය යෝජනා පමණක් නොවෙයි, ඒකට අවශ්‍ය ප්‍රතිපාදන සහ ඒ යෝජනා මහ පොළොවේ පැළ කරලා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපි ඔබතුමාගෙන් අහනවා. ඔබතුමාගේ සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ විශාල වැඩ කොටසක් කරන්න යෝජනා වෙනවා. හැබැයි, ඒවා පසුගිය ආණ්ඩු කාලයේ කරපු යෝජනාම පමණයි. හැබැයි, ඔබතුමා එහෙම කිව්වේ නැහැ. ඔබතුමාට තිබුණු දැනුම, ඔබතුමාගේ කථාව හරහා එදා විපක්ෂයේ සිටියදී විශාල වැඩ රාශියක් යෝජනා කළා. හැබැයි, ඒවා ජනතාව වෙනුවෙන් කොහොමද සවිබලගන්වන්නේ කියන කාරණය පහදා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් හදලා නැහැ.

මට මතකයි, ඔබතුමා කිව්වා මාළුවෙක් වෙනුවට බිලී පිත්තක් දෙන්න ඕනෑ කියලා. එහෙම නම් ඔබතුමා දෙන බිලී පිත්ත මොකක්ද? ඒක පැහැදිලි කරලා දෙන්න. ගරු ඇමතිතුමනි, මේ ආධාර ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ රටේ බදු ගෙවන ජනතාව ඔබතුමාට හදලා දීලා තිබෙනවා. බදු ගෙවන ජනතාවගේ ඒ මුදල මේ අසරණ වෙච්ච ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගන්න කටයුතු කරන්න යොදනවා වාගේම, ඔවුන් රැකගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සඳහාත් යොදන්න. වයෝවෘද්ධ වෙච්ච කණ්ඩායමට, නැති බැරි උදවියට ඒ මුදල් දෙන කොට ඔවුන් යාචකයන් සේ සලකන එක හරිද? ඔවුන්ට ඇවිදගන්න බැරි නම්, ලෙඩවෙලා නම්, ඔවුන්ට වෙනත් විකල්පයක් නැහැ. ආණ්ඩුව හැටියට ඔබතුමා ඔවුන්ට පිහිට වෙන්නට ඕනෑ. ඒක තමයි ඔබතුමාට මේ අමාත්‍යාංශය තුළ තිබිය යුතු කාර්යභාරය. එයින් බැහැර වෙලා, "නිකම් දෙනවා, නිකම් ගන්නවා, නිකම් කනවා" කිය කියා සමාජයේ අසරණ වෙලා සිටින හැමෝටම චෝදනා කරන්නේ නැතුව යම් සාධනීය වැඩ පිළිවෙළක් දියත් කිරීමේ අවශ්‍යතාව අපට පෙනෙනවා. අපි ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ තුළින්, නැත්නම් යොදවන මුදල තුළින් අපට ලැබෙන output එක රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් විය යුතුයි කියන කාරණය අපි දකිනවා. හැබැයි, ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ මොකක්ද ගරු ඇමතිතුමා? ඒ වැඩ පිළිවෙළ තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ යහපත් කටයුත්ත වෙනුවෙන් හොඳ යෝජනා තිබෙනවා නම් ඒවා අපි සාධනීය ලෙස පිළිගන්නවා. එහෙම නොකර, අසරණ වූ මේ ජනතාවට චෝදනා කරන වැඩ පිළිවෙළක් හදන්න එපා කියලා අපි තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමනි, කර්මාන්ත අමාත්‍යාංශය ගත්තත්, මෙන්න මේ කාරණා තමයි ඉතාම වැදගත් වෙන්නේ. අපේ දේශීය කර්මාන්ත ටික රැක ගැනීම, දේශීය අනන්‍යතාව රැක ගැනීම, අපනයන කර්මාන්ත වැඩිදියුණු කිරීම කියන ඒ වගකීම තමුන්නාන්සේ අතට භාර දීලා තිබෙනවා. ඔබතුමා එදා කියපු බොහෝ කාරණා තිබෙනවා. මේ රට තුළ තිබෙන සම්පත් ටිකට, දේශීය කර්මාන්ත ටිකට නැවත පණ පොවන්න පුළුවන් අලුත් වැඩ පිළිවෙළක් හදවා කියලා ඔබතුමා කිව්වා. අපේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය ඉදිරියට ගේන්න පුළුවන් වැඩ පිළිවෙළ හදනවාය කියන කාරණය තමුන්නාන්සේ එදා කිව්වා. ඒ නිසා තමයි ඔබතුමාට මේ කර්මාන්ත අමාත්‍යාංශය තුළ විශාල කාර්යභාරයක් කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න භාර දීලා තිබෙන්නේ කියලා මම විශ්වාස කරනවා, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය යටතේ ඔබතුමාට විශාල වැඩ කොටසක් ඉටු කරන්න තිබෙනවා. එය ඉටු කිරීමේදී විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ලබා දුන් ණයවලට අදාළ ණයකරුවන්ට අවශ්‍ය සහන වැඩ පිළිවෙළ ඉටු වෙනවාද, නැද්ද කියලා සොයා බලන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ඔබේ ආණ්ඩුවත්, පසුගිය ආණ්ඩුවත් මේ ආර්ථික අස්ථාවරභාවය තුළ ණය කළමනාකරණය කිරීමට අදාළව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී විශේෂයෙන්ම කළේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පමණයි. දේශීය ණය ප්‍රතිව්‍යුගත කිරීම හරියට සිදු වුණේ නැහැ. දේශීය ණය ප්‍රතිව්‍යුගත කිරීමේදී රටේ කම්කරුවාට සිදු වුණු, කර්මාන්තශාලාවලට සිදු වුණු අසාධාරණවලට සාධාරණත්වය ඉටු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ වන තෙක් සකස් කරලා නැහැ, ගරු ඇමතිතුමනි. අන්න එතැන බරපතළ බේදවාචකයක් තිබෙනවා. අපි දන්නවා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ලක්ෂ 11කට වඩා අපේ රටේ ඉන්න බව. ඔවුන් දළ දේශීය නිෂ්පාදනයට සියයට 52ක වාගේ දායකත්වයක් ලබා දීලා මේ රටේ දියුණුවට හා සංවර්ධනයටත් දායකත්වය දෙනවා. හැබැයි, ඔබතුමා සොයා බැලුවාද මේ අය ගැන? පසුගිය ආර්ථික ව්‍යසනය තුළ 2022 වෙනකොට 260,000කට එහා කර්මාන්තශාලා ප්‍රමාණයක් ඔවුන් ගත් ණය ගෙවාගන්න බැරුව වැසී ගිහින් තිබෙනවා. ඒ වාගේම, 2025 වර්ෂයේ කොච්චර කර්මාන්ත ප්‍රමාණයක් වැසී ගියාද කියන එක තමුන්නාන්සේලාගේ තොරතුරු පද්ධතියේ නැහැ. ආසන්න වශයෙන් ලක්ෂ එකහමාරක් වාගේ ප්‍රමාණයක් වැසී ගිහින් තිබෙනවා. ඒ ප්‍රමාණය ලක්ෂ දෙකහමාරකට වාගේ වැඩිවෙලා තිබෙනවා. අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ව්‍යාපාර මේ වෙනකොට සියයට 50ක් විතර විනාශ වෙලා තිබෙනවා, සම්පූර්ණ වශයෙන් සහ අර්ධ වශයෙන්. ඒවා යාවත්කාලීන කිරීමේ, ඒවා රටේ ආර්ථිකයට දායක කර ගැනීමේ වගකීම තිබෙන්නේ තමුන්නාන්සේට. හැබැයි, අපට එහෙම වැඩ පිළිවෙළක් පෙනෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ ව්‍යාපාරිකයින් බොහෝ දෙනෙකු අසාධු ලේඛනයට ඇතුළත් වුණා. අසාධු ලේඛනයට ඇතුළත් වීම නිසා ඔවුන්ට තමුන්නාන්සේලා අය වැය යෝජනා හරහා ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රම යටතේ ණය ගන්න විධියක් නැහැ. 2026 වර්ෂය සඳහා රුපියල් මිලියන 50ක ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා කියලා තිබෙනවා. ඔබතුමා අපට පැහැදිලිව කියන්න, ඒ ණය යෝජනා ක්‍රමයේදී අසාධු ලේඛනයේ ඉන්න සියලු දෙනාට ඒ ණය ගන්න පුළුවන්ද? IMF එකේ කොන්දේසි අනුව දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය නොවීම හරහා මේවා ක්‍රියාත්මක කරන්න බැරි වුණා, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි. එතකොට ඔබතුමන්ලා යෝජනා කරන මේ සියලු දේවල්වලින් මේ අයට සහනයක් සැලසෙනවාද?

අද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ලක්ෂ 11කින් හරි අඩක් පමණ රටේ ආර්ථිකයට බද්ධ වෙලා නැහැ, දායක වෙලා නැහැ. ඒවා යාවත්කාලීන කිරීමේ සෘජු වගකීම ඔබතුමාට පැවරිලා තිබෙනවා. නමුත් ඔබතුමන්ලා අය වැයෙන් කියනවා, මේ උදවියට රුපියල් මිලියන 50ක් දක්වා ණය ලබා දෙනවා කියලා. හැබැයි ඔවුන් අසාධු ලේඛනයේ ඉන්නේ, ගරු ඇමතිතුමනි. ඔවුන්ට මේක ගන්න බැරි වෙනවා. ඔවුන්ට මේක ගන්න පුළුවන් ප්‍රතිපාදනය, මඟ පෙන්වීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්නේ කොහොමද කියන කාරණය ගැන කියන්න. ඒක වැදගත්. ඒ ඇයි? ඔවුන්ගේ කර්මාන්තශාලා ටික තෙමෙනවා. ඔවුන් යොදපු මූලික ප්‍රාග්ධනය හරහා ගොඩනඟාගත් වැඩ පිළිවෙළක් තිබෙනවා. එතැනට අලුතින් කර්මාන්ත හදනවාට වඩා වැටිලා තිබෙන කර්මාන්ත හදන එක යෝග්‍ය නැද්ද, ගරු ඇමතිතුමනි? මේ කර්මාන්ත හරහා රැකී රක්ෂා 450,000ක් පමණ බිහිවෙලා තිබෙනවා. හැබැයි, මේ 450,000ට වඩා පෞද්ගලික අංශයෙන් වෘත්තිකයාට ලැබිච්ච රැකියාව අහිමි වෙලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන කල්පනා කරන්න ඕනෑ; හිතන්න ඕනෑ. මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සංඛ්‍යාත්මකව හොඳයි; හැඩයි; ලස්සනයි. සමාජයට ඒක පේනවා. නමුත් ඒක කර්මාන්ත අමාත්‍යාංශය විසින් ප්‍රායෝගිකව කරන්නේ කොහොමද? මේවා ලිහිල් කරලා, බැඳීම් අයින් කරලා සත්‍ය වශයෙන්ම අසරණ වෙච්ච ප්‍රජාවගේ කර්මාන්තශාලා ටික ගොඩ ගන්න පුළුවන් මඟ පෙන්වීම, අවශ්‍ය හයිය ලබා දෙන වැඩ පිළිවෙළ ගැන තමුන්නාන්සේගේ කථාව තුළින් අපට කියන්න. ඒක ඒ අයට සහනයක් වෙයි. ජනතාව අපෙන් මේවා ගැන ඉල්ලීම් කරනවා, අපිත් එක්ක මේවා ගැන කථා කරනවා. අපට විපක්ෂයේ ඉඳගෙන කරන්න තිබෙන්නේ, ඔවුන්ගේ ඒ ඉල්ලීම, දුක් ගැනවිල්ල ආණ්ඩු පක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාට යොමු කරන එකයි. තමුන්නාසේලා විපක්ෂයේ සිටිද්දී අපට වඩා හොඳට මේවා කියපු බවත් අමතක කරන්න එපා, ගරු ඇමතිතුමනි.

දැන්, ඔබතුමන්ලාගේ වාරය ඇවිල්ලා තිබෙන්නේ; කාලය ඇවිල්ලා තිබෙන්නේ. මඩ ගගහා ඉන්නේ නැතිව, පසුගිය කාලයේ ෆයිල් ටික පෙන්ව පෙන්වා ඉන්නේ නැතිව වැඩ කරන්න. ඒ ෆයිල්වල වැඩ පිළිවෙළ හරියට හදනවා නම් හොඳයි. ෆයිල් ඇරලා හොරු අල්ලන්න ආපු කට්ටිය කෝ? අන්න, අද දහවල් 2.00ට එනවා, නුගේගොඩට. ඔබතුමන්ලා, -*[බාධා කිරීමක්]*අල්ලන්න,

[ගරු චමින්ද විජේසිරි මහතා]

අද දහවල් 2.00ට එනවා. අපි කැමැතියි, වැරදි ක්‍රියාමාර්ග ඕනෑ තැනක, ඕනෑ වෙලාවක පෙන්වන්න. හැබැයි, අපට නරි නාවන්න බැහැ. මොකද, සමගි ජන බලවේගය ගොඩ නැඟුණේ හොරුන්ට විරුද්ධව. සජිත් ප්‍රේමදාස මහත්මයා මේ පක්ෂය හදන්න මුල පුරනකොට අපි බය නැතිව ගිහිල්ලා වාඩි වුණේ ඇයි? අපේම කඳවුර හොරකම් කළා කියලා ඔබතුමන්ලා චෝදනා කරනකොට, එහෙම නොවී කශේරුකාවක් තියාගෙන ඉඳ ගන්න පුළුවන් කඳවුරක් අපි ගොඩ නඟලා තිබෙනවා.

මම ඔබතුමන්ලාට අභියෝග කරනවා. මේ වෙනකොට සමගි ජන බලවේගයේ - අපේ - කවුරු හරි, ඔබතුමන්ලාගේ බොරු උසාවිය හරි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හරි පාවිච්චි කරලා - උසාවි ගිහිල්ලා - නඩුවක් දාලා සිරගත කරලා තිබෙනවාද කියලා පුළුවන් නම් කියන්න. මම දන්න විධියට කවුරුත් හිරේ නැහැ නේ. ඇයි? අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. මොකද, අවුරුද්දකුත් මාස ගාණකුත් ගත වෙනකොට සමගි ජන බලවේගය කියන පක්ෂය පිරිසිදු පක්ෂයක්, හොරු නැති පක්ෂයක් කියලා නලින්ද ජයතිස්ස මහත්මයාත් බය නැතිව කිව්වා. ඉතින්, අපි ඒ ගැන සතුටු වෙනවා. ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා. අපට හොඳ කශේරුකාවක් තිබෙනවා, අපේ දේශපාලනය අපි පිරිසිදුව කරනවා කියන කාරණය අද සමාජයට ඍජුව හෝ වක්‍රව කියන්න මේ ආණ්ඩුවට හැකියාව ලැබී තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. 2019දී වැරදුණා; වැරැද්දුවා. 2025ත් වැරදුණා; වැරැද්දුවා. මම දන්නේ නැහැ, ඊළඟටත් වරද්දා ගනියිද කියලා. මේ පක්ෂයේ ඉන්න කණ්ඩායම බලන්න. අපේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඇතුළු තරුණ කණ්ඩායමක් ඉන්නවා. අපි කථාව විතරක් නොවෙයි, අපි වැඩ කරලා තිබෙනවා. අපි ආණ්ඩුවේ ඉන්නකොට - 2016, 2017, 2018 කාලයේ - වැඩ කරලා පෙන්නුවා. අපි එදා යහපාලන ආණ්ඩුවෙන් වැඩ කරලා පෙන්නුවා. ඊළඟට, 9 වැනි පාර්ලිමේන්තුවේ සිටි නායකතුමා වන ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට කර ගන්න බැරි වෙලා දාලා යනකොට රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා ආණ්ඩුව භාර ගන්න වෙලාවේ අපි විපක්ෂයේ ඉඳලා උදව් කළා. අපි අදත් උදව් කරනවා. අපි සාධනීය යෝජනා ඉදිරිපත් කරමින්, වැඩ පිළිවෙළ පෙන්වා දෙනවා. කුහක වෙන්නෙ නැතිව අපි ඒවා පෙන්වා දීලා තිබෙනවා. ඒකත් මේ රටේ ජනතාව දකින්නට ඕනෑ, තේරුම් ගන්නට ඕනෑ.

එහෙම නැතිව වෛරය පිරිමහ ගන්න එක එක දේවල් කරන්න එපා. එදා හිටපු කණ්ඩායමට දඬුවම් දෙන්න ඔබතුමන්ලා හැදුවා. දැන් ඔබතුමන්ලාට දඬුවම් දෙන්න කණ්ඩායම් හදන්න කවුරු හරි අපට එන්න කියනවා නම්, - *[බාධා කිරීමක්]* දඬුවම් දෙන්න ඕනෑ විධියට, නීත්‍යනුකූලව දඬුවම් දෙන්න ඕනෑ. හැබැයි, ජන මතය, ඡන්දය විකෘති වීම හරහා සිද්ධ වුණේ මොකක්ද කියන කාරණය පිළිබඳවත් රටේ ජනතාවට හිතන්න කියලා මම මේ වෙලාවේ මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වැටිලා තිබෙන මේ මහා අගාධයෙන් ගොඩගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඔබතුමා හදලා දෙයි කියලා මම හිතනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සතුව තිබෙනවා ගැසට් එකක්. එහි ඔබතුමා ආයතන ගණනාවක් ගැසට් කරලා තිබෙනවා. ඒවා ඉතාම කාලෝචිතව මේ රටේ අනාගතය වෙනුවෙන් යොදවාගන්නට ඕනෑ. ඒ තුළ පාරම්පරික කර්මාන්ත ගණනාවක් තිබෙනවා. ඒ පාරම්පරික කර්මාන්ත හරහා ගොඩනැගුණු, බද්ධ වුණු විවිධ වූ ක්ෂේත්‍ර අද බිමටම ඇද වැටිලා තිබෙනවා. ඒකට එක හේතුවක් තමයි මේ පිරිවැයන් වැඩිවීම. වැඩිවෙලා තිබෙන පිරිවැයන් මේවායි. ඉන්ධන පිරිවැය වැඩි වෙලා තිබෙනවා, විදුලිය පිරිවැය වැඩි වෙලා තිබෙනවා. ඒකට සාපේක්ෂව ඔවුන්ගේ නිෂ්පාදන මිල ඔවුන්ට පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙනවා. එහෙනම් ඒක දන්න ඇමතිවරයෙක් හැටියට ඒක හඳුනාගනිමින් ඒ මිල අඩු කරන්න පුළුවන් ක්‍රමවේදයකට මැදිහත් වෙන්න, සහන දෙන්න. ඒ සහන දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ පිළිබඳව, ඉන්ධනවලින් සහන දෙන්නේ කොහොම, විදුලියෙන් සහන දෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ඉතාම ඕනෑකමින්, උන්නඳුවෙන් අවධානය යොමු කළොත් ඔබතුමා එදා කියපු ඒ සියලු දේවල් ප්‍රායෝගිකව කරන්න වැඩ පිළිවෙළක් ඔබතුමාට අමාත්‍යාංශය තුළ ඇති කර ගන්න පුළුවන් වෙයි. එහෙම නැතුව බැහැ.

අද අපේ පාරම්පරික කර්මාන්ත ටික කොහේද තිබෙන්නේ කියලා බලන්න. ඔවුන්ගෙන් ඇහුවාම මොකද කියන්නේ? "සර්, අපිට මේ තිබෙන විදුලි මිලත් එක්ක, මේ තිබෙන ඉන්ධන මිලත් එක්ක අපට ලැබෙන අමුද්‍රව්‍යවල මිල ගෙවාගෙන, සේවක මණ්ඩලයේ පඩි-නඩි ගෙවාගෙන මේක කරන්න බැහැ" කියලා ඔවුන් කිව්වා. අන්න ඒ ප්‍රධාන කාර්යය තේරුම් ගෙන මේ කර්මාන්ත සියල්ල හරි තැනට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළ හදන්න පුළුවන් දැනුම, ශක්තිය තමුන්නාන්සේට එදා විපක්ෂයේදී තිබුණා. දැන් නේ, පොඩි අවුලක ඉන්නේ. දැන් තමයි පොඩි අවුලක ඉන්නේ. ඒ නිසා ඒ අවුල හදන්න එපා. මොකද, ආණ්ඩුවට ඒක හොඳ නැහැ. ආණ්ඩුව ගොඩනැඟෙනකොට ඔබතුමා පිළිබඳව, ඔය ඉදිරි පෙළේ ඉන්න බොහෝදෙනා පිළිබඳව දැඩි විශ්වාසයක් මේ ඡන්ද දායකයා තුළ තිබුණා. දැන් - මම ඒ වචනය කියන්න හොඳ නැහැ - ඔබතුමාගේ හැසිරීමත් එක්ක, ඔබතුමාගේ නියෝජනයත් එක්ක මොකක්ද සිද්ධ වුණේ කියලා දැන් තේරීගෙන යනවා. එහෙනම් එතැනට යන්න එපා. මොකද, ඔබතුමන්ලාට අපි කරන යෝජනාවල ප්‍රතිලාභ සියල්ල ලැබෙන්නේ අපට නොවෙයි, රටේ ජනතාවට. ඒ නිසා රටේ අසරණ වෙච්ච, සමාජයේ හැම දාම දුක් විඳින ජනතාව පෝෂණය කරලා, ඔවුන්ව ආරක්ෂා කරලා ඔවුන්ගේ ජන ජීවිතය; ඔවුන්ගේ එදිනෙදා ජීවිතය යථා තත්ත්වයට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මේ 2026 වර්ෂයේවත් ඔබතුමාට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම point of Order එක කියන්නම්.

ගරු සභාපතිතුමනි, Standing Order No. 29(1) and (2). මම දෙමළෙන් කියන්නම්.

கௌரவ தவிசாளர் அவர்களே, நான் இப்போது புத்தளம் மாவட்டம் தொடர்பான கேள்வியைக் கேட்டுவிட்டுப் பாராளுமன்ற canteenக்குச் சென்றபோது, canteen வாசலுக்கு முன் இருக்கின்ற cameraவுக்கு முன்னால் வைத்து புத்தளம் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் முஹம்மட் பைசல் அவர்கள் என்னைக் கொலை செய்வதாக -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා ඒක point of Order එකක් නොවෙයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු සභාපතිතුමනි, මරණ තර්ජනයක් තිබෙනවා. ඒ නිසා ඒක කියන්න දෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කාටද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට. [බාධා කිරීම්]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහෙනම් අනිවාර්යයෙන් කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ වගකීමක්, මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට ලබා දෙන්න. *[බාධා කිරීම්]* හොඳයි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ தவிசாளர் அவர்களே, canteen வாசலில் உள்ள cameraவுக்கு முன்னால் வைத்து, "මම ඔයාව මරලා දානවා" என்று எனக்கு நேரடியாகச் சொல்லியிருக்கின்றார். தயவுசெய்து அந்தக் camera recordingஐ எடுத்துப் பார்த்து விட்டு inquiryஐ start பண்ணுங்கள்! எனக்கு சாவதற்குப் பயமில்லை! ஆனால், புத்தளம் மாவட்டம் சார்பாக ஒரு கேள்வியைக் கேட்டதற்காக அவர் இவ்வாறு செய்திருக் கின்றார்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධව මා වෙත ලිඛිතව ලබා දෙන්න.
Next, the Hon. Chathuranga Abeysinghe. You have 15 minutes.

[පූ.භා. 10.07]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු සභාපතිතුමනි, මම නියෝජ්‍ය අමාත්‍ය ධුරයේ දිවුරුම් දීලා අදට හරියටම වසරක් ගත වනවා. 2026ට අදාළව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා. විශේෂයෙන්ම මේ විවාදය පටන් ගනිද්දි කර්මාන්තකරණයට හෝ ව්‍යවසායකත්වයට සුදුසු විද්‍යාත්මක පදනමකින් කිසිම තර්කයක් විපක්ෂයට ඉදිරිපත් කරගන්න බැරි වුණා. කෙසේ වුණත්, ඒ කාරණය මම පැත්තකින් තියන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මේ වගකීම භාර ගත්තා වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය, අපේ අමාත්‍යාංශයේ සභාපතිවරුන්, අපේ පෞද්ගලික කාර්ය මණ්ඩල වාගේම විවිධ අමාත්‍යාංශවල නිලධාරින්, මේ රටේ බිඳ වට්ටලා තිබුණු කර්මාන්තකරණය නඟාසිටුවන්නට දැවැන්ත සහායක් ලබා දී තිබෙනවා. ඒ සහාය තුළින් තමයි මම දැන් ඉදිරිපත් කරන කරුණුවල යථාර්ථය, එහෙම නැත්නම් ජයග්‍රහණය කණ්ඩායමක් විධියට අපි ලබා ගත්තේ. ගරු සභාපතිතුමනි, මේ මහත්වරුන් කර්මාන්තකරණය කරලා, ආර්ථිකය ගොඩ නඟන්න හැදුවාට, ආර්ථිකය බංකොලොත් කරලා තමයි අපට භාර දුන්නේ. එම නිසා මේ ආර්ථිකයත් එක්ක අපි කොහොමද ඉස්සරහට යන්නේ කියලා කර්මාන්තකරුවා හිටියේ වකිතයකින්. ව්‍යවසායකයන්ට අවශ්‍ය ධෛර්යය, ශක්තිය එදා තිබුණේ නැහැ. දත්තවලින් කිව්වොත් හරියටම 16,000ක් හිටියා, ණය ගෙවා ගන්න බැරිව. ඔවුන්ගේ දේපළ බැංකුවලට සින්න වෙන්න යන තත්ත්වයක් එදා තිබුණේ. ඉතින්, මෙන්න මේ වාගේ කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට ධෛර්යයක්, ශක්තියක්, විශ්වාසයක් ලබා දෙන එක තමයි අපේ 2025 වැඩ පිළිවෙළේ ප්‍රධාන කාරණය වුණේ.

ආර්ථිකය ගැන හරියටම කථා කරනවා නම්, අපි කර්මාන්තකරණය ඇතුළේ මේ අවුරුද්දේ ලබා ගත් ජයග්‍රහණවලින් කිහිපයක් මම කියන්නම්. එතකොට ඔය කියපු කාරණා නැති වෙලා යනවා. ඇමෙරිකාවෙන් reciprocal බද්දක් දාලා අපි රටක් විධියට ආපස්සට යයි කියලා කථා වෙමින් තිබියදී, ඒක ජයග්‍රහණය කරලා අපනයන ක්ෂේත්‍රය ජයග්‍රහණය කරන්න අපට 2025දී පුළුවන්කමක් ලැබුණා. අපි සියයට 7ක අපනයන වර්ධනයක් ළඟා කරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම නිෂ්පාදන ක්ෂේත්‍රයේ වර්ධනය ගත්තොත්, සියයට 9.7ක්. Index of Industrial Production - IIP - මේ අවුරුද්දේ සියයට 6කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, දළ දේශීය නිෂ්පාදනයට වඩා වේගයෙන් එය වර්ධනය වනවා. Purchasing Managers' Index එක 61ට ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම බැංකුවලට සින්න වන NPLs ප්‍රමාණය සියයට 20කින් අඩු වෙලා ණය දෙන්නත්, ණය ගන්නත් තිබෙන හැකියාව සහ වුවමනාව සියයට 20කින් වැඩි වෙලා තිබෙනවා. මේ දත්තවලින් අපට පෙනෙන්නේ කර්මාන්තකරණයට වඩා සුදුසු බිමක් දැන් හැදිලා තිබෙනවා කියන එකයි.

ඒ වාගේම කර්මාන්ත අමාත්‍යාංශය පැත්තෙන් අපට කියන්න පුළුවන්, කර්මාන්ත සහ ව්‍යවසායකත්වය කොච්චර සක්‍රියව මේ අවුරුද්ද තුළ මේ රටේ ප්‍රබෝධයට පත් වුණාද කියලා. ගරු සභාපතිතුමනි, කර්මාන්ත අමාත්‍යාංශයට කර්මාන්තයක් විධියට ලියාපදිංචි වෙන්න applications 118ක් ලැබුණා. එයින් 89ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. කර්මාන්ත අමාත්‍යාංශයට ඉඩම් ඉල්ලාගෙන කර්මාන්තකරුවන් 38ක් ඇවිත් තිබෙනවා. කාර්මික සංවර්ධන මණ්ඩලයට 110ක් ඇවිත් තිබෙනවා. ඒ වාගේම කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලුතින් register වෙච්ච ව්‍යවසායකයින් 2,400ක් මේ අවුරුද්දේ පමණක් ඉන්නවා. NEDA එකේ පමණක් මේ අවුරුද්දේ නව ව්‍යවසායකයින් 1,294ක් register වෙලා තිබෙනවා. කුඩා කර්මාන්ත ආයතනයේ - SED එකේ - 15,241ක්, අපනයන සංවර්ධන මණ්ඩලය හරහා නව අපනයනකරුවන් 482ක් මේ අවුරුද්දේ බිහි වෙලා තිබෙනවා.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ගරු සභාපතිතුමනි, කර්මාන්ත අමාත්‍යාංශයේ TIEP කියලා scheme එකක් තිබෙනවා. ඒකෙන් තමයි දේශීය නිෂ්පාදකයා අපනයනයට යොමු කරන ක්‍රියා පටිපාටිය සිද්ධ වන්නේ. 2025 අවුරුද්දේ නැවත 993ක් register වෙලා තිබෙනවා. එතකොට කිච්චා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ණය දෙන්නේ නැහැ, ඒවා වැඩ කරන්නේ නැහැ කියලා. අපේ අමාත්‍යාංශය යටතේ ව්‍යාපාර 201කට ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් බිලියන 1.3ක් සැප්තැම්බර් වෙද්දි ලබා දීලා තිබෙනවා. තව රුපියල් බිලියන 3ක් ලබා දීම සම්බන්ධව මේ වනකොට වැඩ කෙරෙමින් පවතිනවා. ඒ වාගේම E-Friends loan ක්‍රමය යටතේත් රුපියල් මිලියන 400ක් අපි ආයතන 47කට ලබා දෙනවා. මේකෙන් අපට ඉතාම පැහැදිලිව තර්කානුකූලව කියන්න පුළුවන්, කර්මාන්තකරණය සහ ව්‍යවසායකත්වය සක්‍රියව මේ මහ පොළොවේ ඇති වනවා, මහ පොළොවේ ක්‍රියාත්මක වනවා, ඒකට කර්මාන්ත අමාත්‍යාංශය දැඩිව මැදිහත් වනවා කියලා. මෙන්න මේ කාරණා ඇතුළේ අපේ අමාත්‍යතුමාටත් විවිධ කථා කියමින් විපක්ෂය මේ විවාදය පටන් ගත් නිසා ඔබතුමන්ලාට දශක තුනක් හතරක් තිස්සේ කරගන්න බැරි වුණු, නිශ්චිත වශයෙන් අපි කරපු කරුණු කාරණා 15ක් මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. ඒ කරුණු 15 පදනම් කරගෙන පුළුවන් නම් මේ විවාදය හවස් වෙනකම් අරගෙන යන්න.

ගරු සභාපතිතුමනි, අපි කර්මාන්තකරණයට අවශ්‍ය ආයතන පද්ධතිය හදාගත්තේ මේ අවුරුද්දේ. එතකොට කර්මාන්ත අමාත්‍යාංශයට හමුවෙලා නොතිබුණු අපනයන සංවර්ධන මණ්ඩලය

- EDB, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය - NPS, ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළේ තිබුණු කුඩා කර්මාන්ත සංවර්ධන අංශය - SED, ඒ වාගේම SLIM කියන ආයතන ඒකාබද්ධ කරලා අපි මේ අවුරුද්දේ සමස්ත සංවිධිත ආයතන පද්ධතියක් ගොඩනැඟුවා. ඒ, පළමුවැනි කාරණය.

දෙවන කාරණය මෙයයි. කර්මාන්තකරණයට අවශ්‍ය ඉඩම් නැති ප්‍රශ්නය තමයි අපට විශාල වශයෙන් තිබුණේ. මෙච්චර කාලයක් කරගන්න බැරිවුණු, කර්මාන්තකරණයට ඉඩම් සියයට 1ක් වෙන් කරලා, ඉඩම් ප්‍රමාණය අක්කර 50,000ක් දක්වා ගෙනයන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම අපි කළේ මේ අවුරුද්දේ. එතකොට මේ අවුරුද්දේ විතරක් කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළේ කර්මාන්තපුර 10ක් ඉදිවනවා, ගරු සභාපතිතුමනි. දැන් ඒ කර්මාන්තපුර තුනක වැඩ ඉවරයි. ඒ වාගේම 2026 අවුරුද්ද ආරම්භයේදීම සූරියවැව, රයිගම, අළුතැපොල කියන කර්මාන්තපුර අපට ආරම්භ කරන්න පුළුවන්. ඒ වාගේම අලුත් කර්මාන්ත පටන් ගන්න කර්මාන්ත හිමියන්ට ඉඩම් 50ක් මේ අවුරුද්දේ අපි allocate කරලා තිබෙනවා. ඒ වාගේම කාර්මික සංවර්ධන මණ්ඩලය තව අක්කර 105ක් කර්මාන්තකරණයට මේ අවුරුද්දේ එකතු කරලා තිබෙනවා. මහවැලි අධිකාරිය යටතේ තව අක්කර 5,500ක් කර්මාන්ත අමාත්‍යාංශය යටතට ඇවිත් තිබෙනවා. ඒ වාගේම, කර්මාන්ත පුළුල් කරන්න අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණයට අපි සක්‍රිය දායකත්වයක් ලබා දුන්නා.

තුන්වන කාරණය විධියට අපි මේ කථා කරන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ණය අර්බුදය ගැනයි. ඒකට සෘජුව මැදිහත් වුණා, කර්මාන්ත අමාත්‍යාංශය. මේ වනකොට අමාත්‍යාංශයේ මැදිහත් වීම නිසා මුදල් අමාත්‍යාංශයෙන් ව්‍යවසායකයින්ට කිච්චා, ණය ප්‍රතිව්‍යුහගත කරගන්න එන්න කියලා. ගරු සභාපතිතුමනි, 1,093යි ආවේ. ඒ 1,093න් 200කගේ ණය අපි මේ වනකොට ප්‍රතිව්‍යුහගත කරලා තිබෙනවා. තව 245කට රුපියල් මිලියන 5 ගණනේ අලුත් ණය ක්‍රමයක් යටතේ ණය ලබා දෙන්න අපි මේ මාසය ඇතුළත ක්‍රියාත්මක වනවා.

හතරවැනි කාරණය ගත්තොත්, ලංකාවේ ඵලදායිතාව ඉතාම අඩු බව අපි හැමෝම දන්නවා. ආයතනික ඵලදායිතාව, සම්පත්වල ඵලදායිතාව -මේ සියල්ල- ඉහළ නංවන්න ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය හරහා අපි National Productivity Award එක නැවත අරගෙන ඇවිත් තිබෙනවා. එතකොට පෞද්ගලික, රාජ්‍ය සහ පාසල් කියන මට්ටමින් කර්මාන්ත අංශයේ දැවන්ත වැඩ පිළිවෙළක් අවුරුදු දෙකක් ඇතුළත ක්‍රියාත්මක වනවා. ජාතික ඵලදායිතා Master Plan එක අපි ඊයේ APO එකත් එක්ක ලංකාවට ඉදිරිපත් කළා, ඉදිරි අවුරුදු පහට ලංකාවේ ඵලදායිතාව වැඩි කරන්නේ කොහොමද කියලා. ව්‍යවසායකයින් 1,000කට අපි "4i Project" එක පටන් අරගෙන අවුරුදු තුනක වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වාගේම ඵලදායිතාව ගම් මට්ටමට අරගෙන යන්න ක්‍රියාත්මක වෙනවා.

පස්වැනි කාරණය මෙයයි. අපි කර්මාන්ත අමාත්‍යාංශයේ සේවා විමධ්‍යගත කරලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ කර්මාන්ත සංවර්ධන සහා පිහිටුවා තිබෙනවා. දැන් කර්මාන්තකරුවාට, ව්‍යවසායකයාට කොල්ලුපිටියට එන්න අවශ්‍යතාවක් නැහැ. ඒක ලබන අවුරුද්දේ සිට ඩිජිටල් පද්ධතියකට ඇතුළත් වෙනවා.

හයවැනි කාරණය ගත්තොත්, අපේ සේවකයින්ගේ, රාජ්‍ය නිලධාරින්ගේ කුසලතා නංවන්න පළමුවැනි වතාවට තමයි කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරින් අධ්‍යාපනික කටයුත්තකට යොමු වුණේ. අපේ සංවර්ධන නිලධාරින් relations officersලා විධියට හදන්න, SLIM ආයතනයත් එක්ක එකතු වෙලා අපි රුපියල් මිලියන 300ක දැවැන්ත ආයෝජනයක් කරමින් ඔවුන්ව පුහුණු කරන්න පටන් ගත්තා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම අපේ අධ්‍යක්ෂ මණ්ඩල හා ඉහළ නිලධාරින් එකතු වෙලා අවුරුදු පහක සැලැස්මක් හදලා, දවස් තුනක workshop එකක් කළා. ඒ වාගේ දේවල් මීට කලින් කර්මාන්ත අමාත්‍යාංශයේ සිද්ධ වෙලා තිබුණේ නැහැ.

ඊළඟට, හත්වැනි කාරණය. රාජ්‍ය ව්‍යවසායයන් ඔක්කොම අකර්මණ්‍ය කරලා තිබුණේ. එලෙස අකර්මණ්‍ය කරලා තිබුණු ව්‍යවසායයන්, විශේෂයෙන්ම වහන්න දාලා තිබුණු බීසීසී ආයතනය, සෙරමික් ආයතනය, පරන්තන් කෙමිකල්ස් ආයතනය, National Paper Company Limited හා National Salt Limited ආදී ඔක්කොම ආයතන නැවත ප්‍රකෘති තත්ත්වයට පත් වෙලා, අද වනකොට ලාභදායී විධියට ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඊළඟට, ප්‍රගතියක් ගන්න බැරි වෙලා තිබුණු ලංකා පොස්පේට් සමාගම, Lanka Mineral Sands Limited, කහටගහ පතල අපි නවීකරණය කරලා, රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යන්න දැන් කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම, මෙගොල්ලන් බංකොලොත් කරලා තිබුණු Lanka Sugar Company (Pvt.) Limited එක, ලක්සල වාගේ ආයතන නැවත අපි ගොඩනහා ගෙන යනවා. මේ විධියට රාජ්‍ය-පෞද්ගලික ආයතන එකතු වෙලා, මේවා ගොඩනඟන්න වැඩ පිළිවෙළක් හැදුවේ, 2025දී කර්මාන්ත අමාත්‍යාංශය මහිනුයි.

අටවැනි කාරණය මෙකයි. අපි කර්මාන්තකරුවාට තිබුණු අර්බුදවලට විවිධ ණය ක්‍රම හඳුන්වා දුන්නා. එයින් එකක් තමයි, ඇප රහිත ණය. ඒක මුදල් අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා සාර්ථකව ක්‍රියාත්මක කරනවා. මේ වෙනකොට රුපියල් බිලියන 4කට වඩා ණය ලබා ගෙන, කර්මාන්තකරුවන් 800කට වැඩි ප්‍රමාණයක් ඒකෙන් ප්‍රතිලාභ ලබා තිබෙනවා. ඒ වාගේම මෙහෙම අඩු පොලියට ලබා දෙන ණයක් තිබෙනවා කියලා සමාජය දැන ගත්තේ 2025 වසරේදීයි, ගරු සභාපතිතුමනි. මේ ගැන සමාජය සමස්තයක් විධියට දැනගෙන, බැංකු පද්ධතිය වෙනස් වෙමින්, ආයතනය වෙනස් වෙමින්, මේ ණය පුළුල් කරපු නිසා තමයි අපිට 2026 වර්ෂයට රුපියල් බිලියන 80ක ණය ලැබුණේ.

ඊළඟට, නවවැනි කාරණය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර - SMEs - ගැන මෙතුමන්ලාට කථා කළාට, ඒකට අවශ්‍ය කරන සංවිධිත ආකෘතියක් තිබුණේ නැහැ. තැන් තැන්වල තමයි විවිධ සේවා තිබුණේ. මේවා ඔක්කොම එකතු කරලා, SME framework එක හැදුවේ 2025දී. අපි විතරක් නොවෙයි, ආසියානු සංවර්ධන බැංකුව, World Bank Group එක කියන ඔක්කොම එකතු වෙලා, අපේ ව්‍යවසායකයන් ආරම්භයේ සිට විශාල පරිමාණයේ ව්‍යවසායකයන් බවට පත් වෙනතුරු අවශ්‍ය කරන සියලු සංවිධිත සේවා ලබා දෙන්න රාමුව නිර්මාණය කළේත් 2025 වර්ෂයේදීයි.

දහවැනි කාරණය වශයෙන් මම කියන්නම්, අපේ අපනයන අංශය ගැන. අපේ අපනයන වර්ධනය කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, ගරු සභාපතිතුමනි. අපනයන සංවර්ධනය කිරීම සඳහා අලුත් අපනයන සංවර්ධන සැලැස්ම ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක එකතු වෙලා අපි දැන් හදලා තිබෙනවා. ඒ සැලැස්ම 2026 අවුරුද්දේ සිට ක්‍රියාත්මක වෙනවා. අවුරුදු 25ක් මේගොල්ලන්ට ක්‍රියාත්මක කර ගන්න බැරි වෙලා තිබුණු Export Development Council of Ministers - EDCM - දෙවතාවක් ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් රැස්වෙලා, අර්බුද 22ක් විසඳමින් ඉන්නවා. ඒ වාගේම, gem and jewellery ක්ෂේත්‍රයට අර්බුදයක්ව තිබුණු VAT refund scheme එක අපි දැන් ආරම්භ කර තිබෙනවා. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සාධාරණ වෙළෙඳ නිෂ්පාදන - fair trade - ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුරෝපීය සංගමයේ වෙළෙඳ දූත පිරිසකගේ හමුවක් අපේ අපනයන සංවර්ධන මණ්ඩලයේදී පසුගිය සතියේ ආරම්භ කළා. අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් බිම් මට්ටමට ගිහිල්ලා හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් යටතේම එක් අපනයනකරුවෙකු එකතු කර ගන්නත්, ලංකාවේ නවත්වා දමා තිබුණු "Expo 2026"වලට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදන්නත් අපි 2026 අවුරුද්ද වෙනුවෙන් මුදල් වෙන් කර ගත්තා. මේවා මීට කලින් කරලා තිබුණේ නැහැ, ගරු සභාපතිතුමනි.

11වැනි කාරණය මේකයි. කර්මාන්තකරණයට අවශ්‍ය කරන ප්‍රතිපත්ති නිර්මාණය කර ගන්න මේගොල්ලන්ට බැරි වුණා. අපේ රටට කර්මාන්ත ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඒ ප්‍රතිපත්ති දෙකම අපි සකස් කර අවසන් කළා, ගරු සභාපතිතුමනි. Tariff policy එක drive කළේ කර්මාන්ත අමාත්‍යාංශයෙන්, වෙළෙඳ අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා. Anti-dumping policy එක drive කළේ කර්මාන්ත අමාත්‍යාංශය. ඒ වාගේම, Bills of Exchange (Amendment) Act එකෙන් අපේ කර්මාන්තකරුවන්ට වාසියක් වුණා. ඒ වාගේම තමයි, සාධාරණ වෙළෙඳ පොළක් හදන්න VAT එකේ change එක ඇඟලුම් කර්මාන්තය වෙනුවෙන් ඉෂ්ට කරලා දුන්නා. පොල් අපනයනය, මාළු අපනයනය, spices අපනයන ඇතුළු හැම එකකටම ප්‍රතිපත්තිමය වශයෙන් ඉදිරිපත් වුණේ කර්මාන්ත අමාත්‍යාංශය. වාහන එකලස් කිරීමේ කර්මාන්තයට අවශ්‍ය අලුත් SOP එක හැදුවේ 2025දී. මීට කලින් තිබුණු එක අසාර්ථක ප්‍රතිපත්තියක් බවට පත් වෙලා තිබුණා.

12වැනි කාරණාව මේකයි. විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය isolate වෙලා තිබුණේ; කර්මාන්ත අමාත්‍යාංශය තනිවම වැඩ කළේ. දැන් කර්මාන්ත අමාත්‍යාංශය, Ministry of Agriculture, Livestock, Land and Irrigation, Ministry of Science and Technology, Ministry of Digital Economy, Ministry of Trade, Commerce, Food Security and Co-operative Development, Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, Ministry of Education, Higher Education and Vocational Education සහ Ministry of Defence එකතු වෙලා අපේ ආරක්ෂක අංශයේ නිලධාරීන් ඉදිරි අවුරුදු තුනේ විශ්‍රාම යනකොට ඒගොල්ලන් ව්‍යවසායකත්වයට, කර්මාන්තකරණයට එකතු කර ගන්න අවශ්‍ය දැවැන්ත වැඩ පිළිවෙළක් මේ වනවිට නිර්මාණය කරගෙන යනවා. ඊළඟට, ධීවර අමාත්‍යාංශය සහ Ministry of Public Administration, Provincial Councils and Local Government සමඟ එකතු වෙලා රටේම ඵලදායිතාව නංවන්න මේ වෙලාවේදී මූලිකත්වය ගන්නේත් කර්මාන්ත අමාත්‍යාංශයයි.

ගරු සභාපතිතුමනි, ඊළඟට 13වන කාරණය. කර්මාන්ත අමාත්‍යාංශය ඩිජිටල්කරණයට ලක් වෙන්න පටන් ගන්නේ 2025 වර්ෂයේදී. අපි අමාත්‍යාංශය පැත්තෙන් ගත්තොත්, Industry 5.0 Index එක හදලා ඒක ලබන අවුරුද්දේ launch කරන්න සූදානමින් ඉන්නවා. SME life cycle එක manage කරන්න digital platform එකක් මේ වෙනකොට නිර්මාණය වෙනවා. ඒ වාගේම, කර්මාන්තවල තොරතුරු එකතු කර ගන්න දත්ත පද්ධතිය නිර්මාණය කළේත් 2025 වර්ෂයේදී. කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීමේ පියවරක් ලෙස GovPay නමින් හැඳින්වෙන ගෙවීම් පහසුකමක් හඳුන්වා දී තිබෙනවා. ඒ තුළින් වංචාව, දූෂණයෙන් තොරව ඒ කටයුතු කර ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම, අපේ progress එක අපිට monitor කරන්න internal system එකක් දැන් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම ආයතන ERPවලට මාරු වෙමින් තිබෙනවා.

14වැනි කාරණය ගත්තොත්, institutional consolidation අපි ලබන අවුරුද්දේ කරනවා. ඒ අනුව IDB, NEDA, SED කියන ආයතන තුන ඒකාබද්ධව එක ආයතනයක් වෙනවා. NCC, NDC, ලක්සල, සළුසල එක ආයතනයක් බවට පත් වෙනවා. ඒ වාගේම SLITA එක දැන් university එකක් බවට පත් වෙලා තිබෙනවා. මේවා මේගොල්ලන්ට හිතා ගන්නවත් බැරි කාරණා, ගරු සභාපතිතුමනි. මොකද, මේවා දශක ගණනක් තිස්සේ කර ගන්න බැරි වුණා.

ඊළඟට, 15වැනි කාරණය. අපේ අමාත්‍යාංශයට ඕනෑ කෙනෙක් එන්න. අපට අවුරුදු 5ක සැලැස්මක් තිබෙනවා. ඒ සැලැස්ම පිළිබඳව අපේ අමාත්‍යාංශයේ ඕනෑම නිලධාරියෙකුට පැහැදිලි කරන්න පුළුවන්. අපි හැමෝටම KPIs දීලා තිබෙනවා. ඒ වාගේම performance agreements මුලින්ම ආරම්භ කළේ කර්මාන්ත අමාත්‍යාංශයයි කියන එක මම සතුටින් කියනවා. ගරු සභාපතිතුමනි, මේ කාරණා 15ම මම සඳහන් කළේ මේ නිසායි. ඕනෑම කෙනෙකුට මේ කාරණා ගැන අහන්න පුළුවන්. ඇමතිතුමාට විහිළු කරන්න පුළුවන්; මට විහිළු කරන්න පුළුවන්. නමුත් කර්මාන්ත අමාත්‍යාංශය තුළ මම මේ කිව්ව කාරණා 15 දශක ගණනාවක් තුළ සිද්ධ වෙලා තිබුණේ නැහැ. අපි දත්ත පාවිච්චි කරලා, විද්‍යාත්මකව අපේ රටේ කර්මාන්තකරණය දකුණු කොරියාව, ඉන්දියාව, වියට්නාමය වාගේ තැනකට ගෙනියන්න දැවැන්ත සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ අය වැය තුළදී කථා කළ Trade National Single Window System එක, ආයෝජකයින්ට නේවාසික වීසා ලබා දීම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව පනත - PPP Act එක, ආයෝජන ආරක්ෂණ පනත කියන මේ හතර අපට දැවැන්ත ශක්තියක් බවට පත් වෙනවා.

ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ, සීනි කථාව වැනි පුංචි කථාවකට ලඝු කරලා, මේ අපි කරන කර්මාන්ත පුනරුදය කාටවත් නවත්වන්න දෙන්නේ නැහැ කියන එකයි. කලින් මන්ත්‍රීතුමෙක් මේ කාරණය ගැන කිව්ව නිසා මම ඒ ගැන කියන්නම්. ඔව්, නුගේගොඩ කඩේ දැම්මා තමයි. දවස් 9යි. මේ වෙනකොට විකුණුම් ප්‍රමාණය ලක්ෂ 8 පැනලා තිබෙනවා. සාමාන්‍ය වෙළෙඳ පොළේ අපට ඉඩ නැති වුණාම, අපි කොහොම හරි වෙළෙඳ පොළ ජයග්‍රහණය කරන්න උත්සාහ කරනවා. ඒ නිසා මම කියපු කාරණා 15 පිළිබඳව පුළුවන් නම් අද දවස ඇතුළත ප්‍රතිතර්ක ගොඩනඟන්න කියලා විපක්ෂයට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have eight minutes.

Order, please! the Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.23]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, එතුමා කියපු කරුණු ගැන ප්‍රතිතර්ක ගොඩනහන්න කියලා. අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක දායකත්වයක් ලබා දෙන 1,100,000කට වැඩි ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඉන්නවා. ඒ, ලක්ෂ 45කට රැකියා, ජීවනෝපාය ලබා දෙන කණ්ඩායම. 2022 කාල වකවානුව තුළ මේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත 260,000කට වැඩි ප්‍රමාණයක් වැහිලා තිබෙනවා. අපි අනුමාන කරනවා, පසුගිය අවුරුදු දෙක තුළ තවත් 150,000ක් වැහිලා කියලා. මේ අය වෙනුවෙන් මොකක්ද කළේ? අවස්ථා දෙකකදී දේශපාලන කරුණු කාරණා මත *parate* නීතිය අත්හිටෙව්වා; *parate* වෙන්දේසිය අත්හිටෙව්වා. හැබැයි, ඒ *parate* වෙන්දේසිය අත්හිටුවනවාත් සමඟම තමුන්නාන්සේලා මේ අයගේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන්නට කටයුතු කළාද? ජාත්‍යන්තර මූල්‍ය ආයතන ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන්න කියලා කියනකොට EPF එකේ, ETF එකේ සල්ලිවලට පික්පොකට් ගහලා වැඩ කරන ජනතාවගේ ණය නම් ප්‍රතිව්‍යුහගතකරණය කළා, primary bond dealersලාව බේරලා, බැංකු ක්ෂේත්‍රය බේරලා. මේ, නිර්ධන පන්තියේ ආණ්ඩුව. මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක දායකත්වයක් ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මොකක්ද වුණේ කියන එක මම අහනවා. මම අභියෝග කරනවා, පුළුවන් නම් ඒ අයගේ නියෝජිතයන් ගෙන්වා ඒ අයට යුතුකම් ඉටු වුණාද, ඒ අයට සාධාරණත්වය ඉෂ්ට වුණාද කියලා ප්‍රසිද්ධියේ විවාදයක් පවත්වා අහන්න කියලා.

ප්‍රතිතර්ක ගොඩනහන්නය කිව්වා නේ. ඔන්න ගොඩනැඟුවා. මෙතැනත් තර්ක විතර්ක කරන එක නොවෙයි, අවශ්‍ය. රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ උත්තර. රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ විසඳුම්. මොකක්ද, ඔබතුමන්ලාගේ ජාතික අපනයන ප්‍රතිපත්තිය? මොකක්ද, ජාතික අපනයන ක්‍රමෝපාය? මම මේ කාරණා ගැන වැඩිපුර කියන්නට යන්නේ නැහැ. මොකද, ඒකෙන් අපනයන ක්ෂේත්‍රය අධෛර්යවත් වෙන්න පුළුවන්. හැබැයි, එක්තරා රටක වෙළෙඳ ක්ෂේත්‍රය පිළිබඳව වන වාර්තාවකින් අද අපේ රටේ අපනයන ක්ෂේත්‍රයට තිබෙන බාධා, ගැටලු පිළිබඳව බොහොම පැහැදිලිව විග්‍රහ කර තිබෙනවා. මම ඒවා විග්‍රහ කරන්න යන්නේ නැහැ. මොකද, අපනයන ක්ෂේත්‍රය අධෛර්යවත් කිරීම අපේ අරමුණ නොවෙයි.

විශේෂයෙන්ම අපි ඉල්ලීමක් කරනවා. ව්‍යාපාර කිරීමේ පහසුකම - ease of doing business - තව වර්ධනය වෙන්නට ඕනෑ. ඒ සඳහා රාජ්‍ය මැදිහත්වීම අවශ්‍යයි; facilitation අවශ්‍යයි. ඒ කරුණු කාරණා සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියා මම කාරුණිකව ඉල්ලීමක් කරනවා. ඡන්දෙ කාලයට පෙර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට හොඳට සැලකුවා. *[බාධා කිරීමක්]* No, no. Please raise your point of Order after my speech.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Muhammad Faizal, we will take it up after his speech.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Do not interrupt me, please.

විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, මේ කාරණය. ඡන්දෙ කාලයට පෙර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් එක්ක රැස්වීම් කීයක් තිබ්බාද? කී දාහක් හමු වුණාද? කොච්චර පොරොන්දු වුණාද? අද කෝ, ඒ පොරොන්දු? අද කෝ, ඒ දුන් බලාපොරොත්තු? ඒ අයගේ විශ්වාසය කඩකරලා තිබෙන්නේ. දැන්වත් ප්‍රමාද නැහැ. මේ අයගේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන්නට කටයුතු කරන්න. පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට ආසන්න කාලයේ අග භාගයේ ඔබ වෙන්දේසිය පටන් ගත්තා. මොකද, ජනාධිපතිවරණය ඉවර කර ගත්තා. පාර්ලිමේන්තු මැතිවරණයෙනුත් තුනෙන් දෙකක බලයක් ලබා ගත්තා. ඊට පසුව පටන් ගත්තා, තරගෙට වෙන්දේසිය. සම්පූර්ණ අසාධාරණයක් සිද්ධ වෙන්නේ අපේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට. කරුණාකරලා ඒ අයව සම්බන්ධ කරගෙන ඒ අයට විසඳුමක් ලබා දෙන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා.

සමාජ සවිබලගැන්වීම කියන මාතෘකාවත් අද සාකච්ඡාවට භාජන වෙනවා. අස්වැසුම වැඩසටහනින් අපේ රටේ දුප්පත්කම තුරන් කරන්න පුළුවන් කියලා ඔබ පිළිගන්නවාද? පිළිගන්නේ නැත්නම්, මොකක්ද ඔබගේ විකල්පය? ඔබගේ පක්ෂයේ නියෝජිතයන් මූලිකත්වය ලබා ගත් ප්‍රජා ශක්ති කමිටු හරහා ද, මේ රටේ දුප්පත්කම තුරන් කරන්න යන්නේ? Centre for Poverty Analysis එක කියනවා, අපේ රටේ දුප්පත්කම සියයට 25යි කියලා. තවත් සමහර විශ්ලේෂකයින් කියනවා, අපේ රටේ දුප්පත්කම සියයට 40ත්, 50ත් අතර වෙනවා කියලා. එතකොට මේ අස්වැසුමෙන් පුළුවන්ද, දුප්පත්කම තුරන් කරන්න? දුප්පත්කම තුරන් කරන්නට නිෂ්පාදනය තිබෙන්න ඕනෑ, ඉතිරිකිරීම තිබෙන්නට ඕනෑ, ආයෝජනය තිබෙන්නට ඕනෑ, පරිභෝජනය තිබෙන්නටත් ඕනෑ, අපනයනය තිබෙන්නටත් ඕනෑ. අස්වැසුමේ තිබෙන්නේ පරිභෝජනය විතරයි.

ඒ නිසා කරුණාකරලා, දුප්පත්කම තුරන් කිරීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක වුණු සෑම වැඩසටහනක්ම හොඳින් පරිශීලනය කරලා, ඒවායේ තිබෙන හොඳ ගුණාංග ටික අරගෙන, වැරදි අඩුපාඩුකම් ටික ඉවත් කරලා අලුත් වැඩ පිළිවෙළක් සකස් කරන්න අවශ්‍යයි, අපේ රටේ දුප්පත්කම තුරන් කිරීම සඳහා.

ගරු සභාපතිතුමනි, අද දිනයේ මාතෘකාවට අදාළ නොවුණත් මම මේ කාරණයත් කිව යුතුමයි. සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, අපේ විජිත හේරත් මැතිතුමාට මේ කාරණය දැනුම් දෙන්න කියලා. විදේශ සේවා

නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙච්ච ආයතනයක් තිබෙනවා මහරගම, "රේන්බෝ" කියලා. රුමේනියාවට යවනවාය කියලා එම ආයතනය එක් පුද්ගලයෙකුගෙන් රුපියල් 850,000 සිට රුපියල් 1,850,000 දක්වා අරගෙන තිබෙනවා. මම හිතන විධියට මේ නිසා 500ක විතර පිරිසක් අගතියට පත්වෙලා තිබෙනවා. මේක රුපියල් කෝටි 74ක වංචාවක්. මම අද ගංගොඩවිල උසාවිය ළඟට ගිහිල්ලා ආවේ, අගතියට පත් වෙච්ච ඒ පිරිස හමුවෙලා. නීතිමය වශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ සඳහා යම් පියවර අරගෙන තිබෙනවා. මොකද, හොඳ දෙයක් කළාම අපි ඒ හොඳ දෙයට හොඳයි කියන්න ඕනෑ නේ. හැබැයි, වසර ගණනාවක් පවත්වාගෙන ගිය ඒ වංචා සහගත ආයතනය,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, your allotted time is up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I will take two more minutes, Sir.

වසර ගණනාවක් තිස්සේ ඒ ආයතනය කරගෙන ගිය වංචා සහගත ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඒ අයගේ ලයිසන් එක අත්හිටෙව්වේ, මේ 2025 ජනවාරි මාසයේදී. මෙහි වරද කොතැනද තිබෙන්නේ? විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ -හැමෝම නොවෙයි- නීති අංශයේ නිලධාරින් නඩු වාර ගණනාවකට ගිහිල්ලා නැහැ, ඒ අගතියට පත් වෙච්ච පිරිස වෙනුවෙන්. එක පුද්ගලයෙකුගෙන් රුපියල් 1,800,000ක් අරගෙන තිබෙනවා, රුමේනියා යවනවාය කියලා. Sri Lanka Bureau of Foreign Employmentහි නීති අංශයේ නිලධාරින් ගිහිල්ලා නැහැ, ඒ අගතියට පත් වෙච්ච කණ්ඩායම නියෝජනය කරන්න. අද අපි ඔවුන්ට ලබා දුන්නා, නොමිලේ නීති සහාය. අද දවසට විතරක් නොවෙයි, ඒ නඩු විභාගය අවසන් වෙනකල් අපි එය ලබා දෙනවා, ඒ වංචාවට ලක් වුණු 500ක් දෙනාගේ රුපියල් කෝටි 74 කොහොම හරි බේරලා දෙන්න. සම්පූර්ණ අසාධාරණයක් මේ සිද්ධ වෙලා තිබෙන්නේ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති අංශය මෙහෙම කටයුතු කරන එක වැරදියි. අගතියට පත් වෙච්ච ඒ කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටින්න කියලා මම ඉල්ලා සිටිනවා.

මාතෘකා ගණනාවක් ගැන කථා කරන්න තිබෙන නිසා මට තවත් කාල වේලාව තිබුණා නම් හොඳයි. විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් -MSME- පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ පාරම්පරික කර්මාන්ත ගම්මාන තිබෙනවා. සම්ප්‍රදායානුකූල කර්මාන්ත ගම්මාන තිබෙනවා. ඒවායේ නිෂ්පාදන ජත්‍යන්තර වෙළඳ පොළත් එක්ක සම්බන්ධ කරන්නට යම්කිසි වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරමු. ඒ සඳහා අපෙත් සහයෝගය ලබා දෙන්නම්; උපරිම සහයෝගය ලබා දෙන්නම්. විශේෂයෙන්ම කුඩා පරිමාණයේ පාරම්පරික කර්මාන්ත කරන අය, ඒ සම්ප්‍රදායානුකූල කර්මාන්ත කරන අය, තමන්ගේ නිපුණතාව, දක්ෂතාව හා කුසලතාව උපයෝගී කරගෙන ඒ කරන නිෂ්පාදන ටික විදේශ වෙළෙඳ පොළ කරා ගෙන යන්නට අපි කටයුතු කරන්නට ඕනෑ. එතකොට තමයි අපේ රටට ඩොලර් ආදායම ලැබෙන්නේ.

ඒ වාගේම ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාට මම කියන්න කැමැතියි, නැවත නැවතත් සොයා බලන්න, 2028දී අපට ණය ගෙවීම ආරම්භ කරන්න තිබෙනවා, ඒ සඳහා අපේ ආර්ථික වර්ධන වේගය ප්‍රමාණවත්ද, growth trajectory එක හරිද, අපට ප්‍රමාණවත් ලෙස remittance ලැබෙනවාද, අපට ලැබෙන export earnings ප්‍රමාණවත්ද, අපේ රටට එන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණවත්ද කියලා. මම කෙළින්ම කියන්නම්. මට නම් හැඟෙන ආකාරයට ප්‍රමාණවත් නැහැ. ඒ මොකද, අපි කැමැති නැහැ 2022දී නිර්මාණය වුණු තත්ත්වය 2028දීත් දකින්නට.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. රටට පොඩ්ඩක් කියන්නකෝ IMF ගිවිසුමේ තිබෙන macro-linked bond එක ගැන. ඒක ගැන පොඩ්ඩක් කියන්නකෝ. ඔබතුමා දන්නවාද, කොච්චර උත්තේජක දීලා, කොච්චර පහසුකම් දීලා, කොච්චර සහන දීලා, කෘෂි ක්ෂේත්‍රය, කර්මාන්ත ක්ෂේත්‍රය, සේවා ක්ෂේත්‍රය හා ස්වයං රැකියා ක්ෂේත්‍රය කියන ඒ හැම ක්ෂේත්‍රයම බලගන්වලා මේ රටේ ආර්ථික වර්ධනය ඉහළ යන හැම මොහොතකදීම macro-linked bond එක හරහා අපේ රටට ලැබුණු haircut එක අඩු වනවා කියලා. මේ, පුදුම සූත්‍රයක් නේ. එක පැත්තකින් කියනවා, ආර්ථිකය වර්ධනය කරන්න කියලා. වර්ධනය වන හැම මොහොතකදීම අපේ රටට ලැබෙන ණය කපා හැරීම අඩු වනවා. ඒක නේ අපි විශ්වාස කළේ, මේ වැරදි IMF ගිවිසුම වෙනස් කරයි කියලා. ඔබ ඒක කළේ නැහැ. නිර්ධන පන්තිය නියෝජනය කරන ඔබ අර නව ලිබරල්වාදී ආණ්ඩුව අනුගමනය කළ ගමනේමයි යන්නේ. අඩුම ගණනේ දැන්වත් මේක රටට පැහැදිලි කරන්න. *[බාධා කිරීමක්]* මොකක්ද ඇමතිතුමා?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් ඇහුවා නම් හරි, එතුමාගේ මතය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාගේ මතයත් ඒකම තමයි. භය වෙන්න එපා. එතුමා ඇතුළු අපි ඔක්කෝම IMF එකේ පීටර් බෲවර් මහත්තයාගේ මුහුණටම කිව්වා. අපි තනියම නොවෙයි. කබීර් හෂීම් මන්ත්‍රීතුමා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සහ හිටපු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා ඇතුළු තවත් මන්ත්‍රීවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, කථිකාචාර්යවරු හා මහාචාර්යවරු එය කිව්වා. ඔබතුමන්ලා තමයි වමට සිග්නල් දාලා දකුණට යන්නේ. ඔබතුමන්ලා වමට සිග්නල් දාලා දකුණට යනවා. මේ කරුණු කාරණා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා ඔබතුමන්ලා මේ යන වැරදි මාර්ගය නිවැරදි කරන්නට කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Muhammad Faizal, what is your point of Order?

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
கௌரவ தவிசாளர் அவர்களே, எங்களுக்கு வாக்களித்து இந்த உயரிய சபைக்கு அனுப்பியிருப்பது, இந்த நாட்டுக்கும் மக்களுக்கும் நலவு செய்வதற்கு. அந்த அடிப்படையில் புத்தளம் தொகுதியில் வாழ்கின்ற அனைத்து இன மக்களும் எங்களுக்கு வாக்களித்து புத்தளம் தொகுதிக்கு நலவு செய்வதற்காக அனுப்பியிருக்கிறார்கள். அந்த வகையில், நாங்கள் புத்தளம் வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருமாறு எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்களிடமும் மாண்புமிகு அமைச்சரிடமும் நாங்கள் கேட்டிருக்கின்றோம்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, please come to your point.

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
ஓர் உறுப்பினர் என்னுடைய பெயரைச் சொல்லி இங்கே பேசியிருக்கிறார்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்களும் அமைச்சர் அவர்களும் அதனைச் செய்து தருவதாகச் சொல்லியிருக்கிறார்கள். ஆனால், நாங்கள் voteஇற்காகப் பொய் சொல்வதாக இந்த உயர்ந்த சபையில் அவர் சொல்கிறார். நாங்கள் voteஇற்காகப் பேச இங்கு வரவில்லை; யாரையும் பயமுறுத்தவும் இங்கு வரவில்லை. நாங்கள் வெளியில் கதைத்துக் கொண்டிருந்த நேரம், அவர்தான் எங்களிடம் வந்து "எப்படிக் கொடுத்தேன்?" என்றார். கேட்கப் பட்ட கேள்விகள் சரியாக இருந்தாலும் பொய் சொல்லக் கூடாது. இந்த உயர்ந்த சபையில் உள்ளவர்களை அதிகௌரவப்படுத்திப் பேசுவதற்கும் நாங்கள் இங்கு வரவில்லை; தனிப்பட்ட முறையில் யாரையும் தாக்கிப் பேசுவதற்கும் இங்கு வரவில்லை. அவர் சொன்ன பொய், நாங்கள் voteஇற்காகப் பேசுவதாகச் சொன்னது. நாங்கள் vote கேட்பதற்காகச் சொல்லவில்லை. நாங்கள் எங்களுடைய வைத்தியசாலையைத் தரமுயர்த்தக் கேட்டிருக்கிறோம். சனாதிபதி அவர்களும் அமைச்சர் அவர்களும் அதற்கான உத்தரவாதத்தைத் தந்திருக்கிறார்கள். இந்த வேலையை *இன்ஷா அல்லாஹ்* நாங்கள் செய்வோம்! இதை நாங்கள் உறுதியாகக் கூறிக் கொள்கின்றோம். இங்கு நாங்கள் யாரையும் பயமுறுத்த வரவில்லை; பயமுறுத்துவதற்காக இங்கு வரவேண்டிய தேவையும் இல்லை.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, Hon. Member, I got your point.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna? I can see you on your feet.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am used to speaking in this august Assembly with points. Without a point, I do not speak. Standing Order No. 92(2) අනුවයි point of Order එක ගෙනෙන්නේ. මේ සභාව ඇතුළේ කවුරු හරි මන්ත්‍රීවරයෙකුගේ නම කියලා කථා කරලා තිබුණා නම්, එතුමා ඒ වෙලාවේ සභාවේ හිටියේ නැත්නම් ආපහු ඒ ගැන මෙහිදී මතු කරන්න එතුමා ගිහින් අවසර අරගන්න ඕනෑ, ඔබතුමාගෙන්. ඒ අනුව මෙතුමා ඔබතුමාගෙන් අවසර අරගෙන තිබෙනවාද ඒකට? *[බාධා කිරීමක්]* If we are supposed to work in accordance with the Standing Orders, we must do so. Standing Ordersවලට අනුව කටයුතු කරන්නේ නැතුව එතුමාට නැඟිටලා එතුමාගේ ප්‍රකාශය විනාඩි එකහමාරක් කරන්න පුළුවන් නම්, ඒක හැමෝටම සමාන වෙන්න ඕනෑ. දෙවැනි එක තමයි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Ramanathan Archchuna, he stood up and asked for my permission to raise his issue.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Right.

The second matter is, Parliament (Powers and Privileges) Act එක අනුව, if somebody is harassing or threatening a Member of Parliament within the precincts of Parliament, he should be arrested. Parliament (Powers and Privileges) Act එකේ 27වන වගන්තියේ පැහැදිලිව තිබෙනවා. කවුරු හරි Schedule Part B යටතේ එන offence එකක් කරලා තිබෙනවා නම්, Parliament has no right to make a conclusion on it or inquire into it. Sir, this is a severe threat to my life. So, එතුමාව arrest කරන්න ඕනෑ දැන්. හැබැයි මට විශ්වාසයක් නැහැ ඔබතුමන්ලා arrest කරයි කියලා. අද CID එකේ complaints දාලා වැඩකුත් නැහැ. මොකද, these things should not be investigated here. එතුමා මට කිව්වා, "පුත්තලමේ ආවොත් ඔබතුමාව මරලා දානවා" කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Ramanathan Archchuna, please give ear to what I say. Now, you have raised an issue, which you say is a matter of Privilege.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
It is not a matter of Privilege; it is a direct threat to my life.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
So, you could raise it as a matter of Privilege tomorrow morning.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir. - [Interruption.]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Muhammad Faizal, please be seated.

Now, shall we move on to the next speaker? I call upon the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. Hon. Member, you have 15 minutes.

[மு.ப. 10.40]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ தவிசாளர் அவர்களே!

இன்றையை விவாதத்திலே நான் கிராம அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு தொடர்பான ஒரு சில கருத்துகளை இங்கு தெரிவிக்க விரும்புகின்றேன். இந்த நாட்டின் மொத்தச் சனத்தொகையில் 80 சதவீதமானவர்கள் கிராமப்புறத்திலே வசிப்பவர்கள். ஆகவே, இந்தக் கிராமிய அபிவிருத்தி என்பது, ஒட்டுமொத்த நாட்டினுடைய அபிவிருத்தியாக அமையும். இலங்கையில் பெரும்பாலும் கிராமங்களில் வாழ்வோரின் பிரதான தொழில் விவசாயம், விலங்கு வேளாண்மை மற்றும் மீன்பிடியாகும். அதேபோல, மலையகக் கிராமங்களிலே தேயிலை, இறப்பர், வாசனைத் திரவியங்கள் போன்றவை உற்பத்தி செய்யப் படுகின்றது. இலங்கையின் மொத்தத் தேசிய உற்பத்தியில் விவசாயத் துறையின் பங்களிப்பு 7 அல்லது 8 சதவீதமாகத்தான் காணப்படுகின்றது. ஆனாலும், நாட்டின் மொத்த மனித வலுவை - human resources - இனைப் பார்க்கும்போது, 25 முதல் 30 சதவீதமானவர்கள் விவசாயத்தையே செய்கிறார்கள். ஆகவே, இந்த 30 சதவீதமான மனிதவலு இந்த நாட்டின் GDPஇன் 7 அல்லது 8 சதவீதத்துக்குத்தான் பங்களிப்புச் செய்வதாக இருந்தால், இந்த 30 சதவீத மனித வலுவின்மூலமாக அதிக உற்பத்தித்திறன் கிடைக்கவில்லை என்பதையே இதிலிருந்து நாங்கள் காணக் கூடியதாக இருக்கிறது. ஆகவே, கிராமங்களில் வாழுகின்ற உழைக்கும் வர்க்கத்தினரைத் தேசிய பொருளாதாரத்தின் பங்காளர்களாக இணைத்துக்கொள்வது நாட்டின் பொருளாதார அபிவிருத்திக்கு மிகவும் அவசியமானதாகும்.

கிராமிய அபிவிருத்தி என்பது அனைத்துத் துறைகளிலும் மக்களின் தேவைகளைப் பூர்த்தி செய்யக்கூடிய வகையிலான நிலையான அபிவிருத்தியாக இருக்க வேண்டும். கிராமிய வறுமையை ஒழிக்க வேண்டுமாகவிருந்தால், உற்பத்தியில் ஈடுபடக்கூடியவாறு மக்களுக்கான வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும். உச்சமான பயன்பாட்டுக்காகக் காணிகளை விடுவிக்க வேண்டும். இன்று எங்களுடைய பிரதேசங்களிலே உள்ள காணிகள் வெவ்வேறு அரச திணைக்களங்களினாலும் முப்படையினராலும் ஆக்கிரமிக்கப் பட்டு, உற்பத்திப் பொருளாதாரத்திற்குப் பங்களிக்க முடியாத நிலையில் காணப்படுகின்றது. ஆகவே, இந்தக் காணிகளை நாட்டினுடைய முன்னேற்றத்திற்காக உடனடியாக விடுவிக்க வேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்திற்கு இருக்கின்றது. அதேபோல, சொந்தக் காணி இல்லாத பெருந்தொகையான மக்கள் எங்களுடைய பிரதேசங்களிலே வாழ்கிறார்கள். ஆகவே, காணியற்ற மக்களுக்குக் காணி ஒதுக்கீடு என்பது இந்த நாட்டினுடைய பொருளாதார அபிவிருத்திக்கு மிகவும் முக்கியமான ஒரு விடயமாக இருக்கின்றது.

அதேபோல, எங்களுடைய பிரதேசங்களிலே நீண்ட காலம் சிவில் நிர்வாகம் இல்லாதிருந்த காரணத்தினால் அங்குள்ள மிக அதிக எண்ணிக்கையான குளங்கள் பாவிக்கப் படாமல் கைவிடப்பட்டிருக்கின்றன. அந்த நீர்ப்பாசனக் குளங்களைப் புனரமைத்து, இந்த நாட்டினுடைய உற்பத்திப் பொருளாதாரத்திற்கு அந்த மக்கள் பங்களிப்புச் செய்யக்கூடிய விதத்திலான நடவடிக்கைகளை இந்த அரசாங்கம் எடுக்க வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன்.

2026ஆம் ஆண்டுக்கான பாதீட்டில் கிராமிய அபிவிருத்திக்காகக் குறிப்பிடத்தக்களவு நிதி ஒதுக்கீடு செய்யப் பட்டுள்ளதைக் காணக்கூடியதாக இருக்கின்றது. அந்த வகையிலே, கிராமிய அபிவிருத்தியின் பிரதான பங்குதாரராக உள்ளூராட்சி மன்றங்கள் இருப்பதனால், ஒதுக்கீடுகளை அரசியல் பேதமின்றி அனைத்து உள்ளூராட்சி மன்றங் களுக்கும் வழங்குவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் கேட்டுக் கொள்கின்றேன்.

சமூகத்தில் நலிவடைந்த பிரிவினருக்கான விசேட செயற் றிட்டங்களை நடைமுறைப்படுத்துவதில் நலனோம்புகைச் சேவை முக்கிய பங்காற்றுகின்றது. குறிப்பாக, சிரேஷ்ட பிரஜைகள், - disabled persons - இயலாமையுடையவர்கள், நாட்பட்ட நோயால் அவதியுறும் நோயாளர்கள், பெண் தலைமைத்துவக் குடும்பங்கள், நிறுவனப் பராமரிப்பில் வாழ்வோர், குறைந்த வருமானம் பெறுவோர் போன்ற பலதரப்பட்டவர்கள் இந்தப் பிரிவில் இருக்கின்றார்கள். எங்களுடைய பிரதேசங்களிலே, குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே மிக அதிக எண்ணிக்கையான பெண் தலைமைத்துவக் குடும்பங்கள் இருப்பது இந்த நாட்டிலே இருக்கின்ற அனைவருக்கும் தெரியும். அவர்கள் விசேடமானவர்களாகக் கணிக்கப்பட வேண்டிய தேவை இருக்கின்றது.

சமூகப் பாதுகாப்புக்காக 2026ஆம் ஆண்டு பாதீட்டில் 387 பில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அண்மைக்காலத் தரவுகளின்படி, இந்த நாட்டினுடைய மொத்த சனத்தொகையில் 7 சதவீதமானவர்கள் இயலாமையுடை யவர்களாக - disability உடையவர்களாக - இருப்பது கண்டறிப்பட்டுள்ளது. அதிலும் விசேடமாக, 3 தசாப்த கால யுத்தத்தால் நேரடியாகப் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மாகாணங்களில் மிகவும் அதிக எண்ணிக்கையான இயலாமையுடையவர்கள் வாழ்ந்துவருவது எல்லோருக்கும் தெரிந்த விடயம். வடக்கு மாகாண சுகாதார அமைச்சராக நான் கடமையாற்றிய காலத்திலே எங்களுடைய மாகாணத்திலே ஆய்வுகளை மேற்கொண்டு, இயலாமையுடையவர்களுக்கு விசேட திட்டங்களை ஏற்பாடு செய்திருந்தோம். அவர்களுக் கான மலசலகூடம் மிகவும் முக்கியமான அடிப்படைத் தேவை. அந்த வகையில், விசேட மலசலகூடங்களை அமைத்துக் கொடுத்திருந்தோம். முள்ளந்தண்டுவடம் பாதிக்கப்பட்டுப் படுக்கையிலே இருக்கின்ற நோயாளர்களின் வீடுகளுக்குச் சென்று அவர்களது சுகாதார வசதிகளை மேம்படுத்துவதற்கான நடமாடும் சேவைகளைச் செய்திருந்தோம். அவர்களுக்கான மாதாந்தக் கொடுப்பனவை முதன்முதலாக எங்களுடைய மாகாணத்திலே ஆரம்பித்திருந்தோம். அதுபோல், 600 கோடி

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා]

ரூபாய் செலவிலே முல்லைத்தீவு மாவட்டத்தின் மாங்குளத்திலே அமைக்கப்பட்ட ஒரு புனர்வாழ்வு வைத்தியசாலை தற்போது பல குறைபாடுகளுடன் இயங்கிக் கொண்டிருக்கின்றது. ஆனால், அவர்களுக்கு மேலும் பல தேவைகள் உள்ளதென்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆகவே, நாட்டின் ஏனைய பகுதிகளுக்கு ஒதுக்கப்படுகின்ற நிதிக்கு மேலதிகமாக வடக்கு, கிழக்கு ஆகிய இரண்டு மாகாணங்களுக்கும் நலனோம்புகைத் திட்டங்களுக்காக ஒதுக்கப்பட வேண்டிய தேவை இருக்கின்றது என்பதையும் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகிறேன்.

அண்மையில், தோழர் சுகத் வசந்த த சில்வா அவர்களும் நானும் எங்களுடைய Parliamentary Caucus for Persons with Disabilities ஊடாக முல்லைத்தீவு, கிளிநொச்சி மாவட்டங்களில் உள்ள விசேட தேவையுடைய - disability - ஆட்களுக்காகப் பணிபுரிகின்ற அரச, அரச சார்பற்ற அமைப்புக்களை அழைத்து ஒரு கலந்துரையாடலை மேற்கொண்டிருந்தோம். அந்தக் கலந்துரையாடலிலே பல கோரிக்கைகள் அவர்கள் சார்பிலே முன்வைக்கப்பட்டன. இயலாமை உடையவர்களுக்கான கல்வி வசதி ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும் ஏற்படுத்தப்பட வேண்டுமென்று அவர்களால் கோரிக்கை விடுக்கப்பட்டது; அதில் உண்மை இருக்கின்றது. ஏனென்றால், எங்களுடைய பிரதேசங்களிலே பொதுப் போக்குவரத்து மிகவும் மோசமாக இருப்பதன் காரணமாக இயலாமையுடைய மாணவர்கள் பல கிலோமீற்றர் தூரத்துக்குச் சென்று கல்வி கற்பதற்கு முடியாமல் இருக்கின்றது. அந்த வகையிலே, விசேட தேவைக்குட்பட்டவர்களுக்கான கல்வி வசதி ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும் ஏற்படுத்தப்படுமானால், அவர்கள் கூடிய பயனைப் பெற்றுக் கொள்வார்கள்.

அடுத்து, பொதுப் போக்குவரத்தின்போது இயலாமையுடையவர்களுக்காகச் சட்ட ரீதியாக ஆசன ஒதுக்கீடு செய்யப்பட வேண்டுமென்று நான் இந்தச் சபையிலே கேட்டுக் கொள்கிறேன். இயலாமையுடையவர்கள் பொதுப் போக்குவரத்து வாகனங்களில் செல்லும்போது அவர்களுக்கு இடமளிக்கின்ற மனநிலை மக்கள் மத்தியில் குறைவாகவே காணப்படுகிறது. ஆகவே, இந்த ஏற்பாட்டைக் கட்டாயம் செய்ய வேண்டும். அதேபோல, படுக்கையில் இருக்கின்ற நோயாளர்களுக்கான நடமாடும் சேவை தொடரப்பட வேண்டுமென்பதையும் நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன். அவ்வாறே இயலாமையுடையவர்களுக்கான வீட்டு வசதியும் மிகவும் முக்கியமானது. அவர்களுக்கு வீட்டு வசதியைச் செய்யும்போது, அங்கு அவர்களின் வாழ்க்கையை இலகுபடுத்தக்கூடிய வகையில் விசேட ஏற்பாடுகள் செய்யப்பட வேண்டும். அவ்வாறு விசேட ஏற்பாடுகளைச் செய்வதற்கு, அரசாங்கத்தால் ஏனையவர்களுக்கான வீட்டுத் திட்டத்துக்கு ஒதுக்கப்படுகின்ற அதேயளவான நிதி போதாமலிருக்கின்றது. ஆகவே, இப்போதைய காலத்துக்கு ஏற்றவகையில் குறைந்தபட்சம் இருபது இலட்சம் - இரண்டு மில்லியன் - ரூபாயாவது இயலாமையுடையவர்களின் வீட்டுத் திட்டத்துக்காக ஒதுக்கப்பட வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, அவர்களின் வாழ்வாதாரம் தொடர்பான விடயத்தில், அரச வேலைவாய்ப்புகள் மற்றும் சுய உற்பத்தியில் ஈடுபடுபவதற்கான கடன் வசதிகளை வழங்க வேண்டும். கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இப்போது வட்டி குறைந்த கடன் தொடர்பாகப் பல விடயங்களைச் சொல்லியிருந்தார்; நல்ல விஷயம். ஆனால், அதனால் பயன்பெறுபவர்களின் எண்ணிக்கை மிகவும் குறைவான தாகவே இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஏனென்று சொன்னால், சுய உற்பத்தியில் ஈடுபடுகின்ற இவ்வாறானவர்களுக்குக் குறைந்த வட்டியுடனான கடன் வசதிகளைச் செய்யும்போது, வங்கிகள் பல conditions முன்வைக்கின்றன. அந்தக் conditions எல்லாவற்றையும் பூர்த்திசெய்து கடன்பெறுவது அவர்களால் முடியாத காரியமாக இருக்கிறது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, தயவுசெய்து இந்தக் கடன்களை இலகு கடன்களாக அவர்கள் பெறக்கூடிய வகையிலே நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென்ற முன்மொழிவை நான் உங்களுக்குச் சமர்ப்பிக்கிறேன்.

அதேபோல, 'அஸ்வெசும' திட்டத்தில் இயலாமை யுடையோருக்கான கொடுப்பனவுகளை வழங்குவதில் பாரிய குறைபாடு ஒன்று இருக்கின்றது. 'அஸ்வெசும' கொடுப்பனவுக்கான பயனாளிகளைத் தெரிவுசெய்யும்போது, அந்த அதிகாரிகள் அவர்களுடைய வீட்டின் electricity billஇல் உள்ள தொகையைப் பார்க்கின்றார்கள். அதில் பெரியளவு தொகை இருந்தால், இவ்வளவு பெரியளவான தொகையைச் செலுத்தக்கூடியதாக நீங்கள் மின்சாரத்தைப் பயன்படுத்த முடியும் என்றால், உங்களுக்கு 'அஸ்வெசும' கொடுப்பனவு தேவையில்லை என்ற ஒரு கருத்து அங்கு முன்வைக்கப் படுகின்றது. கௌரவ தவிசாளர் அவர்களே, இந்த இயலாமை உடையவர்கள் தங்களுடைய அன்றாடத் தேவைகளைப் பூர்த்திசெய்வதற்குப் பல மின் உபகரணங்களைப் பாவிக்க வேண்டிய தேவை இருக்கிறது. படுக்கையில் உள்ளவர்களுக்கு எந்த நேரமும் fan தேவையாக இருக்கிறது. இவ்வாறு பல மின் உபகரணங்களைப் பாவிக்கின்றபோது obviously அவர்களுடைய electricity bill பெரியளவான தொகையாகவே வரும். எனவே, அவர்களுடைய electricity bill அதிகளவான தொகையாக இருக்கின்றது என்று சொல்லி 'அஸ்வெசும' கொடுப்பனவை நிறுத்துவதாக இருந்தால், அது உண்மையாக அவர்களுக்குச் செய்கின்ற ஓர் அநியாயமாக இருக்கும். ஆனபடியால், தயவுசெய்து இந்த விஷயத்தை நீங்கள் அந்த fieldஇல் வேலை செய்பவர்களுக்கு அறிவுறுத்த வேண்டும். Electricity billஐ மாத்திரம் வைத்து ஒருவர் 'அஸ்வெசும' பயனாளியாக இருக்க முடியுமா, இல்லையா? என்பதைத் தீர்மானிப்பதை நிறுத்த வேண்டும் என்று நான் இந்தச் சந்தர்ப்பத்திலே உங்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, நிறுவனப் பராமரிப்பில் வாழ்ந்து, - அது children's homeஆக இருக்கலாம் அல்லது விசேட schoolsஆக இருக்கலாம் - அங்கேயிருந்து 18 வயதின் பின் வெளியிலே வந்து சுயமாக வாழவேண்டிய சூழல் வரும்போது, அவர்களுக்குத் தொழில் வாய்ப்போ, தங்குமிட வசதியோ, காணியோ இல்லாத நிலை காணப்படுகின்றது. இந்தச் சமூகத்தில் வாழ்வதற்கான அடிப்படை வசதிகள் அவர்களுக்கு இல்லை. அவர்களுக்கான ஒரு காணி வேண்டும்; தங்குமிட வசதி வழங்கப்பட வேண்டும்; தொழில்முயற்சிக்குப் பயிற்சியும் பணமும் தேவை. கௌரவ அமைச்சர் அவர்கள் இதில் கூடிய கவனம் செலுத்துவீர்கள் என்று நான் நம்புகிறேன்.

அதேபோல, என்னுடைய ஒரு வேண்டுகோளை இங்கு முன்வைக்கிறேன். இம்முறை முல்லைத்தீவு மாவட்டத்திலே இருந்து வாய் பேச முடியாத, விசேட தேவைக்குட்பட்ட ஒரு மாணவன் முதன்முதலாகப் பல்கலைக்கழகத்துக்குத் தெரிவுசெய்யப்பட்டிருக்கிறார். அந்த மாணவன் தனது சுய முயற்சியினூடாகப் படித்துப் பல்கலைக்கழகத்துக்குத் தெரிவு செய்யப்பட்டிருக்கிறார். ஆனால், எங்களுடைய நாட்டிலே

இவ்வாறான விசேட தேவை உள்ளவர்கள் படிப்பதற்கான வசதிகள் இல்லை. ஆனால், இந்தியாவிலே இந்த மாணவன் படிப்பதற்கான வசதிகள் இருக்கிறபடியால், சில நலன்விரும்பிகள் சேர்ந்து இம்மாணவனை இந்தியாவுக்கு அனுப்பி வைத்திருக்கிறார்கள். ஆனால், அந்த மாணவனின் ஏழ்மை நிலையிலுள்ள பெற்றோர் அம்மாணவன் அங்கு படிப்பதற்கான பணத்தை அனுப்புவதில் பாரிய இடர்பாடுகளுக்கு முகங்கொடுக்கின்றார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்திய அரசாங்கத்தோடு பேசி அந்த மாணவனுக்கு ஒரு புலமைப்பரிசில் வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்று தயவாகக் கேட்டுக் கொள்கிறேன். இது single, individualஇன் பிரச்சினையல்ல! இந்த நாட்டில் முதன்முதலாக அப்படியான ஒரு மாணவர் பல்கலைக் கழகத்திற்குத் தெரிவுசெய்யப்பட்டு இருக்கிறார். இங்குள்ள பல்கலைக்கழகத்தில் படிப்பதற்கு வசதியில்லாதபடியினால், இந்தியாவுக்குப் போயிருக்கின்றார். ஆனபடியால் தயவுசெய்து, நீங்கள் இந்த விடயத்தைக் கவனத்தில் எடுக்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கிறேன்.

அடுத்து, கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு தொடர்பாகச் சில விடயங்களை இங்கே குறிப்பிட விரும்புகிறேன். நாடு நிலைபேறான பொருளாதார அபிவிருத்தி அடைந்து, சமூகத்தில் காணப்படும் பாரிய ஏற்றத்தாழ்வுகள் நீக்கப்பட வேண்டுமானால், பொருத்தமான முதலீட்டாளர்களை எங்களுடைய நாட்டுக்குள் கொண்டுவந்து, எமது நாடு உற்பத்திப் பொருளாதாரம் சார்ந்த, உற்பத்திப் பொருளாதாரத்தில் தன்னிறைவடைந்த நாடாக மாறி, இறக்குமதிகள் குறைந்து, இங்கிருந்து ஏற்றுமதியைச் செய்யக்கூடிய வகையில் எமது பொருளாதாரக் கட்டமைப்பு அமைக்கப்பட வேண்டும். அவ்வாறான பொருளாதாரக் கட்டமைப்பு அமைய வேண்டுமாக இருந்தால், உற்பத்தியை நோக்கிச் செல்லவேண்டிய தொழிற்பயிற்சி என்பது மிகவும் முக்கியமானது. ஆனால், எங்களுடைய பிரதேசத்திலே, அதாவது, வடக்கு, கிழக்கு மாகாணங்களிலே தொழிற் பயிற்சிக்கான வாய்ப்பு இல்லாத நிலையே காணப்படுகின்றது.

தொழிற்பயிற்சி மையங்களை எங்களுடைய பிரதேசங்களிலே அமைக்காமல், தொழில்வாண்மை - professional - பயிற்சியைப் பெறாதவர்களை வைத்துக் கொண்டு நாங்கள் உற்பத்தியைப் பெருக்க முடியாது. ஆகவே, தொழிற்பயிற்சி மையங்கள் எங்களுடைய பிரதேசங்களில் மிகவும் அவசியமானது. இன்று காலைச் செய்தியில், இலங்கையிலிருந்து ஜப்பானுக்கு அனுப்புவதற்காக 5,000 பேருக்கு மொழிப் பயிற்சி நடைபெற்றுக் கொண்டிருக்கின்றது என்ற விடயத்தை நான் கேட்டேன். எங்களுடைய மாகாணங்களைப் பாருங்கள்! அங்கு வேறு நாட்டு மொழிகளைக் கற்பதற்கான எந்த வசதியும் இல்லை. இங்கு Korean language கற்பதால் கொரியாவுக்கு வேலைக்குப் போகிறார்கள்; Japanese languageஐக் கற்றுவிட்டு ஜப்பானுக்கு வேலைக்குப் போகிறார்கள்; Russian languageஐக் கற்றுவிட்டு ரஷ்யாவுக்கு வேலைக்குப் போகிறார்கள். இதுபோன்று எங்களுடைய பிரதேசங்களிலும் மொழிப் பயிற்சிக்குரிய வசதியைச் செய்து தந்தால், எங்களுடைய இளைஞர், யுவதிகளும் அங்கு சென்று இந்த நாட்டுக்குப் பெருமளவான அந்நியச் செலாவணியைப் பெற்றுத் தரக்கூடிய தொழில் துறைகளிலே ஈடுபடுவார்கள் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்திலே சொல்ல விரும்புகிறேன்.

அடுத்து, தொழில்முயற்சியாளர்களுக்கு ஊக்கமளிக்கும் வகையில் அவர்களுக்கான இலகுகடன் வசதிகளைத் தயவுசெய்து செய்யுங்கள்! அதில் கூடுதலான கவனத்தை எடுங்கள்! முதலீட்டுக்குச் சாதகமான சூழலை ஏற்படுத்துங்கள்! தொழில்முயற்சிகளை மேம்படுத்த உள்நாட்டு, வெளிநாட்டு முதலீட்டாளர்கள் இங்கு வரவேண்டும். அவ்வாறு முதலீட் டாளர்கள் இங்கு வரவேண்டுமென்றால், நாங்கள் முதலீட்டு வலயங்களை உருவாக்க வேண்டும். இந்த நாட்டுக்கு வந்து முதலீடு செய்பவர்களின் உற்பத்திச் செலவைக் குறைத்தால் தான் அவர்கள் சந்தையிலே போட்டி போடக்கூடியதாக இருக்கும். ஆகவே, உற்பத்திச் செலவைக் குறைக்க வேண்டுமாக இருந்தால், போக்குவரத்து வசதி, விமான நிலைய வசதி, துறைமுக வசதி என்பன மிகவும் முக்கியமானது.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அந்த வகையில், எமது பகுதியிலுள்ள பலாலி விமான நிலையம் அபிவிருத்தி செய்யப்பட வேண்டும்; காங்கேசன் துறைத் துறைமுகம் அபிவிருத்தி செய்யப்பட வேண்டும்; தலைமன்னார் துறைமுகம் அபிவிருத்தி செய்யப்பட வேண்டும். இந்தியா இலங்கைக்கு கிட்டத்தட்ட 20,000 மில்லியன் இலங்கை ரூபாயைத் தானமாகத் தருவதற்கு ஆயத்தமாக இருக்கின்றது. தயவுசெய்து, அந்த நிதியைப் பயன்படுத்தி எங்களுடைய காங்கேசன்துறைத் துறைமுகத்தை அபிவிருத்தி செய்யுங்களென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Upali Pannilage. You have 20 minutes.

[පූ.භා. 10.56]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම, ස්ථාවර කරනු ලැබූ රටක සංවර්ධන ඉලක්ක සහිතව 2026 වර්ෂය සඳහා ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විධියට විශේෂයෙන්ම මේ රටේ මහජනතාවගේ මුදල් භාවිත කරමින් පසුගිය වසරක කාලයක් පුරා අප විසින් ඉටු කරනු ලැබූ කාර්යභාරයන් පිළිබඳවත්, ඒ වාගේම 2026 වර්ෂයේදී අප සැලසුම් කර තිබෙන කාර්යයන් පිළිබඳවත් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට මේ අවස්ථාව මා යොදා ගන්නවා. විශේෂයෙන්ම මගේ කථාවට ප්‍රථමයෙන් අදහස් දැක්වූ ගරු වෛද්‍ය සත්‍යලිංගම් මන්ත්‍රීතුමාට පසුව මට කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳවත් මම සතුටු වෙනවා. එතුමා අපේ අමාත්‍යාංශය සම්බන්ධයෙන්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ඉදිරිපත් කරපු සියලු කරුණු ඉතාම සාධනීයයි. ඒ කරුණු සම්බන්ධව අපි මේ වෙනකොටත් කටයුතු කරමින් ඉන්නවා. අද ඉදිරිපත් කරපු කරුණු අපි තවදුරටත් අපේ වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා භාවිත කරන බවත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් ආවරණය කරනවා. මේ ක්ෂේත්‍ර තුන සම්බන්ධව ප්‍රධාන වශයෙන් අපේ ආයතන 10ක් යටතේ අපි කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම ග්‍රාම සංවර්ධනය සම්බන්ධයෙන් ග්‍රාම සංවර්ධන කාර්යාංශයක් 2025 වසරේ අපි ආරම්භ කළා. ඒ වාගේම, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයක් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා. ඒ වාගේම, ලෝක ආහාර වැඩසටහනේ සහයෝගිතා ලේකම් කාර්යාලයත්, ග්‍රාම සංවර්ධනය වෙනුවෙන් අපි විශේෂයෙන් මෙහෙයවමින්, වැඩකටයුතු කරමින් ඉන්නවා. අනෙක් පැත්තෙන්, සමාජ ආරක්ෂණය සඳහා අපි විශේෂයෙන්ම කල්පනා කරන දෙයක් තිබෙනවා. අපට අවශ්‍ය වන්නේ අන්තර්කරණීය සමාජයක් - inclusive society එකක්. මෙන්න මේ අන්තර්කරණීය සමාජයක අවශ්‍යතාව සපුරා ගැනීම වෙනුවෙන් අපි සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ජාතික සමාජ සංවර්ධන ආයතනය වැනි ආයතන අපි මෙන්න මේ අන්තර්කරණීය සමාජයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය දෙසට යොමු කරමින් තිබෙනවා.

විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ වන වැඩකටයුතු ගැන සාකච්ඡා කරනකොට, පසුගිය වසර ගණනාවක් තිස්සේ මේ රටේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ආරම්භ කර ක්‍රියාත්මක කරමින් තිබුණු, ඒ සඳහා ප්‍රධාන වැඩ කොටසක් ඉටු කරපු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඉතාම වැදගත් වෙනවා, ගරු සභාපතිතුමනි. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අපෙන් ඇහුවා, දිළිඳුකම තුරන් කිරීම සඳහා අපේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා. ගරු සභාපතිතුමනි, දිළිඳුකම තුරන් කිරීම සඳහා අපේ වැඩ පිළිවෙළ එක් ආයතනයකට, එක් අමාත්‍යාංශයකට පමණක් සීමා වන්නේ නැහැ. අපෙන් ඇහුවා වාගේ අපි ආධාර දීලා පමණක් දිළිඳුකම තුරන් කිරීමට අපේක්ෂා කරන්නේ නැහැ.

නමුත්, ආධාර ලැබිය යුතු පිරිසට ආධාර ලබා දෙමින්, සවිබලගැන්විය යුතු අය සවිබලගන්වමින්, නිෂ්පාදන ක්‍රියාවලියට දායක කළ හැකි අයගේ දායකත්වය ලබා ගනිමින් අපි ඉතාම පුළුල් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යටතේ තමයි දිළිඳුකම තුරන් කිරීම සඳහා කටයුතු කරමින් ඉන්නේ. ඒ අනුව අපේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මේ වන විට සම්පූර්ණයෙන්ම ප්‍රජා සවිබලගැන්වීම දෙසට වෙන් කරලා තිබෙනවා. පසුගිය වසර තුළ අපි ප්‍රධාන වශයෙන්ම ආකාර කිහිපයකින් ප්‍රජාව සවිබලගැන්වීම සඳහා මේ වැඩසටහන දියත් කරනු ලැබුවා. විශේෂයෙන්ම අපි කල්පනා කරනවා පුද්ගලයින් හෝ පවුල් ආර්ථික වශයෙන් සවිබලගැන්විය යුතුයි කියලා. නමුත්, ඔවුන් ආර්ථික වශයෙන් පමණක් සවිබලගන්වා අපි සමාජයේ අපේක්ෂා කරන ඒ අපේක්ෂිත තත්ත්වයන් ළඟා කර ගැනීමට අපහසුයි, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි ඔවුන් ආර්ථික වශයෙන් සවිබලගන්වනවා වාගේම මානුෂීය වශයෙනුත්, අනෙකුත් මූල්‍යමය සාක්ෂරතා වශයෙනුත්, සමාජ ආරක්ෂණයත් ලබා දෙමින් ඔවුන් සවිබලගැන්වීමේ වැඩසටහනක් පසුගිය වර්ෂය තුළ ආරම්භ කරලා මේ වෙනකොට එය ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

මේ ප්‍රජා සවිබලගැන්වීමේ ක්‍රියාවලිය යටතේ අපේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව; සමෘද්ධි සංවර්ධන නිලධාරින් පසුගිය වසරක කාලය තුළ අඩු ආදායම්ලාභී පවුල් සිටින නිවාසවලට ගිහිල්ලා ඒ අයගේ තොරතුරු අරගෙන පවුල් සංවර්ධන සැලැස්මක් සකස් කර තිබෙනවා. ඒ අනුව, ඔවුන්ගේ පවුලේ ස්වභාවය, ඔවුන්ට තිබෙන සම්පත්, ප්‍රදේශයේ තිබෙන අළෙවිය හා මාර්කට් එක බලලා, ඔවුන්ට ගැළපෙන විධියේ ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් හදලා ඒ සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා අපි කටයුතු කළා. ඒ අනුව අපි මේ 2025 වසර තුළ මේ විධියේ ව්‍යාපාර සැලසුම් හදලා පවුල් 292,000ක් පමණ ආර්ථික වශයෙන් සවිබලගැන්වීමට කටයුතු කළා, ගරු සභාපතිතුමනි. ඒ හරහා ජීවනෝපාය ආධාර ලබා දීමටත්, ඔවුන් ස්වයං රැකියාවලට යොමු කිරීමටත්, ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමටත් අපි ගත වූ වසර තුළ කටයුතු කළා. යම් පවුලක්, යම් පුද්ගලයෙක් සවිබලගැන්වීමේ දී ඒ මානව සම්පත දියුණු කිරීම ඉතා වැදගත්. ඒ නිසා පසුගිය වසර තුළ "Next Sri Lanka" කියලා වැඩසටහනක් ආරම්භ කළා. ඒ වැඩසටහනේ අරමුණ තමයි මේ අඩු ආදායම්ලාභී පවුල්වල, විශේෂයෙන්ම සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාගවලට පෙනී ඉඳලා රැකියාවක් නොමැතිව සිටින අය රැකියාගත කිරීම හරහා ඔවුන්ගේ පවුලේ ආර්ථිකයටත්, සමාජ තත්ත්වයටත් යම් දායකත්වයක් ලබා දීම. ඒ යටතේ මේ වෙනකොට අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් 65,670ක් අපේ වැඩසටහන් සඳහා බද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය ඒ පුහුණුව හා ඒ ඒ ආයතනවලට යොමු කිරීමේ කටයුතු අපි මේ වසරේ දී ආරම්භ කළා. අපි ඒ කටයුතු ඉදිරි වර්ෂයේ දී දිගටම ක්‍රියාත්මක කරනවා. ගරු සභාපතිතුමනි, ඒ අය වෙනුවෙන් හෝටල් ක්ෂේත්‍රය, සත්කාර සේවා ක්ෂේත්‍රය, කාර්මික ක්ෂේත්‍රය, තොරතුරු තාක්ෂණ ආදී ක්ෂේත්‍රයන්හි NVQ Level 3 සහ NVQ Level 4 ප්‍රවීණතාවන් ලබා ගන්න පුළුවන් වෘත්තීය පුහුණුව ලබා දීමේ වැඩසටහනක් අපි මේ වසරේ ආරම්භ කළා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. අපේ රටේ විහිදිච්ච සමෘද්ධි බැංකු 1,097ක් තිබෙනවා. මෙන්න මේ බැංකු පද්ධතිය හරහා අපේ ප්‍රජාව සවිබලගැන්වීම සඳහා අවශ්‍ය කටයුතු පසුගිය වසර පුරා ඉතා සාර්ථකව ඉටු කරනු ලැබුවා. මේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය විනය පිළිබඳව සමාජයේ යම් කතිකාවක් තිබුණා. ඒ නිසා අපි මේ සමෘද්ධි බැංකු සියල්ල 2025 වර්ෂයේ දී රජයේ විගණනයට යටත් කරන විධියට එම පනත සංශෝධනය කරන්න කටයුතු කළා. ඒ වාගේම මූල්‍ය අක්‍රමිකතා හා බැංකු පද්ධතියේ තිබෙන අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා තනි මූල්‍ය පද්ධතියක් මේ වන විට හඳුන්වා දීලා තිබෙනවා. ඒ වැඩකටයුතු අපි කරමින් ඉන්නවා. ඒ හරහා මේ සමාජයේ කතිකාවක් යොමු වෙලා තිබෙනවා. සමෘද්ධි බැංකුවල තිබෙන මූල්‍ය අක්‍රමිකතා අවම කර ගැනීම සඳහාත් අපි පසුගිය වසරක කාලය තුළ කටයුතු කළා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට, ඔවුන්ගේ පවුල්වල දරුවන්ට අවශ්‍ය ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළා. විශේෂයෙන්ම, "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ අපි රුපියල් 1,500ක මුදලක් මසකට ලබා දෙනවා. ඒ හරහා අපි ළමුන් 33,265කට 2025 වර්ෂයේදී ශිෂ්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කළා. ඒ විතරක් නොවෙයි, "සමෘද්ධි නිවාස ආධාර" වැඩසටහන යටතේ

කලින් ලක්ෂ එකහමාරක් ලෙස තිබුණු වැඩසටහන අපි සම්පූර්ණයෙන්ම නිවාස අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා ඒ guidelinesම පාවිච්චි කරලා රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කළා. ඒ අනුව මේ වෙනකොට ලංකාවේ නිවාස 903ක වැඩකටයුතු, සමෘද්ධි නිවාස වැඩසටහන යටතේ ආරම්භ කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයන්ට ප්‍රශ්න ගණනාවක් තිබුණා. විශේෂයෙන්ම ඒ අය විශ්‍රාම ලබා ගැනීමේ දී ප්‍රශ්න තිබුණා. ඒ වාගේම ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලේ අධිභාරයක් වාර්ෂිකව වැල් පොලියට එකතු කිරීම වාගේ කටයුතු සම්බන්ධයෙන් අපි කැබිනට් මණ්ඩලයේදී තීරණයක් අරගෙන තිබුණා. එක් වරකට පමණක් පොලියක් අය කරලා ඒ සම්බන්ධ ප්‍රශ්නය විසඳීම සඳහා අපි කටයුතු කළා. ඒ වාගේම සමෘද්ධි නිලධාරීන්ගේ කාර්යාල දීමනාව ග්‍රාමීය ප්‍රදේශවල රුපියල් 2,000 දක්වාත්, නාගරික ප්‍රදේශවල රුපියල් 3,000ක් දක්වාත් වැඩි කිරීමට අවශ්‍ය කටයුතු කළා.

ගරු සභාපතිතුමනි, මෙම 2026 අය වැය මඟින් සමෘද්ධි දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 27,381ක් වෙන් කරලා තිබෙනවා. මේ වැය අපි සම්පූර්ණයෙන්ම ප්‍රජා සවිබලගැන්වීමේ ක්‍රියාවලිය වෙනුවෙන් යොදවන්නට බලාපොරොත්තු වනවා. ඒ සඳහා අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ ක්‍රියාවලියේදී මා කලින් කිව්ව විධියට පංචවිධ ක්‍රියාමාර්ගවලින් ප්‍රජාව සවිබලගැන්වීමටත්, "Next Sri Lanka" වැඩසටහන ඒ ඔස්සේ ක්‍රියාත්මක කිරීමටත් අපි මේ වනකොට සැලසුම් සකස් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම සමාජ ආරක්ෂණය අපේ සමාජයට ඉතාම වැදගත් වනවා. අපි inclusive, එහෙම නැත්නම් අන්තර්කරණීය සමාජයක් දෙසට යනකොට අපට මේ සමාජයේ සියලු ජන කොටස් දෙස බලන්න වනවා. මම කලින් කිව්වා වාගේ ඒ ජන කොටස් ජනවාර්ගික වශයෙන් වන්න පුළුවන්, ස්ත්‍රී පුරුෂ වශයෙන් වන්න පුළුවන්, ආබාධිත හෝ අනාබාධිත වශයෙන් වන්න පුළුවන්, එහෙම නැත්නම් වැඩිහිටි, තරුණ, ළමා ආදී වශයෙන් වන්න පුළුවන් මේ සියලුදෙනාටම සමාජ ආරක්ෂණයක් ලබා දීමේ වැඩසටහනක් අපි ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් අපි ආරම්භ කළා, දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක්. මෙන්න මේ වැටුප් ක්‍රමය හරහා මේ වනකොට දස ලක්ෂයකට ආසන්න පිරිසක් මේ දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට දායක වෙලා තිබෙනවා. අපි දන්නවා, රජයේ රැකියාවක් කරනවා නම් ඔවුන්ට විශ්‍රාම වැටුපක් තිබෙනවා. පෞද්ගලික අංශයේ රැකියාවක් කරනවා නම් සමහර වෙලාවට පාරිතෝෂික දීමනා තිබෙනවා. නමුත් අවිධිමත් ක්ෂේත්‍රයේ ඉන්න අයට ශ්‍රම බලකායට ඔවුන්ගේ දායකත්වය දක්වන්න නොහැකි කාලයේදී ඔවුන්ට කිසිදු සමාජ ආරක්ෂණයක් ලැබෙන්නේ නැහැ. ඒ සමාජ ආරක්ෂණය ලබා දීම සඳහා අපි මේ වනකොට වැඩ පිළිවෙළක් හදලා ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි.

මම විශේෂයෙන් කියන්න ඕනෑ, අපි ආන්තික ලෙස හඳුන්වන සමහර ආබාධ සහිත පුද්ගලයින් වාගේම වැඩිහිටි පුද්ගලයින් වෙනුවෙනුත්, ගත වූ කාලය තුළ අපි සැලකිය යුතු වැඩ කොටසක් කර තිබෙන බව, ගරු සභාපතිතුමනි. ඒ අතරින් අපට නීතිමය ක්ෂේත්‍රයේ ගැටලු ගණනාවක් තිබුණා, විසඳා ගන්න. 1996දී සම්මත කරන ලද ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත තමයි අපට මේ සම්බන්ධව කටයුතු කරන්න තිබුණේ. අපි මේ පනත සංශෝධනය කරන්න අවශ්‍ය කටයුතු කරලා, මේ වනකොට නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාසනය සඳහා එය යොමු කර තිබෙනවා. ඒ වාගේම තමයි සංඥා භාෂා පිළිබඳ පනත් කෙටුම්පතක් සකස් කරලා එහි වැඩ කටයුතු අවසන් කරලා නීතිපති දෙපාර්තමේන්තුව වෙත එයත් යොමු කර තිබෙනවා. ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වූ ප්‍රවේශ රෙගුලාසි ගැසට් කිරීම සඳහා අවශ්‍ය කටයුතුත් අපි සූදානම් කර තිබෙනවා. ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන් සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ UNDP එක සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් ඉන්නවා. ඒ වැඩ කටයුත්තෙහි සැලකිය යුතු ප්‍රගතියක් මේ වනකොට අපි අත්පත් කරගෙන තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම රිදී ආර්ථිකයේ ආයෝජනය කිරීම සඳහා වැඩිහිටියන් සමාජයේ සක්‍රිය පාර්ශ්වකරුවන් බවට පත් කර ගැනීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කරලා එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රතිපත්ති සහ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වන විධියට වැඩ කටයුතු කරලා මේ වනකොට අපි ඒකට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමින් තිබෙනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම 2011 අංක 5 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කරලා, වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය සංශෝධිත පනත් කෙටුම්පත මේ වනකොට අපි නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාසනය සඳහා යොමු කර තිබෙනවා. ඒවා මේ පාර්ලිමේන්තුවට ඉතා කෙටි කාලයක් තුළ ඉදිරිපත් කර සම්මත කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවත් මේ වෙලාවේ මම සඳහන් කරන්න කැමැතියි. මේ විධියට අපි නීති ක්ෂේත්‍රයට අදාළ අණ පනත්, ප්‍රතිපත්ති සකස් කරන අතර, අනෙක් පැත්තෙන් ආබාධ සහිත පුද්ගලයින්ටත්, වැඩිහිටි අයටත්, සමාජයේ අනෙකුත් ආන්තික කණ්ඩායම්වලටත් අවශ්‍ය සුබසාධන වැඩසටහන් ද මේ වන විට ක්‍රියාත්මක කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි. ඔබතුමාත් දන්නා විධියට, අපේ රජය බලයට පත් වූ විගස ආබාධ සහිත පුද්ගලයෙකු ඉන්න අඩු ආදායම්ලාභී පවුල්වලට මාසිකව ලබා දෙන ආධාරය රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ විතරක් නොවෙයි. ආබාධ සහිත පුද්ගලයෙකු ඉන්න පවුලකට නිවසක් සාදා ගැනීම සඳහා කලින් ලබා දුන් රුපියල් ලක්ෂ 5ක මුදල අපි 2025 වර්ෂයේ ජනවාරි මස සිට රුපියල් ලක්ෂ 7 දක්වා වැඩි කළා. ඊට පස්සේ 2025 අගෝස්තු මාසයේදී එම මුදල රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කරලා, මේ වනකොට පවුල් 269කට එය ලබා දී තිබෙනවා. 2026 වර්ෂයේදී මේ කටයුතු තවදුරටත් පුළුල් ලෙස ඉටු කිරීමට අපි කටයුතු කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන් භාවිත කරන උපකරණ මිලදී ගැනීමට කලින් රජයන් විසින් රුපියල් 20,000ක මුදලක් ලබා දුන්නා. අපි 2025 මැයි මස සිට මේ මුදල රුපියල් 50,000ක් දක්වා වැඩි කරලා පුද්ගලයින් 3,550ක් සඳහා එම ආධාර මුදල් 2025 වර්ෂයේදී ලබා දුන්නා. 2026 වර්ෂයේදී අපි මේ කටයුතු තවදුරටත් පුළුල් කරනවා, ගරු සභාපතිතුමනි. මේ විධියට අපි සුබසාධනය සම්බන්ධයෙනුත් වැඩ කළා.

ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන් රැකියාගත කිරීම සඳහා අපි පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක් එක්ක වැඩ කරනවා. ඒ අනුව යම් පෞද්ගලික අංශයේ ආයතනයක් ආබාධ සහිත පුද්ගලයෙකු රැකියාගත කරනවා නම්, රුපියල් 15,000ක උපරිමයකට යටත්ව සේවකයාගේ වැටුපෙන් සියයට 50ක වැටුප් සහනාධාරයක් මාස 24ක් දක්වා අපි ලබා දෙනවා. ඒ, ආබාධ සහිත පුද්ගලයින් රැකියාගත කිරීම සඳහා පෞද්ගලික අංශය උනන්දු කරවීමට. ඒ අනුව මෙවර අය වැයෙන් - 2026 අය වැයෙන් - මේ සඳහා රුපියල් මිලියන 500ක අමතර මුදලක් ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී වෙන් කළා. ඒ ඔස්සේ අපි ආබාධ සහිත

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

පුද්ගලයන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීමට විශේෂ අවධානයක් යොමු කරනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන් පාසල්වල ඉගෙන ගන්නවා නම්, අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධිත දරුවන් සඳහා අමතරව මාසිකව රුපියල් 5,000ක ශිෂ්‍යත්වයක් ලබා දෙන්න මෙවර අය වැයෙන් යෝජනා කළා. ඒ වාගේම විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන ආබාධ සහිත ශිෂ්‍යයින් දිරි ගැන්වීමේ අරමුණින් අඩු ආදායම්ලාභී පවුල්වල ශිෂ්‍යයින් සඳහාත් රුපියල් 5,000ක මුදලක් ලබා දෙන්න මෙවර අය වැයෙන් යෝජනා කළා. මේ විධියට ආබාධ සහිත පුද්ගලයන්ගේ සුබසාධනය වෙනුවෙන් අපි විශේෂ වැඩසටහන් ගණනාවක් පසුගිය වසරේදී ආරම්භ කළා. මේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් අපි 2026 වසර තුළ කටයුතු කරන බවත් මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම වයස අවුරුදු 60ට වැඩි අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට ශ්‍රවණ උපකරණ, ඇස් කණ්ණාඩි වාගේ දේවල් ලබා දීම සම්බන්ධයෙනුත් අපේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මැදිහත් වෙලා වැඩ කටයුතු කරනවා. ඒ වාගේම වැඩිහිටි පුද්ගලයන්ගේ සමාජ ජීවිතය ගත කිරීම සඳහා වැඩිහිටි සමිතිවලට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහාත්, ඒ සමිති සමාගම් ප්‍රවර්ධනය කිරීම සඳහාත් අපේ අමාත්‍යාංශය වැඩ කටයුතු කරනවා. ඒ සඳහා මේ වනකොටත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන 11ක වැඩ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. 2026 වර්ෂය තුළ දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සමාජශීලී ජීවිතයක් ගත කරන්න අවශ්‍ය දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අපි කටයුතු සැලසුම් කරලා, මේ වනකොටත් ඒ වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ, ආබාධ සහිත පුද්ගලයින් පුහුණු කරන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන එකොළහක් තිබෙනවා. ඒ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන එකොළහේ 2025 වර්ෂයේදී 496දෙනෙක් සඳහා වෘත්තීය අධ්‍යාපනය ලබා දුන්නා. ඒ අයට වෘත්තීය පුහුණුව ලබා දීලා, ඊට පසුව ඔවුන් රැකියාගත කිරීම තමයි අපි සිදු කරන්නේ. අපි මේ වසරේදීත් අපේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා විශේෂයෙන් ආබාධ සහිත පුද්ගලයින් 700කට ආසන්න ප්‍රමාණයකට වෘත්තීය පුහුණුව ලබා දීලා ඔවුන් රැකියාගත කිරීමට කටයුතු කරනවා. මේ සඳහාත් අපි අය වැය යෝජනා මඟින් ලබා දුන් රුපියල් මිලියන 500ක මුදල් භාවිත කිරීමට අපේක්ෂා කරනවා, ගරු සභාපතිතුමනි.

අය වැය යෝජනාවක් මඟින් ඉදිරිපත් වුණු වයස මාස 6ත්, අවුරුදු 18ත් අතර ඔටිසම් ඇතුළු ආබාධ සහිත දරුවන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආදර්ශ කුසලතා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අටක් සකස් කිරීමේ වැඩ කටයුතු අපි 2025 වර්ෂයේදී ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා ආරම්භ කළා. අපි ලබන වර්ෂයේදී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම ආරම්භ කරනවා. ඒ සඳහා අපට අමතර රුපියල් මිලියන 250ක් මෙවර අය වැයේදී ගරු මුදල් ඇමතිතුමා විධියට ජනාධිපතිතුමා විසින් වෙන් කර දීලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. මේ විධියට අපේ සමාජයේ ආන්තික ජන කොටස් විධියට සලකන අයටත් සුබසාධනය සලසන්න කටයුතු කරනවා. අනෙක් පැත්තෙන්, පස් ආකාරයකින් සමාජය සවිබලගැන්වීමේ කටයුතුත් අපි සිදු කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම මා විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ ග්‍රාම සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් නිසි අවබෝධයක් නැතුව පසුගිය කාලයේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු යම් විවේචනයක් ඉදිරිපත් කළා, ගරු සභාපතිතුමනි. අපේ ග්‍රාම සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ තමයි, මේ රටේ ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම. අපේ රටේ දිළිඳු ජනගහනයෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවල. ඒක නිසා ග්‍රාමීය දිළිඳු බව තුරන් කරන්නේ නැතුව අපේ රටේ සංවර්ධනයක් ගැන අපට හිතන්න බැහැ. ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා අපි අනුගමනය කරන වැඩසටහන් ගණනාවක් තිබෙනවා. මම කලින් කියපු අපේ ආයතනත්, විශේෂයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවත් ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලිය, සුබසාධනය අවශ්‍ය අයට එම සුබසාධනය ලබා දීම විතරක් නොවෙයි සිදු කරන්නේ. අපේ අරමුණ ලංකාවේ තිබෙන සෑම ගමක්ම නිෂ්පාදන ගම්මානයක් බවට පරිවර්තනය කිරීමයි. ඒ නිසා අපි ඒකාබද්ධ සහ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් තමයි හඳුන්වා දීලා තිබෙන්නේ. මට තේරෙන්නේ නැහැ, ඒකාබද්ධ සහ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හරියට තේරුම් ගන්නේ නැතුව ක්‍රියා කරන්නේ ඇයි කියලා. මෙතෙක් කල් අපේ රටේ දේශපාලකයෝ වාගේම රාජ්‍ය නිලධාරීන් එකතු වෙලා තමයි මේ රටේ දිස්ත්‍රික් සංවර්ධන කමිටු වාගේම ප්‍රාදේශීය සංවර්ධන කමිටු පිහිටුවා තිබුණේ. ඒ ආකෘතියම ගමට ගෙනිහිල්ලා ගමේ උපාධිධාරියෙකු ලේකම් බවට පත් කරලා, අපි "ප්‍රජා ශක්ති" නමින් ක්‍රියාවලියක් ආරම්භ කරලා තිබෙනවා. අපි අමාත්‍යාංශ නවයකුත්, ජනාධිපති ලේකම් කාර්යාලයත් සම්බන්ධ කරගෙන ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා 2026 වර්ෂය සඳහා අමතර රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ ඔස්සේ ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සම්බන්ධයෙනුත් අපි විශේෂ වැඩසටහනක් ලබන වර්ෂයේදී ක්‍රියාත්මක කරන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Dr.) Dilith Jayaweera. You have 12 minutes. - [Interruption.] Sorry, that was a mistake. The Hon. Dilith Jayaweera.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

The Hon. Chairman has given you a doctorate.

[11.18 a.m.]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

Yes, a doctorate! And, Hon. Chairman, it is nice to see you, after a while, in the Chair. *Assalamu'alaikum!*

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම නව රජයේ දෙවන අය වැය විවාදයේ ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් වැය ශීර්ෂයක් විවාදයට ගන්නා මේ මොහොතේදී මම වැදගත් කරුණු කිහිපයක් කෙටියෙන් මතු කළ යුතුයි. මම දැක්කා, මොහොතකට කලින් ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා. නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්නවා.

මම දිගින් දිගටම සංවාදයට ලක් කළා සේම නැවත වරක් ආණ්ඩුවට යෝජනා කරන්නේ මෙයයි. අපේ රට වෙනුවෙන් කළ

හැකි යම් දෙයක් තිබෙනවා නම් ඒ ලැයිස්තුවේ තිබෙන අංක එක තමයි, මේ රටේ ව්‍යවසායකත්වයන් පිබිදවීම සහ මේ රටේ ජනතාවත්, ඔබත් ව්‍යවසායකත්ව මනසකින් ධනය නිර්මාණය කිරීම පිණිස කටයුතු කිරීමට මෙහෙයවීම.

ගරු සභාපතිතුමනි, ඔබ සියලුදෙනාම දන්නා පරිදි, මෙවර අය වැයේ සඳහන් වන සියලු යෝජනාවල කේන්ද්‍රගත වෙලා තිබෙන්නේම, "අපට ප්‍රශ්නයක් තිබෙනවා, ඒ ප්‍රශ්නය ණය හා බද්ධ වුණු එකක්, ණය ගෙවා ගන්නට තිබෙනවා, ඒ නිසා බදු මඟින් සල්ලි එකතු කරන්නට ඕනෑ, අපි ඒක හොඳට කරලා තිබෙනවා" කියන දෙයයි. මේ අය වැයේ අය පැත්ත ගත්තොත්, ඒ කියන්නේ ධනය නිර්මාණය කිරීම පැත්ත ගත්තොත්, "අපි ධනයක් නිර්මාණය කිරීම සඳහා ගමනක් යනවා"ය කියන ඒ උපාය මාර්ගික ක්‍රියාදාමය කිසිම තැනක සඳහන් වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, එම නිසා මම යෝජනා කරන්නේ මේකයි. We are in a very sad situation. We have to compete with the region and also with the world. Most emerging economies are developing very fast; those are being driven on strategies and the particular nations know what they want. Whereas we are being forced to think on the lines of the IMF, we have to understand that their motive is very different to that of our nation. They want to exploit us, our resources, put pressure on the people of Sri Lanka and collect what they want from us; that has been their agenda right throughout. I am not an anti-IMF person; I am very much open to all the modern tools and to dealing with all those institutions. But, in dealing with them, we have to negotiate with them with strength, not with weakness. Now, the world, especially these institutions, look at us as a very weak player.

ගරු සභාපතිතුමනි, ඒ නිසා තමයි මම කියන්නේ, අපට මේ තත්ත්වය උදා කරලා දීලා තිබෙන්නේ, ඓතිහාසිකව අපෙන් බලාපොරොත්තු වුණු අපේ දේශමාමකත්වය විනාශ කරලා, "රටට ආදරෙයි" කියන එක සම්පූර්ණයෙන්ම විනාශ කරලා, ඒ වෙනුවට රටට එරෙහිව කටයුතු කළ හැකි ආකාරයේ පුද්ගලයින් පිරිසක් බලයට පත් කරලා, දුර්වල පුද්ගලයින් පිරිසක් බලයට ගෙනැල්ලා, ඔවුන් ලවා කර ගන්න ඕනෑ දේවල් ඔක්කෝම කර ගැනීමට කියලා. මේ රටේ අහිංසක මිනිස්සු හරිම පව්. ඓතිහාසිකව වර්ධනය වුණා යැයි කියලා මේගොල්ලන්ම කියන 76 වසරක ශාපයට එරෙහි රජයක් ගේනවා කියලා, අන්තිමට කුමන්ත්‍රණකාරීව රජයක් ගෙනැල්ලා තිබෙනවා, මෙන්න මේ බාහිර අපේක්ෂාවන් හොඳටම ඉෂ්ට කර ගන්න පුළුවන් වන විධියට. මේ අය වැයෙනුත් තහවුරු වෙන්නේ ඒක. වෙන කිසි දෙයක් නැහැ, ගරු සභාපතිතුමනි. මම හිතනවා, මේ රටේ ජනතාව ඔබට අනුකම්පා කරයි කියලා; ඔවුන් ඔබට අනුකම්පා කරයි.

දැන් අපේ ඇමතිතුමා ලස්සනට ඉන්නවා. I must appreciate the fact that you are in suit and tie. But, we should not be slaves; ටයි කෝට් ගැහුවාට අපි මේ බටහිර ආඛ්‍යානයේ වහලුන් නොවිය යුතුයි. අපි ඉස්සරහට යන්නේ කොහොමද කියලා හිතන්නට ඕනෑ, අපේ මව් බිමේ දෘෂ්ටි කෝණයෙන් බලලා. දේශපාලනික වශයෙන්, ආර්ථිකමය වශයෙන් අපට වරදක් වෙලා තිබෙනවා නම් අපි ඒක නිවැරදි කර ගන්නට ඕනෑ. හැබැයි, අපි ඒක නිවැරදි කර ගන්නවා වෙනුවට මුළුමහත් ජාතියම පාවා දෙමින්, මුළුමහත් රටම පාවා දෙමින්, ආර්ථිකමය වශයෙන් ජීවිතේට ගොඩ එන්න බැරි වළකට අපිව ඇදගෙන යනවා නම්, ඒ දිහා බලාගෙන ඉන්නේ මොන හිතකින්ද?

ගරු සභාපතිතුමනි, අපි ඔක්කෝම මහ පොළොවේ හොඳට පය ගහලා ඉන්න අය. මේ යථාර්ථය තේරුම් ගැනීමට කිසිම බාධාවක් ඔවුන්ට නැහැ. හැබැයි, අද ඔවුන් මනසින් නිර්මාණය කරලා තිබෙනවා, මේ බලවේගය විසින් කාලයක් තිස්සේ ඔවුන්ගේ ඔළුවට දමලා තිබෙනවා, මෙන්න මේක තමයි ඔයගොල්ලන්ගේ රාජකාරිය කියලා. ඒගොල්ලන් මේක ආගමක් විධියට විශ්වාස කරනවා. ඒ නිසාම තමයි බොරු කියමින්, රවටමින්, වංචා කරමින්, සමහර වෙලාවට ඒ බොරු ඔවුන්ම විශ්වාස කරමින් මේ රට විනාශය කරා ගෙන යන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනයෙන් මෙතැනට ආපු කෙනෙක් හැටියට, අවංකව සහ හදවතින් මේ රටේ මිනිස්සු වෙනුවෙන් බොහොම ආයාචනාත්මකව ඉල්ලීමක් කරන්න කැමැතියි. අපේ දේශපාලන අරමුණු පැත්තකින් තබන්න. දේශපාලනිකව යමක් ඉටු කර ගන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒවා ඔක්කෝම පැත්තකින් තබලා මම මේ කියන දෙය දිහා අවංකව බලන්න. මේක නොවෙයිද අපට වෙලා තිබෙන්නේ? එහෙම නම් මම යෝජනා කරන්නේ, යම්කිසි මොහොතක හෝ ඔබ නින්දෙන් ඇහැරී ඔබගේ හදවතට එකඟව මේ දෙය කල්පනා කර බලන්න කියායි.

මේ රටේ ධනය නිර්මාණය කිරීම සඳහා ලෝකයත් එක්ක තරගකාරීව හැසිරෙන්නට නම් අපට අත්‍යවශ්‍ය දේවල් තමයි, ව්‍යවසායකත්ව මනස, ව්‍යවසායකත්ව මනසකින් යුතු රාජ්‍යය සහ ව්‍යවසායකත්ව මනසකින් යුතු පිරිසක් කටයුතු කිරීම. ඒකට, මේ ළඟදී ගෙනාපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි එක දර්ශකයක් හැටියට, දිශානතියක් හැටියට ගත්තොත්, එහි නිකම් ව්‍යවසායකත්වය කියලා විෂයයක් නව විෂය නිර්දේශයට දාලා තිබෙනවා. ලොව ව්‍යවසායකත්වය කියන්නේ, ඒකට නොවෙයි. කුඩා දරුවාගේ ඉඳලා, from early childhood, you must create this kind of mindset in kids through education. And as a result, you produce people who create jobs and not people who go behind jobs. That is the thinking of the new world; that is the world we have to deal with and fight with. එහෙම ශ්‍රී ලාංකිකයෙක් අපට හදා ගන්න අවශ්‍ය නම්, අපි ඒ මාර්ගයේ ගෙනියන්න ඕනෑ. ඒකට අපි අවංක වෙන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. අද ඒකට හොඳම උදාහරණය තමයි සංචාරක කර්මාන්තය. ඒ ගැන මෙතුමන්ලා කථා කරනවා.

ව්‍යවසායකත්ව මනසකින් මොහොතක් බලන්න. අද බොහෝ සංචාරකයින්, -විශේෂයෙන්ම දකුණු වෙරළබඩ තීරයේ හා නැඟෙනහිර වෙරළබඩ තීරයේ- ව්‍යවසායකයින් වෙලා තිබෙනවා. ඔවුන්ගේ Telegram groupsවලින් අපට බඩු විකුණනවා. අපට පිටරට බීම විකුණනවා, සිගරට් විකුණනවා. ඒ වාගේම ඔවුන් ඇඟ විකුණනවා. අද, ඔවුන් අපෙන් සල්ලි අරගෙන යන ව්‍යාපාරිකයින් පිරිසක් බවට පත්වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳව මොහොතක්වත් කථා කරලා නැහැ. අපි සංචාරක කර්මාන්තය ගැන නොම්මර කියමින් කථා කළාට, ශ්‍රී ලංකාව කෙතරම් මුදලක් ශුද්ධ වශයෙන් උපයා ගන්නවාද කියලා අපි කථා කරනවාද? Now, tourism being the lowest hanging fruit we could pluck at this moment of time, Sir, do we even discuss how to exploit that opportunity to get the best for this country? Instead, what happens is, those tourists are exploiting our country and they take our money and go away, in fact, creating a loss to the nation. That is really a loss to the nation. I am asking our Minister to please look into that. I can show you thousands of examples of Telegram groups, through which they do businesses and illegally get involved in businesses in this country without paying a single cent on tax . එම නිසා, මගේ ආයාචනාව මෙයයි. අපි මොන විධියේ දේශපාලනයක් කළත්, මොන විධියේ රණ්ඩු කළත්, මොන විධියේ රැලි තිබ්බත්, ඒ රැලිවලට කොච්චර සෙනඟ ගෙනැල්ලා පෙන්නුවත් අපි මේ රටට අවංක නම් අපි අද සාකච්ඡා කළ යුත්තේ විසඳුම ගැනයි.

අපි දරුණු තැනකට, දරුණු අගාධයකට ඇවිල්ලා තිබෙනවා. අපි විවිධ දේවල් ගැන කථා කළාට, අපි ණය ගෙවනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Dilith Jayaweera, you got two additional minutes.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

Thank you, Hon. Chairman. You are being very nice today and I appreciate you.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

You had also been given a doctorate.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

You even promoted me to the position of Doctor.

On that note, I would like to say, let us revisit this whole proposition and our full support will be with you. The day you convince us or we get convinced that your approach is *bona fide,* that your approach is genuine and you are not working for those powers as servants, then we will be with you. Why would we even want to topple your Government, if you are genuinely serving the country with an agenda targeting the country? That is the point I want to make, Sir.

ඒ වාගේම ව්‍යවසායකත්ව මනස ගැන කථා කරද්දී මම මේ කාරණයත් කියන්නට ඕනෑ. ඊයේ මම දැක්කා, මේ රජය, අපේ ජනාධිපතිතුමා තංගල්ලේ ගිහිල්ලා ලොකු රැස්වීමක් පවත්වනවා. එය පවත්වන්නේත් අපේ සංචාරක කර්මාන්තය දියුණු කළ හැකිව තිබෙන දකුණු වෙරළබඩ තීරය ආශ්‍රිතවයි. ඒකේදි කියන්නේ අපේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය මත්ද්‍රව්‍ය ප්‍රශ්නය කියලායි. දැන් මට ඒක දේශපාලනිකව තේරෙනවා. ඒ කියන්නේ ආණ්ඩුවක් දුවන්න නම් මොකක් හරි එහෙම එකක් අල්ලා ගෙන ඒක මත තමයි දුවන්නට ඕනෑ. ලේසියෙන් අල්ලා ගන්න පුළුවන් එකක් දැන් අල්ලා ගෙන තිබෙනවා. ඒක බොහොම දේශපාලනිකයි. ඒක ප්‍රචාරක වැඩක් හැටියට හොඳයි. ඒ කියන්නේ මිනිස්සුන්ට හැමදාම මත්ද්‍රව්‍ය අල්ලා අල්ලා පෙන්වන්න පුළුවන්. හැබැයි, අවසාන ප්‍රතිඵලය මට අද කියන්න පුළුවන්. මේ රටේ මිනිස්සුන්ට ධනය නිර්මාණය කරලා දෙන්නේ නැතිව, මේ රටේ මිනිස්සුන්ගේ ආර්ථිකය වර්ධනය කරලා දෙන්නේ නැතිව, මේ රටේ තාරුණ්‍යයට අපේක්ෂාවක් දෙන්නේ නැතිව, බලාපොරොත්තුවක් දෙන්නේ නැතිව කටයුතු කරනවා නම්; මේ රටේ තරුණ තරුණියන් උදෑසන ඇඳෙන් නැගිට්ටාම ඒගොල්ලන් මේ රටෙන්, අපේ ජාතියෙන් බලාපොරොත්තු වෙන්න ඕනෑ මොකක්ද, තමන්ගේ අපේක්ෂාව විය යුත්තේ මොකක්ද කියලා දන්නේ නැත්නම්; "අපට දියුණු වෙන්නට පුළුවන්, අපට සල්ලි හම්බ කරන්නට පුළුවන්, අපට හොඳ වාහනයක් ගන්නට පුළුවන්, අපට ලස්සන ජීවිතයක් ගත කරන්නට පුළුවන්" කියලා සිහිනයක් ඔවුන්ට නැත්නම් ඔවුන් යන්නේ මේ වාගේ විසඳුම් හොයා ගෙනයි. ඒවා කොහෙන් ගෙනාවාද, කොහොම ගෙනාවාද, අල්ලනවාද කියන එක නොවෙයි ඔවුන් බලන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වාගේ බොරු වැඩ නවත්වන්නට ඕනෑ. අපි කාවද, මේ රවට්ටන්න හදන්නේ? මිනිස්සු අද්දලා, අද්දලා ගෙනැල්ලා රැස්වීමක් තියලා, "ඉවත් වනු" කිව්වාට ඉවත් වෙනවාද? මේක බොරුවක් නේ. මේක බොරුවක්. ඒ වෙනුවට ඔය රැස්වීමම තියලා, දකුණේ තාරුණ්‍යය ගෙනැල්ලා, ජනාධිපතිතුමා ඔවුන් වෙනුවෙන් ඒ වෙලාව වැය කළා නම්, තාරුණ්‍යය අභිප්‍රේරණය කරලා ඔවුන්ට මෙන්න මේ අවස්ථාවන් අපි නිර්මාණය කරලා දෙනවා, අපි මෙන්න මේ සහයෝගය දෙනවා, ඔබට මේ ප්‍රාග්ධනය දෙනවා, මෙන්න මේ ණය පහසුකම් අපි ඔබට දෙනවා, ඔබට පුහුණුව දෙනවා, ඔබට ශිෂ්‍යත්ව දෙනවා කියලා ධනාත්මක ආඛ්‍යානයකින් දකුණ ආමන්ත්‍රණය කළා නම් අපට ඇති වෙන්නේ ආදරයක්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Dilith Jayaweera, your time is up.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

අන්න, you are being unkind! I think you did not give me those extra two minutes.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Yes, that was given and you have completed those two minutes also.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

Anyway, would you give me just 30 seconds to sum up?

ගරු සභාපතිතුමනි, මේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන මම කියන්නේ නැහැ. මේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීමේදීත් "ව්‍යවසායකත්වය" කියන වචනය ඇතුළත් කර ගෙන තිබෙනවා. මම අවංකව කියන්නේ, මේක තේරුම් ගන්න. ව්‍යවසායකත්වය or entrepreneurship is not a word that you could use loosely. You have to understand the deep-down concept of it and out there in the world, that, technically, means something else completely. Also, study the regional competition, the global competition, how they are moving forward and how we could include all that into our strategies to take the nation forward.

ජාතිය ඉදිරියට යන ගමනේදී ඔබ ව්‍යවසායකත්ව රාජ්‍යය කියන සංකල්පය ඔබගේ චින්තන දේහයට යොදා ගත් දිනකදී අපට එක දේශපාලනයක් ගැන කථා කරන්නට පුළුවන්. එදාට තමයි මේ රටේ මිනිස්සු මත්ද්‍රව්‍යයෙන් ඉවත් වෙන්නේත්, මේ රටේ මිනිස්සු ඒ සියලු අකටයුතුකම්වලින් ඉවත් වෙන්නේත්, මේ රටේ මිනිස්සු එක ජාතියක් හැටියට නැඟී සිටින්නේත් කියන එක ප්‍රකාශ කරමින්, නැවත වතාවක් අපේ සභාපතිතුමාගේ සිනාමුසු සහයෝගයට අගය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Sugath Wasantha de Silva. You have ten minutes.

[පූ.භා. 11.34]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු සභාපතිතුමනි, මගේ විශ්වවිද්‍යාල සගයාගෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් සතුටුයි. එතුමා කථාව අවසන් කරන කොට කියපු දෙයක් තමයි, තාරුණ්‍යය ගලවා ගැනීම සඳහා ව්‍යවසායක රාජ්‍යයක් අවශ්‍යයි කියන කාරණය. ඔව්, ඒක හරි. හැබැයි දැනට ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් තරුණ තරුණියන් මුදා ගත්තේ නැත්නම් අපට තාරුණ්‍යයක් ඉතිරි වෙන්නේ නැහැ. එම ව්‍යසනයෙන් ජනතාව මුදා ගැනීම සඳහා ගන්නා උත්සාහය ඔය තරමට හැල්ලු කරන්න එපා. එය ඔය තරමට හැල්ලු කිරීම මත්ද්‍රව්‍ය වෙළෙන්දාත්, ව්‍යාපාරිකයාත් තරුණ සංහතිය වළ පල්ලට ගෙන යන කටයුත්තට සහයෝගය දීමක් වනවා. එයට සහයෝගය දෙන්න එපා කියලා මගේ මිත්‍රයාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අද, නොවැම්බර් 21. අද දවස ඓතිහාසික දවසක්. මීට හරියටම අවුරුද්දකට කලින් ජාතික ජන බලවේගයට පුළුවන් වුණා; ඔවුන් එක්ක ඒකාබද්ධ වෙච්ච ලක්ෂ 69කට අධික ඡන්ද දායකයන්ට පුළුවන් වුණා, එවකට නිර්මාණය කරමින් තිබිච්ච රාජාණ්ඩු ක්‍රමයත්, ව්‍යවස්ථාපිත ආඥාදායකත්වයත් පරාජය කරමින් දසවන පාර්ලිමේන්තුවේ දිවුරුම් දීමට ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකට අවස්ථාව සලස්වන්න. ඒ ගැන ජනතාවට අපගේ ප්‍රණාමය සහ ගෞරවය පිරිනමන්න මා කැමැතියි.

මේ නිර්මාණය කරපු ජනතාවාදී ආණ්ඩුවේ සාමාජිකයෙකු වෙන්න ලැබිච්ච එක ඇත්තෙන්ම මාගේ භාග්‍යයක්. මගේ මිත්‍ර වෛද්‍ය ගරු පත්මනාදන් සත්‍යාලිංගම් මන්ත්‍රීතුමාත් එක්ක අපි කිලිනොච්චියට ගිහිල්ලා පාර්ලිමේන්තු සංසදය විධියට ලොකු වැඩක් කළා. එහි ඡායාරූප දැකපු එක්තරා විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරයෙක් පෝස්ටුවක් පළ කරලා තිබුණා. මාව ඉලක්ක කරගෙන ඒකෙන් කිව්වේ "උඹත් තව එක් වහලෙක් විතරයි" කියලායි. පසුව ඒක අයින් කරගෙන තිබුණා. ඔව්, ඔබ කියනවා නම් අපි වහලුන් තමයි. හැබැයි අපි ස්පාර්ටකස් පරපුරේ වහල්ලු. අපි වහල් ක්‍රමයට එරෙහිව, වැඩවසම් ක්‍රමයට එරෙහිව, මංකොල්ලකාරී ධනවාදයට එරෙහිව සටන් වදින වහල්ලු. මේ වහල් බව ආබාධ සහිත ප්‍රජාව තුළ තිබෙනවා. ඒ වහල්භාවයේ බැමි එකින් එක ගලවා දැමීමේ උත්සාහයක් අපි පසුගිය අවුරුද්ද පුරාම දැරුවා. මා හිතන්නේ එහි මූලික බලඇණිය විධියට කටයුතු කරන මේ අමාත්‍යාංශයට, ගරු ඇමතිතුමාට, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට, ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයට ලොකු ගෞරවයක් හිමි වෙනවා. අපි ඒ ගෞරවය ඔවුන්ට පිරිනමන්න ඕනෑ.

අපි කොහොමද, ආබාධිත බවත් එක්ක තිබෙන බැමි එකින් එක කඩන්නේ? ගරු ඇමතිතුමා සඳහන් කළා වාගේම, 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කරලා ආබාධ සහිත තැනැත්තන්ට අයිතිවාසිකම් 25කට වැඩි ප්‍රමාණයක් ලබා දීමේ පනත් කෙටුම්පතත් සකස් කරලා ඉවරයි. ඒක එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ප්‍රඥප්තියට සමපාතයි. අනෙක් පැත්තෙන් ගත්තාම, අයිතිවාසිකම් නීතිගත කිරීම විතරක් මදි. ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය යන්ත්‍රණය, රාජ්‍ය ව්‍යුහයන් නිර්මාණය කිරීමට ඒ පනත් කෙටුම්පතින් යෝජනා කරනවා. එහි සංකීර්ණ බවක් පෙනේවි. නමුත් මේ ප්‍රජාව සමඟ බද්ධ වෙලා තිබෙන ප්‍රශ්න සමුදායෙන් ඔවුන් මුදා ගැනීමට ඒ වාගේ ආයතන රාමුවක් අනිවාර්යයෙන්ම ඕනෑ වෙනවා.

අනෙක් පැත්තෙන්, අපට අවශ්‍ය වැදගත්ම දෙයක් තමයි, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම. ඒ සඳහා කර උර දෙමින් දැනටත් ජාතික සභාව ක්‍රියාත්මක වෙනවා. මම කලින් කියාපු පනත් කෙටුම්පත ලබන 24වැනි දා ජාතික සභාවට ඉදිරිපත් කරලා අනිවාර්යයෙන් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව හරහා ඔබතුමන්ලා ඉදිරියට ගෙන ඒවි, ගෞරවනීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි. මම විශ්වාස කරනවා, පක්ෂ විපක්ෂ ඔබ සියලුදෙනා එක අතක් නොවෙයි අත් දෙකම ඔසවා, ඒ මානවවාදී පනත් කෙටුම්පත පනතක් බවට පත් කරලා, ආබාධ සහිත පුද්ගලයන්ට අයිතිවාසිකම්වලින් හෙබි අභිමානවත් ජීවිතයක් උරුම කර දීම සඳහා ගන්නා වූ ඒ සමාජ යුක්තිය පිළිබඳ කාරණය ඉෂ්ට කරන්න සහයෝගය දෙයි කියලා. අප ගොඩ නඟන්න උත්සාහ කරන්නේ, නිර්බාධිත සමාජ ජීවිතයක්. ඒ නිර්බාධිත බව ආබාධ සහිත පුද්ගලයන්ට අනිවාර්යයෙන් උරුම කර දෙන්න නම්, අපට සුභසාධනවාදී වැඩ පිළිවෙළක් අවශ්‍යයි. එවැනි වැඩ පිළිවෙළක් එක්ක තමයි මේ අයිතිවාසිකම් පාදක කර ගත්තු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

මට ඇහුණා, සුභසාධනවාදය පිළිබඳව සහ දීමනා පිළිබඳව නඟන යම් යම් මැසිවිලි. හැබැයි, ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමාත් කිව්වා වාගේ ආබාධ සහිත පුද්ගලයන්ට ලබා දෙන සියලු දීමනා අපි පසුගිය අවුරුද්ද පුරා ඉහළ නංවා තිබෙනවා. ඒ සමහර ඒවා සියයට 150කින්; සමහර ඒවා සියයට 25කින් වැඩි කර තිබෙනවා. ඒ වැඩි කිරීම විතරක් නොවෙයි, ඒ දීමනා ලබා දෙන පිරිවරත්, පරිමාවත්, සංඛ්‍යාවත් වැඩි කර තිබෙනවා ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයකින්. මේකෙන් අපි අදහස් කරන්නේ නැහැ, ආබාධ සහිත පුද්ගලයන් හුදෙක් යැපෙන්නන් විධියට, දීමනා මත තමන්ගේ ජීවිතය ගත කළ යුතුය යන්නක්. ඔවුන් බල ගැන්විය යුතුයි; ඔවුන්ට ආර්ථික සමෘද්ධිය අත්පත් කර දිය යුතුයි. ඒ සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා ඔවුන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබා දෙනවා. අනෙක් පැත්තෙන්, ඔවුන් රැකියාගත කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරගෙන යනවා.

මෙහිදී කිව යුතු ඉතා වැදගත් කාරණයක් තිබෙනවා. දැනට ක්‍රියාත්මක වන 1996 පනතට අනුව ආබාධ සහිත තැනැත්තන් වෘත්තීයගත කිරීමේ භාරදූර කාර්යය ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයට සහ අප අමාත්‍යාංශයට පැවරිලා තිබෙනවා. රජයේ සේවයේ සියයට 3ක ප්‍රතිශතයක් ආබාධ සහිත පුද්ගලයන්ට ලබා දිය යුතුයි. මෙන්න මේ ප්‍රතිපත්තිය අනිවාර්ය කිරීමේ ප්‍රකාශය පසුගිය අය වැය ලේඛනය මඟින් ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ඉදිරිපත් කළා. මේක යථාර්ථයක් කිරීමේ භාරදූර කර්තව්‍යය එක අමාත්‍යාංශයකට සීමා වෙන්නේ නැහැ. රාජ්‍ය පරිපාලන, කම්කරු වාගේම මගේ සහෝදර සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ විෂය පථය වන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව ඇතුළු සෑම ක්ෂේත්‍රයක් තුළින්ම මේ කියපු සියයට 3 රැකියා කෝටාව අනිවාර්යය කිරීමේ වගකීමට කර උර දෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, ගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයටත් ආමන්ත්‍රණය කරනවා. පෞද්ගලික අංශයට ආමන්ත්‍රණය කරමින් එතුමා කියන්නේ, ආබාධ සහිත තැනැත්තන් පෞද්ගලික අංශයේ රැකියාවලට ඇතුළත් කර ගැනීමේදී සේවා යෝජකයන් දිරිගැන්වීමක් වශයෙන් රුපියල් 15,000ක උපරිමයකට යටත්ව ඒ සේවකයන්ගේ වැටුපෙන් සියයට 50ක මාසික දීමනාවක් රජය මඟින් ගෙවනවා කියලායි. මේ, හුදු වචන නොවෙයි. අපි ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

වර්තමානයේ තිබෙන විශාල ගැටලුවක් තමයි බුද්ධි වර්ධන ඌනතා සහිත දරුවන් බිහි වීම. ඔවුන් නඩත්තු කිරීම, ඔවුන් රැක බලා ගැනීම උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මෙන්න මේ සඳහාත් පසුගිය අවුරුද්දේ අය වැය ලේඛනයෙන් මෙන්ම මේ අවුරුද්දේ අය වැය ලේඛනයෙනුත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව ඇතුළු

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

අපේ අමාත්‍යාංශය සක්‍රිය වැඩ කොටසක් කරගෙන යනවා. මේ හරහා බලාපොරොත්තු වන්නේ මොකක්ද? ඒ දරුවන්ට රැකවරණය සහ ආරක්ෂාව සපයමින්, ඔවුන් පෝෂණය කරමින් ඔවුන්ගේ දෙමව්පියන් සහ පවුලේ සාමාජිකයන් එම වගකීමෙන් යම් මට්ටමකට මුදා හැර ඔවුන් ශ්‍රම බලකායේ සක්‍රිය ශ්‍රමිකයන් බවට පත් කිරීමයි. ඒ සංකල්පය තමයි අප මේ ක්‍රියාත්මක කරන්න හදන්නේ. මේ සෑම වැඩ පිළිවෙළක් හරහාම ආබාධ සහිත ප්‍රජාව බල ගැන්වීමේත්, ඔවුන් නඩත්තු කිරීමේත්, ඔවුන්ට අභිමානවත් ජීවිතයක් අත්පත් කර දීමේත් මහඟු වගකීම අපි දරනවා.

ඒත් එක්කම මම මේ කාරණය ඉතාම ගෞරවයෙන්, ළෙන්ගතුව කියන්න කැමැතියි. සමාජ සේවා නිලධාරින් ලංකාව පුරාම ඉන්නවා. ඔවුන්ට වෘත්තීය ගැටලු තිබෙන බව මම දන්නවා. හැබැයි, මගේ ආයාචනය, මගේ අභියාචනය තමයි ඔබ ආබාධ සහිත පුද්ගලයන් වෙත යන්න. ඔවුන්ගේ ප්‍රශ්න, ගැටලු, වේදනාව හඳුනා ගන්න. ඔබ එනතුරු ඔවුන් බලාගෙන ඉන්නවා. ඔවුන්ගේ දුක, වේදනාව, කඳුළු පඬුරු කොට තියනවා, ඔබ ඉදිරියේ ඔප්පු කරන්න. ඔබ තුළ ඒ සඳහා ඉතා ඉහළ වෘත්තීය ගරුත්වයක් සහ වෘත්තීයභාවයක් තිබෙනවා. ඔබ ආමන්ත්‍රණය කළ යුත්තේ ඔවුන්ගේ දුකට. ඔවුන්ගේ හිත් නිවන්න ඕනෑ, මොකද, ආබාධිත බවත් එක්ක ඔවුන් වේදනාවට පත් වෙලා ඉන්නේ. ඒ ආබාධිත බව ඒ අය විසින් උරුම කර ගත්ත දෙයක් නොවෙයි. තමන් කැමැත්තෙන් උරුම කර ගත්ත දෙයක් නොවෙයි. ඒ වගකීම කාට ගියත්, මේ ආබාධ සහිත ප්‍රජාව රැක බලා ගැනීම, ඔවුන් සංවර්ධනය සඳහා දායක කර ගැනීම අපේ වගකීමක්. ඒක අපි "එක්ව, අත්නොහැර" කියන අපේ ප්‍රතිපත්තිය තුළ ගැඹුරින් සඳහන් කරලා තිබෙනවා; අවධාරණය කරලා තිබෙනවා.

ඒක හුදු වචනයක් බවට පත් නොවන බව, ආබාධ සහිත ලක්ෂ සංඛ්‍යාත මගේ සහෝදර සහෝදරියන් පිළිගන්නවා ඇති, අපි පසුගිය අවුරුද්ද පුරා කරපු වැඩත් එක්ක. ඉදිරි අවුරුද්ද පුරාවටත් අපි ඒ හා සමාන, ඊටත් වැඩිය ජවයකින්, ඊටත් වැඩිය වේගයකින් මේ ජනතාව වෙත අභිමානය සහ සංවර්ධනය, ආර්ථික ඵලදායිතාව ගෙන එන්න කටයුතු කරනවා. මාත් එක්ක අපේ නිලධාරි මණ්ඩලයත්, ගරු ඇමතිතුමා එක්ක සහයෝගයෙන් අත් වැල් බැඳගෙන, ඔවුන්ට නිර්බාධිත සමාජ ජීවිතයක් උරුම කර දීමේ මා හැඟි, උත්තුංග කටයුත්තට කර උර දෙමු කියන යෝජනාව කරමින්, මට ලබා දුන් කාලයට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Waruna Liyanage. You have eight minutes.

[පූ.භා. 11.45]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා. ගරු සභාපතිතුමනි, අපි අද කථා කිහිපයක් ඇහුවා. ඒ සියලුදෙනාගේම අදහස වුණේ කර්මාන්ත අංශය කඩා වැටිලා, ඒවා දියුණු කරන්න අවස්ථාවක් ලබා දෙන්න පුළුවන් නම් ආණ්ඩුවට විශාල ශක්තියක් ලබා දෙයි කියන එක. පසුගිය කාලයේ විපක්ෂ නායකතුමා ඉතා වැදගත් යෝජනාවක් කළා පරාටේ නීතිය ගැන. ගරු අමාත්‍යතුමනි, පරාටේ නීතිය ක්‍රියාත්මක කරන එක තාවකාලිකව හෝ නවත්වලා දෙන්න පුළුවන් නම් ඒක විශාල ශක්තියක් වෙයි. මොකද, කර්මාන්ත අංශය ගත්තාම අද විශාල පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ ගත්ත තීන්දු එක්ක ඒවා කඩා වැටුණු නිසා, නැවත නඟා සිටුවීමේදී ගැටලු රාශියක් තිබෙනවා.

අපි තමුන්නාන්සේලාට උදාහරණයක් විධියට මේ කාරණය මතක් කරලා දෙන්න ඕනෑ. මගේ ආසනය රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ආසනය. මගේ ආසනයේ මේ වෙනකොට garment factories දෙකක් විතර වැහිලා තිබෙනවා. ඒ නිසා 4,000කට ආසන්න සංඛ්‍යාවකට එදිනෙදා ජීවනෝපාය කටයුතු කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අයට විශාල අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒවායේ රැකියාවල නිරත වෙලා හිටපු කාන්තාවන්ගේ රැකියා අහිමිවීම නිසා, පසුගිය කාලසීමාවේ ඒ දරුවන්ට සපත්තු දෙකක්වත් ගන්න බැරි තත්ත්වයක් තමයි නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ කර්මාන්ත නඟා සිටුවීමට අවශ්‍යයි. පරාටේ නීතිය නැවත ක්‍රියාත්මක කිරීම තුළින් ඒවා ගොඩ ගන්න බැරි වෙයි. 2025 ජූනි 30 වෙනකොට පරාටේ නීතිය නැවත ක්‍රියාත්මක කරන්න කියලා මේ ආණ්ඩුව තීරණයක් ගෙන තිබෙනවා. ඒක නවතා දෙන්න පුළුවන් නම් හොඳයි කියන එක තමයි, මගේ පළමුවැනි කාරණය වන්නේ.

ගරු සභාපතිතුමනි, අපි කියන්න ඕනෑ අනෙක් කාරණය මේකයි. රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම, මේ රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලැබෙනවා මැණික් කර්මාන්තයෙන්. මැණික් කර්මාන්තය අද වෙනකොට විශාල අසාධාරණයකට ලක් වෙලා තිබෙනවා. ඉතිහාසයේ ඉඳලා ගත්තාම, මේ මැණික් කර්මාන්තයේ නියැළුණු කම්කරුවන්ට අපි බාසුන්නහේලා කියලා තමයි අපි කථා කළේ. හැබැයි, අද බාසුන්නැහේලා නැති වෙලා, බැකෝ යන්ත්‍රකරුවා තමයි අද බාසුන්නැහේ බවට පත් වෙලා තිබෙන්නේ. බැකෝ යන්ත්‍ර පතල් තමයි, අපේ දිස්ත්‍රික්කයේ අද වෙනකොට වැඩියෙන්ම තිබෙන්නේ. අද ඒ නිසා කුලිය නැති වෙලා, හවුල නැති වෙලා, ඒ කම්කරුවන් කුලීකරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද වන විට මේ අයට විශාල අසාධාරණයක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ කටයුතු නැවත යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍යයි. මම දන්නේ නැහැ, ඒක තමුන්නාන්සේලා කොහොම කරයි ද කියලා. අපි බලාපොරොත්තු වන්නේ නැවත බාසුන්නැහේ කෙනෙක් ඇති කර ගන්නයි. නමුත්, අද බැකෝ යන්ත්‍රකරුවා තමයි බාසුන්නැහේ බවට පත් වෙලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත.

ඒ වාගේම, අද වන විට මැණික් කර්මාන්තය විශාල ගැටලු රාශියක් තිබෙන්නේ. අද අපේ රටේ මැණික් අඩු වීම නිසා මැණික් import කරනවා. අපි import කරන කොටත් අද tax ගහනවා. ඉතිහාසයේ කවදාවත් import කරනකොට tax ගැහුවේ නැහැ. Import order එකට ඩොලර් 200ක් ගෙව්වාට පස්සේ, ඒ ඩොලර් 200 ගෙවලා ලංකාවට ඕනෑ තරම් මැණික් ගේන්න තිබුණා. හැබැයි, අද ඒකටත් සියයට 18ක් VAT එක ගහලා, ආපහු SSCL එක සියයට 3ක් ගහනවා. එතකොට සියයට 21ක්. අද මැණික් import කරන්නේ නැතිවීම නිසා ඒ ක්ෂේත්‍රයේ සිටින අපේ කුඩා කර්මාන්තකරුවන්ට, මැණික් කපා ඔප දමන - gem cutting - ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් අවදානමට ලක් වෙලා තිබෙනවා. මේක අවධාරණය කර ගත්තේ නැහැ කියලා තමයි මම නම් හිතන්නේ. ඒ නිසා නේ VAT එක ගහලා

තිබෙන්නේ. ඒ නිසා අද විශාල ගැටලු රාශියකට මේ cutting and polishing ක්ෂේත්‍රයේ නියැළිලා ඉන්න අපේ කම්කරුවන් මුහුණ දෙමින් සිටිනවා. ඒ නිසා මේ බදු ඉවත් කර ගන්න පුළුවන් නම් ඒක මේ ක්ෂේත්‍රයේ අයට විශාල සාධාරණයක් වෙයි. අපේ importsවලට tax ගහනවා වාගේම exportsවලටත් tax ගහනවා. මේ විධියට exportsවලටත් tax ගැහුවාට පස්සේ, ඊට පස්සේ හොර පාරෙන් තමයි මැණික් අපනයනය කරන්න වෙන්නේ. ඒ නිසා මේ සඳහා නීත්‍යනුකූල ක්‍රමයක් හදලා මේ මැණික් export කිරීමේදී සහනයක් දෙන්න පුළුවන් නම් හොඳයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විදේශ ශ්‍රමිකයෙක් ලංකාවට සල්ලි ගේනකොට, විදේශ ශ්‍රමිකයෙක් ලංකාවට මැණික් ගේනකොට ඒවාට tax ගැහුවේ නැහැ. ඒ කාලයේ ඒවාට tax ගැහුවේ නැහැ. දැනුත් tax ගහන්නේ නැහැ. අද මැණික් විකුණන ව්‍යාපාරිකයාත් පිටරට ගිහිල්ලා ව්‍යාපාරයක් කරලා තමයි සල්ලි ගේන්නේ. එම නිසා ඒ සල්ලිවලට tax එකක් ගහන්නේ නැතිව තමයි ඒ කාලයේ එන්.එම්. පෙරේරා මැතිතුමා මේවා ක්‍රියාත්මක කළේ. ඒ නිසා තමයි ඒ කාලයේ ලංකාවට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලැබිලා තිබෙන්නේ. අද වෙනකොට මැණික් exports කඩා වැටිලා තිබෙනවා. මම ඔබතුමාට ඒ සංඛ්‍යාලේඛන පෙන්වන්නම්. මේ සංඛ්‍යාලේඛන අනුව මේ අවුරුද්දේ මේ වෙනකොට මැණික් exports US Dollars මිලියන 164යි. ගිය අවුරුද්දේ තිබෙනවා US Dollars මිලියන 206ක්. ඒ මැණික්වල. ඩයමන්ඩ්වලින් US Dollars මිලියන 277ක් තිබිච්ච එක, US Dollars මිලියන 198ට බැහැලා තිබෙනවා. ඒ නිසා අපි 2027දී අපේ target එකට යන්න ඕනෑ නම් මේ කටයුතු වර්ධනය කර ගන්න ඕනෑ කියලායි මගේ අදහස.

මේ දේවල් අපි ගිය සැරේත් පෙන්නලා දුන්නා. ඒ වාගේම, මේ සැරේත් අපි තමුන්නාන්සේලාට පෙන්නලා දෙනවා. නමුත්, මේවා ක්‍රියාත්මක වුණේ නැත්නම් ඒක විශාල අසාධාරණයක් හැටියට තමයි අපි දකින්නේ. ගරු අමාත්‍යතුමනි, අද වන විට මේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පවත්වාගෙන යන බිල්ඩින් එකට විශාල මුදලක් ගෙවනවා. මේ ගොඩනැඟිල්ලට මාසයකට රුපියල් ලක්ෂ 45 ක්, plus tax ගෙවන්න සිද්ධ වෙනවා. ඒක විශාල මුදලක්. 2021-2023 කාලය තුළ මේ ගොඩනැඟිල්ලට මාසයකට රුපියල් ලක්ෂ 45 ගණනේ ගෙවා තිබෙනවා. ඒ වාගේම, 2023-2025 කාලයේ මේ ගොඩනැඟිල්ලට මාසයකට රුපියල් ලක්ෂ 49 ගණනේ ගෙවා තිබෙනවා. ඒ වාගේම, 2025.11.30 වෙනකොට මේ ගොඩනැඟිල්ලට මාසයකට රුපියල් ලක්ෂ 51 ගණනේ ගෙවා තිබෙනවා. ඒ නිසා මේ ගොඩනැඟිල්ල වෙනුවෙන් විශාල මුදලක් ගෙවනවා. අපි පසුගිය කාලය පුරාමත්, ගිය ආණ්ඩුව කාලයේත් කිව්වා, මේක නිවැරදි කරන්න කියලා. හැබැයි, මේ ආණ්ඩුවත් ඒකම කරගෙන යනවා. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පවත්වාගෙන යන බිල්ඩින් එක ගිලා බැස්සා කියලා තිබුණා. හැබැයි, සුළු මුදලක් ගෙවමින් ඒ ආයතනය පවත්වාගෙන යන්න තිබුණා. මාසයකට රුපියල් ලක්ෂ 51ක කුලියක් ගෙවනවා කියන්නේ ලොකු මුදලක් ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි මේවා නවත්වා ගන්න ඕනෑ. ඒක තමයි අපට මුදල් ඉතිරි කරගන්න තිබෙන ක්‍රමය. ඒ නිසා ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු අමාත්‍යතුමනි, අද මම දැක්කා අමාත්‍යාංශයෙන් Regulation එකක් එවා තිබෙනවා. මේ ගල් පිටරට යවන්න Regulation එකක් හදලා තිබෙනවා. මේකේ ඒ කැරට් ගණන් දාලා තිබෙනවා. මේකේ තිබෙනවා "young" කියලා. ඒ කියන්නේ young geuda කියන එක. ඒ වාගේම, "ඔට්ටු" කියලා ගල් වර්ගයක් තිබෙනවා. මේවා "maximum 500 grams" කියලා තිබෙන්නේ. මේවා පසුගිය කාලසීමාවේදී කොහොමත් ලංකාවෙන් පිටතට ගෙනියන්න දුන්නේ නැහැ. පසුගිය කාලයේ ගෙනියන්න දුන්නේ cut and polished නම් විතරයි. හැබැයි, දැන් මේක මෙතැනට ගෙනැල්ලා තිබෙනවා. එතකොට rough ගල් ගෙන යැම කියන කාරණය ගත්තොත්, ඒක හරියටම කරන්න පුළුවන් නම් ගැටලුවක් නැහැ. හැබැයි, මේකෙන් අයුතු ප්‍රයෝජනය ගත්තොත්, මේක විශාල අසාධාරණයක් වෙනවා, ගරු සභාපතිතුමනි. මොකද, cut-and-polish ක්ෂේත්‍රයත් කඩා වැටෙනවා. මේ පොඩි පොඩි ගල්වලට අදාළව තමයි අපේ දිස්ත්‍රික්කයේ factories ටික තිබෙන්නේ. හැබැයි, මේවා ඔක්කෝම පිටරට යනවා නම්, මේවායින් අපට වැඩ කරන කට්ටිය නැති වෙන්න පුළුවන්. මොකද, මම දැක්කා ඔබතුමන්ලාගේ, -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Warna Liyanage, your time is up now.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
තත්ත්පරයක් කිහිපයක් දෙන්න, ගරු සභාපතිතුමනි.

මේ අය වැය ඇස්තමේන්තුවේ තිබෙන cut- and-polish ක්ෂේත්‍රය ගත්තොත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් හැමදාම අපේ traineesලා train කළා. හැබැයි, ගිය අවුරුද්දේ එක්කෙනෙක්වත් train කරලා නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. මේක විශාල ගැටලුවක්. මම කියන්නේ මේවා නිවැරදි කරලා, traineesලා train කරලා, ලංකාවට මැණික් ගෙනැල්ලා කොහොම හරි export කර ගන්න පුළුවන් නම්, ඒකෙන් තමයි අපට ප්‍රයෝජන ගන්න පුළුවන් වෙන්නේ.

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. M.S. Uthumalebbe. - *[Not in the Chamber.]*

Then, the next speaker is the Hon. T.K. Jayasundara. You have nine minutes.

[පූ.භා. 11.54]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු සභාපතිතුමනි, 2026 අය වැය කාරක සභා අවස්ථාවේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාදයේදී මගේ අදහස් දක්වන්නට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන් මගේ කථාවේ ප්‍රවේශය හැටියට දකුණු කොරියාව බිඳ වැටිලා තිබුණු මොහොතේ, ඒ රට ගොඩනඟන්න කටයුතු කළ යුතු ආකාරය ගැන ඒ රටේ හිටපු මහාචාර්යවරයෙකුගේ අත් දැකීම් ආශ්‍රිතව ලියැවුණු පොතක් වෙත අවධානය යොමු කරන්නට මම කැමැතියි. ඒ, සැමුවෙල් උන්ඩොං කියන මහාචාර්යවරයා ලියපු පොත. එය දැන් මගේ අතේ තිබෙනවා. ඒ පොත පරිවර්තනය කරලා තිබෙන මහාචාර්යවරියට ගෞරවයක් වශයෙන් එතුමියගේ නම මා සඳහන් කරන්න කැමැතියි. ඇය, පද්මලතා සිරිවර්ධන කියන මහාචාර්යවරියයි. "අපේ ගම හා රට සංවර්ධනය කරන්නේ කොහොමද" කියන එම පොත අපේ රටේ පුස්තකාලවල තිබෙනවා. මමත් ඒ පොත කියෙව්වා. ඒක කියවනකොට ගත් යම් කරුණු ටිකකින් මගේ කථාව පටන් ගන්න ඕනෑ කියලා හිතුවා.

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

"සැමුවෙල් මූලධර්ම" කියන කාරණය ඇතුළේ සමූහිකත්වය, මහන්සි වී වැඩ කිරීම, තම තමන්ට උදවු කිරීම කියන කාරණා පිළිබඳව කියනවා. ඒවා තමයි එතුමා මූලධර්ම හැටියට ගත්තේ. ඒ වාගේම එතුමා කියනවා, මෙන්න මේ කරුණු අයින් කරන්න ඕනෑ කියලා. "අපට බැහැ, අපට එය කළ නොහැකිය" කියන කාරණා ඒ සමාජයේ වාක්‍ය මාලාවෙන් අයින් කරන්න ඕනෑ කියලා. ඒ වාගේම "එය අපට පුළුවන්, එය අපට කරන්න පුළුවන්" කියන කථාව නිතරම සමාජයට ගේන්න කියලා. ඉතින් අද විපක්ෂයේ, "කරන්න බැහැ, කළ නොහැකිය" කියන ඒ සෘණාත්මක ආකල්ප - negative attitudes - සහිත කථා මධ්‍යයේ, "ඔව්, අපට මේක කරන්න පුළුවන්; එය අපට කළ හැකියි; මේ මව්බිම ගොඩනඟන්න පුළුවන්" කියලා කියමින් මගේ කථාව ආරම්භ කරන්නට මට සිද්ධ වෙනවා.

මේ අය වැය ලේඛනය - මේ කාර්යභාරය - අපි කරගෙන යනකොට මේ වසරෙත් රජයේ නිලධාරින් අපට සැහෙන උදවු කළා. විශේෂයෙන්ම කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරින් පමණක් නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඒ අවට තිබෙන සියලු රජ්‍ය ආයතනවල නිලධාරින් අපේ මේ සංයුක්ත දැක්මට උදවු කළා. ඒ සියලු දෙනාට ස්තුති කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, අපි මේ අවුරුද්දේ කළේ මොකක්ද? මේ අවුරුද්දේ අපට කරන්න තිබුණු දේ තමයි ව්‍යවසායකයාගේ විශ්වාසය ගොඩනැඟීම. ව්‍යවසායකයෙක් කියන්නේ ව්‍යාපාරිකයෙක් නොවෙයි, ඉන් එහා ගිය යම් යම් අමු ද්‍රව්‍ය යොදා ගෙන, මානව සම්පත යොදා ගෙන, නව නිෂ්පාදනයක් කරන පුද්ගලයෙක්. ඔහු තමයි මේ සමාජයට අගය එකතු කරන්නේ. ඔහු තමයි මේ සමාජය ගොඩනඟන්න ශ්‍රමය දායක කර ගන්නේ. ඒකේදී විශ්වාසය අතිශය වැදගත්. නමුත් අපි හිටියේ, ජාත්‍යන්තර විශ්වාසය බිඳ වැටිච්ච තැනක. සියලු රටවල් අපිව ප්‍රතික්ෂේප කරපු රටක. දේශපාලනය පිළිබඳ ලෝකයේ මහා නරක චිත්‍රයක් තිබුණු රටක. ඒක අපි වෙනස් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ආර්ථික දත්ත ගත්තාම, විවිධ research ආයතන හරහා අපට හොඳ දත්තයන් දැන් ගෙනැල්ලා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඩොලරය ස්ථාවර වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මහා දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා, මේ කර්මාන්ත කරනකොට. ඒ තමයි අපේ ශ්‍රමයට යන මුදල. සමහර වෙලාවට අපට ශ්‍රමිකයෝ නොමැතිවීම ගැටලුවක්. ඒ ගොඩක් තැන්වල, ගම්වල කර්මාන්තශාලාවල අය කියනවා, ගමේ තරුණ පෙළ කුඩුවලට ඇබ්බැහි වෙලා කියලා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච නිසා නව පරම්පරාව වැඩට එන්නේ නැහැ කියලා තමයි කියන්නේ. මෙතැනදී එක මුදලාලි කෙනෙක් කිව්වා, අර මුලින් ආවේ කිකිළිද, බිත්තරයද වාගේ කථාවක්. ඉස්සෙල්ලා ළමයින්ට රක්ෂා දීලා ඉන්නලු, පසුව කුඩු එන එක නවත්වන්නලු. එතකොට ඉබේම නවතියි ලු. ඔන්න ඔය වාගේ කථා තමයි මෙතනදී කිව්වේ. කිසිම තර්කයක් තිබුණේ නැහැ. මේ මුදලාලිලාගේ කථාවල තිබුණු දේවල් අපට පිළිගන්න බැහැ. මොකද, මේ කුඩු ප්‍රශ්නය නිසා මේ රටේ සියලු දෙනා ඇඬූ කඳුළින් ඉන්නේ. ඒ නිසා ඒවා නවත්වන්නේ නැතුව "නැහැ, ඒක නවත්වන එක නොවෙයි, පළමුවැනි වැඩේ" කියලා කවුරු හරි මෙතැන ඇවිල්ලා කියනවා නම්, ඒ කුඩු බිස්නස් එකට සම්බන්ධ අය වෙන්න ඕනෑ, අනිවාර්යයෙන්ම.

ඊළඟට, දෙවැනි කාරණය විධියට අපේ රටේ තිබෙන කර්මාන්ත ගැනත් සඳහන් කරන්න ඕනෑ. අපේ රටේ මේ කර්මාන්තකරණය සම්බන්ධව කිසිම ඒකාග්‍රතාවක් තිබුණේ නැහැ. අපේ සිංහල භාෂාවේ කියමනක් තිබෙනවා, "දූන්න දූනුගමුවේ - ඊතල කිතලගමුවේ, රාල මීගමුවේ - මුවෙක් හැඩුවයි සබරගමුවේ" කියලා. ඒ විධියට තමයි අපේ රටේත් වැඩ කටයුතු සිදු වුණේ. විවිධ ආයතන, විවිධ තැන්, විවිධ අමාත්‍යාංශ, විවිධ පුද්ගලයෝ, විවිධ දේශපාලනඥයෝ - එක්කෙනාට එක්කෙනා සම්බන්ධයක් නැහැ. ගමක් ගත්තත්, පක්ෂවලට බෙදිලා තමයි මේ වැඩ කළේ. අපි මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ.

අපි දැන් ඒක කරමින් ඉන්නවා. අපි මොකක්ද දැන් ඒ සඳහා කරන්නේ? අපිට ප්‍රශ්නයක් තිබුණා, මධ්‍යම රජයේ ඒවා සහ පළාත් සභා ඒවා කියලා. ඒ විතරක් නොවෙයි. විවිධ අමාත්‍යාංශ වෙන වෙනම වැඩ කළා. දැන් අපි ඒ තත්ත්වය වෙනස් කර තිබෙනවා. දැන් දිස්ත්‍රික්කයක් ගත්තොත්, එම දිස්ත්‍රික්කයේ කර්මාන්ත කියන එක, එක unit එකක් විධියට වැඩ කරනවා. ඒ සියලු දෙනා එකට එකතු වෙලා වැඩ කරනවා. කර්මාන්ත අමාත්‍යාංශය, පළාත් සභා, මධ්‍යම රජය කියන මේ සියලුම රාජ්‍ය ආයතන එක ඉලක්කයකට වැඩ කරන්න පටන් ගෙන තිබෙනවා. එහෙම නැතුව කොහොමද කරන්නේ? අතේ ඇඟිලි පහ, පස් විධියකට වැඩ කළොත්, අපේ අතින් කිසිම දෙයක් කරන්න බැහැ. ඒ නිසා එක මිටකට වැඩ කරන්න නම්, ඇඟිලි පහම එකට වැඩ කරන්න ඕනෑ. මෙච්චර කාලයක් අපේ රටේ දේශීය ව්‍යාපාරිකයා ගොඩනැගෙනවාට අකැමැති අය; පිටරටින් භාණ්ඩ ගෙනැල්ලා මේ රටේ කර්මාන්ත බිඳ වට්ටන්න හවුල් වෙච්ච අය තමයි මේ ක්‍රියාවලියට විරුද්ධ වෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි දිස්ත්‍රික් කර්මාන්ත හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන සභා ගොඩනැගුවා. එම සභා ගොඩනඟා, ඒවා තිබුණු තැන්වල ඒවා තවත් ශක්තිමත් කරලා, අපි ඒවා ක්‍රියාත්මක තලයට ගෙනැල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රාදේශීය කර්මාන්ත හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන සභා ගොඩනඟා, ඒවා ශක්තිමත් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, ජාතික ශිල්ප සභාව, අපනයන සංවර්ධන මණ්ඩලය යනාදී එකී නොකී සියලු ආයතන එක මිටකට එකතු කරමින් අපේ ගමන යනවා.

මෙතැනදී විපක්ෂ නායකතුමාගේ පැත්තෙන් කියනවා මට ඇහුණා, macroeconomy එකක් ගැන. අපි macroeconomy එක ගැන බලන්නේ නැහැලු. Macroeconomy එක ගැන තමයි මේ අපි කථා කරන්නේ. ගමක් කේන්ද්‍ර කරගෙන හැදෙන කුඩා, කුඩා කර්මාන්ත ඉලක්ක කරගෙන තමයි macroeconomy එක හැදෙන්නේ. ඒක තමයි මහ දැවැන්ත එකකට ශක්තිය දෙන්නේ. ඊළඟ කාරණය තමයි මේ කටයුතු ඩිජිටල්කරණය කිරීම. දැන් ඩිජිටල්කරණයක් නැතුව මේ නව යුගය තුළ අපට ඉදිරියට යන්න බැහැ. ඩිජිටල් ආර්ථිකයට සම්බන්ධ නොවී, ගමේ ආර්ථිකය මහ දැවැන්ත ආර්ථික පදාසයකට සම්බන්ධ කරන්නේ කොහොමද? අපි දැක්කා, ඉන්දියාවට ගොඩ යන්න පාර තිබුණේ ඒ ඩිජිටල්කරණය හරහා බව.

ඊළඟට, අපි ව්‍යාපාරිකයාට, ව්‍යවසායකයාට සමබිමක් ඇති කරන්න ඕනෑ. ඒ නිසා අපි එම කටයුතුවලින් දේශපාලන හිතවත්කම ඉවත් කළා. කිසිම දේශපාලන සම්බන්ධයක් නැතුව ඕනෑම මිනිහෙකුට ඒ සඳහා අවස්ථාව සලසා තිබෙනවා. මෙච්චර කල් තිබුණේ කොහොමද? කුකුළු පැටියා, තේ පැළය පවා බෙදුවේ තමන්ගේ පක්ෂය බලලා, තමන්ගේ ඡන්ද campaign එක බලලා. උදැල්ල පවා බෙදුවේ එහෙමයි. එහෙම තිබුණු දේශපාලන සංස්කෘතියක් තමයි අපි වෙනස් කළේ. දැන් අපි තරුණ ව්‍යවසායකයින්ට ගොඩනැඟෙන්න සමබිමක් හදලා තිබෙනවා. ගමේ කාන්තා සමිති හරහා කාන්තාවන්ට ගොඩනැඟෙන්න සමබිමක් හදලා තිබෙනවා. අපේ දේශීය

ව්‍යාපාරිකයාට විදේශ වෙළෙඳ පොළත් එක්ක හැප්පෙන්න බැරිව තිබුණා. අපි Anti-Dumping and Countervailing Duties Act එක හරහා ඊට අවශ්‍ය කටයුතු කර තිබෙනවා; ජාත්‍යන්තර වශයෙන් ඔවුන්ට සමබිමක් හැදෙන මට්ටමට වැඩ කටයුතු සලසා තිබෙනවා.

ඊළඟට, ඵලදායිතාව වැඩි කරන්න අපට අවශ්‍යයි. මොකද, අපි වැඩ කළාට වැඩක් නැහැ; භාණ්ඩ බෙදුවාට වැඩක් නැහැ. අපේ රටේ තිබුණේ භාණ්ඩ බෙදිල්ලක් විතරයි. භාණ්ඩ බෙදිල්ල විතරක් හරියන්නේ නැහැ. මෙතැනදී අපට ඕනෑ, ඵලදායිතාව වැඩි කරන්නයි. අපි යම් කටයුත්තකට රටේ ජාතික සම්පත් යොදවනකොට, ජනතාවගේ මුදල් වැය කරනකොට, ඒකේ ඵලදායිතාව ගැනත් බලන්න ඕනෑ. ඒ සඳහා ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුම වැඩිදියුණු කළ යුතුයි. ඒ අනුව අපි ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව විෂයයක් ලෙස පළමු වතාවට අපේ පාසල් විෂය මාලාවට ඇතුළත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අධීක්ෂණය සහ ඇගයීම - monitoring and evaluation - ප්‍රධාන කාරණයක් බවට පත් කර තිබෙනවා, ඵලදායිතාව වැඩි කිරීම සඳහා.

ඒ විතරක් නොවෙයි. අපි එතැනින් එහාට විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශයත් සම්බන්ධ කරගෙන විවිධ ණය ක්‍රම පාවිච්චි කරමින් ඵලදායිතාව වැඩි කර ගනිමින්, ලෝක වෙළෙඳ පොළ ඉලක්ක කර ගත්ත කර්මාන්ත - කුරුඳු කර්මාන්තය, තේ කර්මාන්තය, බිරලු කර්මාන්තය, දැව ආශ්‍රිත නිෂ්පාදන, උණ ශාකය ආශ්‍රිත නිෂ්පාදන, පන් ආශ්‍රිත නිෂ්පාදන, ආහාර ආශ්‍රිත නිෂ්පාදන, මැණික් ආශ්‍රිත නිෂ්පාදන- සඳහා සියලුදෙනාම එකතු කර ගනිමින් ඉස්සරහට යමින් සිටිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. T.K. Jayasundara, your time is up now.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

අපට මාස ගණනයි ගියේ. අපි ඇත්තටම කෙටි කාලයක් ඇතුළත තමයි මේ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. අමාරුම කාර්යය අපි කරලා තිබෙනවා. ඒ තමයි ව්‍යවසායකයා තුළ විශ්වාසය ගොඩනැඟීම. රජය පිළිබඳව විශ්වාසය, යමක් කරන්න පුළුවන් කියන විශ්වාසය, ලෝකය අපව පිළිගන්නවා කියන විශ්වාසය, අපේ ආර්ථිකය ස්ථාවරයි කියන විශ්වාසය අපි ගොඩනඟලා තිබෙනවා. ඒ නිසා පළමුවැනි අදියර හරි.

ලබන වසර තුළ අපි විවිධ ක්‍රමවලින් ඵලදායිතාව වැඩි කර ගැනීමට කටයුතු කරනවා. කාන්තාවන්, තරුණයන් නිෂ්පාදනය සඳහා එකතු කර ගනිමින්, නව ව්‍යවසායකයන්ට මඟ පෙන්වමින් යන ගමනට උදැල්ල දමන්න එපා; බාධා කරන්න එපා; මේ රටේ නව පරපුරක් ගොඩනැඟෙන අවස්ථාවට බාධා කරන්න එපා කියලා විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. 1970දී පටන් ගත්ත සැමුවෙල් උන්ඩොංගේ ව්‍යාපෘතිය 1990 වෙනකොට අවුරුදු 20ක් ඇතුළත කොරියාව ආසියාවේ හතරවැනි ආර්ථිකය තිබෙන රට බවට පත් කළා. වසර දහයක් ඇතුළත අපටත් ඒ වාගේ ආර්ථිකයක් ගොඩනඟා ගන්න පුළුවන් කියලා විශ්වාසයි. ඒ සඳහා සහාය වන ලෙස සියලුදෙනාට ආරාධනා කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have 15 minutes.

[பி.ப. 12.05]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
மாண்புமிகு தவிசாளர் அவர்களே, நான் திருகோணமலை மாவட்டத்தில் பிறந்து வளர்ந்தவன் என்றவகையில், இப்பொழுது திருகோணமலை மாநகரில் எழுந்துள்ள சிக்கல் பற்றி ஒரு தெளிவையும் அதன் உண்மைத் தன்மையையும் இந்த மேலான அவைக்கு எடுத்துக்கூற விரும்புகின்றேன். திருகோணமலை மாநகர மணிக்கூட்டுக் கோபுரத்தில் இருந்து பிரட்றிக் கோட்டை வாசலுக்குச் செல்லும் சாலையை முகவரியாகக்கொண்டு, 1957ஆம் ஆண்டில் "ஸ்ரீ சம்புத்த ஜெயந்தி போதிவர்தன சமிதிய" என்னும் ஓர் அறக்கட்டளை பதியப்பட்டுள்ளது. இது 2003ஆம் ஆண்டில் ஒரு தர்மப்பள்ளி நடத்தும் நிலையமாக மாற்றப்பட்டுள்ளது. அத்தோடு, இது 2010ஆம் ஆண்டில் ஒரு புத்த விகாரையாகவும் பதிவு செய்யப்பட்டுள்ளது. பதிவுசெய்யப்பட்ட வேளையில் இது 1951ஆம் ஆண்டில் இருந்து செயற்பட்டு வருவதாகக் கூறப்பட்டுள்ளது. இந்த இடம் இப்பொழுது "சங்கமித்தை விகாரை" என்றும் அழைக்கப்படுகின்றது. இது அதற்கான முதலாவது இடமாகும்.

இது இவ்வாறிருக்க, டொக்யாட் வீதியில் இருந்து பிரட்றிக் கோட்டை வாசலுக்குச் செல்லும் சாலையில், மேற்படி "ஸ்ரீ சம்புத்த ஜெயந்தி போதிவர்தன சமிதிய" அமைப்பின் விண்ணப்பத்தின் பேரில், 40 பேர்ச் பரப்பளவுள்ள வேறொரு காணி அன்றைய குடியரசுத் தலைவரான மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ அவர்களால் 2008ஆம் ஆண்டு நீண்ட காலக் குத்தகைக்கு வழங்கப்பட்டுள்ளது. பின்னர் 2014ஆம் ஆண்டு யூலை மாதம் 09ஆம் நாள் அதன் நீண்டகாலக் குத்தகையை மாற்றி, மேற்குறித்த காணிக்கான உறுதி குடியரசுத் தலைவரான மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ அவர்களால் வழங்கப்பட்டுள்ளது. இது அதற்கான இரண்டாவது காணியாகும்.

மேற்படி இந்த இரண்டு இடங்களும் வெவ்வேறானவை. ஆனால், இப்பொழுது இவை இரண்டும் ஒன்றெனக் குழப்பப்பட்டுள்ளது. 2008ஆம் ஆண்டு குத்தகைக்குப் பெற்ற காணியில் எவ்வாறு 2003ஆம் ஆண்டு தர்மப் பள்ளி பதியப்பட்டு நடத்திவர முடியும் என்பதை நாம் எண்ணிப் பார்க்க வேண்டும். இந்தக் காணியை 2008ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 5ஆம் நாள் அளவீடு செய்த நில அளவைத் திணைக்களமானது, குறிப்பிட்ட காணி கடலோரப் பகுதி என்றும், இது எவ்வித கட்டிடமும் அமைக்கப்பட முடியாத வலயம் என்றும் குறிப்பிட்டிருக்கின்றது. அவ்வாறிருக்கையில், எவ்வாறு அதனுள் கட்டிடம் அமைக்கலாம் என்ற கேள்வி எழுகின்றது. மேலும், இக்காணிக்கு வடக்கு, கிழக்கு, தெற்கு ஆகிய மூன்று பக்கமும் எல்லை கடற்கரை என்றும், மேற்கு எல்லை கோட்டைக்குச் செல்லும் வீதி மற்றும் சவுக்கு மரம் அமைந்துள்ள தோட்டம் என்றும் நில அளவைத் திணைக்களம் தனது குறிப்பில் தெரிவித்துள்ளது.

எது எவ்வாறிருப்பினும், 2004ஆம் ஆண்டின் சுனாமிக்குப் பிந்திய கரையோரப் பாதுகாப்பு மற்றும் கரையோர வளங்கள் முகாமைத்துவச் சட்டத்துக்கமைய, இரண்டாவதாகக்

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

குறிப்பிட்ட அந்த இடத்தில் எந்தக் கட்டிடத்தையும் கட்ட முடியாது. அதாவது, கடற்கரையோரத்திலிருந்து 20 மீற்றருக்குள் எந்தக் கட்டடத்தையும் கட்ட சட்ட அனுமதி இல்லை என்பதனைக் கரையோரப் பாதுகாப்புச் சட்டம் தெளிவாக எடுத்துரைக்கின்றது. இருப்பினும், தற்போதைய இந்தக் கட்டிடத்தை, அதாவது தர்மப் பள்ளியை, கரையோரத்திலிருந்து 10 மீற்றர் தூரத்திற்குள் அமைக்க முனைவது இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் சட்டத்தை அப்பட்டமாக மீறும் செயலாகும். இந்த இடத்தில் ஒரு தர்மப்பள்ளி கட்டப்பட்டு நடத்தப்படும்பொழுது, மீண்டும் ஒரு சுனாமிப் பேரலை ஏற்பட்டால் மாணவர்களின் நிலை என்னவாகும் என்பதையும் நாம் அறிவியல் அடிப்படையில் சிந்தித்துப் பார்க்க வேண்டும். இத்தகைய பேரிடர் மீண்டும் ஏற்பட்டு மனித உயிர்கள் காவுகொள்ளப்படாமல் இருக்க வேண்டுமென்றால், இந்த இடத்தில் எவ்விதக் கட்டிடமும் கட்டுவது பொருத்தமானது அல்ல என்பதனைத் தெரிவித்துக்கொண்டு, சட்டத்தின் ஆட்சியை நிலைநிறுத்த அரசும் நீதித்துறையும் ஆவன செய்யவேண்டும் என்றும் வேண்டிக் கொள்கின்றேன்.

மாண்புமிகு தவிசாளர் அவர்களே, "மதம் என்பது அபினைப் போன்றது" என்று கார்ஸ்ல் மார்க்ஸ் கூறினார். இந்த நாடாளுமன்றத்தில் உள்ள எதிர்க்கட்சி உறுப்பினர் சிலரின் செயற்பாடுகளிலிருந்து இது உண்மை என்பதனை என்னால் அறிந்துகொள்ள முடிகின்றது. மேலும், கார்ஸ்ல் மார்க்ஸ், "ஒரு மனிதனுக்கு அகச் சூழல், புறச் சூழல் என்று இரண்டு நிலை காணப்படுகின்றது. சில மனிதர்கள் புறச் சூழலால் மாறியிருப்பவர் போலத் தோன்றினாலும், அகச் சூழலால் மாறியிருக்க மாட்டார்கள்" என்றும் குறிப்பிடு கின்றார். அதுவும் உண்மை என இந்த உறுப்பினர்களின் செயற்பாடுகளிலிருந்து அறிந்துகொள்ள முடிகின்றது. அதாவது, இவர்கள் இன, மத வாதம் அற்றவர்கள் போலக் காணப்பட்டாலும், அகச் சூழலால் மாற்றப்படாதவர்களாகவும், உண்மையில் இன, மத வாதத்தினைத் தூக்கிச் சுமப்பவர் களாகவும் காணப்படுகின்றனர். இவர்கள் குழம்பிய குட்டை யில் மீன்பிடிக்க முனைகின்றனர். இந்த இனவாதிகளின் கூச்சலுக்கு எடுபடாமல், அமைதி காத்துவரும் திருகோணமலை வாழ் சிங்கள, தமிழ் மக்களுக்கு எனது உளமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மாண்புமிகு தவிசாளர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான பாதீட்டின் மீதான விவாதத்தில் கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சுத் தொடர்பாக எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன். அரசால் முன்வைக்கப்பட்டுள்ள 2026ஆம் ஆண்டுக்கான பாதீட்டில் இந்த அமைச்சுக்கு மீண்டெழும் செலவுக்காக 27.4 பில்லியன் ரூபாயும், மூலதனச் செலவுக்காக 11.2 பில்லியன் ரூபாயுமாக மொத்தம் 38.6 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது மொத்தப் பாதீட்டில் 0.9 சதவீதமாகும். கடந்த ஆண்டுடன் ஒப்பிடும்போது இது 23.1 சதவீத அதிகரிப்பைக் காட்டுகின்றது. இருப்பினும் பண வீக்கத்தைக் கணக்கில் எடுத்துப் பார்த்தால் இதன் உண்மையான அதிகரிப்பு 15 சதவீதம் மட்டுமே ஆகும். இந்த ஒதுக்கீடு போதுமானதல்ல. ஆகவே, இது குறைந்தது இரட்டிப்பு ஆக்கப்பட வேண்டும்.

மாண்புமிகு தவிசாளர் அவர்களே, இலங்கைக் குடித் தொகையில் 75 சதவீதமானோர் கிராமப்புறங்களில் வாழ்கின்றனர். எனவே, கிராமிய அபிவிருத்தி என்பது தேசிய வளர்ச்சியின் மிக முதன்மையான கூறாகும். இலங்கையில் நகர்ப்புற வறுமை 10 சதவீதமாகவும், கிராமப்புற வறுமை 28 சதவீதமாகவும் காணப்படுகின்றது. எனவே, கிராமிய வறுமை ஒழிப்புத் திட்டங்களில் அரசு கூடுதல் கவனம் செலுத்த வேண்டும்.

இலங்கையின் கிராமப் புறங்களில் இன்னமும் வேளாண்மை உற்பத்தித்திறன் குறைவு, விவசாயிகளின் வருவாய் நிலையின்மை, குடிநீர்ச் சிக்கல், சாலைப் போக்குவரத்து இடர்பாடு, இளைஞர்களின் அதிகரித்த வேலையின்மை, பெண்களின் குறைந்த தொழில் பங்குபற்றல் வீதம், தொழில்நுட்ப வசதி பற்றாக்குறை முதலியன மிகையாகக் காணப்படுகின்றன. இவற்றைச் சரி செய்யாமல் இலங்கையைப் பொருளாதாரத்தில் மேம்பட்ட நாடாக மாற்ற முடியாது.

ஊரக மற்றும் பிராந்திய மேம்பாடு தொடர்பாக எடுத்துக்கொண்டால், 'பிரஜா சக்தி' என்று அழைக்கப்படும் ஒருங்கிணைந்த ஊரக மேம்பாட்டுத் திட்ட ஒதுக்கீட்டைப் பாதீடு 25,000 மில்லியன் ரூபாயாக அதிகரிக்கிறது. இது நாடு முழுவதையும் உள்ளடக்கி ஒவ்வொரு கிராம அலுவலர் பிரிவிலும் சமூக அபிவிருத்திச் சபைகள்மூலம் செயற் படுத்தப்படும் ஒரு தேசியத் திட்டமாகும். இது உள்ளூர் சமூகத்தால் அடையாளம் காணப்பட்ட திட்டங்களுக்கு நிதியளிக்கும் சாத்தியமான ஒரு வழி என முன்மொழியப் பட்டுள்ளது. எனினும், கிராம மட்டத்தில் கிராம அபிவிருத்திச் சங்கங்கள், மகளிர் கிராம அபிவிருத்திச் சங்கங்கள், சனசமூக நிலையங்கள், கமக்காரர் அமைப்புகள், கடற்றொழிலாளர் அமைப்புகள் எனப் பற்பல ஊரக மட்ட அமைப்புகள் இருக்கும்பொழுது, புதிதாக சமூக அபிவிருத்திச் சபை என்னும் ஓர் அமைப்பை நிறுவி, அதன்மூலம் தேவைகளை அடையாளங்காண முற்படுவதானது அபிவிருத்தியை நோக்காகக் கொண்டதாக அல்லாமல் அரசியலை நோக்காகக் கொண்டதாக இருப்பதாக ஆய்வாளர்கள் கருதுகின்றனர். இதனை மாற்றியமைக்க அரசு ஆவன செய்ய வேண்டும்.

இந்த அமைச்சானது உலக வங்கி, ஆசிய அபிவிருத்தி வங்கி, உலக உணவுத் திட்டம் ஆகியவற்றிடமிருந்து 3,567 மில்லியன் ரூபாய் வெளிநாட்டு நிதியுதவியைப் பெற்றுள்ளது. இந்த உதவிகளிலிருந்து உணவு நிவாரண நிகழ்ச்சித் திட்டத்திற்காக 3,140 மில்லியன் ரூபாயை ஒதுக்கியுள்ளது. இது முதன்மையான உணவுப் பாதுகாப்பு ஆதரவை வழங்குகின்றது.

2024ஆம் ஆண்டின் பாதீட்டில் சமூக சேவைகள் திணைக்களம் மற்றும் சமுர்த்தி அபிவிருத்தித் திணைக்களம் ஊடான நலன்புரிச் செயற்பாடுகளுக்கான ஒதுக்கீடானது 50.7 பில்லியன் ரூபாயாகக் காணப்பட்டது. இருப்பினும் இது 2025ஆம் ஆண்டின் பாதீட்டில் 23.7 பில்லியன் ரூபாயாகவும், 2026ஆம் ஆண்டுக்கான பாதீட்டில் 29 பில்லியன் ரூபாயாகவும் குறைக்கப்பட்டுள்ளமை மகிழ்ச்சியான விடய மல்ல!

இந்த அமைச்சுக்கான மொத்த ஒதுக்கீட்டின் 71 சதவீதத்துக்குச் சமுர்த்தித் துறை ஆதிக்கம் செலுத்துகிறது. 1.5 மில்லியன் குடும்பங்கள் சமுர்த்தி உதவியைப் பெறுகின்றன. இது அண்ணளவாக 6 மில்லியன் தனி ஆட்கள் அல்லது மக்கள் தொகையின் 28 சதவீதத்தை உள்ளடக்கியது. இந்தத் தொடர்ச்சியான முதலீடு அடிப்படைச் சமூக உறுதிப்பாட்டைப் பராமரிக்கின்றது. மேற்கூறிய செயற்பாடானது, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக மேம்பாட்டின் பிற வடிவங்களைவிட

நேரடிப் பணப் பரிமாற்றத் திட்டங்களுக்கு அரசாங்கம் முன்னுரிமையளிப்பதை எடுத்துக் காட்டுகின்றது. இருப்பினும் சில கவலைகளும் உள்ளன. அதாவது, இந்த அமைச்சுக்கு ஒதுக்கப்படும் ஒவ்வொரு 100 ரூபாயிலும் 63 ரூபாய் ஊழியர் ஊதியத்திற்காகவும், 6 ரூபாய் நிருவாகப் பராமரிப்புக்காகவும் செலவிடப்படுகின்றது. 31 ரூபாய் மட்டுமே பயனாளிகளைச் சென்றடைகின்றது. ஒரு நிதியொதுக்கீட்டில் ஏறத்தாழ 20 சதவீதம் மட்டுமே நிருவாகச் செலவுக்குச் செல்ல வேண்டும் என்பது சமூகப் பாதுகாப்புத் திட்டங்களுக்கான சிறந்த பன்னாட்டு நடைமுறையாகும். இலங்கையில் இது 69 சதவீதமாகக் காணப்படுவது பயனுறுதி வாய்ந்த விடயம் அல்ல. இது ஒரு தலைகீழ் முன்னுரிமை முறையாகும். இந்தோனேசியாவின் சமூகப் பாதுகாப்பு அமைப்பு 40 மில்லியன் பயனாளிகளுக்கு 15,000 ஊழியர்மூலம் சேவை செய்கின்றது. இது ஓர் ஊழியருக்கு 2,667 பயனாளிகள் என்ற அடிப்படையில் அமைகிறது. எனினும், இலங்கையில் இத்துறையில் 67 குடும்பங்களுக்கு ஓர் அரச ஊழியர் சேவை செய்கின்றார். அந்நாட்டுடன் ஒப்பிடுகையில், இலங்கை 40 மடங்கு குறைவான செயற்றிறன் கொண்ட நாடு என்பதை இது சுட்டிக் காட்டுகின்றது.

'அஸ்வெசும' பயனாளிகள் வலுவூட்டல் திட்டத்திற்காக 2025ஆம் ஆண்டில் 1,500 மில்லியனும், 2026ஆம் ஆண்டில் 4,200 மில்லியனும் ஒதுக்கப்பட்டுள்ளது. இது மகிழ்ச்சியான விடயமாகும். எனினும் 'அஸ்வெசும' நலன்புரிக் கொடுப்பனவு பெறுபவர்களில் மாற்றுத் திறனாளிகளையும் மற்றவர்களையும் வேறு பிரித்து, மற்றையவர்களுக்கு 'அஸ்வெசும' கொடுப்பனவு வழங்கும் காலத்தில் வினைத்திறன் மேம்பாட்டுப் பயிற்சிகளை அளித்து அவர்களை முடிந்தளவு விரைவில் தொழிற்படையில் இணைக்க வேண்டும். கனடா நாட்டில் நலன்புரிக் கொடுப்பனவு பெறுவோர் அதனைப் பெற்றுக்கொண்டு வீட்டில் இருக்க முடியாது. அவர்கள் வினைத்திறன் மேம்பாட்டுப் பயிற்சிக்குக் கட்டாயம் செல்ல வேண்டும்; பொருத்தமான வேலை ஒன்றைத் தேட வேண்டும். ஐக்கிய அமெரிக்க நாட்டில் ஒருவர் தனது வாழ்நாளில் 3 ஆண்டுக்குமேல் நலன்புரிக் கொடுப்பனவைப் பெற முடியாது; அந்தக் காலப்பகுதிக்குள் அவர் தனது வினைத்திறனை வளர்த்து, பொருத்தமான வேலையைத் தேடிக்கொள்ள வேண்டும்.

குடியரசுத் தலைவர் அவர்கள் தனது பாதீட்டு உரையில் நாட்டின் மொத்த சனத்தொகையில் ஏழு சதவீதமாக உள்ள மாற்றுத்திறனாளிகள் மற்றும் சிறப்புத் தேவைகள் உள்ளோருக்குப் பொது இடங்களில் அணுகல் மற்றும் சுகாதார வசதிகளை உறுதிசெய்ய 1,000 மில்லியன் ரூபாய் ஒதுக்கீட்டை முன்மொழிவதாகக் குறிப்பிட்டிருந்தார். இது வரவேற்கத்தக்க விடயமாகும். அபிவிருத்தி அடைந்த நாடுகளில் மாற்றுத் திறனாளிகள் மற்றும் சிறப்புத் தேவைகள் உள்ளோருக்கு அனைத்துப் பொதுப் போக்குவரத்துச் சேவைகளிலும் பொது இடங்களிலும் அணுகல் வசதிகள் செய்து கொடுக்கப் பட்டுள்ளன. இதனைக் கருத்திற்கொண்டு இந்த அரசும் இதனை நடைமுறைப்படுத்த ஆவன செய்ய வேண்டும்.

தலசீமியா நோயாளிகளுக்குச் சலுகை வழங்க 250 மில்லியன் ரூபாய், நரம்பியல் வளர்ச்சிக் குறைபாடுள்ள குழந்தைகளுக்கான பகல் நேரப் பராமரிப்பு நிலையம் அமைக்க 500 மில்லியன் ரூபாய், குறைந்த வருமானம் கொண்ட குடும்பங்களைச் சேர்ந்த மாற்றுத்திறனுடைய மாணவர்களுக்குக் கொடுப்பனவு வழங்க 53 மில்லியன் ரூபாய் ஆகிய ஒதுக்கீடுகளும் முன்மொழியப்பட்டுள்ளது. இதுவும் வரவேற்கதக்க விடயமாகும். மாற்றுத்திறனாளிகள் மற்றும் சிறப்புத் தேவைகள் உள்ளோருக்கு அரச சேவையில் மூன்று சதவீதம் ஒதுக்கீட்டைச் செயற்படுத்த நடவடிக்கை எடுக்கப்படும் எனக் குடியரசுத் தலைவர் அறிவித்தமை மேலும் மகிழ்ச்சி தரும் விடயமாகும். இந்த அறிவித்தலைச் செயற் படுத்துவதனை அரசு உறுதிப்படுத்த வேண்டும்.

இந்த அமைச்சுக்கான மூலதனச் செலவு 11,200 மில்லியன் ரூபாய் என வகைப்படுத்தப்பட்டாலும், அதில் 92.6 சதவீதமானவை உட்கட்டமைப்பு முதலீடு அல்ல, இது மூலதனப் பரிமாற்றங்களைக் கொண்டுள்ளது. இவை ஒருமுறை மானியங்கள் மற்றும் கொடுப்பனவுகளாகும். அவை நன்மை பயக்கும் என்றாலும், நீடித்த சொத்துகளை உருவாக்காது. உண்மையான மூலதன முதலீடென்பது, எடுத்துக்காட்டாக, 25 ஆண்டுகளுக்கு ஆண்டுதோறும் 100,000 பேருக்குச் சேவை செய்யும் 200 தொழிற் பயிற்சி மையங்களை அமைத்தல்; விவசாயிகளை வாங்குபவர்களுடன் இணைக்கும் கிராமப்புறச் சந்தை வசதிகளை உருவாக்குதல்; இணையவழிச் சேவை வழங்கலைச் செயற்படுத்தும் எண்மிய உட்கட்டமைப்பை நிறுவுதல்; தொடர்ச்சியான வேலை வாய்ப்பை உருவாக்கும் நிலையான சமூக நிறுவனங்களை நிறுவுதல் முதலியவற்றை உள்ளடக்கியது என்பதனை அரசு கருத்திற்கொள்ள வேண்டும். அவற்றுக்குப் பதிலாக, இங்கு உடனடி நுகர்வுக்கான பணம் மற்றும் மானிய உதவியே வழங்கப்படுகின்றது. இதனால் பயனாளிகள் அடுத்த ஆண்டு அதே கட்டமைப்பு வறுமைக்குள் தள்ளப்படுவார்கள்.

கிராமிய அபிவிருத்தி தொடர்பாக இந்தியாவின் பட்டறிவில் இருந்து நாம் பல பாடங்களைக் கற்றுக் கொள்ளலாம். இந்தியா கிராமிய அபிவிருத்தி துறையில் கடந்த 20 ஆண்டுகளில் பெரும் முன்னேற்றத்தை எட்டியுள்ளது. குறிப்பாக, மூன்று முதன்மையான திட்டங்கள் வழியாக இதனை அடைந்துள்ளது. இவை இலங்கைக்கு வழிகாட்டி யாகின்றன. அதில் முதலாவது, கிராமிய சாலைத்திட்டம். இந்தத் திட்டத்தின்மூலம் இந்தியாவின் 180,000க்கும் மேற்பட்ட கிராமங்கள் தரமான சாலைகளால் இணைக்கப் பட்டுள்ளன. இதன் விளைவாக விவசாயப் பொருட்களின் சந்தை அணுகல் வீதம் இரட்டிப்பாகியுள்ளது; மாணவர் மற்றும் மகளிர் எளிதாகப் பயணிக்கும் சூழல் உருவாகியுள்ளது; மருத்துவ சேவைகள் விரைவாக்கம் பெற்றுள்ளது. இதுபோன்ற ஒரு தேசிய கிராமிய சாலை இணைப்புத் திட்டம் இலங்கையிலும் செயற்படுத்தப்படுவது கிராமிய அபிவிருத்தியை விரைவாக்கும்.

இரண்டாவது, சுய உதவிக் குழுக்கள்மூலம் பெண்களை வலுவூட்டும் திட்டம். இதன்மூலம் இந்தியாவில் 80 மில்லியன் பெண்கள் இணைக்கப்பட்டுள்ளனர். இதன் விளைவாகப் பெண்களின் வருவாய் உயர்ந்துள்ளது; குடும்பநிதி மேலாண்மை மேம்பட்டுள்ளது; சிறு தொழில் உருவாக்கம் வளர்ச்சி கண்டுள்ளது. இலங்கையில் நலன்புரிக் கொடுப்பனவு பெறும் பெண்களை மையமாகக்கொண்டு பெரிய அளவில் இத்திட்டத்தை உருவாக்க முடியும்.

மூன்றாவதாக, கிராமப்புற எண்மிய மாற்றம். இதன்மூலம் இணையவழி இணைப்பு, இலத்திரனியல் சுகாதாரம், இலத்திரனியல் கல்வி, விவசாயிகளுக்குச் சமகாலச் சந்தைத் தகவல் வழங்கல் முதலியன மிகவும் மேம்பட்டுள்ளன. இந்தப் பட்டறிவுகளை இலங்கையும் பின்பற்றுவது நன்மைபயக்கும். இந்த முன்மொழிவுகளைச் செயற்படுத்துவதில் துணிச்சலான நடவடிக்கைகளை எடுக்குமாறு கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன்.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இறுதியாக, நேற்றைய தினம் தொல்லியல் திணைக்களமானது எமது அயல் மாவட்டமான மட்டக்களப்பு மாவட்டத்தில் பட்டிப்பளை, செங்கலடி, கிரான், வாகரை, வெல்லாவெளி பிரதேச செயலகப் பிரிவுகளின் சில பகுதிகளில் பதாகைகளைக் கட்டி அடையாளமிட்டிருக்கின்ற விடயத்தைச் சபையின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகிறேன். கடந்த ஆண்டுகளிலும் தொல்லியல் திணைக்கள அதிகாரிகள், சர்ச்சைக்குரிய மதகுரு ஆகியோர் அங்கு பல பிரச்சினைகளைத் தோற்றுவித்தார்கள். இம்முறையும் அவ்வாறு பிரச்சினை களைத் தோற்றுவித்தால் மேலும் இன ஒற்றுமைக்குச் சிக்கல் ஏற்படலாம் என்று மக்கள் அச்சம் கொள்கின்றார்கள். இந்த விடயத்தில் அரசு தலையிட்டு அமைதியை நிலைநாட்ட வேண்டுமென்று கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Nandana Pathmakumara. You have 10 minutes.

[අ.භා. 12.19]

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් සාකච්ඡා වන අද දවසේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න මට පුංචි හෝ වේලාවක් ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා. අපි මොන තරම් අභාග්‍ය සම්පන්න, ඛේදජනක තත්ත්වයන්ට මුහුණ දුන්නු රටක්ද, පුරවැසියන්ද? අපේ රටට නිදහස ලැබිලා මේ වනකොට අවුරුදු 77ක් වනවා. ඒ අවුරුදු 77න්, අවුරුදු 76ක් රට පාලනය කළේ කවුද, මම කලින් කිව්වා වාගේ මේ රට එතරම් ඛේදජනක තත්ත්වයකට රැගෙන ගියේ කවුද කියලා මේ රටේ ජනතාව දන්නවා. ඒ අවුරුදු 76 තිස්සේ කරපු, කියපු දේවල් අමතක වෙලා වාගේ තමයි අද ඒ අය මේ අය වැය විවාදය තුළ බොහෝ දේ ප්‍රකාශ කරන්නේ. බොහෝ විට ඔවුන්ගේ අදහස් තුළ තිබෙන්නේ ඔවුන් කරපු, කියපු දේවල් වාගේම විවිධ සංඛ්‍යාලේඛන සහ වියදම් කළ විධිය වාගේ නොයෙක් දේවල්. හැබැයි, ඔවුන් මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ සේවය හරියට, නිසියාකාරව ඉෂ්ට කළා නම්, අද අපේ රටේ මෙච්චර දිළිඳුභාවයක් තිබෙන්න විධියක් නැහැ.

අපි දන්නවා, අපේ රටේ ජනතාවගෙන් සියයට 16.6ක් දරිද්‍රතාවෙන් පෙළෙන බව. ඒ සියයට 16.6 ඇතුළේ ඉන්න සෑම පුරවැසියන් 6දෙනෙකුගෙන් එක් අයෙක් බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන තැනට අද මේ රට පත් වෙලා ඉවරයි. ඒ වාගේම අපි දන්නවා, ඒ සියයට 16.6 ඇතුළේ ජීවත් වන ජනතාවගෙන් සියයට 95.3ක්ම ග්‍රාමීය වතු ආශ්‍රිතව ජීවත් වන බව. එම නිසා ඒ ජනතාවගේ ජීවිත වෙනස් කිරීම සඳහා වූ දැවැන්ත වගකීම් කොටසක් අපට පැවරී තිබෙනවා. ඔවුන් ඒ වැඩේ හරියට නොකළ නිසා තමයි ඒක දැන් අපට භාර වෙලා තිබෙන්නේ. පසුගිය කාලයේ මේ රට පාලනය කළ ආණ්ඩු විසින් "සමෘද්ධිය", "අස්වැසුම", "දිවි නැඟුම" වැනි නොයෙක් සුබසාධන වැඩසටහන් ගෙනා බව අපි දන්නවා. හැබැයි, ඒ ගෙනා කිසිම වැඩසටහනක් තුළින් ජනතාවගේ දුප්පත්කම නැති කරන්න ඔවුන්ට හැකියාවක් ලැබුණේ නැහැ. ජනතාව ඒ විධියටම තවමත් දුප්පත්භාවයෙන් පෙළෙමින් තමයි ජීවත් වෙන්නේ. දුප්පත්භාවයෙන් පෙළෙන ඒ සියලු ජනතාව ඉන් මුදා ගැනීම සඳහා අපේ ආණ්ඩුව තුළින් වැඩසටහන් විශාල ප්‍රමාණයක් සූදානම් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, බොහෝදෙනෙකුට ජීවත් වීම සඳහා නිවසක් පවා නැති බව. ඒ වාගේම සෞඛ්‍ය පහසුකම් නැහැ. හොඳ පරිසර තත්ත්වයක් නැහැ. එම නිසා බොහෝ විට එම ජනතාව මතට ඇබ්බැහි වෙලා තිබෙනවා. අන්න ඒ ජීවිත වෙනස් කරන්න සහ පරම්පරා ගණනාවක් තිස්සේ එන ඒ දිගුව වෙනස් කිරීම සඳහා තමයි අපි මේ සියලු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉන්නේ. ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, අන්තර්කරණීය සමාජ ආරක්ෂණ වැඩසටහන හා සමාජ සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනික ආයතන වැඩසටහන ආදී වශයෙන් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයට අදාළ කරන විශේෂ වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒ වැඩසටහන් හතර තුළින් පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට ගෙනැවිත් දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි මේ වැඩසටහන් ක්‍රියාත්මක කරලා සුවපහසු රටක්, ආරක්ෂිත රටක්, ධනවත් රටක්, ශක්තිමත් රටක් බවට මේ රට පත් කරනවා වාගේම දිළිඳුභාවයෙන් පෙළෙන ජනතාවට පරිපූර්ණ ජීවිතයක්, ගෞරවනීය ජීවිතයක්, නවීන ජීවිතයක් වාගේම අභිමානවත් ජීවිතයක් ලබා දෙන්න තමයි අපි සැලසුම් හදලා තිබෙන්නේ.

ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයට අදාළව මා ප්‍රකාශ කළ වැඩසටහන් හතර සඳහා අපි වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය බැලුවොත්, ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන් සඳහා අපි රුපියල් මිලියන 2,856.35ක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට රුපියල් මිලියන 5,220ක්, අන්තර්කරණීය සමාජ ආරක්ෂණ වැඩසටහනට රුපියල් මිලියන 3,547ක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කරන්න, ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නංවන්න විතරක් නොවෙයි, ඔවුන්ගේ සමාජ ජීවිතය වෙනස් කරන්න ප්‍රජාශක්ති වැඩසටහනට අපි රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අඩු ආදායම්ලාභී පවුල්වලට මුදල් ප්‍රදානය සඳහා අපි රුපියල් බිලියන 151.3ක් වෙන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මීට පෙර ඉදිරිපත් කළ කිසිම අය වැයක නැති විධියට අපි මෙවර අය වැයෙන් ආබාධිත පුද්ගලයන් ඇතුළු මේ සමාජයේ සෑම ජන කොටසක් වෙතම විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. සමාජයේ ජීවත් වන ආබාධිත පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ට සහන දීම සඳහා අපි රුපියල් මිලියන 19,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ ජනතාවගේ පහසුව සඳහා, ඔවුන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා අදාළ කරන ස්ථාන තැනීම වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක් අපි වෙන් කරලා තිබෙනවා. මේ අය වැය ඒ විධියට සමාජයේ සෑම කොටසක් කෙරෙහිම අවධානය යොමු වෙච්ච අය වැයක් කියලා අපි විශ්වාස කරනවා.

මේ අය වැය තුළ තිබෙන විශේෂත්වය තමයි, රට ගොඩ නැඟීමේ, මේ රටේ දිළිඳුභාවය තුරන් කිරීමේ කටයුත්තේදී සෑම අමාත්‍යාංශයක්ම ඒකාබද්ධ වන විධියට; ඒ, ඒ අමාත්‍යාංශ එකිනෙකට ගැළපෙන විධියට අය වැය සකස් කර තිබීම. විශේෂයෙන් දිළිඳු පවුල්වල දරුවන්ගේ ජීවිත වෙනස් කිරීම සඳහාත් අපි මෙවර විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. ඒ දිළිඳු පවුල්වල පෙර පාසල් යන දරුවන්ගේ උදෑසන ආහාර වේල ලබා දීම සඳහා අපි රුපියල් බිලියන 3.5ක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ දිළිඳු පවුල්වල දරුවන්ට පාසල් නිල ඇඳුම් ටික ගැනීම සඳහා අපි රුපියල් බිලියන 6.4ක්

වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දුෂ්කර පාසල්වල දරුවන්ට පාවහන් ගැනීම සඳහා රුපියල් බිලියන 2.5ක් වෙන් කරලා තිබෙනවා. මේ වාගේ සෑම අමාත්‍යාංශයක්ම එකිනෙකට බද්ධ වෙච්ච විශේෂ වැඩ පිළිවෙළක් තමයි මේ අය වැය තුළ තිබෙන්නේ. මේ අය වැය 2025ට, 2026ට, 2027ට සීමා වෙච්ච එකක් නොවෙයි. 2025 සිට 2030 දක්වා මේ සමාජය දිළිඳුභාවයෙන් මුදා ගැනීමේ වැඩසටහන් තමයි අපි මේ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. විපක්ෂය මේ කාර්යය හරියට කළේ නැති නිසා තමයි අපට එය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන එකත් මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ. අපි රජයේ වගකීමක් ලෙස මේ කාර්යය භාර ගෙන තිබෙනවා.

මේ සියලු වැඩසටහන් අතර මේ රටේ ආබාධිත පුද්ගලයන්, වැඩිහිටි පුද්ගලයන් රැක බලා ගැනීමේ කාර්යයත් අපට තිබෙනවා. මේ වනවිට අපේ සමාජයේ වැඩිහිටියන් ප්‍රමාණය ඉතා වේගයෙන් වැඩි වෙමින් තිබෙනවා. අපේ රටේ දරු උපත් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. වැඩිහිටි ජනගහනය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා වැඩිහිටියන් විශාල ප්‍රමාණයක් අනාරක්ෂිතභාවයෙන් පෙළෙන බව අපි දන්නවා. අන්න ඒ අනාරක්ෂිතභාවයෙන් පෙළෙන වැඩිහිටියන් කෙරෙහි අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. පසුගිය දවස්වල මාධ්‍යවල පළ වෙලා තිබුණා, දවසකට වැඩිහිටියන් 25,000කට වැඩි ප්‍රමාණයක් මහ පාරේ රැය පහන් කරනවා කියලා. ඒ, ඔවුන්ට තිබෙන අනාරක්ෂිතභාවය නිසා. ඒ විතරක් නොවෙයි. 8,800කට වැඩි ප්‍රමාණයක් කාත් කවුරුවත් නැතිව වැඩිහිටි නිවාසවල ජීවත් වෙනවා කියලා අපි දැක්කා. අපි මෙන්න මේ වැඩිහිටි ජනගහනය කෙරෙහිද විශේෂ අවධානය යොමු කරලා ඔවුන්ගේ ජීවිත වෙනස් කිරීම සඳහා මේ අය වැය තුළින්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය හරහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වැඩිහිටි ජනගහනය බලා ගැනීමේ වගකීම අපි ආණ්ඩුවක් ලෙස භාරගෙන තිබෙනවා. දිළිඳුභාවය තුරන් කර, වැඩිහිටි ජනගහනයට හොඳ සුරක්ෂිත ජීවිතයක් හදලා දීමට, ඒ වාගේම මේ සමාජයේ ජීවත්වන ආබාධිත පුද්ගලයන්ගේ රැකවරණය ඇතුළු ඒ කටයුතු සියල්ලම භාර ගන්න, ඒ සඳහා වග කියන රජයක් ලෙස අපි වැඩ කරගෙන යනවා. මේ 2026 අය වැය තුළින් ඒ විශ්වාසය රටේ ජනතාව තුළ ඇති වෙලා තිබෙනවා. මේ වසර 5 ගත වෙනකොට අපි අනිවාර්යයෙන් මේ සමාජය දිළිඳුභාවයෙන් මුදාගෙන, මේ රට පොහොසත් රටක් කරලා ජනතාවට ලස්සන ජීවිතයක්, සුරක්ෂිත ජීවිතයක් ළඟා කර දෙනවා කියන විශ්වාසය තබමින්, රටේ ජනතාවට ඒ ගැන බලාපොරොත්තු තබා ගන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The ongoing Proceedings of the Committee of the whole Parliament shall stay suspended till 1.30 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට වෙන් කර තිබුණු කාලය අඩු වෙලා. කෙසේ වෙතත්, මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්.

අය වැය කාරක සභා අවස්ථාවේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේත්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයයි අද පැවැත්වෙන්නේ. මේ අමාත්‍යාංශ විෂයයන්ට අදාළව ගත් කල, අද මේ රට තිබෙන තැන පිළිබඳව අපි අමුතුවෙන් කථා කරන්න අවශ්‍ය නැහැ. මෙහිදී අපට අමතක කරන්න බැහැ, මහින්ද රාජපක්ෂ යුගය. මහින්ද රාජපක්ෂ යුගයේ විශේෂයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කරලා, වරාය හදලා, ගුවන් තොටුපොළ හදලා, මාර්ග පද්ධති හදලා කර්මාන්ත සංවර්ධනය වෙනුවෙන්, ව්‍යවසායකයන් දිරි ගැන්වීම වෙනුවෙන් දැවැන්ත පියවරක් තැබුවා; දැවැන්ත කාර්ය භාරයක් ඉටු කළා. අපට මතකයි, එතුමා හම්බන්තොට වරාය හදලා, ගුවන් තොටුපොළ හදලා, අධිවේගී මාර්ග හදලා දැවැන්ත කර්මාන්ත පුර නිර්මාණය කළ හැටි. හැබැයි විවිධ හේතු මත, විවිධ ආණ්ඩු මාරුවීම් මත ඒ දේවල් සාර්ථක කර ගන්න පුළුවන් වුණාද, නැද්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ විෂය ගැන කථා කරන කොට අපට අතීතය පිළිබඳව කථා නොකරම බැහැ. මෙය, අතීතයෙන් බැහැර වෙලා වර්තමානය ගැන කථා කරන්න ඕනෑ මොහොතක් වුණත්, අතීතයට අවලාද නඟමින් කථා කළ යුතු මොහොතක් නොවුණත්, පසුගිය 76 වසර ගැන කථා නොකර අපට ඉදිරියට යන්න බැහැ.

විශේෂයෙන්ම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හරහා සුළු හා මධ්‍ය පරිමාණ වාගේම මහා පරිමාණ ව්‍යවසායකයන් නඟා සිටුවන්න නොහැකි වීමට අතීතයේ මේ රටේ පැවැති අයහපත් තත්ත්වයන් ඉවහල් වුණා කියන කාරණය අපට අමතක කරන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. විශේෂයෙන්ම 30 වසරක ශාපලත් යුද්ධය, ඒ වාගේම 1971-1989 ජනතා අරගළය හෙවත් ජනතා විමුක්ති පෙරමුණ මැදිහත් වෙලා සිදු කරපු ජනතා අරගළය, කළු ජූලිය, සුනාමි ව්‍යසනය, සහරාන්ගේ ප්‍රහාරය, ළඟම උදාහරණය වන කොරෝනා වසංගතය, ඒ වාගේම පසුගිය ආණ්ඩුව මුහුණ දීපු අරගළය යන සියල්ල අමතක කරමින් ඉදිරියට යන්න අපට බැහැ. විශේෂයෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රය ඉදිරියට නොයන්න, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නඟා සිටුවීමට නොහැකි වෙන්න ඒ පැවැති අයහපත් තත්ත්වයන් ඉවහල් වුණා කියන කාරණය අපට පිළිගන්න වෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වත්මන් ආණ්ඩුවට ඒ ගැටලුවලින් පරිබාහිරව ඉතාම නිදහසේ කටයුතු කරන්න පුළුවන් මාවතක් විවර වෙච්ච වෙලාවක තමයි අද අප මේ විවාදයට එළඹ තිබෙන්නේ. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, සුළු හා මධ්‍ය පරිමාණ, මහා පරිමාණ ව්‍යවසායකයන් ගොඩනඟන්න මේ ආණ්ඩුවට අවස්ථාවක් තිබෙන බව. මේ විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනය මේ රට තුළ යථාර්ථයක් බවට පත් කරමින් මේ රටට දැවැන්ත ආයෝජන ගෙන එන්න

[ගරු වාසනක මාදුගොඩ මහතා]

අවශ්‍ය වටපිටාව, පරිසරය අද සකස් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ අවස්ථාව හොඳින් පාවිච්චි කරයි කියන විශ්වාසය ඇතිව අපි මේ කථාව ඉදිරියට ගෙන යමු.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ විෂය ගැන කථා කරන කොට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් ගැන අප කථා කළ යුතුම වෙනවා. අද ඔවුන් විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දීලා සිටිනවා. විශේෂයෙන්ම ඔප නොදැමූ මැණික් ගල් ආනයනය කිරීමේදී අද ඔවුන්ට දැවැන්ත බද්දක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. සියයට 18කට ආසන්න බද්දක් ගෙවන්න සිදු වීම නිසා එම කර්මාන්තයට අදාළව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයේ යෙදෙන අය අද විශාල ගැටලුවකට මුහුණ පා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටට රත්‍රන් ආනයනය කිරීමේදීත් විශාල බද්දක් ගෙවීමට සිදු වීම නිසා අද මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් විශාල ගැටලුවකට මුහුණ දී සිටිනවා. අප විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ, පුළුවන් නම් ඒ බද්ද අඩු කරලා ඒ ව්‍යාපාරය කරගෙන යන්න පුළුවන් වටපිටාවක් ගොඩ නඟලා දෙන්න කියලායි. එහෙම නැත්නම් පෙර පැවැති ක්‍රමවේදයම සකස් කරලා දෙන්න කියන ඉල්ලීම මා මේ මොහොතේ කරන්න කැමැතියි.

අපි සතුටු වෙනවා, විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ ආණ්ඩුව 2030 වර්ෂය වන විට සංචාරක ව්‍යාපාරයේ ආදායම ඩොලර් බිලියන 10ක් දක්වා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් දියත් කර තිබීම ගැන. හැබැයි, සංචාරක ව්‍යාපාරය හා ඉතාම සෘජුව සම්බන්ධ වන මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වගකීමක්. ඔබතුමන්ලා දන්නවා ඇති, එම කර්මාන්තයේ යෙදෙන ඔවුන් ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන ඒමේදීත් විශාල බද්දක් මේ රජයට ගෙවන බව. ඒ වාගේම අමුද්‍රව්‍ය නිමැවුමක් බවට පත් කරලා ඒ නිමැවුම් භාණ්ඩ වෙළෙඳ පොළට යැවීමේදීත් ඔවුන් විශාල බද්දකට යටත් වෙලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියාත් විෂය භාර ගරු ඇමතිතුමා සභාවේ ඉන්න මේ මොහොතේ මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අපේ ගාල්ල දිස්ත්‍රික්කයට සංචාරක ව්‍යාපාරයට වාගේම විශාල සම්බන්ධයක් තිබෙනවා, කැටයම් කර්මාන්තයටත්. කැටයම් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායකයන් අද දැඩි ප්‍රශ්නයකට මුහුණ දී සිටිනවා. කැටයම් ආශ්‍රිත නිෂ්පාදනකරුවන් "ලක්සල" ආයතනයට භාණ්ඩ ලබා දීමේදී ඔවුන්ට ඒ සඳහා යම්කිසි අත්තිකාරම් මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක් තිබුණා. ගරු ඇමතිතුමනි, නමුත් අද ඒ ක්‍රමවේදය නැහැ. අද ඔවුන්ට ඒ මුදල් ලැබෙන්නේ මාස තුනකට, මාස හයකට, අවුරුද්දකට පමණ පසුවයි. ඒ නිසා අද ඒ කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙනවා. ඔවුන් කුඩා පරිමාණයේ ව්‍යවසායකයන්. අද ඔවුන්ට දැව ලබා ගැනීමේ ප්‍රශ්නයක් ද මතුව තිබෙනවා, ගරු ඇමතිතුමනි. එදා ඔවුන්ට රාජ්‍ය දැව සංස්ථාව හරහා දැව ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් තිබුණා. නමුත් අද මහා පරිමාණයේ ව්‍යවසායකයන්ට පමණයි ඒ දැව ලබා ගන්න හැකියාව ලැබී තිබෙන්නේ. ඒ නිසා කැටයම් කර්මාන්තයේ යෙදෙන කුඩා පරිමාණයේ කැටයම්කරුවන් වෙනුවෙන් ණය පහසුකම් ලබා දෙන්න, ඔවුන්ට අවශ්‍ය උපකරණ ලබා දෙන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි. ඒ පහසුකම් ලබා දී ඔවුන් ශක්තිමත් කිරීම සංචාරක ආදායම ඩොලර් බිලියන 10 දක්වා ගෙන ඒමේ ඔබේ සිහිනය සැබෑ කර ගන්න ඉඩක් ලැබෙන කාරණයක් බව මම මේ මොහොතේ සඳහන් කරනවා.

ඒ වාගේම, විශේෂයෙන්ම මම සිහිපත් කරන්න ඕනෑ, කුඩා ව්‍යවසායක සංවර්ධන අංශය ගැනත්. අපි විශේෂයෙන්ම එම අංශය පිළිබඳව දැඩි ප්‍රසාදයකින් කටයුතු කරනවා. ඒ අංශය සෑම ආණ්ඩු කාලයකම ඉතාම හොඳින් ක්‍රියාත්මක වුණා. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය ක්‍රියාත්මක වුණේ තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේයි කියන එක අපට මතකයි. විශේෂයෙන්ම ජාතික තරුණ සේවා සභාව, ජාතික යොවුන් සේනාංකය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය තරුණ ප්‍රජාව වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් කළා. ඔවුන්ට ඒ සඳහා ශක්‍යතාවක් තිබුණා. ඔවුන්ගේ නිලධාරින් 1,150ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කටයුතු කළා. ඒ අය මඟින් පුහුණු කිරීම්, උපදෙස් ලබා දීම්, වෙළෙඳ අවස්ථා සලසා දීම් වැනි විශාල කාර්යභාරයක් එදා සිදු කළා. හැබැයි, අද කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය තරුණ කටයුතු අමාත්‍යාංශයෙන් කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඔබතුමා ඒ තීරණය ඉතාම හොඳ චේතනාවක් මත ගන්න ඇති කියලා. හැබැයි, ඒ පියවර තුළින් අපේක්ෂා කළ දේවල් යථාර්ථයක් බවට පත් කරන්න පසුගිය කාලයේ බැරි වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ තිබියදී 2012 වර්ෂයේ සිට ව්‍යවසායක ප්‍රදර්ශනයක් පවත්වාගෙන ආවා. එය ඉතාම හොඳ ව්‍යවසායක ප්‍රදර්ශනයක්. ඒ තුළින් තරුණයන්ට ඉතාම හොඳ අවස්ථාවක් ලැබුණා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා තරුණ තරුණියන් 300කට ආසන්න පිරිසකට ඒ සඳහා අවස්ථාව ලැබුණා. රජය මඟින් ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දුන්නා; වෙළෙඳ කුටි, මුදල් ආදි පහසුකම් සියල්ල සපයා දුන්නා. නමුත් ගරු ඇමතිතුමනි, අද ඔබතුමාට ඒ කටයුත්ත යථාර්ථයක් කර ගන්න බැරි වෙලා තිබෙනවා. පසුගිය අප්‍රේල් මාසයේ තමයි BMICH එකේදී ඒ ප්‍රදර්ශනය පැවැත්වෙන්නට නියමිතව තිබුණේ. නමුත්, අදටත් ඔබතුමාට එම ප්‍රදර්ශනය පවත්වා ගන්න බැරි වෙලා තිබෙනවා. එය නැවත වරක් දෙසැම්බර් 05, 06, 07 දක්වා ඉදිරියට ගෙන ගොස් තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම කටයුතු සඳහා ඔබතුමා රුපියල් මිලියන 25ක් වෙන් කළත්, ඊට අවශ්‍ය වෙළෙඳ කුටි ටෙන්ඩරය ලබා දීමට තවම ඔබතුමාට බැරි වෙලා තිබෙනවා. කථාවක් තිබෙනවා ඒ කටයුත්ත නැවතී තිබෙන්නේ ඒ ටෙන්ඩරය ලබා දෙන්න නොහැකි වීම නිසායි කියලා. ගරු ඇමතිතුමනි, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න. ඒක රටේ තරුණයන් වෙනුවෙන් තිබුණු අවස්ථාවක්. ඒ අවස්ථාව නැවත ලබා දෙන්න ඔබතුමා කටයුතු කරයි කියා අපි විශ්වාස කරනවා. ඒ තුළින් අලුත් ව්‍යවසායකයන් ගොඩනැඟෙනවා; ඔවුන්ට වෙළෙඳ පොළක් හැදෙනවා. ඒ වෙළෙඳ පොළ දැකලා තවත් අය ඒ සඳහා ඉදිරිපත් වෙනවා. ඒ නිසා ඒක ඉතාම හොඳ වැඩසටහනක්. ඒ ටෙන්ඩර් ගැටලුව ආදිය නිරාකරණය කරලා ඒ තරුණ ව්‍යවසායකයන්ට තිබුණු අවස්ථාව ඔබතුමා නැවත ලබා දෙයි කියා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම, අපි දිගින් දිගටම මේ සභාවේ අවධානය යොමු කළා පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාවේ ගැටලුව පිළිබඳව. මා ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කළ අවස්ථාවේදී ඔබතුමා ඉතාම සාධනීය පිළිතුරක් ලබා දුන්නා, ගරු ඇමතිතුමනි. අපි ඒ සාධනීය පිළිතුර විශ්වාස කළා. විශේෂයෙන්ම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාව පිළිබඳ ගැටලුව ගත්තාම, අද එම සංස්ථාවේ කම්කරු මහත්ම මහත්මීන් අවුරුදු එකහමාරක් තිස්සේ කිසිදු වේතනයක් ලබා ගන්නේ නැතිව ඔබේ ආයතනය ශක්තිමත් කරන්න කටයුතු කරනවා. ඔවුන් බඳවා ගත් ක්‍රමවේදය පිළිබඳ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත්, ඔවුනුත් මේ රටේ මිනිස්සු. තමන්ගේ දූවා දරුවන්, ඥාතීන් රක්ෂා කිරීම වෙනුවට ඔවුන් අවුරුදු එකහමාරක් තිස්සේ ඥාතීන්ගෙන් යැපෙමින්, ජීවත් වෙමින් අද ඛනිජ වැලි සංස්ථාව

ශක්තිමත් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කම්කරු නීතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සටන් කළා; කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අවුරුදු එකහමාරක් පඩි නැතිව වැඩ කරන ඒ ආදරණීය කම්කරු මහත්ම මහත්මීන්ට සහනයක් සැලසීම වෙනුවෙන් මැදිහත් වෙන්න කියලා. අද වන කොට ඔවුන් දින 40ක් තිස්සේ උපවාසයේ යෙදී සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. 2025 වර්ෂයේ සමාජ ආරක්ෂණය යටතේ ළමා සුරැකුම් මධ්‍යස්ථානවල ධාරිතාව සංවර්ධනය සහ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබුණා. ඒක ඉතාම හොඳ, වටිනා වැඩක්. නමුත්, පාර්ලිමේන්තුවෙන් එහි ප්‍රගතිය විමසුවාම වැය කළ මුදල ගැනවත් අදටත් දැනුවත්කමක් නැහැ. ඒ මුදල වියදම් කරලා, ආණ්ඩුව යෝජනා කරපු කාර්යයන් සිදු කරලා නැහැ. 2025 ජනවාරියේ ඉඳලා මේ දක්වා කර තිබෙන්නේ රැඳවුම් නිවාස ආකෘතියක් පිළියෙල කිරීම සඳහා සාකච්ඡා කිරීම පමණයි. එහි ප්‍රගතියක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. විශේෂයෙන්ම රැඳවුම් නිවාසවල ඉන්න දරුවන්ට ස්ථිර නිවාසයක් තනා ගැනීම වෙනුවෙන් එක් අයෙකුට මිලියනයක නිවාස ආධාරයක් ලබා දෙන්න 2025 වර්ෂයේ අය වැයෙන් යෝජනා කරලා තිබුණා. ඒ සඳහා ඒ අය වැය තුළ රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබුණා. ඒ අනුව දරුවන් 1,000කට නිවාස ආධාර ලබා දෙන්න පුළුවන්. නමුත් තවම කිසිදු නිවසක් හදලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තවම පත් ඉරු පරීක්ෂාව විතරක් කරලා තිබෙනවා 14 දෙනෙකුගේ පමණක්. ඒකේ ප්‍රගතියක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. 2025 අවසන් වෙන්න තවත් දින 40යි තිබෙන්නේ. ඒ දින 40 තුළ ඒක කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

ඔබතුමන්ලා පසුගිය දවස්වල නුගේගොඩ රැලිය ගැන පාර්ලිමේන්තුවේ දී කථා කළා. නුගේගොඩ රැලියට විවිධ දේවල් කිව්වා. අපි නුගේගොඩ රැලිය පවත්වන්නේ ඇයි කියන කාරණය පමණක් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපි නුගේගොඩ රැලිය තියන්නේ මේ ආණ්ඩුව ගෙදර යවන්න නොවෙයි; මේ ආණ්ඩුව ගෙදර යැවීමේ ආකල්පයෙන් නොවෙයි, මේ ආණ්ඩුව නිවැරදි කර ගන්නයි එය පවත්වන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ලබා දීපු පොරොන්දු ඉටු කරවා ගන්න, පොහොසත් රටක්, ලස්සන රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් ඔබ මේ රට හමුවේ තබපු ඒ කාරණා සනාථ කරවා ගන්න, සහතික කරවා ගන්න මේ සමාජය තුළ ඒවා ඉටු කර ගැනීම වෙනුවෙන් තමයි මේ නුගේගොඩ රැලිය පවත්වන්නේ.

එදා ගෙනාපු කන්ටේනර් පෙට්ටි 323 ගැන තවම මේ පාර්ලිමේන්තුවට කියන්නේ නැහැ. පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු කවුද කියන එක ගැන පසුගිය අප්‍රේල් 21වෙනි දා ගරු ජනාධිපතිතුමා මේ සභාවට ඉදිරිපත් කරනවා කිව්වා. නමුත් තවම ඉදිරිපත් කළේ නැහැ. ඉන්දියාවත් එක්ක ගහපු ගිවිසුම් පිළිබඳව තවම අපි දන්නේ නැහැ. ඇමෙරිකාව එක්ක ගහපු ගිවිසුම් ගැන තවම අපි දන්නේ නැහැ.

ඒ වාගේම අද වෛද්‍යවරු දැඩි අපහසුතාවට පත් වෙලා තිබෙනවා. අද රට ඉන්න වෛද්‍යවරුන්ට අපේ රටට එන්න කියනවා. අද අපේ රටේ වෛද්‍යවරු මේ රටින් පිටවෙන්න උත්සාහ ගන්නවා. අද ඔබතුමන්ලා ඒ කියපු දේවල් ක්‍රියාත්මක වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ වාගේම අධ්‍යාපනයට සියයට 6ක් දෙනවා කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටේ පුරවැසියන්ට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩනැඟීම වෙනුවෙන් සුවිශාල වගකීමක් දරන කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ගැන අදහස් දක්වන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙනවා.

මම ලංකාවේ කර්මාන්ත හා ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු පිළිබඳ අධ්‍යයනය කරනකොට පොඩි විමසීමක් කරලා බැලුවා, පසුගිය වසර 75ක කාලය තුළ මේ ක්ෂේත්‍රයේ අපි මොන විදියටද ගමන් කරලා තිබෙන්නේ කියලා. 1950 වෙනකොටත් ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට සියයට 19.6ක දායකත්වයක් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් දක්වලා තිබුණා. 2025 වෙනකොට එය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 25ක් පමණයි. අවුරුදු 75කදී දළ ජාතික නිෂ්පාදිතයට අපි කර්මාන්ත අංශයේ දායකත්වය වර්ධනය කරගෙන තිබෙන්නේ සියයට 5.5කින් පමණයි. එහෙමනම්, අපි අතීතය පිළිබඳ කථා කළ යුතු ද, නැද්ද කියන එක වෙනම තීරණය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ව්‍යවසායකයන් බිහි කරන්න බැහැ ෆැක්ටරියකින් මොනවා හරි නිමැවුමක් එළියට දෙනවා වාගේ; අච්චු ගගහා, කැලි හද හදා එළියට දාන්න පුළුවන්කමක් නැහැ. රටේ කර්මාන්ත ක්ෂේත්‍රයෙන්, ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් ව්‍යවසායකයන්, ආයෝජකයන් බිහි වෙන්න ඕනෑ නම්, ඒකට ගැළපෙන, සුදුසු වටපිටාවක්, වාතාවරණයක්, පරිසරයක් රට තුළ නිර්මාණය වෙන්න ඕනෑ. ඒ නිසා 2025 වර්ෂය පුරාම අපි මේ රටේ කර්මාන්ත හා ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ වැඩිවීම සඳහා, නැත්නම් ඒ සඳහා මිනිස්සු පෙළඹවීම සඳහා, අනාගතයේ අවුරුදු 30, 40කින් හෝ මේ ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා දැඩි වෙහෙසක් ගත්තා, ඒකට අවශ්‍ය සැලසුම් සකස් කළා.

රටේ ඊළඟ පරම්පරාව ගොඩනඟන්නේ අධ්‍යාපනය තුළින්. මේ අධ්‍යාපනය තුළින් අපි කොහොමද මේ රටේ ව්‍යවසායකයන් බිහි වීම වර්ධනය කරන්නේ. පසුගිය අවුරුදු 75 තුළම මේ රටේ අධ්‍යාපනය තුළින් හැම වෙලාවෙම බිහි කළේ රස්සාවක් ඉල්ලන මිනිස්සු. නමුත්, රටේ සංවර්ධනය වෙනුවෙන් විශේෂයෙන් සලකා බලන අපට ඕනෑ වෙන්නේ, අධ්‍යාපනය අවසානයේ තව දෙන්නෙකුට, තුන්දෙනෙකුට, හතර පහකට, සියයකට දෙසියකට රස්සාවල් දෙන්න පුළුවන් මිනිස්සු. ඒ අය තමයි ව්‍යවසායකයෝ. ඒ නිසා අපි වර්තමාන පරම්පරාවට ව්‍යවසායකත්ව සංකල්පය ඉගෙනීම සඳහා පාසලෙන් අස් වනකොට ව්‍යවසායකත්ව

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

මනෝභාවක් - entrepreneurial mindset එකක් - හා මනෝ රීතියක් තිබෙන මිනිස්සු හදන්න සුවිශේෂ වැඩ පිළිවෙළක් සකස් කරනවා.

ලාංකීය අධ්‍යාපන ඉතිහාසයේ පළමුවැනි වතාවට 2026 වර්ෂයේ එළඹෙන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී 6 ශ්‍රේණියේ ඉඳලා ද්විතීයික අධ්‍යාපනය පටන් ගන්න මොහොතේ ඉඳලාම මේ සංකල්පය දරුවන්ට දෙන්න අලුත් subject එකක් හඳුන්වා දීලා දෙනවා. ඒ තමයි, ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව - entrepreneurship and financial literacy - අපට මතකයි, 2007 විෂය මාලා සංස්කරණයේදී සාමාන්‍ය පෙළ විෂයයක් විධියට ව්‍යවසායකත්ව අධ්‍යයනය හඳුන්වා දෙනකොට ලංකාවේ ඇතැම් පිරිස් ජාතික අධ්‍යාපන ආයතනය ඉස්සරහ පෙළපාළි ගියා, අපේ රටට ව්‍යවසායකත්ව අධ්‍යයනය එපා කියලා. එහි ප්‍රතිඵල තමයි අද අපි බුක්ති විඳින්නේ. නිදහසින් පස්සේ දශක හතහමාරක් ගෙවී ගිහිල්ලාත් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් අපේ දළ ජාතික නිෂ්පාදිතයට දායකත්වය ලැබෙන්නේ සියයට 25ක් පමණයි. මෙවර නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් 10, 11 ශ්‍රේණිවලත් ව්‍යවසායකත්ව අධ්‍යයන විෂය එසේම පවත්වාගනිමින් කලින් නොතිබුණු නමුත්, උසස් පෙළ වාණිජ විෂය ධාරාවට ඉදිරියේදී අපි ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂයක් විධියට එකතු කරනවා. එයින් අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ අධ්‍යාපනයට එන සෑම කෙනෙකුම අනාගතයේ තමන් යන ඕනෑම ක්ෂේත්‍රයකදී ඒ අවදානම් භාරගෙන, පරිසරයේ තිබෙන අවස්ථා හඳුනාගෙන, තමන්ගේ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයෙක් වීමට අවශ්‍ය ඒ පුරුද්ද, පුහුණුව, මනෝභාවය ඇති කර දෙන්නයි. ඒ විතරක් නොවෙයි, අපි මේ ඉගෙනුම, ඉගැන්වීම ආදී ක්‍රමවලත් වෙනසක් කරන්න කටයුතු කරනවා. දැනට අධ්‍යාපනයේ තිබෙන්නේ කට පාඩම් කරලා, ඒක recall කරලා නැත්නම්, මතකය අවදි කරලා විභාගය ලියන ක්‍රමයක්. ඇගැයීමේ ක්‍රමයත් ඒ විධියයි. ඒ නිසා අපි ව්‍යවසායකත්ව සංවර්ධනය වෙන්න උචිත ආකාරයට ඉගැන්වීමේ ක්‍රම පවා, ඇගැයීමේ ක්‍රම පවා වෙනස් කරනවා.

අපි 21st-Century skills පිළිබඳව කථා කරනකොට critical thinking and problem-solving, creativity and innovation, collaboration and communication ආදී 21වන සියවසේ ඉගෙනුම් කුසලතා එක්ක මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කළාම, ඊළඟ පරම්පරාව අනිවාර්යයෙන් ව්‍යවසායකත්ව කුසලතා තිබෙන පිරිසක් වන බව අපට අවිවාදයෙන් පිළිගන්න වෙනවා. ඒ නිසා අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, ඉදිරි දශක කිහිපය තුළ අපේ රටේ ව්‍යවසායකයන්ගේ හිඟයක් ඇති වෙන්නේ නැහැ කියලා. ඒ විතරක් නොවෙයි. සාමාන්‍ය පෙළ විෂය ධාරාවට නව තාක්ෂණ විෂයයන් ටිකක්, ඒ වාගේම උසස් පෙළ විෂය ධාරාවට වෘත්තීමය විෂය ධාරාවක් ආරම්භ කරලා කර්මාන්ත අංශය, වෙළෙඳ අංශය දියුණු කරන්න අවශ්‍ය පුහුණු ශ්‍රමය ලබා දෙන්නත්, නව ව්‍යවසායකයන් දියුණු කරන්නත්, අවශ්‍ය ඒ පසුබිම අධ්‍යාපනය තුළින් ගොඩ නඟන බව අපි කියන්න ඕනෑ.

එහි පසුබිම සකස් කිරීම සම්බන්ධයෙනුත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මෙතෙක් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ කටයුතු කොළඹ කේන්ද්‍ර කරගෙන, කොළඹ මධ්‍යගත වෙලා තිබුණේ. අපේ රජය ආවාට පස්සේ අපි දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන කමිටු ස්ථාපිත කළා. ඒ වාගේම ප්‍රාදේශීය කර්මාන්ත කමිටු ස්ථාපිත කළා. ඒ නිසා සුළු, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණයේ කර්මාන්තකරුවා මුහුණ දෙන ගැටලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේදීම විසඳා ගන්න අවශ්‍ය යාන්ත්‍රණය අපි සකස් කරලා දීලා තිබෙනවා. දැන් මිනිස්සු අපට දෙස් දෙවොල් තියන්නේ නැහැ. අපි ගම් මට්ටමේදී, බිම් මට්ටමේදී ගැටලු විසඳනවා. එතැනින් විසඳා ගන්න බැරි වුණොත් අපි ඒවා දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන කමිටුවට අරගෙන එනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපට ඒ දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන කමිටුවේදීත් කර්මාන්තකරුවාගේ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණොත් තමයි අමාත්‍යාංශයට අරගෙන යන්නේ. ඒක නිසා ගම් මට්ටමෙන්, ප්‍රාදේශීය මට්ටමෙන්, පළාත් මට්ටමෙන් කර්මාන්තකරුවාට දිරිදෙන්න, ව්‍යවසායකයාට නැඟී සිටින්න ඒ අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස අපේ රජය ආවාට පස්සේ අපි ගොඩනඟලා තිබෙනවා. අන්න ඒ නිසා මට දැඩි විශ්වාසයෙන් වාගේම සන්තෝෂයෙන් කියන්න පුළුවන්, අපේ කර්මාන්ත අංශයට අපි ලොකු මුදලක් වෙන් කරනවා වාගේම කර්මාන්ත හා ව්‍යවසායකත්වය කියන පසුබිම, ඒ සඳහා අවශ්‍ය වටපිටාව ගොඩනඟන්න අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබෙන බව. ඒක නිසා අපට, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඒ අරමුණ ඉෂ්ට කර ගැනීම වැඩි ඈතක නැහැ කියලා ප්‍රකාශ කරමින් මා නවතිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.53]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙවර අය වැය විවාදයේදී කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අපේ දිස්ත්‍රික්කයට වැදගත් ක්ෂේත්‍රය වන සීනි කර්මාන්තය ගැන මම පළමුවෙන්ම කථා කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, 1977 ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් එවකට වැල්ලවාය ආසනයේ හිටපු ගරු මන්ත්‍රීවරයා වුණු ජේ.එම්. කුමාරදාස මැතිතුමාගේ යෝජනාවක් මත තමයි මේ සෙවනගල, පැල්වත්ත සීනි කර්මාන්ත සමාගම් දෙක වැල්ලවාය ආසනයේ පිහිටෙව්වේ. මේ ආයතන පිහිටුවන කාලයේ මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ආසනය දරිද්‍රතාවෙන් -දුප්පත්කමෙන්- පෙළෙන මිනිස්සු හිටපු ආසනයක් හැටියට තමයි මුළු රටම දැන ගෙන හිටියේ. හැබැයි, මේ ආයතනය ඇති කළාට පස්සේ මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ දියුණුවේ වෙනසක් ඇති වුණා. ඒ වාගේම මොනරාගල දිස්ත්‍රික්කය වේගයෙන් දියුණු වෙන තත්ත්වයට පත් වුණා.

ගරු ඇමතිතුමනි, අද ඒ ආයතන ඉතාම කනගාටුදායක තත්ත්වයකට තමයි පත් වෙලා තිබෙන්නේ. ඔබතුමා ඒ ආයතනයට ගිහිල්ලා ප්‍රකාශ කළා, මාස දෙකෙන් මේ ප්‍රශ්නය

අපට විසඳලා දෙනවා කියලා. ගරු අමාත්‍යතුමනි, නමුත් ප්‍රශ්නය තවම විසඳලා දුන්නේ නැහැ. ගොවි ජනතාව මහ පාරට බහින එක තවම නතර වෙලා නැහැ. ප්‍රවාහනකරුවන්, ට්‍රැක්ටර් හිමියනුත් ඒ වාගේමයි. ඒ වාගේම සේවකයන් වරින් වර තැන් තැන්වල උද්ඝෝෂණ පවත්වමින් කැකෝ ගහන අවස්ථා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ වනවිට ආයතන දෙකේ සේවකයන් සියලුදෙනා අසරණභාවයට පත් වෙලා සිටිනවා. මේ වනකොට සේවකයන්ට හිමි වෛද්‍ය රක්ෂණය ලබා නොදෙන තැනට පත් වෙලා තිබෙනවා. මේ වනවිට අවුරුද්දකින් ඊපීඑෆ්, ඊටීඑෆ් ගෙවලා නැහැ. අවුරුදු පහක් ඉක්මව වූ සේවකයන්ට උසස්වීම් ලබා දීම නතර වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. රජයෙන් වැඩි කළ වැටුප මේ ආයතන දෙකේ සේවකයන්ට නොලැබෙන තැනට පත් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මේ අයගේ මේ දීමනාවන් ටික ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගොවීන්ගේ උක්වලට කරන ගෙවීම් ප්‍රමාද වීම නිසා උක් කැපුම්කරුවන්, ප්‍රවාහනකරුවන්, ට්‍රැක්ටර් හිමියන් අතර අමනාපකම්, නොයෙකුත් වාද භේද ඇති වන අවස්ථා තිබෙනවා. ඒ නිසා එම ගෙවීම් කඩිනම් කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

මේ ආයතන දෙකේ සේවකයන් 5,000කට ආසන්න පිරිසක් සේවය කරනවා. සීනි මෙට්‍රික් ටොන් 27,000කට එහා ප්‍රමාණයක් ගබඩාවල stock වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ ටික යම් කිසි මුදලකට විකුණා - යම් කිසි මුදලකට කිව්වේ, සීනිවලට වටිනා මුදලකට - එම ගොවීන්ගේ, ඒ වාගේම සේවකයින්ගේ ගැටලු ටික විසඳා දෙන්න කියන ඉල්ලීම කරනවා. පෙර කාල සීමාවල දවසකට මෙම ආයතන දෙකෙන් උක් මෙට්‍රික් ටොන් 4,000ක් පමණ ඇඹරුවා. නමුත්, අද වෙනකොට අඹරන්නේ මෙට්‍රික් ටොන් 3,000කට ආසන්න ප්‍රමාණයක්. එම නිසා කර්මාන්තශාලා තුළ ඒ මෙට්‍රික් ටොන් ප්‍රමාණය වැඩි කර ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ සභාවේ සිටින නිසායි මම මෙහෙම කථා කරන්නේ. ඔබතුමන්ලා අද උක් මෙට්‍රික් ටොන් 1කට රුපියල් 10,000ක් ගෙවනවා. දවසකට මෙට්‍රික් ටොන් 2,000ක් ඇඹරුවොත්, අපේ ගොවීන් අතර රුපියල් කෝටි 2ක් බෙදී යනවා. එම නිසා මේ ආයතන දෙක ආරක්ෂා කර ගන්න අපි කටයුතු කළ යුතුයි කියන අදහසේ අපි ඉන්නවා. ඒ වාගේම ඔබතුමා මේකට මැදිහත් වෙයි, මේ කටයුත්ත කරයි කියලා මම විශ්වාස කරනවා. එම නිසා මේ ආයතන දෙක කඩිනමින් ආරක්ෂා කළොත්, අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වෙලා ජීවත් වෙන්න පුළුවන් අවස්ථාවක් ලැබෙයි කියන විශ්වාසයත් මට තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, පසුගිය දිනෙක - එදා ඔබතුමා සිටියේ නැහැ - නියෝජ්‍ය අමාත්‍ය ගරු ආර්.එම්. ජයවර්ධන මැතිතුමා මගේ නම කියලා ප්‍රකාශ කළා, ධර්මසේන මන්ත්‍රීතුමන්ලා මේ සම්බන්ධයෙන් ලජ්ජා විය යුතුයි කියලා. ගරු අමාත්‍යතුමනි, මම නම් කටයුතු කළේ; මැදිහත් වුණේ පැල්වත්තේ, මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ආසනයේ ජනතාව වෙනුවෙන් මිසක්, වෙන දෙයක් කරන්න නොවෙයි. හැබැයි, මීට ප්‍රථම සමහර අමාත්‍යවරු සිටියදී බදුල්ලෙන්, හාලිඇලෙන් සේවකයෝ ගෙනැල්ලා පැල්වත්ත සමාගම පිරෙව්වා. සමහර මැති ඇමතිවරු රත්නපුරෙන්, ඇඹිලිපිටියෙන් සේවකයෝ ගෙනැල්ලා ඒ සමාගම පිරෙව්වා. සමහර ඇමතිවරු හම්බන්තොට ප්‍රදේශයෙන් ගෙනැල්ලා පිරෙව්වා. තවත් සමහර ඇමතිවරු ගාල්ලෙන් සේවකයෝ ගෙනැල්ලා පිරෙව්වා. ගරු අමාත්‍යතුමනි, අපේ කාල සීමාව තුළ මම මැදිහත් වුණා නම් මැදිහත් වුණේ එහෙම නොවෙයි. එවකට මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොවෙයි. එවකට මම මැදිහත් වුණා නම් මැදිහත් වුණේ, අපේ මැති ඇමතිවරු දැනුවත් කරලා. ඒ අයත් සම්බන්ධ කරගෙන, අපේ දිස්ත්‍රික්කයේ යම් අයෙකුට සේවාවක් ලබා දෙන්න, කම්කරු පත්වීමක් හෝ ලබා දෙන්නයි මම මැදිහත් වුණේ. එම කාල සීමාව තුළ අපි මැදිහත් වුණා නම් මැදිහත් වුණේ, අපේ දිස්ත්‍රික්කයේ පුද්ගලයෙක් එම ආයතනයේ රැකියාවක තබන්න මිසක් වෙනත් දෙයක් කරන්න නොවෙයි. පැල්වත්ත ආරක්ෂා කරන චේතනාවෙන්, මොනරාගල ජනතාවට සේවයක් කිරීමේ ආශාවෙන් තමයි අපි ඒ කටයුත්ත කළේ. එම නිසා අපි නොවෙයි ලජ්ජා වෙන්න ඕනෑ. මම මෙහෙම කියන එකට සමාවෙන්න, ගරු ඇමතිතුමා. ලජ්ජා වෙන්න ඕනෑ නම් මොනරාගල දිස්ත්‍රික්යේ එතුමන්ලා තමයි ලජ්ජා වෙන්න ඕනෑ.

මට මතකයි, 1982 දී මේ ආයතන ආරම්භ කරනකොට මොනරාගල කච්චේරිය වටලලා, ඒක වටේට ඉඳගෙන පිකටින් කළා, ඒක ආරම්භ කරන්න එපා කියලා. ඒ වාගේම තමයි, සීනි සමාගමට යනකොට "බුරුත පාර" කියලා මාර්ගයක් තිබෙනවා, ඒ මාර්ගය වහලා විරෝධතා දක්වලා මේ ආයතනය වහන තත්ත්වයට පත් කරන්න හැදුවා. ඒ විතරක් නොවෙයි, 1988-1989 කාල සීමාව තුළ මේ ආයතන දෙකෙන් සෙවනගල ආයතනයේ විතරක් ඩෝසර් 7ක් ගිනි තියලා විනාශ කළා. ඒක නිසා මම හිතනවා, මම නොවෙයි ලජ්ජා වෙන්න ඕනෑ කියලා. එහෙම නම්, ජයවර්ධන මහත්මයලා තමයි ලජ්ජා වෙන්න ඕනෑ. එම ආයතන ආරක්ෂා කරන්න අපි කටයුතු කරනකොට; ඒවා හදන්න අපේ නායකයෝ කටයුතු කරනකොට, ඒවා විනාශ කරන්න කටයුතු කළ එතුමන්ලා තමයි ලජ්ජා වෙන්න ඕනෑ කියන කාරණය මම තමුන්නාන්සේලාට කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

මම තව විනාඩි දෙකක් කථා කරන්නේත් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු ඇමතිතුමා ඉන්න වෙලාවේ මගේ කථාව කරන්න ලැබීම ගැන මම සතුටු වනවා. මේ ආයතන දෙක ගොඩනැඟීම සඳහා එදා ඒ ආයතනවල වැඩ කළ මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ආසනයේ ගොවි ජනතාව විශාල කාර්යයක් කළා. මේ ආයතන දෙකේ වැඩ කරන සේවකයන්ගේ, ගොවි මහත්වරුන්ගේ දූවා දරුවන් අද වනකොට වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන්, පරිපාලන සේවයේ නිලධාරින් විධියට කටයුතු කරනවා. මේ ආයතනවල සේවය කරන ගොවි මහත්වරුන්ගේ දූවා දරුවන් අද ඒ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එහෙම නම්, අපේ ප්‍රදේශයේ දූවා දරුවන්ට අධ්‍යාපනය ලබා ගන්න, තවත් උසස් රැකියා ලබා ගන්න උදව් වන මේ කර්මාන්තශාලා දෙක ආරක්ෂා කර දෙන්න කියන ඉල්ලීම කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමියටත්, ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.02]

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு மற்றும் கைத்தொழில், தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு ஆகியவற்றின் இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதில் மிகவும் மகிழ்ச்சி யடைகின்றேன்.

அபிவிருத்தி அடைந்துவரும் ஒரு நாட்டிலே, கைத்தொழில் அமைச்சினுடைய தொழிற்பாடு மிகவும் முக்கியமானது. வெளிப்படையான செயற்பாடும் நவீனமுறையில் அபிவிருத்தியைச் செய்ய வேண்டிய பொறுப்பும் இந்த அமைச்சுக்கு இருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்களால் 2026ஆம் ஆண்டில் செயற்படுத்துவதற்காக முன்மொழியப்பட்ட திட்டங்கள், இந்த அமைச்சின் நோக்கத்தை நிறைவேற்றுவதற்கு வழிவகுத்துள்ளது. ஆனால், எமது வட மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் அந்தத் திட்டங்கள் சரியான முறையில் நிறைவேற்றப்படுமா? என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. வடக்கு, கிழக்கு மாகாணங்கள் 30 வருடங்களாக யுத்தத்தினால் பாதிக்கப்பட்டு அழிவடைந்த பிரதேசங்களாகும். அங்குள்ள மக்கள் விவசாயத்தையும் கடற்றொழிலையுமே அதிகமாக நம்பி வாழ்கின்றார்கள். அந்தப் பிரதேசங்களில் அதிக மழை காரணமாக வெள்ளப்பெருக்கு ஏற்பட்டால், விவசாயம் பாழடைந்துவிடும். அதுமட்டுமல்லாமல், காட்டு யானை களாலும் மிருகங்களினாலும் பயிர்ச்செய்கைகள் அழிவடைகின்றன. அதனால் எதிர்பார்த்த பலனை அங்குள்ள விவசாயிகள் அடைய முடியாத நிலையில் இருக்கின்றார்கள். தங்களது கையிலிருக்கின்ற பணத்தையோ அல்லது அவர்களுடைய தங்க நகைகளை அடகுவைத்தோ முதலீட்டைச் செய்து விவசாயத்தை மேற்கொண்டாலும் அவர்களுக்கு எதிர்பார்த்த பலன் கிடைக்காமற்போகின்ற நிலையை நாங்கள் காண்கின்றோம். இதே நிலைமைதான் கடற்றொழிலாளர்களுக்கும் ஏற்படுகின்றது. அவர்களுடைய பிரச்சினைகள் இன்னும் தீர்க்கப்படவில்லை. மீனவர் களுக்கான மானியம் சரியான முறையில் கிடைக்கவில்லை. வடக்கு, கிழக்கு மக்கள் விவசாயத்தையும் மீன்பிடித் தொழிலையும் நம்பியிருக்கின்றார்கள். ஆனால், அரசு அவர்களுக்கான சிறந்த திட்டங்களை முன்மொழியவில்லை. இந்த வரவு செலவுத்திட்டத்தில் வட மாகாணத்துக்கான விசேட திட்டங்கள் எதுவுமே முன்மொழியப்படவில்லை என்ற ஒரு குறை எமக்கு இருக்கின்றது.

அதுமாத்திரமல்லாமல், நாட்டில் கைத்தொழில் துறையை அபிவிருத்தி செய்யவேண்டுமாக இருந்தால், நவீனமயப் படுத்தப்பட்ட திட்டங்கள் வேண்டும்; புதிய கைத்தொழில் திட்டங்கள் ஆரம்பிக்கப்பட வேண்டும். வடக்கு மாகாணத்தில் நடைமுறையிலிருந்த தொழிற்சாலைகள் இயங்காத நிலையில் இருக்கின்றன. இந்தத் தொழிற்சாலைகள் மீளியங்குவதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் இந்தத் திட்டங்களுக்கென எதுவுமே ஒதுக்கீடு செய்யப்படவில்லை. உதாரணமாக, காங்கேசன் துறையில் அமைந்துள்ள சீமெந்துத் தொழிற்சாலையானது, மிக நீண்டகாலமாக இயங்கி வந்ததோடு, அங்கு நிறைய தொழிலாளர்களுக்கு வேலைவாய்ப்பளித்து, நாட்டுக்கு வருமானத்தையும் ஈட்டித் தந்தது. அதேபோல முல்லைத்தீவு, ஒட்டுசுட்டானில் இருக்கின்ற ஓட்டுத் தொழிற்சாலையை மீள இயக்குவதற்குவதற்கு ஏதுவாகப் புனரமைக்காத நிலை காணப்படுகின்றது. இவ்வாறான தொழிற்சாலைகளை மீளவும் இயக்கினால் அந்தப் பிரதேசங்களில் -அந்த மாவட்டங்களில்- வாழ்கின்ற மக்களுடைய வாழ்வாதார மற்றும் இளைஞர்களின் வேலையில்லாப் பிரச்சினைகளை ஓரளவு தீர்க்கக் கூடுமாயிருக்கும். அது நாட்டினுடைய பொருளாதாரத்துக்கும் பங்களிக்கக்கூடியதாக இருக்கும். அதுபோல, பரந்தனிலே ஆரம்பிக்கப்பட்ட இரசாயனக் கூட்டுத்தாபனம் நீண்டகாலமாக இயங்கி வந்தது. யுத்தம் காரணமாக அந்தப் பிரதேசத்திலே உள்ள கைத்தொழிற்சாலைகள் யாவும் அழிவடைந்து, இயங்காத நிலையில் இருக்கின்றன. இந்த நிலையில், வட மாகாணத்திலே மன்னாரிலுள்ள Manthai Salt Limited பகுதியளவில் இயங்கி வருகின்றது. அதேபோல, வாழைச்சேனை காகித ஆலை இயங்கி வருகின்றது. இந்த தொழிற்சாலைகளை நவீனமயப்படுத்தி, அந்த மக்களின் வாழ்வாதாரத்தை உயர்த்துவதற்கு வழிவகுக்க வேண்டு மென்று கோரிக்கை விடுக்கிறேன்.

இது தவிர, மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங் களில் புதிய கைத்தொழிற்சாலைகளை ஆரம்பிக்க வேண்டிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது. காரணம், அவை யுத்தத்தால் பாதிக்கப்பட்ட மாவட்டங்களாகும். அங்கு விவசாயத்தையும் கடற்றொழிலையும் நம்பியிருக்கின்ற மக்கள் அதன்மூலம் உரிய எதிர்பார்ப்புகளையும் பயனையும் அடைய முடியாதிருக்கின்றார்கள். இந்த மக்களின் பொருளாதாரத்தை வளர்க்க, வேலையில்லாப் பிரச்சினையைத் தீர்க்க, புதிய திட்டங்களை வகுத்து, புதிய கைத்தொழிற்சாலைகளை, புதிய கைத்தொழில் பேட்டைகளை அமைக்க வேண்டிய அவசியம் இருக்கின்றது. இந்த மாவட்டங்களிலே பல காணிகள் இருக்கின்றன; வளங்கள் இருக்கின்றன. அவற்றைப் பயன்படுத்தி இந்தத் திட்டங்களை நடைமுறைப்படுத்த வேண்டுமென வேண்டிக் கொள்கின்றேன்.

'அஸ்வெசும' திட்டம் தற்பொழுது நடைமுறையிலே இருக்கின்றது. ஆனால், இந்தத் திட்டத்தினூடாகக் கிடைக்கின்ற உதவித் தொகை வெறும் 15,000 ரூபாய் மாத்திரமே. ஒருவருடைய மாதாந்தச் செலவு சாதாரணமாக 18,500 ரூபாய் ஆகும். நான்கு அங்கத்தவர்கள் கொண்ட குடும்பமாகவிருந்தால், சுமார் 72,000-75,000 ரூபாய் தேவைப்படுகின்றது. ஆகவே, 'அஸ்வெசும' திட்டத்தின் உதவித் தொகையை அதிகரிக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். அத்தோடு, இதன் பயனாளிகள் தெரிவின் போது பல்வேறு காரணங்களைக் காட்டி பலர் புறக்கணிக்கப்படுகின்றார்கள். உதாரணமாக, ஒருவர் 3 மாடுகளை வைத்திருந்தால், அந்தக் குடும்பத்தவர்களை 'அஸ்வெசும' பயனாளிகளாகச் சேர்க்க மாட்டார்கள். ஆனால், அந்த மாடுகளால் அவர்களுக்கு எந்தவித வருமானமும் கிடைப்பதில்லை. கிராமப்புறத்திலுள்ள மாடுகளை சாதாரண மாடுகள் அல்லது நாட்டு மாடுகள் என்று சொல்வார்கள். அவற்றிலிருந்து 1-2 போத்தல் பால் மாத்திரம்தான் கிடைக்கின்றது. அதை வைத்து அவர்களின் வருமானத்தை அதிகரிக்க முடியாது. ஆனால், கணக்கெடுக்கின்ற உத்தியோகத்தர்கள் அல்லது அதிகாரிகள் அந்தப் பயனாளிகளை அதிலிருந்து நீக்குகின்றார்கள். அதுபோல, ஒரு bicycle வைத்திருந்தாலும்கூட பயனாளித் தெரிவின்போது புறக்கணிக்கப்படுகின்றார்கள். இன்னும், ஒரு குடும்பத்திலே 2-3 அங்கத்தவர்கள் 18 வயதுக்கு மேற்பட்டவர்களாக இருந்தால், அவர்கள் வருமானம் தேடுகின்ற பிள்ளைகள் என்று காரணம் காட்டி அவர்களை ஒதுக்குகின்றார்கள். ஆனால்,

அவர்களுக்குத் தொழில் இல்லை; சிலவேளைகளிலே வேறு இடங்களிலுக்குச் சென்று கல்வி கற்கிறார்கள். ஆகவே, இந்தப் பயனாளிகளைத் தெரிவுசெய்யும்போது இவற்றையும் கருத்திற்கொள்ள வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர் நியமனம் 13 வருடங்களுக்கு முன்னர் வழங்கப்பட்டது. புதிய நியமனங்கள் வழங்காத காரணத்தால் அந்தப் பிரதேசங்களிலே அந்தப் பதவிக்கான வெற்றிடங்கள் காணப்படுகின்றன. ஆகவே, சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர் நியமனங்களை வழங்கி அவர்களுக்கான பிரயாணப் படியையும் அதிகரிக்க வேண்டுமென்று வேண்டுகோள் விடுக்கின்றேன். அத்தோடு, முதியோர்களுக்கான உதவித் தொகை, மாற்றுத்திறனாளி களுக்கான உதவித் தொகை போன்றவை அதிகரிக்கப்பட வேண்டும். அவ்வாறு செய்தால்தான் இந்தத் திட்டத்தினூடாக முழுமையான பலனை அடைய முடியுமென்று கூறி, விடைபெறுகிறேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.09]

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2026 වර්ෂයේ අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය අද උදෑසන සිට පැවැත්වෙනවා. නිදහසින් පසුව ගෙවුණු දශක හතහමාරට වැඩි කාලය තුළ ආර්ථික, දේශපාලන, සමාජයීය සහ සංස්කෘතිකමය වශයෙන් සතර නස්පැත්තියම මේ රටට අත්පත් වෙලා තමයි තිබුණේ. අපි දන්නවා, නිදහසින් පසුව මාරුවෙන් මාරුවට අපේ රටේ විවිධ පාලක පක්ෂ, කණ්ඩායම් බලයට පත් වුණු බව. ඒ වාගේම නිදහසින් පසුව අපේ රටේ විවිධ ආර්ථික වැඩ පිළිවෙළවල්, විවිධ ආර්ථික දැක්මන් යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුණා. එහි අවසාන ශේෂ පත්‍රය පරීක්ෂා කර බලන විට අපට පෙනෙනවා, අපේ රටේ ජනතාව ආර්ථික වශයෙන් බෙලහීන තත්ත්වයට පත්වෙලා, එදා වේල හොයාගෙන කන්න බැරිව, රටේ තිබුණු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පද්ධතියත්, ආර්ථිකයට විශාල දායකත්වයක් දක්වන මහා පරිමාණ කර්මාන්තත්, කෘෂි කර්මාන්තය, ධීවර ක්ෂේත්‍රය ඇතුළු සියලුම ආදායම් උත්පාදන ක්‍රමවේද ටිකත් අඩපණ වෙලා තිබුණු බව.

පසුගිය කාල වකවානුව තුළ අපේ රටේ සෑම ක්ෂේත්‍රයකම බිඳ වැටීම් තමයි තිබුණේ. ඒ නිසා මේ රට ලෝකයේ බංකොලොත් රාජ්‍යයක් කියන තැනට පත් වුණාය කියන එක අපි කවුරුත් අත් වින්දා. එහෙම තත්ත්වයක තිබුණු රට තමයි දැන් ක්‍රමානුකූලව, යළි හිස ඔසවමින් ඉදිරියට ගමන් කරමින් තිබෙන්නේ. පසුගිය කාලය තුළ මේ රට තිබුණු තත්ත්වය ගැන හිටපු පාලකයින්ට අමතක වුණු විධියට තමයි මම හිතන විධියට අද උදෑසන සිට ඇතැමුන් මේ සභාව තුළ අදහස් ප්‍රකාශ කළේ. ව්‍යවසායකත්ව පාලනයක් ගැන උදන් අනන, ඒ මනෝරාජික සමාජ සංකල්ප පිළිබඳව හිතන ඇතැමුන්, අතිගරු ජනාධිපතිතුමා වාගේම මේ රටේ සමස්ත ජනතාවගේම ආශීර්වාදය ලැබෙන විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ ජාතික වැඩ පිළිවෙළ සඳහා ගෙන යන මේ සියලු කර්තව්‍යයන් ඉතා පහත් විධියට හෙළා දකිමින් ඒවා විවේචනයට ලක් කරන ස්වභාවයක් අපි මේ සභාව තුළ දුටුවා. ඒ වාගේම ඊයේ දින පැවති විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ ජාතික වැඩ පිළිවෙළට සමගාමීව පැවති ප්‍රචාරාත්මක රැලිය සම්බන්ධවත් එතුමන්ලා විවිධ අදහස් දැක්වුවා. එයින් අපට තේරුම් ගන්න පුළුවන්, අපේ ආණ්ඩුව, ජනාධිපතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළ ඔවුන්ට දැනිලා තිබෙනවාය, ඔවුන්ට ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ගැන රිදිලා තිබෙනවාය කියන එක. ඒක නිසා තමයි තරුණයින්ට ඒ සඳහා විවිධ පුහුණු වැඩසටහන් කළා නම් ඒ කාලය ඉතුරු කර ගන්න තිබුණාය කියන්නේ. විෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් කිරීම අපරාධයක් කියන තැනටම මේ ගරු සභාව තුළ මතවාදයක් ගෙනෙන්න, ඒ පිළිබඳව අදහස් දක්වන්න ඔවුන් පෙලඹුණේ ඒ කාරණය නිසාම තමයි.

අය වැය කාරක සභා අවස්ථාවේදී ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට බඳුන් කරන අද දවසේ මම කියන්න ඕනෑ, විශේෂයෙන්ම "සංවර්ධනයේ ප්‍රතිලාභ සමානව භුක්ති විඳින සුපෝෂිත සමාජයක්" කියන දැක්ම යටතේ තමයි මෙම අමාත්‍යාංශය කටයුතු කරන්නේ කියන එක. ඒ වාගේම, ග්‍රාමීය සංවර්ධනය වැඩිදියුණු කිරීම, සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබලගැන්වීම සහතික කිරීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම කියන දැක්මත් තුළ තමයි මේ අමාත්‍යාංශය කටයුතු කරන්නේ. විශේෂයෙන්ම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පසුගිය ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණ වාර්තාවලට අනුව මුළු ජනගහනයෙන් සියයට 82.8ක් ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල ජීවත් වෙනවා.

මා ජීවත් වන කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැදිගම ආසනය කියන්නේ ඓතිහාසික ආසනයක්. එය මේ පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරු නිර්මාණය කරපු, ඒ වාගේම රටේ නායකයන් බිහි කරපු ආසනයක්. එහි විශාල වශයෙන් වතු ප්‍රදේශ වාගේම ග්‍රාමීය ප්‍රදේශ තිබෙනවා. අපේ දිස්ත්‍රික්කවලත් මේ අනුපාතයට අනුව තමයි ග්‍රාමීය දුප්පත් ජනතාව ජීවත් වෙන්නේ. ඒ වාගේම, ජනගහනයෙන් සෑම හයදෙනෙකුගෙන් එක් අයෙක්ම බහුමානික දරිද්‍රතාවට පත් වෙලා තිබෙනවා. ඔවුන්ගෙනුත් සියයට 95.3ක් ග්‍රාමීය සහ වතු ආශ්‍රිතව ජීවත් වෙනවා. ඒ විධියට අපි හඳුනා ගෙන තිබෙනවා, ග්‍රාමීය වතු ජනතාව තමයි දුප්පත්කමේ හිණිපෙත්තටම ගිහිල්ලා තිබෙන්නේ කියන එක. ඒ නිසා සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන්, සමාජ ආරක්ෂණ වැඩසටහන් කෙළින්ම ඉලක්කගත වෙන්න ඕනෑ, ග්‍රාමීය දුප්පත් ජනතාව සහ වතු ජනතාව මූලික කරගෙනයි.

විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන ගැන කියලා තිබෙනවා. අය වැය කථාවේ 7වන පිටුවේ, 2.5හි ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමට නම් කුඩාම ඒකකය වන ගම, පොහොසත් ගමක් බවට පත් කළ යුතුයි. ආර්ථිකයේ ජාතික මට්ටමේ සිදුවන වර්ධනයේ ප්‍රතිලාභ, ග්‍රාමීය ජනතාවට ද ලැබෙන පරිදි ආර්ථිකය ගමට රැගෙන යා යුතුයි. මේ සඳහා ඵලදායී ආර්ථික කටයුතුවල නියැළීමට හැකි වන පරිදි ග්‍රාමීය ජනතාව සවිබලගැන්වීම අපගේ ප්‍රධාන උපාය මාර්ගයක්. ඒ සඳහා නවීන හා තිරසර මෙන්ම කිසිවෙක් අත් නොහැරෙන සංවර්ධන වැඩ පිළිවෙළක් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ, ආර්ථික අවස්ථා බහුල කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය ප්‍රවර්ධනය, සැලසුම් සහගත නාගරීකරණය, අධ්‍යාපනය හා සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක පාදක කරගත් සංවර්ධන රාමුවක් යටතේ ක්‍රියාත්මක කරනවා.

[ගරු මනෝජ් රාජපක්ෂ මහතා]

ඒ අතරම, විශේෂ රැකවරණය ලැබිය යුතු පිරිස් අඛණ්ඩව රැක බලා ගැනීමත්, විවිධ අර්බුදවල බලපෑම මත සංක්‍රාන්තික දරිද්‍රතාවට පත්වන පිරිස් සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීමත් කළ යුතුයි...."

එහෙම තමයි ගරු ජනාධිපතිතුමා විශේෂයෙන්ම ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන ගැන මේ ගරු පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළේ.

ඒ වාගේම, ග්‍රාමීය සංවර්ධන අංශය ප්‍රධාන ක්ෂේත්‍ර - ප්‍රධාන ආයතන - 3ක් ඔස්සේ ක්‍රියාත්මක කරන්න අපි අමාත්‍යාංශය විධියට කටයුතු කරමින් ඉන්නවා. ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, ලෝක ආහාර වැඩසටහන් සහයෝගීතාව සඳහා වූ හවුල්කාරිත්වයේ ලේකම් කාර්යාලය විධියට ග්‍රාමීය සංවර්ධන අංශය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් විධියට "ප්‍රජා ශක්ති" ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරමින් තිබෙනවා. "ප්‍රජා ශක්ති" ජාතික වැඩසටහන අද රාජ්‍ය නිලධාරින්ගේ මහත් පැසසුමට ලක් වෙලා තිබෙනවා. රාජ්‍ය නිලධාරින් කොන් වෙලා, ගම්බිම් තුළ වාගේම තමන්ගේ වසම් තුළ නිසි කාර්යභාරයක් නොමැතිව, තමන් ලබපු අධ්‍යාපනයට, පුහුණුවට, හැකියාවන්වලට සහ දක්ෂතාවලට ඉඩක් නොලැබෙන තත්ත්වයක් තමයි පසුගිය කාලයේ දක්නට තිබුණේ. නමුත්, අද වනකොට ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. "ප්‍රජා ශක්ති" ජාතික වැඩසටහනට අනුගත වෙලා, වසම තුළ සිටින සියලු රාජ්‍ය නිලධාරින් එක තැනකට එකතු වෙලා, ඒකාබද්ධ වැඩසටහනක් විධියට වාගේම ජාතික වැඩසටහනක් විධියට එම වැඩසටහනට ඔවුන්ගේ දායකත්වය සහ සහයෝගය උපරිම වශයෙන් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ගම්මානවල, වසම් තුළ ඉන්න දක්ෂතා ඇති ප්‍රජාව ඒ සඳහා එකතු කරගෙන තිබෙනවා. තරුණ තරුණියන්, ඒ වාගේම දිළිඳු ප්‍රජාව අතර දක්ෂතා ඇති අය, සියලුම ජාතිකත්වයන් නියෝජනය වන විධියට විශේෂයෙන්ම ප්‍රජා සංවර්ධන සභා ගොඩ නඟාගෙන, විවිධ උපාය මාර්ගික දැක්මක් සහිත පිරිස එකතු කරගෙන, ප්‍රජාශක්ති වැඩසටහන ඉතාම සාර්ථකව ඉදිරියට අරගෙන යමින් ග්‍රාමීය දුප්පත්කම නැති කරන්න ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය කටයුතු කරමින් ඉන්න වෙලාවක, 2026 වර්ෂයේ අය වැය තුළින් ඉදිරි වසර තුළදීත් ඒ කටයුත්ත සාර්ථකව කරන්න අපේ අමාත්‍යාංශයට හැකියාව, ශක්තිය ලැබෙනවා කියන කාරණයත් සිහිපත් කරමින් මගේ අදහස් දැක්වීම නතර කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කර්මාන්ත ක්ෂේත්‍රය ගැන, ඒ වාගේම දිළිඳුකම තුරන් කිරීම කියන මාතෘකාව පිළිබඳව කථා කරන අද දවසේ විශේෂයෙන්ම අපි අවධානය යොමු කළ යුතුයි රටක් විධියට අද මුහුණ දීලා තිබෙන ගැටලු පිළිබඳව. ඒවාට විසඳුම් ලබා දිය හැකි අමාත්‍යාංශයක් තමයි, කර්මාන්ත අමාත්‍යාංශය කියන්නේ. මොකද, අපි ගෝලීය වශයෙන් කොවිඩ් අර්බුදයට මුහුණ දෙනකොට අපේ රටේ කර්මාන්තකරුවාට මේ අභියෝගය ජයග්‍රහණය කර ගැනීමට හැකියාව ලැබුණේ නැහැ. ඒ නිසා අපේ රටේ කර්මාන්තශාලා ලක්ෂයකට එහා ප්‍රමාණයක් නිෂ්පාදන ක්‍රියාවලියෙන් බැහැර වුණා. කර්මාන්තකරණයේ යෙදිලා හිටපු අපේ කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින් ඔවුන්ගේ කර්මාන්ත වසා දමන තත්ත්වයට පත් වුණා. ඒ හරහා වසර කිහිපයක් පසු කර ඇවිත් බංකොලොත්භාවයෙන් මිදිලා, ක්‍රමානුකූලව ආර්ථික වශයෙන් ස්ථාවරත්වයට පත් වෙමින් සිටින යුගයක, ඊළඟ අභියෝගය බවට පත් වෙන්නේ - දැනට තාවකාලික විසඳුමක් විධියට ණය ගෙවීම් අපි නතර කරගෙන හිටියාට - 2028 ඉඳලා ණය ගෙවන්න සිද්ධ වීම.

ණය ගෙවනවා නම් අපට රටක් විධියට ඩොලර් ආදායම් උපයා ගැනීමේ අත්‍යාතාව තිබෙනවා. ඩොලර් ආදායම උපයා ගැනීමේදී අපි හැමදාම අවධානය යොමු කරන්නේ විදේශ ප්‍රේෂණ දිහාවට. හැබැයි, කොවිඩ් වාගේ අර්බුදයක් එනකොට නැවත පිරිවැයක් දරලා ඒ කට්ටියත් අපට ලංකාවට ගෙන්වා ගන්න සිද්ධ වෙනවා. සංචාරක ක්ෂේත්‍රය දිහා බලාගෙන හිටියාමත් අපට සිද්ධ වෙන්නේ එවැනිම තත්ත්වයක්. සංචාරකයන්ගේ පැමිණීම සම්පූර්ණයෙන්ම - සියයට 100කින්ම - නතර වෙලා ඒ ඩොලර් ආදායම් දිහා බලාගෙන හිටපු, ඒවා විශ්වාස කරගෙන හිටපු ආර්ථික සැලසුම් අපට හකුළා ගන්න සිද්ධ වෙනවා.

එහෙමනම් ඒ සියල්ල අතරේ අපට ජයග්‍රහණය කරගත හැකි වන්නේ, ශක්තිමත්ව, රාජ්‍ය මැදිහත් වීම තුළ, දිරිගැන්වීම් තුළ මේ රටේ කර්මාන්තකරණය ඉදිරියට ගෙන ඒම. ඒක ගැන තමයි ඔබතුමන්ලා නිරන්තරයෙන් හඬ නැඟුවේ. ඒ ගැන තමයි ඔබතුමන්ලා නිතරම කථා කළේ. ඔබතුමන්ලා විශාල දේවල් ගැන කථා කළා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා කළ නොහැකි දේවල් කිව්වා. මුහුදු වතුරෙන් දේවල් හදන්නත් කථා කළා; සජ්ජියුරික් අම්ලය වාගේ දේවල්. හැබැයි අවසානයේ මොකද වුණේ? ඉතිහාසය පුරා මුහුදෙන් වට වෙච්ච දිවයිනක් කිව්ව අපේ රටේ ලුණු නිෂ්පාදනය පවා අඩාළ වුණු තත්ත්වයක් තමයි අපි දැක්කේ. එහෙම නම් ඒ කර්මාන්ත ක්‍රමානුකූලව අපි වර්ධනය කරගෙන ඉදිරියට ඇවිත් තවත් දිරි ගැන්විය යුතුයි. අපේ රටේ සියලුම ක්ෂේත්‍ර ආවරණය වන විධියට අපි අපේ කර්මාන්තශාලා දිරිගන්වන්නට, කර්මාන්තශාලා ඇති කරන්නට, වැසී ගිය ඒවාට බලපෑ හේතු මොනවාද කියලා සොයා බලන්නට, වැසී ගිය කර්මාන්තශාලාවලට නැවත නැඟී සිටින්නට ක්‍රමවේදයක් සකස් කරන්නේ කොහොමද?

පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අපි අහෝසි කරලා තිබුණා. දැන් නැවත කාලයක් දීලා තිබුණා. අපි කියන්නේ නැහැ ඒක සදාකාලිකව නතර කර තියන්න කියලා. හැබැයි, ගෝලීය වශයෙන් අපි මුහුණ දීපු අර්බුද හමුවේ සහ රටක් විධියට අපි ගහපු බදු නිසා, රටක් විධියට අපි ගත්තු අසාර්ථක දේශපාලන තීන්දු නිසා මේ රටේ කර්මාන්ත වැහුණා නම්; ඒ ව්‍යවසායකයින්ගේ වත්කම් ටික බැංකුවලට සින්න වෙලා තිබෙන්නේ ඒ හේතු නිසා නම්, ඒ දිහාවට අවධානය යොමු කරලා, ඒ අයට සාධාරණත්වයක් ලබා දීම වෙනුවෙන් රජයේ මැදිහත් වීම අද අතහැරලා තිබෙනවා කියන එක තමයි පරාටේ නීතිය නැවත ක්‍රියාත්මක කරන්න යාම තුළ අපි දකින්නේ. එහෙම කියලා මේ බැංකු ටික කඩාගෙන වැටෙන්න දෙන්නත් බැහැ. ඒකත් අපි දන්නවා, ඔබතුමන්ලා කියනවා වාගේම. ඒ නිසා රජය ඒ පැත්තත් ආවරණය කළ යුතුයි, මේ රටේ බැංකු පද්ධතිය කඩාගෙන නොවැටෙන්නට. පරාටේ නීතිය හරහා අද දේපොළ අහිමි වෙන්න යන, වෙන්දේසි කරන්න යන කවුරු හෝ කෙනෙක් ඉන්නවා නම්, ඒ අය ඇත්තවශයෙන්ම ගෝලීය අර්බුද නිසා, අපේ රටේ ගත්තු දේශපාලන තීන්දු නිසා

ව්‍යාපාර කඩාගෙන වැටීමකට ලක් වෙලා, තමන්ගේ දේපොළ සින්න වෙලා, පාරට වැටෙන තැනට පත් වූ අය නම්, ඒ සම්බන්ධව රජය නිවැරදි මැදිහත් වීමක් නොකෙරුවොත්, මේ රටේ කර්මාන්තකරණය සඳහා තවදුරටත් අපට ව්‍යවසායකයින් සොයා ගන්නට නොහැකි වෙයි.

අද දත්ත පෙන්වමින් ඔබතුමන්ලා බොහෝ දේවල් කථා කළාට අපේ රටේ ලාභ ලබමින් තිබූ ව්‍යාපාරත් ඔබතුමන්ලා ආවාට පසුව අසාර්ථක වෙලා කඩාගෙන වැටෙන තැනට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සීනි කර්මාන්තශාලාව ගත්තාම අද ඒ සේවකයින් ඇතුළු සියලුදෙනාම අර්බුදයකට ලක් වෙලා. ඒ, පසුගිය වසරවල විශාල ආදායමක් ලැබූ කර්මාන්තශාලාවක්. ඒ, එතනෝල් නිෂ්පාදනය නිසාය කියන්න පුළුවන්. එතනෝල් නිෂ්පාදනයේ මිල වැඩි කළ හින්දා ලාභ ලැබුවා. හැබැයි, මිල අඩු වුණාම මද්‍යසාර නිෂ්පාදනයේ මිල අඩු වෙලා තිබෙනවාද? ඒ මිල එහෙමම පවතිනවා. ඒවායේ මිල අඩුවෙලාත් නැහැ. එතනෝල් මිල අඩු කරපු නිසාය කියලා ඒ අතිරික්ත ප්‍රමාණය රජයට බදු විධියට ඇවිල්ලා තිබෙනවාද? එහෙමත් නැහැ. ඔබතුමන්ලා ඒ ලාභය සම්පූර්ණයෙන් මත් වතුර නිෂ්පාදනය කරන ආයතනවලට ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ නිසා අර නැඟීගෙන ආපු සීනි කර්මාන්තශාලා අද වැහෙන තැනට පත් කරලා තිබෙනවා. මෙවැනි තීන්දු-තීරණ ගන්න එක සාධාරණද? එහෙම කරලා තිබියදී සීනි කර්මාන්තය දියුණු කරන්නට, ඒවා නඟා සිටුවන්නට ඔබතුමන්ලා විශාල උත්සාහයක් දරමින් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඊයේ පෙරේදා ඔබතුමා "එක බඩුවකට එක කඩයක්" කියන සංකල්පය රටට හඳුන්වා දීමට කටයුතු කරනවා අපි දැක්කා. මම හිතන විධියට ඒක ඔබතුමා දැකපු සිහිනයක්. ඔබතුමා හිතනවා මේ හරහා සීනි කර්මාන්තය ගොඩ නඟන්න පුළුවන් වෙයි කියලා. ඔය විධියට කරන්න ගියොත්, ඔබතුමාට කඩ කීයක් දමන්න වෙයිද? අපට නගරාසන්නයෙන් ව්‍යාපාරයකට පර්චස් එකක් සොයා ගන්න බැහැ. දැන් ඔබතුමා සීනි කර්මාන්තය නඟා සිටුවීම වෙනුවෙන් "එක බඩුවකට එක කඩයක්" කියලා දුඹුරු සීනි -රතු සීනි- අළෙවි කරන්න කඩයක් දැම්මා. හොඳම වැඩේ කියන්නේ ඒ කඩේ බඩු තිබෙන්න එපායැ, ප්‍රවර්ධනය කරන්න. පාරිභෝගිකයාගේ ආකර්ෂණය වැඩිපුර දිනාගන්න නම් ඒ කඩේ මිල අඩු වෙන්න එපායැ. එතැන මිල වෙළෙඳ පොළේ සාමාන්‍ය සිල්ලර කඩේ මිලට වඩා වැඩියි. කරතියාගෙන එක භාණ්ඩයක් ගෙන යන්න, දුරු කතර ගෙවාගෙන, ප්‍රවාහන පහසුකම් හදාගෙන නුගේගොඩට එන්න ඕනෑ, දුඹුරු සීනි කිලෝ එකක් රුපියල් 275ට ගන්න. කඩේ තිබෙනවා, රුපියල් 248ට, 250ට, 255ට. ඉතින් ඔබතුමා මේ ගන්න උත්සාහය සාර්ථකද? ඔබතුමාට අමාත්‍යාංශයේ නිලධාරින් මේවාට වැරදි උපදෙස් දෙනවාද? නැත්නම් ඔබතුමා දකින සිහින වැරදිද? අපි මේ රටේ අනාගතය දකින්න හදන්නේ, අනාගතයේ ණය ගෙවන්න ඩොලර් උපයා ගන්න සිහින දකින්නේ මේ වාගේ ක්‍රියාමාර්ග හරහා නම් අපට මේක සාර්ථක කරගන්න බැරි වෙනවා, ගරු අමාත්‍යතුමනි.

අද අපේ කර්මාන්ත වැසී යන්නේ ඇයි? අපේ රටේ තිබෙන කර්මාන්ත ගලවාගෙන වෙනත් රටවලට යන්නේ ඇයි? කලාපයේ විදුලිය සඳහා වැඩිම මුදල අය කරන රට අපි. එතකොට අපේ කර්මාන්ත සඳහා ඔබතුමන්ලා සැලැස්මක් සකස් කරලා තිබෙනවාද; ඒ කුඩා පරිමාණයේ කර්මාන්තකරුවාට විදුලිබලය වෙනුවෙන් විශේෂ සහනයක් ලබා දෙන්න මොකක් හරි ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවාද? මහ පරිමාණයේ ව්‍යාපාරිකයෙක්, විදේශ ආයෝජකයෙක් ලංකාවට ගෙන්වා ගන්න රටක් විධියට අපි දෙන්න පුළුවන් හැම දෙයක්ම දෙන්න සූදානම්. හැබැයි, අපේ රටේ බොහොම අමාරුවෙන්, තමන්ගේ අත, කන, කර ටික උගස් තියලා, බැංකුවට ගිහින් ණයකුත් අරගෙන, තව කොහෙන් හරි මුදල් ටිකක් සොයාගෙන, ගමේ ඉන්න අහිංසක කිහිප දෙනෙකුට රැකියා යම් ප්‍රමාණයකුත් හිමිකර දෙන කුඩා පරිමාණ කර්මාන්තයක් ආරම්භ කරන්න යනකෙනාට ලබා දෙන පහසුකම් මොනවාද? විදුලි බලය පැත්තෙන් පහසුකම් දෙනවාද? පරිසර වාර්තා ලබා ගැනීම පැත්තෙන් කාර්යක්ෂමව එම සේවාව ලබා දීමට කටයුතු සකස් කරලා තිබෙනවාද?

මෙවැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ගන්නේ නැතිව, ඒ ක්‍රියාමාර්ග සාර්ථක කරගන්නට කටයුතු කරන්නේ නැතිව අර වාගේ විහිළුසහගත තීන්දුවලට ගියොත්, 2028දී අපට නැවත හිතා ගන්න බැරි අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පක්ෂයේ ප්‍රධාන තීන්දු-තීරණ ගන්න බලවේග අතර kitchen cabinet කියන තැනත් නියෝජනය කරනවා කියා මා විශ්වාස කරනවා. ඒ නිසා ඔබතුමාට දීලා තිබෙන්නේ භාරදූර කාර්යයක්. මේ රටේ අනාගතයේ ගමන් මඟ තීරණය කරන්නට, අපේ රටේ ආරක්ෂණය ගොඩ නඟන්නට තිබෙන අමාත්‍යාංශයක භාරකරුවෙක් විධියට ඔබතුමා මේ වාගේ සරල කාරණා දිහා බලන්නේ නැතිව කටයුතු කළොත් මේ රටේ දිළිඳු බව තුරන් කරන්නට, මේ රටේ රැකියාවල සුරක්ෂිතභාවය ආරක්ෂා කරන්නට කටයුතු කරන්න බැරි වනවා.

ඔබතුමා තව ප්‍රකාශයක් කර තිබුණා, අස්වැසුම ලබන කට්ටිය ගැන. කවුරුවත් ඉල්ලාගෙන කන්නට සූදානම් නැහැ. කවුරුවත් ඉල්ලාගෙන කන්න කැමැති නැහැ, ගරු ඇමතිතුමනි. මල්ල උස්සාගෙන ගිහින් පෝලිමේ ඉන්න කැමැති නැහැ. අභිමානය කියන දේ මේ රටේ සමාජයේ සෑම පුරවැසියෙකුට තිබෙනවා. හැබැයි, තමන් කර කියාගන්න දෙයක් නැති තැනට පත් වුණාට පස්සේ ඒ අය එහෙම කරන්න පුළුවන්. ඔබතුමන්ලා නම් කැබ් එක එහෙම ගන්නවා නේ, රටේ ජාතික වාහනය බවට පත්කරගන්න. ජාතික පක්ෂියා ඉන්නවා, ජාතික කොඩිය තිබෙනවා, ජාතික කියලා එක එක ඒවා තිබෙනවා. දැන් ජාතික රථයත් ඇවිත් තිබෙනවා. ඒ තමයි කැබ් එක. කැබ් එක ජාතික රථය බවට පත් වෙලා තිබෙන්නේ මොකද? ඔබතුමන්ලාගේ ඉල්ලාගෙන කන සම්ප්‍රදාය හින්දා නේ. ඔබතුමන්ලා පක්ෂයේ රැස්වීමකට යනවා. එතකොට ගමේ කට්ටිය ලැහැස්ති වෙලා ඉන්නවා, වාහනයේ ඩිකිය පුරවන්න. V8 එකක ගියොත්, ප්‍රාඩෝ එකක ගියොත් කරවල ටිකක් එහෙම දාගන්න බැහැ නේ. ඇතුළ ගඳ ගහනවා. එහෙන් ලැබෙන දේවල් ටික දාගන්න බැහැ. කෙසෙල් ඇවරිය, පොල් ටික දාගන්න බැරි නිසා ඔබතුමන්ලා ජාතික රථය බවට කැබ් එක පත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ ක්‍රමය අනුගමනය කරමින් ආණ්ඩුකරණයට ඇවිත් අද ඔය විධියට කථා කරනවා.

ඔබතුමන්ලා ආදායම් තියාගෙන නේ මේවා ගත්තේ. ඔබතුමන්ලා තියාගෙන තමයි ගමේ පාක්ෂිකයන්ගෙන් නඩත්තු වුණේ. ඔබතුමන්ලාගේ වත්කම් බැරකම් ප්‍රකාශ ගත්තාම, කරපු අපරාධය අද ඉතාම පැහැදිලියි. ඔබතුමන්ලා හොඳ සුපිරි ආදායම් මාර්ග තියාගෙනයි මෙහෙම කටයුතු කළේ. ඔබතුමන්ලා රැස්වීමකට එනවා කිව්වාම, ඔබතුමන්ලාගේ ගමේ පාක්ෂිකයා ඉතාම අමාරුවෙන් වටේ දුවලා ගෙදර තිබෙන කෙහෙල් කැන කපලා, පොල් ටික එකතු කරගෙන ඇවිත් දීලා ඔබතුමන්ලා පෝෂණය කරන්න කටයුතු කරපු ක්‍රමයෙන් ඇවිල්ලා, ඔබතුමන්ලා අද බලයට පත්වෙලා, ඔබතුමන්ලා දැන් කථා කරන ක්‍රමය ගැන හරි දුකයි, ඇමතිතුමනි. අද කරකියාගන්න දෙයක් නැතිකමට, අසරණකමට, තමන්ගේ අභිමානය කියන එක තුට්ටුවට දාලා, ගිහින් පෝලිමේ ඉඳලා, form එක පුරවලා, මල්ලත් උස්සාගෙන ගිහින් ගන්න අස්වැසුම වැනි සහනාධාර වැඩසටහන්වලට ඔබතුමන්ලා ඒ වාගේ චෝදනා කිරීම ඉතාම වැරදියි කියලායි මම හිතන්නේ. මේ රටේ සෑම ආණ්ඩුවක්ම දිළිඳුකම තුරන් කරන්න උත්සාහ කර තිබෙනවා; ඒ සඳහා විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා; නම් වෙනස් කර කර එක එක ප්‍රතිපත්ති ගෙනැවිත් තිබෙනවා. පසුගිය කාලයේ "සමෘද්ධිය" තාවකාලිකව අත්හිටුවා, "අස්වැසුම" ගෙන එනවා අපි දැක්කා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

රනිල් වික්‍රමසිංහ මැතිතුමා එය කෙටි කාලයකටයි ගෙන ආවේ. හැබැයි, "අස්වැසුම" ක්‍රියාත්මක කරන්න යනකොට, එය අවුල් ජාලාවක් බවට පත් වුණා.

මොකද, එය ක්‍රියාත්මක කළ යුතු, ගමේ දත්ත පිළිබඳව දන්නා, ගමේ මූලාග්‍ර පිළිබඳ දැනුමක් තිබෙන, ග්‍රාම නිලධාරි මහත්මයා, සමෘද්ධි නිලධාරි මහත්මයා, සංවර්ධන නිලධාරි මහත්මයා ඒ ක්‍රියාවලියෙන් ඈත් වුණා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ සම්බන්ධයෙන් ගෙනාපු නිර්ණායක එක්ක එය ක්‍රියාත්මක කරන්න ගියාම, තමන්ගේ වෘත්තිය අවදානමකට ලක් වන නිසා, ඒ ගොල්ලෝ වෘත්තීමය වශයෙන් ඈත් වුණා. එය සාධාරණයි. හැබැයි, ඒකට සාධාරණ විසඳුමක් දීලා, ඒ අයම ගන්නවා වෙනුවට කොහෙන් හරි ඇහිඳගත්තු පිරිසකගෙන් තොරතුරු අරගෙන, "අස්වැසුම" ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. හදාගත්තු නිර්ණායක විතරක් පදනම් කරගෙන, ඒවා විතරක් මූලාග්‍ර කරගෙන, ඒ කටයුත්ත කරපු එකේ ප්‍රතිඵලය වශයෙන්, ඉතාම දිළිඳුභාවයට පත් වෙලා ඉන්න, අසරණභාවයට පත් වෙලා ඉන්න, අස්වැසුම ප්‍රතිලාභ ලැබිය යුතු පවුල් විශාල සංඛ්‍යාවකට අද අස්වැසුම ප්‍රතිලාභ නොලැබී ගිහින් තිබෙනවා. සියලු පහසුකම් තිබෙන, ගෙවල් දොරවල්, කඩ, යාන වාහන පවා තිබෙන, තමන්ගේ දේවල් දරුවන්ට පවරා දුන්නු තාත්තාට පවා පවුලෙන් මිදිලා කියන පදනමින් අස්වැසුම ප්‍රතිලාභ හිමි වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයන් ගම්වල ඇති වෙලා, අද එය අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා.

ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වෙලා වසරක් ගත වුණත්, අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහනේ තිබෙන අක්‍රමිකතාව නිරවුල් කරන්නට ඔබතුමන්ලා වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. ඒ නිසා ඒ අර්බුදය ඉක්මනින් නිරවුල් කරලා, ප්‍රතිලාභ ලැබිය යුතු පිරිසට සාධාරණව එම ප්‍රතිලාභය ලබා දීමට වාගේම, වැරදි නිර්ණායක මත එම ප්‍රතිලාභය ලැබෙන නමුත් සැබවින්ම නොලැබිය යුතු අයට එය අහිමි කරලා මෙතෙක් ප්‍රතිලාභ නොලැබුණු ඉතිරි පිරිසටත් මේ සහනාධාරය ලබා දිය යුතුයි. බුදු හාමුදුරුවෝත් දේශනා කරලා තිබෙන්නේ, බණ දේශනා කරන්න කලින් කුස පුරවා ඉන්න ඕනෑ කියලායි. රටේ ආර්ථිකය කඩා ගෙන වැටිලා තිබෙන නිසා ඒ අය රටේ ආර්ථික ක්‍රියාවලියට දායක කර ගන්නට පෙර පළමුවෙන්ම ඒ අය ජීවත් කරවිය යුතුයි. ඒ අය ජීවත් කරවන්නට නම්, "අස්වැසුම" ප්‍රතිලාභය හැටියට ඔබතුමන්ලා ගෙවන ඔය සොච්චම් මුදලින් සෑහීමකට පත් වෙන්න බැහැ. නමුත්, ඒකත් ක්‍රමානුකූලව, නියමිත දිනයට ලබා දීමට ඔබතුමන්ලා කඩිනමින් -යුහුසුලුව- කටයුතු කළ යුතුයි. මුලින්ම, ඒ අය ජීවත් කරවීමට කටයුතු කරන්න ඕනෑ; ඊට පසුව නිෂ්පාදනයට යොමු කරවන්න ඕනෑ; ඊළඟට, ඉතිරි කිරීම්වලට හුරු කරවන්න ඕනෑ; ඊටත් පස්සේ, ආයෝජනවලට යොමු කරවන්න ඕනෑ. රටක දිළිඳුකම තුරන් කරන්න අවශ්‍ය වන මේ කියන ක්‍රියාවලි 4 ක්‍රමානුකූලව, පිළිවෙළට ක්‍රියාත්මක කරගෙන ගියොත් තමයි, අපට පුළුවන් වෙන්නේ, ජනතාව දිළිඳු බවින් ගලවා ගෙන, ආයෝජනවලට තවතවත් දිරිගන්වා රට ඉස්සරහට ගෙන යන්න පුළුවන් වන්නේ.

ඔබතුමන්ලාගේ අය වැයෙහි විවිධ තැන්වල අපේ රටේ ආබාධ සහිත දරුවන්ගේ, ඒ වාගේම ඔටිසම් දරුවන්ගේ ඉඳලා ආබාධිත ප්‍රජාව ගැන ආණ්ඩුව විශේෂ අවධානය යොමු කරමින් කථා කරලා තිබුණා. අපේ ගරු හඳුන්නෙත්ති ඇමතිතුමා මේ පිළිබඳව හොඳින් දන්නවා කියලා මම හිතනවා. ඒ වාගේම, මාත් මේ කාරණය පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන කෙනෙක්. ඒ දරුවන්ට මුදලක් විතරක් වෙන් කළාම ප්‍රමාණවත්ද, ඒ අය වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන විතරක් පිහිටුවලා ප්‍රමාණවත්ද, මුදලක් වෙන් කරලා ඒ අයට ලබා දීම විතරක් ප්‍රමාණවත්ද? ඒ අයට සාමාන්‍ය පාසල්වලට ගිහින් අධ්‍යාපනය ලබන්න පුළුවන් පරිසරය අද නිර්මාණය කරලා තිබෙනවාද? අමාත්‍යවරුන් මේ කටයුතුවලට සම්බන්ධ නිසා, ඒ අයත් මේක ප්‍රායෝගිකව අත් විඳින නිසා මේ කාරණය කෙරෙහි අවධානය යොමු වෙලා ඇති. හැබැයි, ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරලා, ඒ දරුවන්ට සහ ඒ දරුවන් ඉන්න දෙමව්පියන්ට අස්වැසිල්ලක් ලැබෙන විධියට, ඔටිසම් වාගේම, අධික්‍රියාකාරි දරුවන් කෙරෙහි අවධානය යොමු කරලා කටයුතු කරන්න ඕනෑ. අපේ සමාජයේ අධික්‍රියාකාරි දරුවන් කියන්නේ අප හිතනවාට වඩා දක්ෂ පිරිසක්. ඔටිසම් දරුවනුත් එහෙමයි. ඒ අය අධ්‍යාපනය පැත්තට දුර්වල වුණාට, ඒ අය වෙනත් ක්ෂේත්‍රවලට විශාල දක්ෂතා තිබෙන පිරිසක්. ඒ අය චිත්‍ර අඳින්න, නිර්මාණ කරන්න වාගේම විවිධ ක්ෂේත්‍රවලට දක්ෂයින්. ඒ නිසා ඒ තත්ත්වය හඳුනාගෙන ඉදිරියට යන්න පුළුවන් ක්‍රමයක් අපේ පාසල් පද්ධතියට ඇතුළත් කරන්න ඕනෑ; මේ ආබාධ සහිත වුවන් ගැන කථා කරන විට අප ඒ කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම, ඔබතුමන්ලාගේ අය වැයෙහි සඳහන්ව තිබෙනවා අපි දැක්කා, රාජ්‍ය සේවයට බඳවා ගන්න කොට රජයේ සේවයේ සියයට 3ක් ආබාධ සහිත ප්‍රජාවගෙන් බඳවා ගැනීම අනිවාර්ය කරලා තිබෙන බවක්. ඒ පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ, රජය ඒ සඳහා මැදිහත් වන නිසා. පෞද්ගලික අංශයට ආබාධ සහිත පුද්ගලයන් බඳවා ගන්නවා නම්, පෞද්ගලික සේවා යෝජකයන්ට අවුරුදු දෙකක් සඳහා මාසයකට රුපියල් 15,000ක උපරිමයකට යටත්ව සියයට 50 වැටුප් සහනාධාරයක් දෙන්න රජය සූදානම් බවත් සඳහන් කර තිබෙනවා. රජයෙන් දෙන රුපියල් 15,000 බලාගෙන, සමාජයට කරන සේවාවක් ලෙසත් සලකා යම් කර්මාන්තකරුවකු ආබාධිත පුරවැසියකු රැකියාවකට බඳවා ගත්තාට පසුව අවුරුදු දෙකකින් පස්සේ ඔබතුමන්ලා ඒ දීමනාව නතර කළාම, ඒ සේවකයා එළියට දමන්නද, එහෙම කරලා එයා තවත් අසරණ කරන්නද? තමන් කරගෙන ආපු, හුරු වෙච්ච, හැඩ ගැහුණු ජීවන රටාවෙන් මිදිලා, ඔබතුමන්ලා දෙන රුපියල් 15,000 දිහා බලාගෙන රැකියාවකට යොමු වෙලා, අවසානයේ වසර දෙකකින් පසුව ඒ රුපියල් 15,000 අත් හිටුවූවාට පසුව ඒ ආබාධිත පුද්ගලයාට අත් වන ඉරණම මොකක්ද? එතැනින් පස්සේ එයාට දෙපයින් නැඟී සිටින්න පුළුවන් ක්‍රමයක් මේ ක්‍රමය තුළ හැදිලා තිබෙනවාද? ඒ නිසා මේ කටයුත්ත දිගටම කරගෙන යනවා නම් තමයි හොඳ.

රටක් විධියට අප ගන්නා එවැනි තීන්දු සහ ගන්නා ක්‍රියාමාර්ග ප්‍රායෝගික වෙනවාද, ඒවාට අදාළ දිරි ගැන්වීම් කරන්නේ මොන විධියෙන්ද, එය ප්‍රවර්ධනය කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව ඔබතුමන්ලාට අවබෝධයක් තිබෙනවාද? එහෙම අවබෝධයක් නැත්නම් ඒවා ඉදිරියට කරගෙන යන්න විධියක් නැහැ.

ඒ වාගේම කිව යුතුයි, වැඩිහිටි ප්‍රජාව සහ ආබාධ සහිත ප්‍රජාව ගැන. වැඩිහිටි ප්‍රජාවට සහ ආබාධ සහිත ප්‍රජාවට රජයෙන් ලබා දෙන දීමනාවක් තිබෙනවා. ඒ මුදල ලබා ගන්න අද ඒ අයට විශාල පරිශ්‍රමයක් දරන්න සිදු වෙලා තිබෙනවා. එම මුදල් බැංකු ගිණුම්වලටයි වැටෙන්නේ. සමහර වැඩිහිටියන්ගේ හැඳුනුම්පත්වල ප්‍රශ්න නිසා බැංකු ගිණුමක් විවෘත කර ගන්න බැහැ. බැංකු ගිණුම් විවෘත කර ගත්තත් ඒ මුදල් ලැබෙන නිශ්චිත දිනයක් නැහැ. සමහර මාසවල ඒ මුදල් දමන්නේම නැහැ. ගිණුමට ඒ මුදල් ආලාද, නැද්ද කියන අවිනිශ්චිතතාව තියාගෙන ඒ වැඩිහිටියන්ට ගෙදරින් එන්න බැහැ. ඒ අයට තනියම පාරේ තොටේ බස් එකේ එන්නත් බැහැ, වාහනයක් පදවාගෙන එන්නත් බැහැ, වයෝවෘද්ධ නිසා හෝ ආබාධිත බව නිසා. ඒ අය ඒ මුදල් ගන්න බැංකුවට එනවා නම් එක්කෝ පවුලේ තව කෙනෙකු

එක්ක ත්‍රිරෝද රථයක් හයර් එකට අරගෙන එන්න ඕනෑ. ත්‍රිරෝද රථයටත් හයර් එක ගෙවාගෙන බැංකුවට ඇවිල්ලා බලද්දී ගිණුමට ඒ සල්ලි වැටිලා නැහැ කියලා කිව්වාම අවසානයේදී ආපසු හැරිලා යන්න සිද්ධ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

එහෙම දෙපාරක්, තුන්පාරක් බැංකුවට එන්න වුණොත් මොකද වෙන්නේ? සමහර විට එක පාරක් ආවත් ලොකු වියදමක් දරන්න වෙනවා. දෙපාරක් ආවොත් නම් ඒ දීමනා මුදල වාහන කුලියටම දීලා අවසන් වෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් සාධාරණ වැඩ පිළිවෙළක් සකස් කරන්න. දැන් තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ඩිජිටල්කරණය ගැනත් කථා කරනවා. එහෙම නම්, ඒ මුදල ඒ ප්‍රතිලාභීන්ගේ නිවසටම ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒක කරන්න ඔබතුමන්ලා පිරිවැයක් දරන්න ඕනෑ නැහැ. ඒ ගෙවීම්වලට අදාළ fund එක තිබෙන බැංකුවට කථා කළා නම්, සේවාවක් විධියට සලකා ඒ අය ලවා ඒ කටයුත්ත කරවාගන්න පුළුවන්කම ලැබේවි. ඒ නිසා මේ පිළිබඳවත් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන කාරණය මතක් කරමින්, කාලය ලබා දීම පිළිබඳව ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ තීන්දු නිසා, මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන වශයෙන් කෙරෙන උක් කර්මාන්තය අද විනාශ වන තත්ත්වයට, කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා බලයට ආවේ දේශීය කර්මාන්ත දියුණු කරනවා කියලායි. තමුන්නාන්සේලා බලයට ආවේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරනවා කියලායි. අද අපේ රටේ විදේශ විනිමයෙන් ඉන්ධනවලට පසුව වැඩියෙන්ම වැය වන්නේ උක් කර්මාන්තයටයි; බිලියන 120ක් යනවා.

එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ යුගයේත්, යහ පාලන ආණ්ඩුව කාලයේත් මේ රටේ උක් කර්මාන්තශාලා 4ක් පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබුණා. එකක් පැරණි කර්මාන්තශාලාවක්. ඒ තමයි හිඟුරාන සීනි කර්මාන්තශාලාව. අලුතින් කර්මාන්තශාලා 3ක් පටන් ගත්තා. ඒවා තමයි පැල්වත්ත, සෙවනගල සහ ඇතිමලේ සීනි කර්මාන්තශාලා. අපට වර්ෂයකට සීනි මෙට්‍රික් ටොන් හයලක්ෂයක් ඕනෑ. ඒ කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කරන්නේ සීනි මෙට්‍රික් ටොන් 90,000යි. නමුත් නිෂ්පාදනය කරන ඒ සීනි ටික විකුණා ගන්න බැරි තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. පැල්වත්ත සීනි සමාගමේ මෙට්‍රික් ටොන් 20,000කට වඩා සීනි තිබෙනවා. හිඟුරාන සීනි සමාගමේ මෙට්‍රික්ටොන් 20,000කට වඩා සීනි තිබෙනවා. සෙවනගල, ඇතිමලේ කර්මාන්තශාලාවලත් එහෙමයි. අද එතනෝල් ටික විකුණා ගන්න බැහැ. මොකක්ද, හේතුව? තමුන්නාන්සේලා දේශීය සීනි කර්මාන්ත දියුණු කරනවා වෙනුවට පිට රටින් සීනි ගෙන්වනවා. ගිය අවුරුද්දේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සීනි මෙට්‍රික් ටොන් 404,000ක් ගෙන්වා තිබෙනවා. මේ අවුරුද්දේ ජනවාරියේ සිට සැප්තැම්බර් මාසයේ 30 දක්වා සීනි මෙට්‍රික් ටොන් 461,000ක් ගෙන්වා තිබෙනවා. ඒ කියන්නේ තමුන්නාන්සේලා පිට රටින් සීනි ගෙන්වනවා. ඒ නිසා අපේ ගොවියාගේ උක්වලින් නිෂ්පාදනය කරන සීනි අද විකුණා ගන්න විධියක් නැහැ.

ගරු ඇමතිතුමා නම් දැන් බොහොම හොඳ වැඩක් පටන් අරගෙන තිබෙනවා. ඒ තමයි, රතු සීනි විකුණන එක. දැන් ඇමතිතුමාගේ job එක කර්මාන්ත දියුණු කරන එක නොවෙයි, සීනි විකුණන එක. "දුඹුරු සීනි පියා" කියලා එතුමාම කියා ගත්තා. ඒකට තව නමක් දාන්න වෙයිද දන්නේ නැහැ. මම ඒක මෙතැන කියන්නේ නැහැ. ඇයි තමුන්නාන්සේලා මෙහෙම කරන්නේ? තමුන්නාන්සේලා සුදු සීනි සඳහා ආනයන බද්දක් අය කරනවා. රතු සීනි, සුදු සීනි කියලා බලන්නේ නැතිව දෙකටම එක විධියට අය කරනවා. කරුණාකර දේශීය කර්මාන්තය ආරක්ෂා කර ගන්න නම්, ආනයනික සීනිවලට වැඩි බද්දක් පනවන්න. එතකොට තමයි දේශීය කර්මාන්තය ආරක්ෂා වෙන්නේ. අද දේශීය කර්මාන්තශාලාවල නිෂ්පාදනය කර විකුණන සෑම සීනි කිලෝග්‍රෑම් එකකටම VAT එක සියයට 18ක් ගෙවන්න ඕනෑ. Import කරන එකට VAT එකක් නැහැ. ඒ කියන්නේ, දේශීය ගොවියාට VAT එක තිබෙනවා. අන්තිමට VAT එකේ අයහපත් ප්‍රතිඵලය එන්නේ දේශීය ගොවියාට. ඉන්දියාවේ, පකිස්තානයේ ගොවියාට VAT එකක් නැහැ. කරුණාකර මේ අසාධාරණය නවත්වන්න, ගරු ඇමතිතුමා.

මේ වන විට අපේ රටේ එතනෝල්වලින් නිෂ්පාදනය කරන අරක්කු මිල අඩු වෙලා නැහැ. එතනෝල්වලින් නිෂ්පාදනය කරන අනික් දේවල් අඩු වෙලා නැහැ. හැබැයි, එතනෝල් මිල ලංකාවේ අඩු වෙලා තිබෙනවා. ඇයි, ඒවා පිටරටින් ගේනවා. ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි, පිට රටින් බඩ ඉරිඟු ගේනවා. මොකද, අපේ බඩ ඉරිඟු අවශ්‍යතාවවත් තවම නිෂ්පාදනය කර ගෙන නැහැ. තමුන්නාන්සේලා කියන ඔය මහ බැංකු සෙල්ලමේ,- *[බාධා කිරීමක්]* කියන්න, කියන්න. අපි සාකච්ඡා කරන්නට ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා විශ්වාස කරනවාද, පිටරටින් එතනෝල් ගේනවා කියලා?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු ඇමතිතුමා, මම පැහැදිලි කරන්නම්. පිටරටින් එතනෝල් ගේන්නේ නැහැ. පිටරටින් බඩ ඉරිඟු ගෙනැල්ලා, ඒකෙන්

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

එතනෝල් නිෂ්පාදනය කරනවා. හරි නේද මම කියන එක? පිටරටින් එතනෝල් ගෙනාවත් එකයි, පිට රටින් බඩ ඉරිඟු ගෙනැල්ලා එතනෝල් නිෂ්පාදනය කළත් එකයි. හැබැයි, ඒකට තමුන්නාන්සේලා ලොකු බද්දක් දාන්න ඕනෑ. එතකොට තමයි දේශීය කර්මාන්තය ආරක්ෂා වෙන්නේ. පිටරටින් බඩ ඉරිඟු ගෙනැල්ලා එතනෝල් නිෂ්පාදනය කළාම, මෙහි නිෂ්පාදන මිලට වැඩිය අඩුවෙන් දෙන්න පුළුවන්. අපි ඉල්ලන්නේ, මේවාට බදු දාන්න දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගන්න නම්. අපට ඕනෑ කරන බඩ ඉරිඟු ටිකවත් අපි නිෂ්පාදනය කරන්නේ නැහැ, ඇමතිතුමා. පිටරටින් නේ ගේන්නේ. මම මේ යෝජනාවක් කරන්නේ. මේක කරන්නේ වෙන කවුරුවත් නොවෙයි. හැබැයි, මම ඒ නම කියන්නේ නැහැ. තමුන්නාන්සේලා අර මහ බැංකු හොරකම ගැන කියනවා නේ. ඒගොල්ලන්ම තමයි මේකත් කරන්නේ. ඒ එක්කෙනෙක්.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා කිව්වා, පොහොර සහනාධාර ගැන. උක් ගොවියාට පොහොර සහනාධාරය කිසි විටෙකත් දෙන්නේ නැහැ, තමුන්නාන්සේලා. අපට මතකයි, අපේ යහ පාලන ආණ්ඩුව පැවති කාලයේ මේ රටේ බඩ ඉරිඟු ගොවියාද, වී ගොවියාද, උක් ගොවියාද රුපියල් 1,500ට පොහොර මිටියක් ගත්තා, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා පොහොර ප්‍රශ්නය ඇති කරනතුරු. අද උක් ගොවියා ගන්නේ රුපියල් 10,000කට, 11,000කට පොහොර මිටියක්. අපි ඉල්ලන්නේ, කරුණාකරලා මේවා ගැන කටයුතු කරන්න කියලායි.

ඒ එක්කම දැන් ධර්මසේන මන්ත්‍රීතුමා කිව්වා, මේ රජයේ කර්මාන්තශාලාවල ඉන්න 5,000ක් විතර සේවකයන්ගේ - සෙවනගලයි, පැල්වත්තෙයි- තවම EPF, ETF ගෙවලා නැහැ කියලා. ඒ අයට තමන්ගේ අනාගතය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. කරුණාකරලා මේ ගැන තමුන්නාන්සේලා තීරණයක් ගන්න. ජනාධිපතිතුමාගේ අය වැය කථාව අහගෙන ඉන්කොට මට හිතුණා, එතුමා මේ කර්මාන්තශාලා වහන්නයි යන්නේ කියලා. අර පෞද්ගලීකරණය කරන ලැයිස්තුවේ මේවා තිබෙනවා. ලංකා සීනි සමාගමට අයත් පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා පෞද්ගලීකරණය කරනවාද කියලා මම ඇමතිතුමාගෙන් අහනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒක ජනාධිපතිතුමාත් කිව්වා, ලැයිස්තුවේත් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඉතින් තමුන්නාන්සේ නැහැ කියනවා. ජනාධිපතිතුමාගේ කථාවෙන්,- *[බාධා කිරීමක්]* හරි, අපි කථා කරමු.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ තිබෙනවා, ව්‍යවස්ථාපිත ආයතන හැටියට තිබෙන රාජ්‍ය ව්‍යාපාර කිහිපයක තිබෙන ව්‍යවස්ථාපිත ගෙවීම් කපා හරිනවා කියලා. ඒවා කපා හැරලා ඒ ආයතනවලට පහසුකමක් දෙන්නේ. අර්ථසාධක, gratuity ලෙස ගෙවීමට තිබෙන ඒවා අයින් කරලා, ඒ ආයතනවලට මෙච්චර කාලයක් තිබිච්ච වැය බර අඩු කරනවා. ඒක භාණ්ඩාගාරය භාර ගන්නවා. කිසිම විධියකින් ඒ ආයතන වසා දමන එකක් නොවෙයි, ඒ කියන්නේ. අය වැය කථාව නැවත ඔබතුමා පොඩ්ඩක් සාවධානව කියවන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

එතුමාගේ කථාවේ විධියට මට නම් දැනෙන්නේ එහෙමයි. මම නැවත කථාව බලන්නම්.

අද මේ ආයතන විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද ලංකාවේ සීනි කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 235ක් යනවා, අධික පොහොර මිල, ඉන්ධන මිල නිසා. ආණ්ඩුව ඉන්ධනවලිනුත් සියයට 80ක් විතර ලාභ ගන්නවා. ලෝකයේ දෙවෙනියට වැඩි විදුලි බිල තිබෙන්නේ ලංකාවේ. පොහොර මිල තිබුණා වාගේ හත් ගුණයක් විතර වැඩි වෙලා. අපි ඉල්ලන්නේ කරුණාකරලා තමුන්නාන්සේලා මේවාට මැදිහත් වෙන්න. තමුන්නාන්සේලා ඉස්සරත් විරුද්ධ වුණා. මට මතකයි, 1989 මොනරාගලට ආවා, සියඹලාණ්ඩුවේ සීනි සමාගම පිහිටුවන්න ඉන්දියාවේ මෝතා කොම්පැනිය. ඒ ආපු ආයෝජකයෝ තුන්දෙනෙක් එදා තමුන්නාන්සේලා වෙඩි තියලා මැරුවා; JVP එක. ලංකාවේ හිටපු සිංහ සේනානායක මහත්මයා,- මම හිතන්නේ ඒවා මතක් වෙනවා ඇති - බන්සාල් මහත්මයා, ඔහුගේ නෝනා, ආර්.පී.කෝටා කියන මහත්මිය, ඒ ඔක්කෝම මැරුවා. මට නිකම් කල්පනා වුණා, එදා විනාශ කරන්න ගිය එක අද ආයෙමත් විනාශ කරන්න තමුන්නාන්සේලා උත්සාහ කරනවාද කියලා.

ඒ එක්කම අද උක් කර්මාන්තය ගත්තොත්, මොකක්ද තත්ත්වය? මම ඊයේ පෙරේදා ගියා, සියඹලාණ්ඩුව පැත්තට, පැල්වත්ත පැත්තට. මිනිස්සු උක් ගස් ගලවනවා. ඒ උක් ගස් කපලා භාර දුන්නාම, උක් ගස්වලට මුදල් ගෙවීමට මාස තුනක් හතරක් යනවා. නමුත් මුදල් ලැබිලා නැහැ. දැන් ගොවියා ඒවා ගලවලා වෙන දේවල් හිටවනවා. මම අහනවා, තමුන්නාන්සේලා උත්සාහ කරන්නේ ඒ මිනිස්සුන්ට ඒවා ගලවන තැනට වැඩ සිද්ධ කරන්නද කියලා? ඒගොල්ලන්ගේ රත්තරන් බඩු උකස් තියලා බේරා ගන්න විධියක් නැහැ, මාස ගණනක් තිස්සේ. තමුන්නාන්සේලා බලයට ආවේ මේකටද කියලා අපි අහනවා. උක් කර්මාන්තශාලා විනාශ කරන්නද තමුන්නාන්සේලා බලයට ආවේ කියලා අපි අහනවා. තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලනවා, කරුණාකරලා මේ කර්මාන්තය ආරක්ෂා කරන්න කියලා. තමුන්නාන්සේලාගේ ලොකුම වෘත්තීය සමිති තිබ්බේ මේ කර්මාන්තශාලාවල. වත්මන් කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා එදා වැඩිපුර හිටියේ ඒවායේ. හැබැයි, දැන් වෙන්නේ මොකක්ද? ඒ නිසා දේශීය කර්මාන්තය ආරක්ෂා කරන්න කියලා අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය තමයි ග්‍රාමීය ආර්ථිකය. තමුන්නාන්සේලා කිව්වා, පසුගිය පාලන කාලවලදී කර්මාන්තශාලා වෙනුවෙන් මොකුත් කළේ නැහැ කියලා. ගරු ඇමතිතුමනි, නිදහස ලබනකොට අපේ අපනයන ආදායමෙන් සියයට 90ක් ලැබුණේ තේ, රබර් සහ පොල්වලින්. සියයට 10යි, කර්මාන්තවලින් ලැබුණේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විප්ලවය නිසා පසුගිය 76 අවුරුදු කාල සීමාව තුළ අපට පුළුවන්කම ලැබුණා, තේ, රබර්වලින් ආරක්ෂා වුණු අපනයන ආර්ථිකයට කර්මාන්තවලින් සියයට 90ක ආදායමක් ලබා දෙන්න. දැන් තේ, රබර් සහ පොල්වලින් ලැබෙන්නේ සියයට 10ක අපනයන ආදායමක්.

අද මේ රටේ මිනිස්සු දුප්පත්; රටේ ජනතාවගෙන් සියයට 35ක් දුප්පත්. අපි නොවෙයි ඒක කියන්නේ, ලෝක බැංකුව. මේ සියයට 35න්, සියයට 80ක් ගොවීන්, කෘෂිකර්මාන්තයේ යෙදෙන ග්‍රාමීය ජනතාව, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. තමුන්නාන්සේලා ග්‍රාමීය ආර්ථිකය දියුණු කරන්න මිලියන 25,000ක් වෙන් කර තිබෙනවා, ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන හරහා. තමුන්නාන්සේලා ප්‍රජා සංවර්ධන සභා පිහිටුවනවා, වසමේ. කවුද මේකේ ඉන්නේ? නිල බලයෙන් ඉන්නවා, ග්‍රාම නිලධාරි, සමෘද්ධි නිලධාරි, කෘෂි පර්යේෂණ නිලධාරි, ධීවර නිලධාරි ඇතුළු කණ්ඩායමක්. කවුද ඒකේ සභාපති පත් කරන්නේ? තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පත් කරන්නේ. මන්ත්‍රීවරයෙක් හෝ JVP cadre එකේ ඉන්නා කෙනෙක් තමයි සභාපති ලෙස පත් කරන්නේ. සාධාරණද මේක?

මේ රටේ තිබුණා ආහාර මුද්දර, මේ රටේ තිබුණා ජනසවිය, සමෘද්ධිය තිබුණා. ඒ සියලු කටයුතු කළේ නිලධාරින්. තමුන්නාන්සේලා අද ඒවා දේශපාලන ව්‍යාපාරයක් ලෙස පරිවර්තනය කරගෙන තිබෙනවා. බලන්න, මේ විධියට රටේ ජනතාවගේ බදු මුදල්වලින් තමන්ගේ දේශපාලන පක්ෂය තර කරන්න කටයුතු කරන එක අසාධාරණයි නේද? කරුණාකරලා මේකේ බලය දෙන්න ගමේ අයට. මේ සභාපති තමයි සංවර්ධන ව්‍යාපෘතිවලට ප්‍රතිපාදන වෙන් කරන්නේ. ඔහු තමයි සංවර්ධන ව්‍යාපෘතිවල ඇස්තමේන්තු සකස් කරන්නේ. හදිසි ආපදා සහ ආර්ථික බිඳ වැටීම්වලදී කාටද සහනාධාර දෙන්නේ කියලා එයා තමයි තීරණය කරන්නේ. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධවත් ප්‍රශ්නයක් තිනෙවා. මා ළඟ තිබෙනවා යවපු ඒ චක්‍රලේඛය. මම ඒකයි බය නැතුව මේවා කියන්නේ. මේවාට මිලියන 25,000ක් වෙන් කර තිබෙනවා. මේ රටේ දූප්පත්කම නැති කිරීමේ කිසිම ව්‍යාපාරයකට මේ රටේ ඉතිහාසය තුළ දේශපාලනය ගාවා ගෙන නැහැ. අද ඒකට දේශපාලනය ගාවා ගෙන. හර්ෂ ද සිල්වා මැතිතුමනි, මම කියපු දේ ඔබතුමාත් අනුමත කරනවා නේද? එතුමාත් අනුමත කරනවා. මෙවැනි තත්ත්වයක් තමයි අද පවතින්නේ. ගමේ සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපති විධියට පත් කරන්නේත් තමුන්නාන්සේලාගේ cadre එකේ ඉන්න කෙනෙක්. මේ රට කොහේටද මේ යන්නේ? මේකට තමයි අපි කියන්නේ ව්‍යවස්ථාපිත ඒකාධිපතිවාදය කියලා. ඒක යනවා, ගමටම.

තමුන්නාන්සේලා මේ එන්නේ මොන ක්‍රමයටද කියලා අපි දන්නවා. තමුන්නාන්සේලා ලෑස්ති වෙන්නේ මොනවාටද කියලා අපි දන්නවා. තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දයෙන් බලයට ඇවිල්ලා ඉන්නේ. කරුණාකරලා ඒ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න. ගමේ දූප්පත්කම නැති කිරීමේදී ඒකට දේශපාලනය ගාවා ගන්න එපා. අපි ජනසවිය බෙදද්දී එහෙම කළේ නැහැ. අපි ආහාර මුද්දර ලබා දෙනකොට එහෙම කළේ නැහැ. තමුන්නාන්සේලා අද රජයේ මුදලින්, මහජනතාවගේ බදු මුදලින් තමුන්නාන්සේලාගේ දේශපාලන කඳවුර ශක්තිමත් කරගන්න යනවා. කරුණාකරලා ඒ නරක වැඩේ කරන්න එපා. මම හිතන විධියට, JVP කට්ටිය කැමැති ඇති. NPP කට්ටිය නම් අකමැති ඇති. මම දන්නේ නැහැ, ඒවාට මේ ඇමතිවරුන් දෙදෙනාගේ කැමැත්ත, අකමැත්ත කොහොමද කියලා. කරුණාකරලා ඒ වැඩේ කරන්න එපා. දූප්පත්කම, බඩගින්න සියල්ලටම තිබෙනවා. එතැනදී පක්ෂ, පාට බලන්න එපා, පාට කණ්ණාඩිවලින් බලන්න එපා. මේ සභාවලට පත්වන නායකයා දේශපාලනය කරන කෙනෙක් වුණාම, එයා තමන්ගේ කඳවුරේ පැත්ත තමයි තෝරන්නේ. ඒ නිසා කරුණාකරලා දූප්පත්කමට දේශපාලනය ගාවා ගන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.47]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சின் குழுநிலை விவாதத்திலே கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன். இலங்கையானது நீண்டகாலமாகத் தொழிற்றுறைகளிலே பாரிய வீழ்ச்சி கண்டிருந்த நிலையில், இப்போது அவற்றினுடைய செயற்பாடுகள் முடுக்கி விடப்பட்டு, அதில் காணப்பட்டுவரும் முன்னேற்றம் மக்கள் மத்தியிலே பாரிய நம்பிக்கையை ஏற்படுத்தியிருக்கின்றது. இந்தச் சூழ்நிலையில், வடக்கு, கிழக்குப் பகுதிகளிலே காணப்படுகின்ற தொழிற்றுறைகளின் வளர்ச்சி மற்றும் அவை சந்திக்கின்ற சவால்கள் தொடர்பாக இந்தச் சபையினுடைய கவனத்தை நான் ஈர்க்க விரும்புகின்றேன்.

குறிப்பாக, 2009ஆம் ஆண்டு யுத்தத்தின் பின்னர் வடக்கு, கிழக்கு மாகாணங்களில் காணப்பட்ட தொழில்முயற்சிகள், தொழிற்றுறைகள் அனைத்தும் முற்றுமுழுதாக முடங்கிப்போய், அங்கு எந்தவிதமான அபிவிருத்தியும் இல்லாத நிலைமை காணப்பட்டது. பெண்கள் மற்றும் இளையோர் கைவிடப்பட்ட நிலையிலே, எந்தவிதமான வருமானங்களோ, அந்நியச் செலாவணி ஈட்டலோ இல்லாத ஒரு பிரதேசமாக வடக்கு, கிழக்குப் பிரதேசம் காணப்பட்டது. அந்த வகையில், 2009ஆம் ஆண்டிலிருந்து 2025ஆம் ஆண்டு வரையான காலப்பகுதியிலே வடக்கு, கிழக்கிலே எவ்வாறான அபிவிருத்திகள் காணப்பட்டன என்பதைச் சுருக்கமாக நான் இங்கே குறிப்பிட விரும்புகிறேன்.

2009ஆம் ஆண்டு யுத்தம் முடிவுற்ற காலப்பகுதியிலே அந்தப் பிரதேசம் ஒரு மயான பூமியாகக் காணப்பட்டது. யாரும் அங்கு எந்தவிதமான தொழில் முயற்சிகளையும் முன்னெடுக்காத சூழல் காணப்பட்டது. 2009-2015ஆம் ஆண்டு காலப்பகுதியிலே A-9 வீதி திறக்கப்பட்டு, ஓரளவு சந்தை வாய்ப்புகள் உருவாக்கப்பட்டிருந்தபோதும், தொடர்ச்சியாக அங்கே இருந்த தொழிற்றுறைகளை முன்னேற்றுவதிலோ அல்லது புதிய தொழிற்றுறைகளை உருவாக்குவதிலோ அல்லது வடக்குக்கான தொழில்முனைவோரைக் கொண்டு வருவதிலோ முயற்சிகளெதுவும் மேற்கொள்ளப்படவில்லை. அதற்கு வலுவான அரசியல் காரணங்களும் காணப்பட்டன. அதன் பின்னர், 2015-2019ஆம் ஆண்டு காலப்பகுதியிலே சில அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட்டாலும் அவை மெதுவாக நடைபெற்றன. அதனால் விசேடமாக எந்த விதமான முன்னேற்றமும் காணப்படவில்லை. 2020 - 2024ஆம் ஆண்டு காலப்பகுதியை எடுத்துப் பார்த்தால், 'கொவிட்' காரணமாக குறிப்பாக சிறிய மற்றும் நடுத்தரத் தொழில்முனைவோருடைய -SME- தொழிற்றுறைக்கான பங்களிப்பு முற்றுமுழுதாக வீழ்ச்சியடைந்து காணப்பட்டது. அந்த நிலைமையில்தான் இந்த நாட்டைப் பொறுப்பேற்ற எங்களுடைய அரசாங்கத்தின் மூலம் வடக்கு, கிழக்கிலே, குறிப்பாக வட மாகாணத்திலே தொழிற்றுறைகளை அதிகமாக முன்னேற்றுவதற்கான பாரிய முயற்சிகளை நாங்கள் மேற்கொண்டு வருகின்றோம்.

வடக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், யாழ்ப்பாண மாவட்டத்திலே காணப்படுகின்ற காங்கேசன்துறைப் பிரதேசத்தை ஒரு வர்த்தக வலயமாக மாற்றி, அதன்மூலமாக நிறையத் தொழில்முனைவோரை ஊக்குவிப்பதற்கான முயற்சிகள், கிளிநொச்சி மாவட்டத்திலே பரந்தன் இரசாயனத் தொழிற்சாலையைச் சிறப்பாகச் செயற்படுத்தி, அந்த நகரத்தையும் ஒரு வர்த்தக நகரமாக மாற்றியமைப்பதற்கான முயற்சிகள், பரந்தன் பகுதியிலே காணப்படுகின்ற குறிஞ்சாத்தீவு உப்பளத்தின் உற்பத்தி முயற்சிகள், முல்லைத்தீவு மாவட்டத்திலே மாங்குளம் பகுதியிலே கைத்தொழிற்பேட்டை அமைக்கும் முயற்சிகள், அத்துடன் ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை போன்றவற்றை மீள நிர்மாணித்தல் மற்றும் புதிய புதிய கைத்தொழில் வலயங்களை உருவாக்குதல் என்பவற்றினூடாக, வடக்கு மாகாணத்திலே அதிக அபிவிருத்திகளையும் தொழில்முனைவோரையும்

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

கொண்டுவர நாங்கள் எதிர்பார்க்கின்றோம். அண்மையிலே நடைபெற்ற கைத்தொழில் சம்பந்தமான ஒரு கண்காட்சியிலே வடக்கு, கிழக்கைச் சேர்ந்த அதிகமான முதலீட்டாளர்கள் கலந்துகொண்டதையும் நான் இந்த இடத்திலே தெளிவாகச் சொல்ல விரும்புகின்றேன்.

அதேபோன்று, வருகின்ற சனவரி மாதம் 21ஆம், 22ஆம் திகதிகளிலே Northern Investment Summit என்ற ஒரு மாநாட்டை நாங்கள் வடக்கிலே கூட்ட இருக்கின்றோம். அந்த மாநாட்டிலே அதிகளவிலான முதலீட்டாளர்களை உள்ளீர்த்து, அவர்களைக் கவர்ந்து, அவர்களுடைய வர்த்தக முயற்சிகளை, தொழில் முயற்சிகளை ஊக்குவிப்பதற்காக எங்களுடைய அமைச்சு பாரிய முயற்சிகளை முன்னெடுத்து வருகின்றது. இருந்தபோதும், வடக்கு மாகாணத்திலே கூடுதலான சவால்கள் காணப்படுகின்றன. அதாவது, தொழிற்றுறையை அடிப்படை யாகக் கொண்ட வசதிகள் அங்கு குறைவாகக் காணப்படு கின்றது. வீதிகள், மின்சாரம் மற்றும் போக்குவரத்து சம்பந்தமான வசதிகளை மேலும் நாங்கள் அதிகமாக்க வேண்டிய தேவை இருக்கின்றது. கடந்த காலங்களிலே முதலீட்டாளர்கள் மூலதனங்களைப் பெற்றுக்கொள்வதிலும் வங்கிக் கடன்களைப் பெற்றுக்கொள்வதிலும் காணப்பட்ட பாரிய சவால்களை எதிர்கொள்ளவேண்டிய தேவையும் அங்கு திறமையான மனித வளங்களை உருவாக்கவேண்டிய தேவையும் இருக்கின்றது. கடந்த காலத்திலே நாட்டில் ஏற்பட்ட அனர்த்தங்கள் காரணமாக மிகச் சிறந்த அறிவுடையோர் மற்றும் திறன்களைக் கொண்டோர் இந்த நாட்டைவிட்டு வெளியேறியிருக்கிறார்கள். எனவே, அவ்வாறான வளம்மிக்க, திறன்மிக்கவர்களை உருவாக்கவேண்டி இருப்பதோடு, அவர்களுக்கான பயிற்சிகளை அதிகம் வழங்கவேண்டிய தேவைப்பாட்டிலும் நாங்கள் இருக்கின்றோம்.

அதேபோன்று, கடந்த காலங்களிலே வடக்கிலே உற்பத்தி செய்யப்படுகின்ற பொருட்களுக்கு மிகக் குறைந்தளவான சந்தை வாய்ப்புக்களே காணப்பட்டது. உற்பத்திகளைச் செய்வோர் அவற்றைச் சந்தைப்படுத்த முடியாத சூழ்நிலை காணப்பட்டது. குறிப்பாக, வடக்கு, கிழக்கு மாகாணங்களைத் திட்டமிட்ட ரீதியிலே புறக்கணித்த கடந்தகால அரசாங்கங் களைப் போலன்றி, எங்களுடைய அரசாங்கம் எந்தவிதமான பாகுபாடும் இல்லாமல், அனைத்து அபிவிருத்திகளையும் வடக்கு, கிழக்கில் மட்டுமல்லாது, இலங்கையினுடைய எல்லாப் பிரதேசங்களிலும் ஒரேமாதிரியான முறையில் மேற்கொள்ளும் வகையில் இந்த Budgetஇன் ஊடாக நிதி ஒதுக்கி, எங்களுடைய பொருளாதார அபிவிருத்திக்கு மிக முக்கியத்துவம் கொடுத்து, நாட்டை முன்னேற்றக்கூடிய நடவடிக்கைகளில் ஈடுபட்டிருக் கின்றது.

உங்களுக்குத் தெரியும், ஒரு நாடு முன்னேற வேண்டுமாக இருந்தால் அங்கு தொழிற்றுறை முன்னேற வேண்டும் என்பது. இலங்கையைப் பொறுத்தளவிலே இரண்டு விடயங்களிலே நாங்கள் மிக அதிகமாகக் கவனம் செலுத்திக்கொண்டு இருக்கின்றோம். அதாவது, உல்லாசப் பிரயாணத் துறையூடாக ஈட்டுகின்ற வருமானத்தை அதிகரித்தல் மற்றும் தொழிற் றுறையை விருத்தி செய்வதன்மூலம் உள்நாட்டிலே வேலை வாய்ப்பில்லாத இளைஞர், யுவதிகளுக்கு அதிகமான வருமானத்தைப் பெற்றுக்கொடுப்பதனூடாக இந்த நாட்டை நாங்கள் வளப்படுத்துதல் என்பனவாகும்.

இந்த நாட்டிலே பாரிய முன்னேற்றங்கள் மற்றும் அபிவிருத்திகள் இடம்பெறுகின்றபொழுது இங்கே சிலருக்கு வயிற்றெரிச்சலாக இருக்கின்றது. இந்த நாட்டிலே எந்தவிதமான அபிவிருத்தியும் நடக்கக் கூடாது அல்லது இந்த நாட்டிலே அபிவிருத்திகளைச் செய்கின்றபோது அவற்றைக் குழப்ப வேண்டும் என்று பலர் துடித்துக் கொண்டிருக் கிறார்கள். குறிப்பாக, எனக்கு முன்னால் இங்கே இருக்கின்ற என்னுடைய நண்பர்கள் தமிழ் மக்களுடைய அபிவிருத்தி தொடர்பாக, அவர்களுடைய முன்னேற்றம் தொடர்பாகக் கதைக்கின்றபொழுது நாங்களும் மகிழ்ச்சியடைகின்றோம். அதற்காக உங்களுக்கு நாங்கள் ஆதரவைத் தருகின்றோம். அதேபோன்று, சந்தர்ப்பம் வருகின்றபொழுது அதை வாய்ப்பாகப் பயன்படுத்தி, ஓர் இனவாதச் சூழலை இந்த நாட்டிலே உருவாக்கி, அமைதியைக் குழப்புவதற்காகப் பலர் முண்டியடித்துக்கொண்டு இருக்கிறார்கள். இங்கே வைத்தியர் கௌரவ இராமநாதன் அர்ச்சுனாவும் இருக்கின்றார். *[இடையீடு]* நான் கதைப்பதைக் குழப்பிக்கொண்டிருக்க வேண்டாம் என்று அவருக்குச் சொல்கின்றேன்.

தமிழ் மக்களுடைய அபிவிருத்தி சம்பந்தமாக நாங்கள் உங்களுக்கு முழுமையான ஒத்துழைப்பை வழங்கி, உங்களுடன் சேர்ந்து இயங்கத் தயாராக இருக்கின்றோம். ஆனால், நாங்கள் கொண்டுவருகின்ற நல்ல நடவடிக்கைகளை நீங்கள் எதற்காக எதிர்க்கின்றீர்கள்? இந்த நாடு கடந்த காலங்களிலே 'கொவிட்' காரணமாக, economic crisis காரணமாக பாரிய வீழ்ச்சியைக் கண்டிருந்தது. அதன் காரணமாகப் பெருமளவானோர் வெளிநாடுகளுக்குப் போய் விட்டார்கள். அண்மையில் நீங்களும்கூட வெளிநாட்டுக்குப் போயிருந்தீர்கள். சுவிட்சர்லாந்திருந்து படம் போட்டீர்கள், பிரான்சிலிருந்தும் படம் போட்டீர்கள். நானும் வெளிநாடுகளுக்குப் போயிருந்தேன். அந்த நாடுகள் எப்படி வளர்ச்சியடைந்திருக்கின்றன என்று பார்த்தோம். அதேபோன்றுதான் இலங்கையும் வளர்ச்சியடைய வேண்டும். எங்களுடைய பிள்ளைகள், உங்களுடைய பிள்ளைகள் எல்லோரும் சேர்ந்து இந்த நாட்டிலே சுபிட்சமான வாழ்க்கையை அனுபவிக்க வேண்டுமென்றால், நாங்கள் சகிப்புத் தன்மையோடு இருக்க வேண்டும். அதைவிடுத்து, நாட்டிலே ஏதாவது அனர்த்தம் நிகழ வேண்டும், அந்த அனர்த்தத்திலே குளிர்காய்ந்து எப்படியாவது மீண்டும் ஆட்சிக்கு வரவேண்டும் என்ற எண்ணத்தைத் தவிர்த்து, நானோ, நீங்களோ இங்கே இருப்பதற்குக் காரணமான மக்களுக்காக, இந்த நாட்டினுடைய பிள்ளைகளுக்காக, நாட்டின் எதிர்காலத்திற்காக நாங்களும் நீங்களும் சேர்ந்து எங்களுடைய முழுமையான முயற்சிகளை மேற்கொள்ள வேண்டும் என்று எனது நண்பர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த அழகான, வளமான நாட்டை மீண்டும் ஒரு சுபிட்சம் மிக்க நாடாக, எல்லா நாடுகளுக்கும் முன்னுதாரணமான ஒரு நாடாக மாற்றியமைக்க நாங்கள் திடசங்கற்பம் பூண்டிருக்கிறோம். இதிலே எந்தவிதமான கருத்து வேறுபாடும் இல்லாமல் நீங்கள் உங்களுடைய அரசியலைச் செய்யுங்கள்! நாங்கள் எங்களுடைய அரசியலைச் செய்கிறோம்! உங்களுடைய அரசியலுக்கு எங்களையும் நீங்கள் அழைக்கிறீர்கள்; நாங்கள் ஒருபோதும் வரமாட்டோம் என்பதை இந்த இடத்திலே கூறிக்கொண்டு, இந்த வாய்ப்பை வழங்கியமைக்கு நன்றி கூறி, விடைபெற்றுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Standing Order No. 91(h) මම කියවන්නද, ඔබතුමිය කියවනවාද? It states, I quote:

> "No Member shall make any imputation of improper motives against another Member, or make reference to personal affairs of another Member."

මෙතුමා මගේ personal affairs ගැන කථා කළා. මට උත්තර දෙන්න පුළුවන්ද? මෙතුමා මගේ personal affairs ගැන කථා කළා. ඔබතුමිය interpretation එක අහන්න ඇති නේද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාගේ personal දෙයක් ගැන මොකක්ද කථා කළේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම පිට රට ගියා, කට්ටිය හම්බවුණා කියලා මට අපහාස කරලා තිබෙනවා. ඒවා මෙතැන පාර්ලිමේන්තුවේ කියන්න ඕනෑ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
එහෙම අපහාසාත්මක කථාවක් ඔබතුමා ගැන කියැවුණේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැත්නම් මම ආපසු Hon. Speakerට ලියලා, හෙට උදේ හරි විධියට උත්තර දෙනවා, මේකට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හොඳයි, ලියන්න Hon. Speakerට.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට අවස්ථාව දෙනවාද, නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාගේ කථාව අවස්ථාවේදී කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. මගේ නම සඳහන් කරලා, මම පිට රට ගියා කියලා එතුමා එහෙම ප්‍රකාශ කළාම ඔබතුමිය මට විනාඩියක් දෙන්නේ නැතුව ඉන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හොඳයි, ඔබතුමා තත්පර 30කින් උත්තර දෙන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Deputy Chairperson.

හොඳයි, මම දෙමළෙන් කියන්නම්. මට විනාඩියක් දෙන්න. හරියට විනාඩිය ගන්න පුළුවන් නේ. විනාඩියක් දෙන්න.

நீங்கள் புகழும் பெயரும் இல்லாமல் அந்தப் பக்கம் இருப்பதைவிட, 'சுயேட்சைக் குழு 17' anytime உங்களை வரவேற்கிறது. நன்றி. வணக்கம்!

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
நான் இங்கு அவருடைய பெயரை வேண்டுமென்று சொல்லவில்லை. நான் அங்கு கதைத்ததைப் போன்று அவரும் சில விடயங்களைக் கதைத்திருந்தார். அதைத்தான் நான் இங்கு உதாரணமாகச் சொல்லியிருந்தேன். எங்களுக்குச் சுயேட்சைக் குழுவாக இயங்கவேண்டிய தேவை இல்லை. நாங்கள் தமிழ் மக்களின் நன்மைகளுக்காகச் சேர்ந்து இயங்குவோமென இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.00]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, முக்கிய அமைச்சுகளில் ஒன்றான கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சின் 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு நான் மிக்க மகிழ்ச்சி அடைகின்றேன்.

எமது நாடு கடந்த கால யுத்தத்தால் பாதிக்கப்பட்டு தேசிய வருமானம் இல்லாத நிலையில் இருந்தது. இந்த அமைச்சினூடாக தேசிய வருமானத்தைப் பெறுவதற்கான நல்ல வாய்ப்புகள் இருக்கின்றன. இந்த அமைச்சைத் தலைமைதாங்கி நடத்துகின்ற கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களுக்கு எனது அம்பாறை மாவட்ட மக்கள் சார்பாக நன்றி தெரிவிக்கக் கடமைப்பட்டு இருக்கின்றேன். எமது அம்பாறை மாவட்டத்தில் அமைந்துள்ள ஹிங்குராணை - கல்ஓயா தனியார் நிறுவனத்தால் கரும்பு உற்பத்தி செய்யப்படும் செயற்பாடுகளால் அம்பாறை மாவட்ட கரும்புச் செய்கையாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள் தொடர்பாக அம்பாறை மாவட்ட பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் ஒன்றிணைந்து முன்வைத்த கோரிக்கைக்கு

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

அமைய, கௌரவ அமைச்சர் அவர்கள் அம்பாறை மாவட்டத்துக்கு வருகை தந்து, விசேட ஒருங்கிணைப்புக் குழுக் கூட்டமொன்றை நடாத்தி, அம்பாறை மாவட்ட கரும்புச் செய்கையாளர்களின் உண்மை நிலையை அறிந்து, சீனி நிறுவனத்துக்கு ஒதுக்கப்பட்ட காணியின் விபரங்கள் தொடர்பிலும் கரும்புச் செய்கையில் ஈடுபட்டுள்ள விவசாயி களுடைய காணிகளின் விபரங்கள் தொடர்பிலும் அறிக்கை சமர்ப்பிப்பதற்கு அம்பாறை மாவட்ட அரசாங்க அதிபர் சிந்தக்க அபேவிக்ரம அவர்களின் தலைமையில் விசேட குழுவொன்றை நியமித்திருந்தார். உண்மையிலேயே நாங்கள் இதனை அம்பாறை மாவட்டத்தில் இடம்பெற்ற ஒரு வரலாற்று நிகழ்வாகவே பார்க்கின்றோம். இந்த விடயத்துக்கு எங்களுடைய மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவர் கௌரவ பிரதி அமைச்சர் வசந்த பியதிஸ்ஸ அவர்களும் உதவி செய்திருக்கிறார். அவருக்கும் நான் இந்த இடத்தில் எமது மக்கள் சார்பாக நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன்.

கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக வந்த பின்னர், சீனி சம்பந்தமான பாரிய ஊழல் ஒன்று நடைபெற்றது. அது பற்றி உங்களுக்குத் தெரியுமென நான் நினைக்கின்றேன். தேர்தலின்போது தனக்காகக் கஷ்டப்பட்டவர்களுக்காக - செலவழித்தவர்களுக்காக - சீனிக்கான வரியை அவர் குறைத்தார். அதனால் இவர்கள் இந்த நாட்டுக்கு இரண்டு வருடங்களுக்குத் தேவையான சீனியை மொத்தமாக இறக்குமதி செய்தார்கள். அவ்வாறான வரலாற்றை உடைய நாட்டிலே இன்று நாம் வாழ்கின்றோம். இன்று நல்லதோர் அமைச்சர் கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சைத் தலைமைதாங்கி, நல்ல விஷயங்களைச் செய்து வருகின்றார். அதற்காக அவருக்கு நான் நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன்.

சீனிக் கூட்டுத்தாபனத்தால் மேற்கொள்ளப்படும் கரும்புச் செய்கை சீரான முறையில் நடைபெற்று, அதன்மூலம் இலாபம் கிடைக்குமானால், எங்களுடைய அம்பாறை மாவட்ட விவசாயிகள் ஒருபோதும் நெல் உற்பத்தியை மேற்கொள்ள மாட்டார்கள் என்பது எங்களுடைய பிரதி அமைச்சர் வசந்த பியதிஸ்ஸ அவர்களுக்கும் தெரியும். ஆனால், அவர்களுக்குக் கிடைக்கின்ற இலாபத்தை எல்லாம் தனியார் கம்பனிகள் அப்படியே வட்டிக்கு வட்டி எடுத்து, அந்த மக்களை மீண்டும் ஏழையாக்குகின்றன. விவசாயம் செய்யாத, கரும்புச் செய்கை செய்யாத காணிகளைத் தனியார் கம்பனியினர் எடுத்து, அந்தக் காணிச் சொந்தக்காரருடைய பெயரில் வங்கிகளில் கடன் எடுத்து, அந்த மக்களைக் கடனாளியாக்கிக் கொண்டிருக்கின்ற பாரியதொரு மாபியா அங்கே நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. இது பற்றி நாங்கள் உங்களுக்குச் சொல்லி இருக்கின்றோம்.

கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களின் அறிவுறுத்தலின் பேரிலும், அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவரின் வழிகாட்டலின் பேரிலும், அம்பாறை மாவட்ட அரசாங்க அதிபர் தலைமையிலான சம்பந்தப்பட்ட பிரதேச செயலாளர்கள், மூத்த நில அளவையாளர், காணி ஆணையாளர் அடங்கிய குழுவானது, கரும்பு விவசாயிகள் பயிரிடும் நிலத்தின் பரப்பளப்பு, தொழிற்சாலையால் பயன்படுத்தப்படும் நிலத்தின் பரப்பளவு, காலியாகவுள்ள நிலத்தின் பரப்பளவு, பிற சாகுபடிக்கு உட்படுத்தப்பட்டுள்ள நிலத்தின் பரப்பளவு, விவசாயிகளின் நிலங்களின் உரிமை மற்றும் கல்ஓயா பிளான்டேஷன் (பிரைவேட்) லிமிடெட்டுக்குச் சொந்தமான நிலத்தின் பரப்பளவு குறித்து விரிவான தகவல்களைச் சமர்ப்பிக்க வேண்டுமெனத் தெரிவித்தது. இதன்படி, மூத்த நில அளவையாளர் மற்றும் காணி ஆணையாளரின் உதவியுடன் நிலத்தை நடைமுறையில் ஆய்வு செய்து விரிவான அறிக்கை சமர்ப்பிக்கப்பட்டது. அதன்படி, அம்பாறை, தமன, அக்கரைப்பற்று, அட்டாளைச்சேனை, சம்மாந்துறை, இறக்காமம் போன்ற பிரதேச செயலாளர் பிரிவுகளில் சீனி நிறுவனத்துக்கு ஒதுக்கப்பட்ட நிலங்களில் கையடக்க GPSஐப் பயன்படுத்தி தரவுகளைச் சேகரித்து, மூத்த நில அளவையாளர் மற்றும் தொடர்புடைய பிரதேச செயலாளர்களின் பங்கேற்புடன் கள ஆய்வொன்று நடத்தப்பட்டுள்ளது. மேலும், ஓர் ஆய்வறிக்கையும் தயாரிக்கப்பட்டுள்ளது. அந்த ஆய்வு அறிக்கையின்படி, கல்ஓயா பிளான்டேஷன் (பிரைவேட்) லிமிடெட் 6,646 ஹெக்டெயார் நிலத்தைப் பயன்படுத்து கின்றது. இருப்பினும், 1975ஆம் ஆண்டு மார்ச் 21ஆம் திகதியிட்ட 156ஆம் இலக்க வர்த்தமானி அறிவித்தல், 1989.10.12ஆம் திகதியிட்ட 580ஆம் இலக்க வர்த்தமானி அறிவித்தல், 10-170 அறிவித்தல் ஊடாக அரசாங்க நிலங்கள் கரும்புச் சாகுபடிக்காக இலங்கை சீனி வாரியத்துக்கு மாற்றப்பட்டுள்ளன.

இலங்கை சீனி வாரியத்தின்கீழ் பயன்படுத்தப்பட்ட 7,465.99 ஹெக்டெயார் நிலம் மேற்கூறிய நிலத்துக்குப் பதிலாக ஹிங்குராணை சீனி நிறுவனத்துக்கு மாற்றப்பட்டு இருந்தாலும், கள ஆய்வின்போது 6,646 ஹெக்டெயார் நிலம் இருப்பது அடையாளம் காணப்பட்டுள்ளது. அதன்படி, ஹிங்குராணை சீனி நிறுவனத்துக்கு ஒதுக்கப்பட்ட நிலம் தொடர்பில் நடத்தப்பட்ட கணக்கெடுப்பின்படி, 819 ஹெக்டெயார் நில வேறுபாடு உள்ளது. அந்த வேறுபாட்டுக்கான காரணங்கள் பின்வருமாறு: நிறுவனம் வழங்கும் வசதிகளுடன் விவசாயிகள் கரும்பு பயிரிடும் நிலத்தின் அளவு 5,279 ஹெக்டெயார். விவசாயிகள் பயிரிடும் நிலத்தின் அளவு 304 ஹெக்டெயார். ஹிங்குராணை சீனி நிறுவனத்துக்கு ஒதுக்கப்பட்ட நிலங்களுக்குள் ஒரு குறிப்பிட்ட அளவு நிலத்துக்கு தனிநபர்களுக்கு உரிமங்களும் மானியங்களும் வழங்கப்பட்டுள்ளன. பிரதேச செயலாளர் களால் வழங்கப்பட்ட உரிமங்களில் அல்லது உறுதிகளில் - permitsஇல் - “கரும்பு சாகுபடிக்கு மட்டும்” என்ற நிபந்தனை சேர்க்கப்பட்டுள்ளது. மேற்குறிப்பிட்ட விவசாயிகள் பயிரிடும் 5,729 ஹெக்டெயார் நிலத்தில் 224 ஹெக்டெயார் நிலம் விவசாயிகளிடமிருந்து மீட்கப்பட்டு, நிறுவனம் கரும்பு பயிரிடுமெனக் குறிப்பிடப்பட்டுள்ளது. இந்தக் காணி தொடர்பான அறிக்கையின் பிரதியை நான் இந்தச் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

கல்ஓயா பெருந்தோட்ட நிறுவனம் விவசாயிகளிடமிருந்து நிலங்களை வலுக்கட்டாயமாகக் கையகப்படுத்தி, அவை தங்கள் சொந்த நிலங்கள் என்று கூறி, “கரும்பு சாகுபடிக்கு மட்டும்” உரிமம் பெற்ற நிலங்கள் என்ற நிபந்தனையுடன், அக்கரைப்பற்று மாவட்ட நீதிமன்றத்தில் சுமார் 70 வழக்குகள் நிலுவையில் உள்ளன. சில விவசாயிகள் ஒதுக்கப்பட்ட நிலத்தில் தயக்கத்துடன் கரும்பு பயிரிடுகிறார்கள். இன்னும் சில விவசாயிகள் ஒதுக்கப்பட்ட நிலத்தில் நெல் மற்றும் பிற பயிர்களை பயிரிடுகின்றனர். கரும்புக் காணிகளில் கரும்பு அறுவடை செய்யத் தாமதிப்பதால் கீழ்குறிப்பிடப்படும்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

நஷ்டங்கள் ஏற்பட்டுள்ளன. மேலதிக வட்டி கரும்பு விவசாயிகளிடம் அறிவிடப்படுகின்றன. உரிய காலத்துக்குள் செய்கை செய்யாததால் கரும்பு பூத்து அழிவடைந்து நஷ்டம் ஏற்படுகின்றது. வேலையாட்களுக்கு மேலதிகக் கொடுப்பனவு கொடுத்து அறுவடை செய்கின்றமையால் கரும்புச் செய்கை யாளர்களுக்கு நஷ்டம் ஏற்படுகின்றது. காலம் நீடிக்கப் பட்டதால் பராமரிப்புச் செலவு அதிகரித்து அதிக செலவும் ஏற்படுகின்றது. காலம் தாழ்த்திச் செய்யப்படுகின்றமையால் இரண்டாம் முறை கரும்பு உற்பத்தியில் வீழ்ச்சி ஏற்படுகின்றது. மேற்படி செயற்பாட்டால் கரும்புச் செய்கையாளர்களின் வாழ்வாதாரம் முற்றுமுழுதாக அழிக்கப்பட்டு வருகின்றது.

15.10.2025 அன்று அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவரும் கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சருமான கௌரவ வசந்த பியதிஸ்ஸ அவர்களின் தலைமையில் நடைபெற்ற விசேட கலந்துரையாடலின்போது, 2025/26 மகா போகத்தில் மட்டும் கரும்பு நிலங்களில் நெல் பயிரிடுவதற்குத் தேவையான ஒப்புதலைப் பெறுவதற்கான முன்மொழிவுகளை இயக்குநர் குழுவிடம் சமர்ப்பிப்பதாக முடிவு எடுக்கப்பட்டுள்ளது. கௌரவ அமைச்சர் அவர்களே, கரும்புச் செய்கையைச் சரியாக மேற்கொள்வதற்குரிய வசதிகளைத் தனியார் கம்பனிகளுக்குச் செய்துகொடுத்து, இலாபம் ஈட்டுவதற்குரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அவ்வாறு முடியாதென்றால், அவர்கள் நெல் உற்பத்தி செய்யக்கூடிய வகையில், ஒரு மாற்றுத் திட்டத்தை நீங்கள் முன்வைக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நீங்கள் எனக்கு இரண்டு நிமிடங்களைக் கூடுதலாகத் தர வேண்டும். ஏனெனில், என்னுடைய மாவட்டத்திலுள்ள பிரச்சினைகளைச் சொல்ல வேண்டும்.

இலங்கை கனிய மணல் கூட்டுத்தாபனத்தின் புல்மோட்டை நிலையத்தில் பணியாற்றும் 83 ஊழியர்களுக்கு கடந்த 15 மாதங்களாகச் சம்பளம் வழங்கப்படாமல் இருப்பதால், அவர்களின் வாழ்க்கை மிகுந்த சிரமத்துக்கு உள்ளாகி உள்ளது. சுமார் 39 நாட்கள் தொடர்ச்சியாக ஆர்ப்பாட்டம் செய்தும் சம்பளப் பிரச்சினைக்குத் தீர்வு கிடைக்காத நிலையில், அடுத்த கட்ட நடவடிக்கையாக அவர்கள் தொடர் சத்தியாக்கிரகத்தில் ஈடுபட்டு வருகின்றனர். சம்பள நிலுவை தொடர்பாகப் பல முறை கூட்டுத்தாபனத்தின் தலைவரிடத்திலும் அமைச்சின் செயலாளரிடத்திலும் முறையிட்டும் இதுவரை தீர்வு கிடைக்காத நிலையில், தொடர் சத்தியாக்கிரகச் செயற் பாடுகளை முன்னெடுத்து வருகின்றனர். அண்மையில் நடைபெற்ற திருகோணமலை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் கலந்துகொண்ட கௌரவ கைத்தொழில் அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களிடம் ஊடகவியலாளர்கள் இது தொடர்பாகக் கேள்வி எழுப்பியபொழுது, புல்மோட்டை கனிய மணல் கூட்டுத்தாபனத்தில் பணியாற்றும் 83 ஊழியர் களுக்கான சம்பள நிலுவையையும் சம்பளத்தையும் உடனடி யாக வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்பட்டு வருவதாக அவர் தெரிவித்தார். ஆனால், இதுவரை இலங்கை கனிய மணல் கூட்டுத்தாபனத்தின் புல்மோட்டை நிலையத்தில் பணியாற்றும் 83 ஊழியர்களுக்கான சம்பள நிலுவை வழங்கப்படாத நிலை தொடர்கின்றது. எனவே, புல்மோட்டை கனிய மணல் கூட்டுத்தாபனத்தில் பணியாற்றும் 83 ஊழியர்களின் சம்பள நிலுவையையும், சம்பளத்தையும் வழங்குவதற்கான ஏற்பாடுகளை கௌரவ அமைச்சர் அவர்கள் விசேட கவனம் செலுத்தி மேற்கொள்ள வேண்டுமென நான் அவர்கள் சார்பில் கேட்டுக் கொள்கின்றேன்.

இதேவேளை, 2023ஆம் ஆண்டு டிசம்பர் மாதம் முன்னாள் கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சருமான Dr. Ramesh Pathirana அவர்கள் காலி மாவட்டத்தைச் சேர்ந்த 17 பேருக்கு தற்காலிக நியமனங்களை புல்மோட்டை நிலையத்தில் வழங்கி இருக்கிறார். அந்த 17 பேருக்கும் சம்பளம், மேலதிக கொடுப்பனவுகள், விடுதிகள், மின்சார வசதி, நீர் வசதி உட்பட பல வசதிகள் செய்து கொடுக்கப்பட்டு இருக்கின்றன. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் மேற்குறித்த 83 ஊழியர்களின் பிரச்சினைகளை கவனத்தில் எடுக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, அவர்கள் படும் வேதனையை நீங்கள் அறிவீர்கள். ஏனெனில், நீங்களும் போராட்டங்களை நடத்தியவர்; மக்களுடைய உணர்வுகளை உணர்ந்தவர். எனவே, அந்த ஊழியர்களுடன் பேச்சுவார்த்தை யில் ஈடுபட்டு, அவர்களின் பிரச்சினைகளைத் தீர்த்து வைக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කරුණාකර මට තව විනාඩියක් දෙන්න.

நான் அம்பாறை மாவட்டம் சம்பந்தமாக ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். உங்களுடைய அமைச்சால் முன்னெடுக்கப்படும் 1,000 இளம் தொழில்முயற்சியாளர்களை உருவாக்கும் தேசிய திட்டத்தில் கிழக்கு மாகாணத்தின் அம்பாறை, திருகோணமலை மாவட்டங்கள் உள்வாங்கப் படவில்லை. இது சம்பந்தமான முன்மொழிவொன்றை நான் அமைச்சின் அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் முன்மொழிந்தேன். அதற்குப் பதிலளித்து உங்களுடைய அமைச்சின் செயலாளர் எனக்குக் கடிதம் ஒன்றையும் அனுப்பி இருக்கிறார்.

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சால் முன்னெடுக்கப்படும் 1,000 இளம் தொழில் முயற்சியாளர்களை உருவாக்கும் தேசிய திட்டத்தில் கிழக்கு மாகாணத்தின் அம்பாறை, திருகோணமலை மாவட்டங்கள் உள்வாங்கப்படாமையால், இவ்விரு மாவட்டங் களிலும் உள்ள தொழில் முயற்சியாளர்களும் இளைஞர்களும் பாதிக்கப்பட்டுள்ளனர். இத்திட்டத்தில் அம்பாறை, திருகோணமலை மாவட்டங்களும் உள்வாங்கப்படும் என்று எதிர்பார்த்திருந்த தொழில் முயற்சியாளர்கள் ஏமாற்ற மடைந்துள்ளனர். கௌரவ அமைச்சர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில், 1,000 இளம் தொழில் முயற்சியாளர்களை உருவாக்கும் தேசிய திட்டத்தில், எங்களுடைய கிழக்கு மாகாணத்தைச் சேர்ந்த அம்பாறை, திருகோணமலை மாவட்டங்களையும் உள்வாங்குவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

கொள்கின்றேன். இறுதியாக, உங்களுடைய நல்ல நடவடிக்கைகள் இந்த நாட்டின் தேசிய வருமானத்துக்குப் பங்களிக்க வேண்டுமெனக் கூறி, உங்களுக்கு வாழ்த்துத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[අ.භා. 3.11]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාදය පැවැත්වෙන අද දවසේ මට කථා කරන්න ඉතාම කෙටි වේලාවක් තමයි වෙන් වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත්, කර්මාන්ත අමාත්‍යාංශය ගැන කථා කරනකොට අපට අමතක කරන්න බැහැ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්. ඇත්තටම මේ වෙනකොට ඔවුන්ගේ තත්ත්වය අසාධ්‍ය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක ඔබතුමන්ලා දන්නවා. ඒකට හේතුව තමයි, පසුගිය කාලයේ පැවති කොරෝනා වසංගතය සහ රට බංකොලොත් වීම තුළ මේ ක්ෂේත්‍රයට විශාල හානියක් සිදු වීම. ඒ හානිය අවම කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව තුළදීවත්, වර්තමානයේදීවත් සිදු වෙලා නැහැ. දැන් තමුන්නාන්සේලා බලයට පත් වෙලා අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. නමුත්, තවම ඒ තත්ත්වය යථා තත්ත්වයට පත් කර ගන්න හැකි වෙලා නැහැ කියන එක පැහැදිලියි. ඒ තුළ ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. මොකද, මේ ක්ෂේත්‍රය තමයි, අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයට සියයට 52ක දායකත්වයක් ලබා දෙන්නේ. එය දළ දේශීය නිෂ්පාදනයට විශාල දායකත්වයක් ලබා දෙන ක්ෂේත්‍රයක්. ඒ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න බැරි වුණාම මොකද වෙන්නේ?

උදාහරණයක් හැටියට ගත්තොත්, මේ ක්ෂේත්‍රය තුළින් රැකියා ලක්ෂ 45ක් විතර උත්පාදනය කරලා තිබෙනවා කියන එක තමයි ඒ සංගමයේ අයගේ මතයත්, දත්ත අනුවත් අපට පෙනෙන්නේ. මේ ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නවලට විසඳුම් නැති වනකොට කාරණා ගණනාවකින් අපි ආපස්සට යනවා. ඒ අනුව නිෂ්පාදන ක්‍රියාවලිය අඩු වුණාම ඒක විශාල වශයෙන් රටේ දළ දේශීය නිෂ්පාදනයට බලපානවා. ඒ වාගේම තමයි, රැකියා අහිමි වීම. මේ වෙනකොට රැකියා අහිමි වීම විශාල වශයෙන් සිද්ධ වෙලා තිබෙනවා. රට බංකොලොත්වීම එක්කත් එය සිද්ධ වුණා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඉදිකිරීම් ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් වෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ වනතුරුම සකස් වෙලා නැහැ.

ඒ වාගේම තමයි, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අත්විඳින්න සිදු වෙලා තිබෙන අයහපත් තත්ත්වය. සමහර කර්මාන්තකරුවන් බැංකුවලින් ණය අරගෙන තිබෙන්නේ තමන්ගේ පෞද්ගලික නිවස පවා ඇපකර හැටියට උකසට තියලා. අපි දන්නවා, ඒ අයට යම් සහන කාලයක් දුන්නු බව පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවලා. නමුත් දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය ඉතා අවාසනාවන්තයි. කර්මාන්ත කරන්න ගිහින්, රැකියා ලබා දෙන්න ගිහින් ඔවුන්ට මොකද වෙලා තිබෙන්නේ? ඔවුන්ගේ වරදකින් නොවෙයි රට බංකොලොත් වුණේ. ඒ තත්ත්වය තුළ අද වනකොට ඔවුන්ගේ පෞද්ගලික දේපළ පවා බැංකුවලට සින්න වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නවලට අපි දැන් විසඳුම් හොයන්න ඕනෑ.

තමුන්නාන්සේලා මැතිවරණයට කලින් නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කළා. ඒ නිෂ්පාදන ආර්ථිකය නැවත ගොඩනඟන්න නම් මේ ක්ෂේත්‍රයේ ඉන්න ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා රැක ගන්න ඕනෑ. නමුත්, ඔවුන් රැක ගන්න අරගෙන තිබෙන පියවර ප්‍රමාණවත් කියලා ඔබතුමා හිතුවාට ඒක ප්‍රමාණවත් කියලා අපි කවුරුවත් විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම අපි දැක්කා, බැංකු ක්ෂේත්‍රය හැර අනෙක් ක්ෂේත්‍ර ඔක්කෝම කොවිඩ් වසංගත තත්ත්වයත්, බංකොලොත්භාවයත් එක්ක කඩාගෙන වැටුණු බව. නමුත්, බැංකු ක්ෂේත්‍රයේ තිබෙන හැම බැංකුවක්ම වැඩියෙන් ලාභ ලැබූ බව අපි දැක්කා. රට ආර්ථික වශයෙන් කඩාගෙන වැටුණු වෙලාවේත්, කොවිඩ් වසංගත තත්ත්වය තුළත් හැම බැංකුවක්ම ලාභ ලැබුවා. අපි කියන්නේ නැහැ, බැංකු ලාභ ලබන්න ඕනෑ නැහැ කියලා. නමුත්, එහෙම තත්ත්වයක් තුළ මේ ව්‍යාපාරිකයින්ට යම් සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවාද? ඇත්තටම බැංකුවලින් මොනවාද කෙරෙන්න ඕනෑ? ලෝකයේ දියුණු වෙලා තිබෙන රටවල ඉතිහාසය තුළින් අපට ඕනෑ තරම් අත්දැකීම් සහ ආදර්ශ ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. බොහෝ දෙනෙක් කථා වෙන රටක් වන ජපානය අපි උදාහරණයක් හැටියට ගත්තොත්, දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ ඒ රටේ බැංකු යුද්ධයෙන් විනාශ වුණු, කඩා වැටුණු ව්‍යාපාර ගොඩනඟන්න, ඒවා නැවත ආරම්භ කරන්න ඒ ව්‍යාපාරිකයින්ට අඩගහලා අවශ්‍ය කරන පහසුකම් ලබා දීලා තිබෙනවා; පොලී රහිතව ණය මුදල් ලබා දීලා තිබෙනවා. ඒ අනුව තමයි ලෝකයේ දැවැන්තම නිෂ්පාදන ආර්ථිකයක් හිමි කර ගන්න ජපානයට පුළුවන් වුණේ. නමුත්, අපේ රටේ බැංකුවලින් ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවාද? අද අපේ ව්‍යාපාරිකයෝ රට දාලා යනවා. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් කවුරුවත් ලංකාවේ ව්‍යාපාර ආරම්භ කරන්න දැන් ලැහැස්ති වෙන්නේ නැහැ. එක පැත්තකින් ඔවුන්ට අධික පොලියක් ගෙවන්න වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංසදයේ ව්‍යාපාරික මහත්වරු පැහැදිලිවම කියා තිබෙනවා, "වැට් බදු ගෙවීමේ සීමාව රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 36 දක්වා අඩු කිරීමට අය වැය තුළින් රජය යෝජනා කර ඇති අතර, මෙමඟින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විශාල ප්‍රමාණයකට ප්‍රබල බලපෑමක් ඇති කරයි. මේ තුළින් මෙම සියයට 18 වැට් බදු පාරිභෝගිකයින්ට එකතු කිරීම තුළ තවදුරටත්..." කියලා. වැට් බදු ගෙවීමේ සීමාව රුපියල් මිලියන 36කට අඩු කිරීම තුළ තවදුරටත් ඒ ව්‍යාපාරිකයින් කබලෙන් ලිපට වැටෙනවා. එතකොට වැට් එක සියයට 18ක් එකතු වුණාම නිෂ්පාදනය කරන භාණ්ඩවල මිල කොහොමත් වැඩි වෙනවා. ඒ අනුව තමුන්නාන්සේලා මැතිවරණයට පෙර කියපු කාරණා එකක්වත් ක්‍රියාත්මක වෙලා

නැහැ. අපි නිරන්තරයෙන් දකිනවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා කථා කරනවා. ඒ සංවිධාන තමුන්නාන්සේලාට බලයට එන්න විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ අය ඇවිල්ලා අපව හමු වුණා, මේ අය වැය විවාදයට කලින්. ඒ අයගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ ඔක්කෝම සඳහන් කරන්න මට මේ අවස්ථාවේදී වෙලාව නැති නිසා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංසදය ඔවුන්ට තිබෙන ගැටලු 10ක් පිළිබඳව වාගේම ඔවුන් මුහුණ දීලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය පිළිබඳව සඳහන් කරලා විපක්ෂයට ලබා දුන් ලිපිය සහ ප්‍රසන්න මදුරසිංහ මහතා විසින් ඉදිරිපත් කළ ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මම හිතන විධියට, ඒ ලිපිය ඇමතිතුමාටත් ලැබිලා ඇති. මොකද, මට තිබෙන්නේ විනාඩි 10යි. ඒ ලිපිය කියවන්න ගියොත් මට ලැබී ඇති වෙලාව අවසන් වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මොකද, මේ තත්ත්වය අපි සමනයට පත් කර ගත්තේ නැත්නම් නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කළාට වැඩක් නැහැ, මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය තව තවත් කඩා වැටිලා, මේ රටේ ඒ සඳහා උනන්දුවෙන් ඉන්න සීමිත පිරිසත් අපට නැති වෙලා යනවා. එම නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම මතක් කරනවා.

ඒ වාගේම, ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය ගත්තාම, දුප්පත්කම ගැන කථා කළාම, මේ වෙනකොට දුප්පත්කම එක් එක් ආකාරයෙන් අපේ රටේ ජනතාවට බලපා තිබෙනවා කියා අපි දකිනවා. එක් පැත්තකින් ඔය සහනාධාර ලබන ජනතාවක් ඉන්නවා. සහනාධාර ගැන කථා කරද්දී, ඇත්තටම අපි ගොඩක් වෙලාවට කළේ මොකක්ද? මේ ජනතාවට ජීවත් වෙන්න එවෙලේට යමක් ලබා දෙන එකයි. අපි දන්නවා, ජනතාවට අත්‍යවශ්‍ය දෙයක් තමයි ආහාර. මේ බංකොලොත්භාවයත් එක්ක ඒක අපි අනිවාර්යයෙන්ම ලබා දෙන්න ඕනෑ. හැබැයි, දුප්පත්කමෙන් මේ ජනතාව ගොඩගන්න දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් මේ වැඩසටහන් තුළ තිබෙනවාද? ඒ දෙකම තිබෙන්න ඕනෑ. මම දැක්කා, අද උදේ ගරු ඇමතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, අපි මෙතැනින් ගොඩ යන්න මානසිකවත් ඒ අය ශක්තිමත් කරන්න ඕනෑ කියලා.

මම මේ දේශපාලනය කථා කරනවා නොවෙයි. මට මතකයි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ පැවැති "ජනසවිය" වැඩසටහන. එතුමා ඒ හදලා තිබුණු වැඩසටහන ලංකාව පුරාම ක්‍රියාත්මක නොවුණත්, අපේ තිබෙන දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එය ක්‍රියාත්මක වුණා. එහිදී තිබුණා ඉතිරි කිරීම. ඒ වාගේම, අවුරුදු 2ක් ඇතුළත එම වැඩසටහන නිමා වුණා. එය නිමාවෙනකොට ඒ පුද්ගලයා ආර්ථික වශයෙන් තවදුරටත් සහනාධාර ගන්න පුද්ගලයෙක් හැටියට නොවෙයි, සහනාධාර ගන්නේ නැති පුද්ගලයෙක් හැටියට සමාජය තුළ නැඟී සිටින්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඒ ජනසවිය වැඩසටහන තුළ තිබුණා. ඊට පසු, 1994දී චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුවෙන් ඒක වෙනස් කරලා සමෘද්ධි වැඩසටහන ගෙනාවා. හැබැයි, මේ සමෘද්ධි වැඩසටහන දිගින් දිගටම එද්දී අපි දකිනවා, ඒක ආකර්ෂණීය වැඩසටහනක් හැටියට ඉස්සරහට යනවා මිසක්, දුප්පත්කමින් අයින් වෙලා එතැනින් එළියට ගන්න වැඩ පිළිවෙළක් නොවෙයි එම වැඩසටහන තුළ තිබුණේ කියලා. මම දැකපු විධියට සමෘද්ධි වැඩසටහන තුළ තිබුණේ දිගින් දිගටම ඒ වැඩසටහනට බද්ධ කරගන්නා වැඩ පිළිවෙළක්. මොකද, සමෘද්ධිලාභී පවුල්වලට වෙන වෙන හිමිකම් ගණනාවක් දීලා තිබුණා.

දුප්පත්කම ගැන කථා කිරීමේදී තවත් කාරණයක් ගැන මම මතක් කරන්න ඕනෑ. එය අපි කාගේවත් අවධානයට යොමු නොවෙච්ච කාරණාවක්. අපේ රටේ මධ්‍යම පන්තිය ගැන, විශේෂයෙන් රජයේ රැකියාවල නිරත වෙලා ඉන්න අය ගැනත් කථා කරන්න ඕනෑ. අපේ ගරු ඇමතිතුමා විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් හැටියට වැඩ කළ නිසා ඔබතුමා මේ ගැන දන්නවා ඇති. දැන් ඔබතුමාගේම හිතවතුන් මේ ගැන කියනවා ඇති. විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක් මට කිව්වා, එතුමා නිවස සඳහා ණයක් අරගෙන තිබෙනවා, වාහනයට loan එකක් දාලා තිබෙනවා, එතුමාට ලැබෙන පඩියෙන් මේ වනකොට ඉතිරි වෙන්නේ රුපියල් 55,000යි කියලා. එතුමාට ළමයි දෙදෙනෙක් ඉන්නවා. මෙවැනි තත්ත්වයේ ඉන්න අයත් දැන් දුප්පත් බවට පත් වෙලා තිබෙනවා. ඔවුන්ට ඒ ගැන කියාගන්න විධියක් නැහැ. ඒක තමයි ඇත්ත. අද අපේ රටේ රජයේ රැකියාවල යෙදී සිටින ඒ වාගේ විශාල කණ්ඩායමක් ඉන්නවා. මම එක් උදාහරණයක් පමණයි ගත්තේ. ඒ අනුව, අද දුප්පත්කම වෙනත් ආකාරයකින් ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, අපි ඔය කියන සහනාධාර කණ්ඩායමට අමතරව හොඳට ජීවත් වෙච්ච කණ්ඩායමකුත් අද මේ ආර්ථිකයත් එක්ක ජීවත් වෙන්න බැරි තැනකට ගිහින් තිබෙනවා. ඒ ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ කියා මතක් කරනවා. මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.22]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද - 2025 නොවැම්බර් මාසයේ 21වැනි දා - සුවිශේෂී දිනයක්. මීට අවුරුද්දකට කලින් මේ රටේ මිනිස්සු නැති වෙමින් තිබුණු, පදනම් අහිමි කරමින් තිබුණු ආර්ථිකයක් නැවත නඟා සිටුවීම වෙනුවෙන්, නැති වෙමින් තිබුණු දේශපාලන, සංස්කෘතික සහ වෙනත් සහජීවනයන් සහිත රටක් හදා ගැනීම වෙනුවෙන් ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනෙකුට බලය ලබා දෙමින් මේ රටේ අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කළා. එසේ ඇති කරලා දැන් අවුරුද්දක කාලයක් තමයි ගෙවී ගිහින් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද උදේ ඉඳලා අපේ විපක්ෂයේ විවිධ පක්ෂවල මන්ත්‍රීවරු කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරපු හැම කථාවක් ඇතුළේම ඔවුන් කියන්න උත්සාහ කරපු එක් කාරණයක් තිබෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට අති සුඛෝපභෝගී සම්පත් සහිත, කිසිදු වැයමකින් තොරව රට සංවර්ධනය කරන්න පුළුවන් සැප සම්පත්වලින් පිරුණු, ආර්ථිකයේ පදනම ශක්තිමත් කරපු හරිම ලස්සන රටක් භාර දුන්නා, අපි ඇවිල්ලා ගෙවුණු අවුරුද්ද තුළ මේ රටට කරන්න පුළුවන් විනාශය සම්පූර්ණයෙන් කළා කියලා තමයි ඒ කථාවල කියැවුණේ. ව්‍යවසායකත්වයේ සිහින දකින්න කියලා නිතර මේ පාර්ලිමේන්තුවේ පුරාජේරු කියන මන්ත්‍රීතුමෙක් අද උදෑසන කථා කරලා කිව්වා, කුමන්ත්‍රණකාරී රජයක් තමයි අපි පිහිටුවූයේ, මත්ද්‍රව්‍ය අල්ල අල්ලා පෙන්වනවා, තරුණයන්ගේ ව්‍යවසායක සිහිනය නැති කරනවා කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2025 නොවැම්බර් මාසයේ 02වැනිදා වෙද්දී ලැබුණු දත්ත ප්‍රමාණයක් මම ඔබතුමියට ඉදිරිපත් කරන්නම්. මේ, පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරි විසින් නිකුත් කරපු දත්ත. මේ රටේ මේ ගත වෙච්ච කාලය තුළ මත්ද්‍රව්‍ය -හෙරොයින්, අයිස්, කොකේන්, ගංජා, කුෂ්, මදනමෝදක මේ ආශ්‍රිත මත්ද්‍රව්‍ය- සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන 1,282ක්. හෙරොයින් කිලෝග්‍රෑම් 86ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. වැටලීම් කරලා තිබෙනවා 437ක්. නීතිවිරෝධී වත්කම් විමර්ශන ආරම්භ කරපු සැකකරුවන් ගණන 02යි. රැඳවුම් නියෝග මත ලබා ගත් සැකකරුවන් ගණන 17යි. වැටලීම්වල එකතුව 1,274යි. පුනරුත්ථාපනයට යොමු කළ පිරිස 26යි. අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 252ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. වැටලීම් 448ක් කරලා තිබෙනවා. මහා ජාවාරම්කාර රටක් අපට භාර කරලා තිබුණේ. මත්ද්‍රව්‍යවලින් මේ රට අල්ලා ගෙන, විනාශකාරී රටක් අපට භාර කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි කාට හෝ අපේ හෘදය සාක්ෂියට එකඟව විශ්වාසයෙන් කියන්න පුළුවන්ද උදේ ගෙදරින් එළියට යන දරුවා ආරක්ෂිතයි කියලා. මේ වාඩි වෙලා ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනාගේ දරුවන් ගෙදරින් එළියට ගියාම ආරක්ෂිතව නැවත ගෙදරට එයි කියලා හිතන්න පුළුවන්ද? ඇත්ත හෘදය සාක්ෂියක් තිබෙන අම්මා කෙනකුට, තාත්තා කෙනකුට එහෙම හිතන්න පුළුවන්ද මෙච්චර මත්ද්‍රව්‍ය අහු වෙන රටක. ඒ නිසා අල්ලා අල්ලා මේවා පෙන්වනවා කියා පුරාජේරු කථා කිව්වාට, අපිට මන්ද මානසිකත්වයක් නැහැ එහෙම කරන්න. අපි එකාවන්ව එකතු වෙලා මේ උත්සාහ කරන්නේ මත්ද්‍රව්‍යවලින් තොර රටක් නිර්මාණය කරන්න. අපිට තිබෙනවා ජාතික සැලැස්මක්. අපිට නැහැ, කවුරුවත් ආරක්ෂා කර ගැනීමට බැඳීමක්. මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ එක්ක අපිට බැඳීමක් නැහැ. අපිට හෘදය සාක්ෂියක් තිබෙනවා. අපේ දරුවන්ට ආරක්ෂිත රටක් ඉතිරි කරන්නට ඕනෑ. තාරුණ්‍යයට ආරක්ෂිත රටක් ඉතිරි කරන්නට ඕනෑ. ඒ නිසා කවුරුන් හෝ පුරාජේරු දොඩනවා නම් අපිට දීලා ගිය සංවර්ධිත රට අපි විනාශ කළා කියලා, ඒක නොවෙයි වෙලා තිබෙන්නේ. ජාතික ජන බලවේගය ආණ්ඩුවට මහා විනාශකාරී රටක් ලැබුණේ. අපි අවංකව සතුටු වෙනවා එක කාරණයක් ගැන. මේ අවුරුද්ද තුළ වෙන මොනවා කරන්න බැරි වුණත්, නවක මන්ත්‍රීවරු විධියට අපි සියලු දෙනා සමත් වෙලා තිබෙනවා නීතියේ සමානාත්මතාව සහිත, අල්ලසින්, දූෂණයෙන්, වංචාවෙන් තොර රටක් හදලා පෙන්වන්න. අපි භාර ගත්තේ විනාශ වූ රටක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෙනින්ගේ "තෝරාගත් කෘති" වල එක් ප්‍රකාශයක් මම මේ වෙලාවේ සභාවේ කියන්න කැමැතියි. "ධනපති සමාජයේ මළකුණු පෙට්ටියක බහා ඇණ ගසා වළලා දැමීමට නුපුළුවන. අප මධ්‍යයේම කුණු වී දිරාපත් වන ධනපති ක්‍රමයේ මළකුණු වාතය අපිරිසිදු කරයි. අපගේ ජීවිතවලට විස පොවයි. පැරණි මරණාසන්න හා කුණුවන දෙයින් විහිදෙන දහසක් නූල් හා බන්ධනවලින් අලුත් නැඹුල් සහ පෞරුෂතා සහිත සියල්ල පටලවා තබයි" මේ ලෙනින් කියන්නේ. අපි මේවායින් පටලවලා තිබෙන්නේ. මේ විපක්ෂය විසින් පතුරුවන යම් යම් දූෂිත වෙච්ච කාරණා දූෂිත මතවාද, අසත්‍ය මතවාද -මේ සියල්ල- අපි නිර්මාණය කරන්න හදන රට විනාශ මුඛයට ගෙනයනවා. ඒ නිසා අද අය වැය විවාදයේ මට කථා කරන්න ලැබුණු මාතෘකාව ගැන කථා කිරීමට පෙර මම මේ කාරණය මතක් කළේ, කවුරුන් හෝ හිතනවා නම් අපිට දීපු සුබෝපභෝගී රට අපි විනාශ කළා කියලා, ඒක එහෙම නොවෙයි, අපිට මළකුණු ගඳගහන රටක් දුන්නේ, ඒ රට තුළ තමයි අපි මේ කටයුතු ටික කරගෙන යන්නේ කියන එක මතක් කරන්න තමයි මම මේ කාරණා ටික මතක් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ 2025 සහ 2029 දක්වා කාලය තුළ පවුල් ලක්ෂ 20ක් සවිබල ගැන්වීම තමයි අපේ ප්‍රධාන ඉලක්කය. මේ සවිබල ගැන්වීමේ ක්‍රමවේදය ඇතුළේ ජීවනෝපාය ප්‍රවර්ධනය, මූල්‍ය අන්තර්කරණය, මනෝ සමාජීය බලගැන්වීම, සමාජ ආරක්ෂණය, පුහුණුව සහ මඟ පෙන්වීම කියන ප්‍රධාන මාතෘකා 5 යටතේ, ප්‍රධාන කාරණා 5 යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකු ආධාරත්, නියමු ව්‍යාපෘති දෙකක් විධියට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ජාතික වැඩසටහන මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වෙනවා.

අපි දැන් වර්තමාන ප්‍රගතිය ගැන කථා කරමු. සවිබල ගැන්වීම සඳහා හඳුනා ගත් පවුල් සංඛ්‍යාව 292,050ක් වනවා. පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම් 247,154ක් වනවා. ඒ ආදි වශයෙන් අපි ප්‍රතිලාභීන් විශාල ප්‍රමාණයක් හඳුනා ගනිමින් ඔවුන්ට ජීවනෝපාය සංවර්ධනය කර ගැනීම සඳහා ආධාර ලබා දී තිබෙනවා. ආධාර ලබා දී ඇති පවුල් සංඛ්‍යාව 6,480ක් වනවා. ජීවනෝපාය ආධාර ලබා දීමට සූදානම් ව්‍යාපෘති සංඛ්‍යාව 2,100ක් වනවා. ඒ වාගේම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ තරුණ තරුණියන් රැකියාගත කිරීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය වෙනුවෙන් තරුණ තරුණියන් 65,670ක් ලියාපදිංචි කර තිබෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. සවිබල ණය ඉලක්කගත ප්‍රතිලාභීන් සඳහා උපරිමය රුපියල් 250,000ක් දක්වා ලබා දීමේ ව්‍යාපෘතිය අපි ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම සමෘද්ධි රන්පත ණය, සමෘද්ධි ණය වැඩසටහන්, සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල යටතේ ක්‍රියාත්මක වන විශේෂ වැඩසටහන්, නිෂ්පාදන ගම්මාන වැඩසටහන, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන්, "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන ආදිය අපි ක්‍රියාත්මක කරගෙන යනවා. සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල යටතේ ඉලක්කගත නිවාස 1,020ක් සඳහා නිවාස ආධාර වට්ටිනාකම් අපි ලබා දී තිබෙනවා. සමාජ සංවර්ධනය සහ විශේෂ වැඩසටහන් රාශියක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

"ප්‍රජාශක්ති" කමිටුව ගැනත් මෙහිදී කථා කළා. ඒ සම්බන්ධයෙන් විවේචනයක් විපක්ෂය පැත්තෙන් ගෙන ආවා, අපි එය දේශපාලනීකරණය කරන්නට යනවා කියලා. ප්‍රජාශක්ති කමිටු හරහා එවැන්නක් සිදු වන්නේ නැහැ. සෑම ග්‍රාම නිලධාරි වසමකම නායකත්ව පුහුණුවක් සහිත සභාපතිවරයෙකු සහ රජයට වග කියන, පරිපාලන ක්ෂේත්‍රය නියෝජනය කරන නිලධාරීන් 4දෙනෙක් ප්‍රජාශක්ති කමිටුවේ ඉන්නවා. ඔවුන් සියලුදෙනාගේ සහයෝගය, ඔවුන් සියලුදෙනාගේ නිපුණතාවන් එක් රැස් කරගත් ප්‍රජා ශක්ති කමිටුවක් තමයි අප ක්‍රියාත්මක කරන්නේ. කවුරු හරි අපට අත දිගු කරනවා නම්, අපි ඒකෙන් දේශපාලනය කරන්න හදනවා කියලා, ඒක වැරැදියි. මොකද, එහෙම දේශපාලනය කරපු මිනිසුන්ට වැඩ වැරැදුණු නිසායි ඔවුන්ට ගෙදර යන්න සිදු වුණේ. අපි ප්‍රජාශක්ති කමිටුව හරහා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා, ගමට අහිමි වෙච්ච ගමේ සංවර්ධනයට මුල්තැන දිය යුතු සංවර්ධන වැඩසටහන්. කළ යුතු එවැනි සංවර්ධන වැඩසටහන් තිබියදී එදා වෙනත් දේවල් කළා. ඒ වෙනුවට ඇත්ත සංවර්ධනය ගෙන එන්නට අපි ප්‍රජාශක්ති කමිටුව හරහා ක්‍රියාත්මක වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණයත් කියලා මම මගේ කථාව අවසන් කරන්නම්.

ඇත්තටම පැවැත්මේ වැදගත්කම තිබෙන්නේ තමන්ට තිබෙන බුද්ධිය හෝ ශක්තිය මත නොවෙයි, අනුවර්තනය වීමට තිබෙන හැකියාව මතයි. ඒ නිසා අනුවර්තනය වෙන්න බැරි කිසි කෙනෙකුට පවතින්නට බැහැ. ඒක තමයි, චාල්ස් ඩාවින්ගේ නියමය. ඒ නිසා අනුවර්තනය වෙන්න. දැන් මේ රට ඉන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුව විශ්වාස කරමින්. ඒ අනුවර්තනයට හැඩ ගැසෙන්න බැරි සියලුදෙනා විනාශ මුඛයට පත් වෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුවක් යටතේ අපි මේ රට හදනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට විනාඩි 20ක් නේද තිබෙන්නේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අද යන්නේ නැද්ද නුගේගොඩ රැස්වීමට?

[අ.භා. 3.32]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ මෙතැන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ලබා දී තිබෙන කාලය සංශෝධනය කරලා මිනිත්තු 25ක් ලබා දෙනවා කියලා මට ආරංචියි. ඒ කාලයත් අරගෙන මම මගේ මිත්‍ර සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්තාව ලබා ගන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබ විපක්ෂයේ හිටපු ආකාරයට අද ඔබේ අමාත්‍යාංශය සම්බන්ධයෙනුත් රැඩිකල්භාවය ඇති කළා නම් මා හිතන්නේ, ඔබතුමාගේ ගමන ඉතාම සාර්ථක වනවා කියලායි. ඔබතුමා ඒ කටයුත්තට විශ්‍රාමයක් තබපු එක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ රැඩිකල්භාවය දැනුත් ඇති කළා නම්, අප විවිධ debates පැවැති අවස්ථාවලදී කියපු දේවල් කරන්න ඔබතුමාට දැන් අවස්ථාව ලැබෙනවා. ඔබතුමාට ඒවා කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී තමන්ගේ දැනුම පාවිච්චි කිරීම විතරක් නොවෙයි කළ යුත්තේ. තීන්දු ගන්න පුළුවන් ලේකම්වරියකුත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්නවා. ඒ නිසා ඒ කණ්ඩායම තුළින් ඔබතුමන්ලා ඒ රැඩිකල් වෙනස ඇති කරන්න කියලා විපක්ෂයේ සිටිමින් මා කියන්නේ, මේ රටේ ආර්ථිකය හදන්න අවශ්‍ය නිසායි. ඒක දේශපාලන වශයෙන් පාට කිරීම නොවෙයි අවශ්‍ය වන්නේ.

මීට පෙර කථා කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමිය ඉතාම ආවේගශීලීවයි කථා කළේ. ඒක හොඳයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Powerful.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු බිමල් රත්නායක මැතිතුමා කියනවා, ඒ කථාව powerful ලු. බොහොම හොඳයි. ඒ කථාව ක්‍රියාවේ යොදවන්න. ඒක තමයි දැන් අවශ්‍ය වන්නේ.

ඔබතුමන්ලාගේ ආණ්ඩුවට දැන් අවුරුද්දක් වෙනවා. මීට පෙර අය වැය විවාදය කරන කොට ඔබතුමන්ලා "L" බෝඩ් දාගෙන ගියේ. දැන් අවුරුද්දක experience එකක් එක්කයි යන්නේ. එහෙම නම්, ගන්න තිබෙන තීන්දු ඔබතුමන්ලා ගන්න. අවුරුදු 76ක් ගැන කියමින් බණින එක නවත්වන්න. එහෙම බැන්නා කියලා කිසි දෙයක් අලුත් වෙන්නේ නැහැ. දැන් තිබෙන්නේ යා යුතු ගමන යන්නයි. මම කලිනුත් කිව්වා වාගේ අවුරුදු 76 තුළ වෙච්ච අයහපත් දේවල් තිබෙනවා නම්, ඒවා අහක් කරන්න. මේ අවුරුද්ද තුළ අලුතින් මොකුත් හදලා නැහැ නේ, ගරු ඇමතිතුමනි.

මම තවත් කාරණයක් කියන්න මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. අපි දන්නවා අපේ රටට ලොකු ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. සුද්දාගෙන් නිදහස බලෙන් ලබා ගත්තාට පසුව, අපි එය රටේ අවශ්‍යතාව අනුව කටයුතු කළ හැකි පරිදි නිවැරැදි කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා මේ රටේ ප්‍රාග්ධනය පිළිබඳව වාගේම තිබෙන අනෙකුත් ප්‍රශ්න මොනවාද කියලා කියන්න. ගරු ඇමතිවරුනි, ඔබතුමන්ලා එදා වාමාංශික ආණ්ඩුවක් ගැන කියමින්, නිර්ධන පන්තිය නියෝජනය කරන බව කියමින්, "ධනපතියන්ට හංග වේවා!" කියමින් ගියා. අන්තිමේදී ධනපති ආර්ථිකයක් හදන්න ඕනෑ කියන සංකල්පයම නේද දැන් කියන්නේ, ගරු බිමල් ඇමතිතුමනි? ඔබතුමන්ලා දැන් වෙනස් වෙලා. ලාල් කාන්තගෙනුත්, එතුමා ළඟ ඉන්න බිමල්ගෙනුත් ඒක පෙනෙනවා. දැන් සුනිල් ඒක කියාගෙන යනවා. වසන්ත දැන් ඒ ගැන ඉගෙන ගනිමින් යනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාගේ ව්‍යාපාරවලට අපේ ආණ්ඩුවෙන් හානියක් වෙලා තිබෙනවාද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Tax එක වැඩියි. *[බාධා කිරීමක්]* එහෙම නොවෙයි, සමස්තයක් වශයෙනුයි මා කියන්නේ. රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවත් tax ගැහුවා වැඩියි. මම ඒකත් කියනවා. මම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන එදා කිව්ව එකම තමයි අදත් කියන්නේ. ඔබතුමන්ලාට මේ රට හදන්න ඕනෑ නම්, කරුණාකරලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කියන්න "අපි මේ බදු සියයට 36, සියයට 24ට අඩු කරනවා" කියලා. එහෙම කළොත් තමයි වෙනසක් ඇති වන්නේ. ඒකෙන් අඩු වෙන්නේ බිලියන 25යි. ඒක චක්‍රාකාරයෙන් අල්ලන්න පුළුවන්, රටේ ආර්ථිකය දියුණු කිරීම තුළ. ඒ සඳහා තමයි තරුණ ව්‍යවසායකයන් බිහි කරන්න ඕනෑ. තරුණ ව්‍යවසායකයන් ලක්ෂ 10ක පිරිසක් අද බිහි කරන්න ඕනෑ.

[ගරු රවි කරුණානායක මහතා]

මේ වෙලාවේ ගරු සභාවේ අනිල් ජයන්ත ඇමතිතුමා ඉන්නවා. එතුමා කම්කරු ඇමති. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, වැඩ කරන ජනතාව ඉන්න කර්මාන්ත ක්ෂේත්‍රය භාර ඇමති. ඒ සියයට 36 ප්‍රමාණය සියයට 24ට අඩු වෙනවා නම් ඒ incremental impact එක තුළින් මේ රටේ රැකී රක්ෂා බිහි වෙනවා. ඒ තුළින් මේ රටේ දළ දේශීය නිෂ්පාදනය ව්‍යාප්ත වෙයි. ඒ ව්‍යාප්ත වීම තුළ අපේ tax base එක broad වෙයි. ඒ broad වෙන tax base එක තමයි අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඒ ඉල්ලීම කරන්න අවශ්‍යයි; ඒ අභියෝගය භාර ගන්න අවශ්‍යයි. ඒ වාගේම තමයි මේ රටේ පොලී අනුපාතිකය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගැන කථා කරලා විතරක්, මතුපිටින් අත ගාලා විතරක් හරියන්නේ නැහැ. ඔබතුමන්ලා ණය පොලී අනුපාතිකය සියයට 5ක, 6ක මට්ටමට ගන්න ඕනෑ. ඒ වාගේ දේවල් කියන නිසා තමයි ජනාධිපතිවරයා කිව්වේ, "රවීට තමයි මහ බැංකුව බය" කියලා. ඔව්, මම අහනවා, මේ රටේ පාර්ලිමේන්තුවේ අවසරය නැතුව මේ රට පිළිබඳව බංකොලොත්භාවය ප්‍රකාශ කළේ කොහොමද කියලා. ඒ ගැන තමයි බය වෙන්න ඕනෑ. සේවක අර්ථසාධක අරමුදල මොකද එතැන තියා ගත්තේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වා, public debt management එළියට ගන්න ඕනෑ නම් මේකත් එළියට ගන්න ඕනෑ කියලා. ඇයි මේක විතරක් රැකගෙන ඉන්නේ? ඔබතුමන්ලා ඒක එළියට ගන්න. වැඩි කල් යන්න ඉස්සෙල්ලා ඔබතුමන්ලා කියාවි, මහ බැංකුවේ ස්වාධීනත්වය හේතුවෙන් ඔබතුමන්ලාට කෙළවෙන්නේ කොහොමද කියලා. ඒකට වැඩි කල් යන්නේ නැහැ. දැන් උද්ධමනය වැඩි වෙනවා. අනුර දිසානායක ජනාධිපතිවරයා මෙතැනට ඇවිල්ලා අයවැය කථාව ඉදිරිපත් කරන කොට ඇමෙරිකානු ඩොලර් එක රුපියල් 300.2යි; අද රුපියල් 312.72යි. මේක black market අගය නොවෙයි, official අගයයි. එදා ඉඳන් අද වනකල් ගත්තාම, මේ රටේ ණය බරතාව වැඩි වෙලා තිබෙනවා; බිලියන 398කින්. මම ගිය සැරේ කිව්වා, එය බිලියන 300යි කියලා. දැන් එය බිලියන 398යි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කර්මාන්ත අමාත්‍යාංශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයට තුළ ලොකු දෙයක් කරන්න පුළුවන්. ඒක කරන්න. මම මේ කියන්නේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට පොලී අනුපාතය අනිවාර්යයෙන්ම අඩු කරලා දෙන්න කියලායි. කර්මාන්ත ඇමතිතුමා වශයෙන් ඒක කරන්න ඔබට හැකියාව තිබෙනනවා. අනිල් ජයන්ත මැතිතුමා මුදල් නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්නවා. මුදල් අමාත්‍යාංශයේ මීට වඩා පෙරළියක් ඇති කරන්න අවශ්‍යයි. තීන්දු ගන්න අය ඔබතුමන්ලා වෙන්න අවශ්‍යයි. මොකද, අද රජයේ නිලධාරින් බයයි තීන්දු ගන්න. ඒකට ඒගොල්ලන්ට බණින්නත් බැහැ. මොකද, බැරි වෙලාවත් වැඩිපුර සපත්තු කුට්ටමක් ආවොත්, කොහොමද ඒක ආවේ කියලා ප්‍රශ්න කරන යුගයක් ඇවිල්ලා තිබෙන්නේ. මා හිතන විධියට, අපේ රටේ තරුණ තරුණියන්ට අනාගතයක් ඇති කරන්න පුළුවන් මාර්ගයක් හදන්න ඕනෑ.

ඔබතුමන්ලා ඡන්ද කාලයේ විකුණපු පොරොන්දු මොනවාද? ඒ කාලයේ, මොනවාද නොදෙනවා කිව්වේ? නමුත්, දැන් බලන්නේ, නොදෙන්නේ මොනවාද කියලායි. නමුත්, අපි මෙතැන ඔබතුමන්ලාගේ ආණ්ඩුවට විරුද්ධව බෝඩ් ලෑලි අල්ලන්නේ නැහැ, "අරක කරන්න එපා, මේක කරන්න එපා" කියලා. ඔබතුමන්ලා කොච්චර ලක්කාරයෝද? නමුත්, අපි බලයේ ඉන්න කොට ඔබතුමන්ලා කිව්වේ, "සංවර්ධනය කරනවා කියලා හොරකම් කළා, ඒකා හොරා, මේකා හොරා" කියලා නේ. එදා එහෙම කිය කියායි හිටියේ. මම කියන්නේ, ඔබතුමන්ලා ඒ තත්ත්වය වෙනස් කරන්න කියලායි; ඔබතුමන්ලාත් අපේ රටේ ආර්ථිය හැදීමේ කොටස්කරුවන් වෙන්න කියලායි. ඒ නිසා තමයි මම හැම වෙලාවේම කියන්නේ, එක්සත් ජාතික පක්ෂය මේ රටේ අවුරුදු 76ක සංවර්ධනයක් ඇති කරලා තිබෙන පක්ෂයක් කියලා. අද තනි මන්ත්‍රීවරයෙකු හිටියත් එදා ලක්ෂ ගණන් ඡන්ද ගත්තු පක්ෂයක්, එය. අද ඒ පක්ෂයේ එකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වීමේ භාග්‍යය ලබා තිබෙන මම මේ දේවල් කියන්නේ මේ රට සංවර්ධනය කරන්න ඕනෑ කියන සිතුවිල්ල නිසායි. ඔබතුමන්ලාත් ඒ සිතිවිල්ල එක්ක එකතු වෙන්න.

ඒ විතරක් නොවෙයි. මේ රටේ tax ප්‍රමාණය සියයට 36 සියයට 24ට අඩු කරනවා වාගේ VAT ප්‍රමාණයට අදාළව two-structure rate එකක් ඇති කරන්න. නිෂ්පාදකයෙකුට සියයට 18ක VAT එකකුයි, SSCL සියයට දෙකහමාරකුයි එකතු කළාම මොකද වෙන්නේ? නිෂ්පාදකයෙකු වත්කමකුත් තියලා සියයට 15ක පොලියට ණයක් අරගෙන, සියයට 18ක VAT එකක් ගෙවලා, SSCL එකට සියයට දෙකහමාරක් ගෙවලා ඔබේ ආණ්ඩුවට සියයට 30ක් බදු ගෙවන්න වුණාම, මොකටද ව්‍යාපාර, කර්මාන්ත කරන්නේ කියන ප්‍රශ්නය ඇති වෙනවා නේද? ඒ නිසා තමයි මම කියන්නේ, මේ රටේ tax base එක ට්‍රිලියන 2.1කට - මිලියන 2,100කට- වඩා වැඩි වුණා කිව්වත්, ඒකෙන් තෘප්තිමත් වෙලා වැඩක් නැහැ කියලා. මොකද, අපේ tax base එක වැඩිවෙලා නැහැ. ඒ tax base එක වැඩි කරන එක තමයි අවශ්‍ය වෙන්නේ. අනිල් ජයන්ත ඇමතිතුමා දන්නවා, මම මොනවාද කියන්න හදන්නේ කියලා. ඔබතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවාම, ඔබතුමා යටතේ තිබෙන මහ බැංකුවට පුළුවන්ද මට උත්තර දෙන්න? බැහැ, ඔබතුමා නිහඬ කරනවා. එහෙම බැරි වුණාම, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාට සියයට 5 ගණනේ ණය දෙන්න ඕනෑ වුණත් කොහොමද තමන්ගේ මූල්‍ය ප්‍රතිපත්තිය අරගෙන යන්නේ?

ඔන්න, දැන් වසන්ත සමරසිංහ ඇමතිතුමාත් සභාවට එනවා. දැන් full squad එකම මෙතැන ඉන්නවා. ඉතින්, මීට ඉස්සෙල්ලා අපට මොනවාද කිව්වේ? අපි විපක්ෂයේ ඉඳලා මේ වාගේ උදව් කරනකොට ඔබතුමන්ලා මොනවාද කියන්න ඕනෑ? ඔබතුමන්ලා බෝඩ් ලෑලි අල්ලාගෙන "ස්තුතියි" කියන්න ඕනෑ. මම එහෙම කියන්නේ මොකද? අපට අවශ්‍යයි මේක හදන්න. ඔබතුමන්ලා මේ ආර්ථිකය හැදුවේ නැති වුණාම ඉබේම බලය එන්නේ අපට. ඊට පස්සේ ආර්ථිකය හදන්න ඕනෑ අපි නිසා මේක කුඩුපට්ටම් කළා කියලා අපට තෘප්තියක් ලැබෙන්නේ නැහැ. එම නිසා ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමන්ලාට තිබෙන්නේ මේ තිබෙන පොලී අනුපාතය, මේ තිබෙන tax එක අඩු කරන්න, මේ තිබෙන වක්‍රශීලී බව අඩු කරන්න කටයුතු කරන එක.

ඒ විතරක් නොවෙයි, para tariff අඩු කරන එක ගැනත් මෙතැනදී කථා කළා. ඔබට මේ රටේ දේශීය නිෂ්පාදන ආරක්ෂා කරන්න ඕනෑ නම් මොකක්ද කරන්න ඕනෑ? මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමිය කියපු කථාව අනුව බැරිවෙලාවත් para-tariff ඉවත් කළොත්, ඔබේ අමාත්‍යාංශය වහලා දමන්න පුළුවන්; Ministry of Industry නොවෙයි, import and trade කියන අමාත්‍යාංශය ඔබතුමාට ගන්න පුළුවන්. ඒක වසන්ත සමරසිංහ ඇමතිතුමා ගනීවි. ඉතින්, ඔය දෙක අතර තරගය තමයි තිබෙන්නේ.

අපි ඔබතුමාට කිව්වේ, minimum selling price, maximum selling price කියලා දාලා වැඩක් නැහැ නේ. සීනිවලටත් දාලා හොම්බ ඇණගත්තා නේ. ඒ නිසා තමයි මම කියන්නේ, මේක open trade කියලා. ඔබතුමා මේ රටේ ඇති කරන්න අවශ්‍ය වෙන්නේ, අනිවාර්යයෙන්ම economies of scale advantage එකක්. ඒ නිසා තමයි මම හැම වෙලාවේම සීනි සම්බන්ධයෙන් කියන්නේ. Economies of scale කියලා කිව්ව නිසා මම ඒක ගන්නම්. අපේ අවශ්‍යතාව සීනි මෙට්‍රික්ටොන් 650,000යි. ඒ

ප්‍රමාණයෙන් අපි 81,000ක් මේ රටේ නිෂ්පාදනය කරනවා. දැන් මෙට්‍රික්ටොන් ලක්ෂයකට කිට්ටුව යනවා. හැබැයි, impact එකක් කරන්න නම්, අපි දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ප්‍රමාණය මදි. අද රුපියල් 195ට ආනයන කරනකොට, ඒක රුපියල් 210ට විතර trade වෙනවා. ඒකට රුපියල් 50ක specific levy එකක් දාලා තිබෙනවා. ඔබතුමා "දුඹුරු සීනි පියා" නේ. ඉතින්, ඔය වාගේ තාත්තෙක් කොහොමද අපේ ළමයි ටිකට කන්න දෙන්නේ? දුඹුරු සීනි කිලෝග්‍රෑම් එකක් රුපියල් 265ට විකුණනකොට, සුදු සීනි රුපියල් 205යි කියලා market කරලා තිබෙන එක වෙනත් ආකාරයකට මාරු කරන්න. ඒක තමයි ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් කරන්න ඕනෑ. කරන්න බැරි දේ තිබෙනවා නම් අයින් වෙන්න. ඔබතුමා පටන් ගත්තා කියලා දිගට අරගෙන යන්න ඕනෑ නැහැ. පැල්වත්ත සමාගම commercialize කරන්න; පුළුවන් තරම් commercialize කරන්න. ඒක තමයි ඔබේ පැවැත්ම, එහෙම වුණොත් තමයි පාරිභෝගිකයාට අඩු මිලකට හොඳ දේ දෙන්න පුළුවන් වෙන්නේ. දුඹුරු සීනි කියලා අල්ලාගෙන ඉඳලා වැඩක් නැහැ, ඒක තමයි වෙනස් වෙන්න ඕනෑ විධිය.

ඒ වාගේම තමයි ඔබතුමන්ලා සීනි crystals ගෙනැල්ලා - ඔබතුමන්ලා දැන් කියන්න එපා, සුදු පාටට ගෙනාවොත් ඒවා අයිස් කියලා - ඒ කටයුත්ත මෙහේ කළා නම්, ඔබතුමාට සුදු සීනි නිෂ්පාදනය කරන්න පුළුවන්. දුඹුරු සීනිත් එක්ක සුදු සීනිවලටත් තරග කරන්න පුළුවන් විධියට නිෂ්පාදනය කිරීම තමයි මේ අවස්ථාවේ කළ යුතු වෙන්නේ.

ඒ වාගේම තමයි, පළපුරුදු සේවකයන් අද අපේ රටින් පිටට යනවා. මොකද, ඒගොල්ලෝ හිතනවා, ඒ අයට රස්සා දෙන්න ව්‍යවසායකයන්ට බැරි වුණාම මේ රටේ රස්සා නැහැ කියලා. එහෙම හිතලා ඒ අය රුපියල් 75,000, රුපියල් 80,000 වැටුපට මැදපෙරදිග රටවලට යනවා. ඒ අය අම්මලා, තාත්තලා, අයියලා, මල්ලිලා මෙහේ තියලා යනවා. ඒක අපරාධයක්. ඒ නිසා තමයි මම කියන්නේ මේ රටේ ව්‍යවසායකයන් බිහි කරන්න කියලා. ව්‍යවසායකයන් බිහි කිරීම තුළින් තමයි අපේ තරුණ තරුණියන් අනාගතයේදී මේ රට තුළ ඉන්නේ. බැරි වෙලාවත් ව්‍යවසායකයෙකුට අද කර්මාන්තයක් ආරම්භ කරන්න ඕනෑ නම්, ඒ අයට ඉස්සෙල්ලාම අවශ්‍ය වෙන්නේ හොඳ සේවක පිරිසක් ගන්න එක. නමුත්, මෙහේ හොඳ සේවකයන් නැහැ. ඒක තමයි ඔබේ අමාත්‍යාංශය තුළින් ඇති කරන්න අවශ්‍ය වෙන්නේ.

ඒ වාගේම, BoI, IDB, Ministry of Environment, industrial parks කියන මේ ඔක්කෝම ගත්තොත්, ඒ තැන්වල තමයි ඔබතුමන්ලා රැඩිකල් වෙනසක් ඇති කළ යුත්තේ. Industrial park එකක තිබෙන රජයේ ඉඩමකට අද ඉල්ලීමක් කළොත්, කොතරම් කාලයක් යනවාද ඒ ඉඩම ලබා දෙන්න? බැරි වෙලාවත් ඔබතුමා අද අත්සනක් දැම්මොත්, අවුරුදු 5කට පස්සේ ඔබෙන් අහයි, "ඇයි, සුනිල් හඳුන්නෙත්ති මෙයාට දුන්නේ?" කියලා. ඔන්න ඔය ප්‍රශ්නය තමයි තිබෙන්නේ. කරුණාකරලා ඒක දැන්වත් කැබිනට් එක තුළින් වෙනස් කරන්න. ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් තිබෙනවා. ඔබතුමන්ලාගේ 159දෙනා සිග්නල් කණු වාගේ අත් ඔසවන්න මෙතැන ඉන්නවා. ඉතින්, මේ තීරණය ගතයුත්තේ ඔබේ අභිවෘද්ධියට විතරක් නොවෙයි, රටේ අභිවෘද්ධියටත් එක්ක කියන එකයි මම මේ අවස්ථාවේ කියන්නේ.

ඒ වාගේම market access ගත්තොත්, අපි කොතරම් market access එකක් ගත්තත්, ලක්ෂ 220ක ජනගහනයක් තමයි මේ රටේ ඉන්නේ. අපි market access ගන්න ඕනෑ ඉන්දියාවට, සාර්ක් රටවලට; BIMSTEC එක තුළ market access ගන්න ඕනෑ. ඒ වාගේම regional cooperations තුළින් ASEAN රටවලට ගන්න ඕනෑ. මෙහෙම තමයි අපේ market එක expand කරන්න අවශ්‍ය වෙන්නේ. නමුත් මට පේන්නේ නැහැ, අමාත්‍යාංශ හැටියට ඔබතුමන්ලා ඒ සඳහා වැඩ කරනවා කියලා. මේ අවස්ථාවේ විවිධ market accesses ඇති කිරීම අවශ්‍යයි. විජිත හේරත් ඇමතිතුමා කියලා තිබුණා, ඇමෙරිකාවේ - ට්‍රම්ප් සමඟ - market access ඇති කරන වැඩ පිළිවෙළ තවම කරලා නැහැ කියලා. ඒක පුළුවන් තරම් ඉක්මනට කරන්න. ඊට පස්සේ supply chain stability එකත් පුළුවන් තරම් ඉක්මනට ඇති කරන්න ඕනෑ.

ඊට පස්සේ තිබෙනවා, outdated industrial regulations. ගරු ඇමතිතුමනි, 1942 Factories Ordinance එක සහ 1990 Industrial Promotion Act එක තිබෙනවා. මම දන්නේ නැහැ, මේවා පසුව වෙනස් වුණා ද කියලා. මේවායේ තිබෙන්නේ, ගතානුගතික නීති. මේකට artificial intelligenceවලින් කරන්න දෙයක් තිබෙනවා නම්, මේකට modern technology එක ගෙනෙන්න ඕනෑ වුණත් ඒවා සම්පූර්ණයෙන් අධෛර්යවත් කරනවා. අපට අවශ්‍යයි මේ දේවල් සංශෝධනය කරන්න. සංශෝධනය කරන්න තිබුණත්, මෙවැනි outdated industrial regulations තුළින් ඒවා පරාජය කරනවා. මම ඉතාම ඕනෑකමින් කියනවා, මේක තමයි වෙනස් කරන්න තිබෙන එකම මාර්ගය කියලා.

ඔබතුමන්ලා කියනවා මේ රටේ සියයට 7ක, 8ක වර්ධන වේගයක් අවශ්‍යයි කියලා. සියයට 8ක, 9ක වර්ධන වේගයක් අවශ්‍ය නම්, මේ රටේ incremental capital output ratio එක අඩු ගණනේ සියයට 7ක, 8ක තබා ගැනීම අවශ්‍යයි. මම මේ කියන්නේ, සම්පූර්ණයෙන්ම ආයෝජනය කරන්න තිබෙන ප්‍රමාණය. ඒ කියන්නේ සම්පූර්ණ public investment එක. ඒක බෙදනවා, capital input එකෙන්. ඊට පස්සේ incremental capital output ratio එක, 4 බැගින් ගන්න අවශ්‍ය නම්, අඩු ගණනේ සියයට 30ක් පමණ මේ රටේ ඉතිරි කිරීම් පාවිච්චි කරන්න අවශ්‍යයි. නැත්නම් පිට රටින් ආයෝජන ගෙනෙන්න අවශ්‍යයි. ඔබතුමන්ලා මේ වෙනස කරන්න අවශ්‍ය වන්නේ, දිරි ගැන්වීම ඇති කරන්නයි. ඔබතුමන්ලා සියලුදෙනාම මෙතැන ඉන්න නිසා මම මේ ගැනත් කියන්නම්. කරුණාකරලා IMF එකට කියන්න, අපි හෙට ඉඳලා දිරිගැන්වීම් දෙනවා, ඒ නිසා qualifying payments දෙන්න කියලා. Tax holidays දෙන්න ඕනෑ නැහැ. නමුත් qualifying payments ලබා දෙන්න කියන්න. වියදම් කළා නම්, ඒ වියදම් කරන ප්‍රමාණය මේ tax එකෙන් අඩු කරන්න පුළුවන්. ඊට පස්සේ, ඔබතුමන්ලාට ඒක link කරන්න පුළුවන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට. මේ කථා කරන මොහොතේත් රුපියල් මිලියන 970ක් වියදම් කරනවා, පාරිභෝගික භාණ්ඩවලට. අපි තවම අල, ලූනු, පොල් -පොල් තවම ගෙනාවේ නැහැ- සීනි, පිටි ගේනවා. ඒවාට අවුරුද්දකට ට්‍රිලියනයක් වියදම් වෙනවා කියන්නේ, අපේ සීමිත විදේශ විනිමය එළියට යන එකයි. අපේ blue chip companiesවලට කියන්න, ඔයගොල්ලන්ගේ tax එක අපි අඩු කරලා දෙන්නම්, import substitution එකක් කෘෂිකර්ම ක්ෂේත්‍රයට ඇති කරලා දෙන්න කියලා. ඒවා තුළින් තමයි ආර්ථිකය නවීකරණය කරන්න පුළුවන් වෙන්නේ. ඒක කරන්න බැරිකම නොවෙයි තිබෙන්නේ. ඒක කරන්න ඕනෑකමක් තිබෙනවාද, නැද්ද කියන එකයි තිබෙන්නේ.

මම නිදසුනක් කියන්නම්. කොරියාවේ Samsung Electronics Co. Ltd. එක, අවුරුදු 22කට කලින් බංකොලොත් වුණා. බංකොලොත් වෙනකොට ඒකේ හිටපු CEO කිව්වා, මේක නැවත reorient කරන්න ඕනෑ, reposition කරන්න ඕනෑ කියලා. ඔහු මොකක්ද කළේ? Samsung phone එක අරගෙන completely reinvent කළා. ඒක අවුරුදු 2කින් compete කරන්න පටන් ගත්තා, Nokia Corporation එකත් එක්ක. එදා, ලෝකයේම Nokia තමයි තිබුණේ. අද වෙනකොට ඒක කොච්චර වර්ධනය වෙලා තිබෙනවාද? අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතය US Dollars 82 billion. ඒ කොම්පැනියේ division එකේ iPhone

[ගරු රවි කරුණානායක මහතා]

එක විතරක්, ලෝකයේ market එකෙන් US Dollars 222 billion. ඒ කියන්නේ, අපේ දළ දේශීය නිෂ්පාදිතය වාගේ තුන් ගුණයක්, iPhone එක විතරක්! ඒ වාගේම Samsung phone එක අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් හරියට අඩක් වන US Dollars 50 billion. එතකොට phone එකකින් කොච්චර ආදායමක් ලබනවාද? අපේ රටේ ඔක්කෝම ගත්තත්, අපේ කෘෂිකර්මය, අපේ services ඔක්කොම එකතු කරලා දළ දේශීය නිෂ්පාදිතයට සම කළාම ඒ වාගේ දෙයක් තිබෙනවාද? Toyota Motor Corporation එකේ 2024 වර්ෂයේ ආදායම බිලියන 411යි, Toyota cars ලෝකයට අපනයනය කිරීම තුළින්. අපේ ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය US Dollars 84යි. ඉතින් ඇමතිතුමනි, අපට කොතරම් දේවල් කරන්න පුළුවන්ද කියලා පෙනෙනවා නේ එක product එකකින්. මොකක්ද අපේ රටේ වෙලා තිබෙන්නේ? 1948දී අපි නිදහස ලබා ගන්නා අවස්ථාවේදී අපේ ඒක පුද්ගල ආදායම US Dollars 48යි, ජපානයේ US Dollars 49යි. ඒගොල්ලන්ට කිසිම ස්වාභාවික සම්පතක් තිබුණේ නැහැ. අපට හැමදේම තිබිලාත් මේක නම් මොකක්ද මේ රටට වෙන්නේ? මොකක්ද අපේ ඉරණම? ඔබතුමන්ලා දැන් බලයට ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා තමයි පෙළපාළි ගියේ, ප්‍රශ්න ඇති කළේ. දැන් ඒවා වෙනස් කරන්න. දැන් ආණ්ඩුවක් විධියට කටයුතු කරගෙන යන්න. දැන් ඒ රැඩිකල්භාවය ඇති කරලා මේ රටේ ආර්ථිකය හදන ගමන ගැන කියන්න. ඒ නිසා තමයි මම කාරුණිකව ඔබතුමන්ලාගෙන් මේ ඉල්ලීම කරන්නේ. ආර්ථිකය හදන්න පුළුවන් ගමන අපි ආරම්භ කරන්න අවශ්‍යයි. රට තුළ රැකීරක්ෂා ප්‍රමාණය ඇති කරන්න අවශ්‍යයි. මේ තුළින් තමයි ඔබතුමන්ලාට වෙනසක් ඇති කරන්න පුළුවන් වන්නේ.

ඒ වාගේම තමයි මැණික් කර්මාන්තය. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් එදා ප්‍රශ්නයක් ඇහුවා. ඒකට යම් ප්‍රමාණයකින් උත්තරයක් ලැබුණා. නමුත්, ඒක මදි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම බලන විධියට මට විනාඩි පහක්ම තිබෙනවා. කමක් නැහැ, ඔබතුමියගේ නම්‍යශීලීභාවය තුළ මම එය භාර ගන්නම්.

මැණික් කර්මාන්තය ගත්තොත්, මැණික් කර්මාන්තය තිබෙන තත්ත්වය අනුව අද ඒවා සාක්කුව ඇතුළේ දමා ගෙන යන්න පුළුවන්. ඒක නවත්වන්නේ කොහොමද? එම නිසා පුළුවන් තරම් ඒක නීතිගත කරන්න. මොකද, මමත් මුදල් ඇමති වශයෙන් කටයුතු කරලා තිබෙනවා. ඒ වෙලාවේ ඇවිල්ලා කථා කරනකොට අපෙන් අහන එකම දේ තමයි, ඒක නීත්‍යනුකූලව ගේන්න අපට තිබෙන motivation එක මොකක්ද කියන එක. එම නිසා මේක වෙනස් කරන්න බැහැ. මොකද, මේක ලෝකයේම නවත්වන්න බැරි දෙයක්. එම නිසා හැම එකටම සියයට 36ක් දමන්න කියලා IMF එකෙන් කිව්වා කියලා, ඒ වාගේ දේවල් අනුගමනය කරන්න එපා. මේක පුළුවන් තරම් නීතිගත කරන්න. "අරක වුණා, මේක වුණා, ඩේසි ආච්චි අරක කළා" කියලා ඒක නිසා සියයට 36ක් දාලා වැඩක් නැහැ. මේ කර්මාන්තය තුළ බිලියන දෙකක target එකක් ඇති කරන්න. ඒ බිලියන දෙකේ target එක අනිවාර්යයෙන්ම ඇති කරන්න පුළුවන් දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ අනිල් ජයන්ත ඇමතිතුමා දන්නවා ඇති, හවාලාවලට වැඩියෙන්ම පාවිච්චි කරන්නේ මැණික් කියලා. මොකද, යූඑස් ඩොලර් මිලියන 100ක් පිටරට යවන්න ඕනෑ කියලා මහ බැංකුවට කිව්වාම, ඒකෙන් කරන්න බැහැ කියලා කිව්වාම මැණිකක් දානවා. මේවා ඇතුළෙන් ගිහිල්ලා එළියට දානවා. කවුද, ඒක නවත්වන්නේ? අන්න ඒ නිසා තමයි මම කියන්නේ මේක නීත්‍යනුකූල කරන්න කියලා. මේක නවත්වන්න බැහැ. ඔබතුමාට තවත් අවශ්‍ය නම් මම කියන්නම්. 2015දී මේ රට gold market එකේ hub එකක් කරන්න බැලුවා. සිංගප්පූරුවෙන් සියයට 9ක් ගන්නවා, ඩුබායිවලින් සියයට 7ක් ගන්නවා, ඉන්දියාවට විකුණනවා. මේකට සියයට 2ක බද්දක් දාලා ඒක මෙහේ ඇති කළා නම් - *[බාධා කිරීමක්]* මහ බැංකුව කියන එක පැත්තකට දමන්න. කොහොමත් අද වනකොට මේ හරියෙන් trade එක යනවා - ඔබතුමාට අනිවාර්යයෙන්ම සල්ලි ප්‍රමාණයක් එනවා, මේ රටේ රැකීරක්ෂා බිහි වෙනවා. රැකීරක්ෂා බිහි වෙන එක තුළින් දළ දේශීය නිෂ්පාදනය වර්ධනය වෙනවා. එහෙම තමයි කළු සල්ලි සුදු වෙන්නේ. එහෙම තමයි grey market එක නැති කරන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ මහ බැංකුව කියන, යම් විධියකට බිල්ලා මවන ගමන නවත්වලා ඔබතුමා ආර්ථිකය හදන්න. එම නිසා තමයි ජනාධිපති කිව්වේ මහ බැංකුව රවීට බයයි කියලා. ඉතින්, ඒ නිසායි මම මේක නැවත නැවත කියන්නේ. මටත් හැකියාවක් තිබෙනවා, මේ රටේ ආර්ථිකය හදන්න. මේ අය තමයි නැති කරන ගමන ගියේ. අපි එකට එකතු වෙලා මේවා ඇති කරමු.

ඒ විතරක් නොවෙයි, මේ අවස්ථාවේ අපේ target එක සියයට 7ක, 8ක තිබෙනවා නම්, මම කිව්වා වාගේ අපේ දේශීය වශයෙන් කරන ඉතිරි කිරීම් මදි. මේ රටට ගෙනෙන්න අවශ්‍ය කරන තාක්ෂණය සුද්දා ගෙනාවේ නැත්නම් තාක්ෂණයත් එක්ක ප්‍රාග්ධනය ගෙනෙන්න. ඒ ප්‍රාග්ධනය ගෙනෙනකොට අපට අවශ්‍ය වන්නේ ඒකට දෙන tax rebate එක නොවෙයි, ඒකට යම් විධියකින් දෙන, මේ පැත්තේ තිබෙන ආරක්ෂාවයි. ඒක තවම පෙනෙන්න නැහැ. මෙන්න මේක තමයි අපි ඇති කරන්න අවශ්‍ය වන්නේ. මේ රටේ රුපියල කාන්දු වීම අපි නවත්වන්න අවශ්‍යයි. ඩොලරය රුපියල් 312ට, රුපියල් 313ට වාගේ යන්න පටන් ගත්තොත් මේකේ ස්ථාවරභාවයක් ඇති වෙනකන් ආයෝජන එන එක නවතියි. ඒක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය.

මේ අවස්ථාවේදී ඔබතුමාගේ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සිටින ව්‍යවසායකයින්ට; සුළු සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයින්ට මීට වඩා මානුෂීයව හැසිරෙන්න. 2022දී බංකොලොත්භාවය ඇති වුණාම මේ රටේ පොලී අනුපාතය සියයට 30ට ගෙනිච්චේ ඒගොල්ලෝ නොවෙයි. මේ රටේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාදයක් වන ස්ථාවර නියෝග 27 (2) යටතේ මම අහපු ප්‍රශ්නයට තවම උත්තරය ආවේ නැහැ, ගරු බිමල් ඇමතිතුමනි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 ව්‍යවස්ථා අනුව කටයුතු නොකිරීම තුළ බංකොලොත්භාවයක් ඇති කළා නම් ඒකේ ප්‍රතිවිපාකය තමයි අපි තවම විඳින්නේ.

අද වනකොට rating agencies C minus කරලා තිබෙන්නේ ඇයි? ඒ බංකොලොත්භාවය නිසා. මෙතැන සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒක කිසිසේත්ම අනුමත කළේ නැහැ. ඒක අනුමත කළේ නැත්නම්, එසේ අනුමත නොකිරීමේ ප්‍රතිවිපාක විඳින්නේ කවුද? 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා උදෑසන එක පාරට ඇවිල්ලා ඒක ප්‍රකාශ කළේ කවුද? ඒකට කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් තිබෙනවාද, පාර්ලිමේන්තුවේ අනුමැතියක් තිබෙනවාද, මුදල් අමාත්‍යාංශයේ අවසරය දුන්නේ කවුද? මේ විධියට තමයි ඒකට රැකවරණය ලැබුණේ. මේවා තමයි හොයලා බලන්න ඕනෑ.

මට සතුටුයි, අද වනකොට ශ්‍රීලන්කන් ගුවන් සේවය restructure කර තිබීම ගැන. ඒ අය මේක ගැන දැන ගෙන බැරි වෙලාවත් කිව්වා නම්, ඔබතුමන්ලාගේ පාර්ලිමේන්තුවේ මේකට අවසරයක් නැහැ, එහෙනම් අදාළ මුදල අනිවාර්යයෙන්ම ගෙට ගෙවන්න කියලා, කොතරම් අවදානම් තත්ත්වයක්ද ඇති වෙන්නේ? ඒ නිසා තමයි මම කියන්නේ, පාර්ලිමේන්තුවේ අවසරය ලැබුණේ කොයි ආකාරයෙන්ද කියලා හොයලා බලන්න කියලා. එතකොට මීට වැඩිය සෙල්ලම් එළියට ඒවි. එතකොට අපි අහන ප්‍රශ්නවලට අනිල් ජයන්ත ඇමතිතුමාට මේ පාර්ලිමේන්තුවේ උත්තර දෙන්න පුළුවන් වේවි. අද ඔබතුමන්ලා හිර වෙලා තිබෙනවා. මොකද, monetary policy එක තිබෙන්නේ වෙන තැනක, fiscal එක ඔබතුමන්ලා ළඟ. බලන්න, මේ රටේ විදුලි බිල අඩු කරන්න ගියත්, මහ බැංකුව බනීවි. විදුලි බිල වැඩි කළත්, ඔබතුමන්ලාට බණීවි. විදුලි බිල අඩු කළොත් කියයි, තමන්ගේ stimulus එක අයින් කරනවා කියලා. විදුලි බිල වැඩි කළොත් කියයි ඔන්න උද්ධමනකාරී තත්ත්වයක් ඇති කරනවා කියලා. ඒ අයට කිසි වෙලාවක බණින්නේ නැහැ, ඔබතුමන්ලාට තමයි බණින්නේ. ඔබතුමන්ලා ඒක රැකගෙන වැඩ කරන්න පිළිගත්තා. එසේ පිළිගත්තාට පස්සේ දැන් ලෝකයට බැණලා වැඩක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මට තව විනාඩි දෙකක් දෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂය හිතපු ආකාරයෙන් වැඩ කරලා සුන්දර බවක් ඇති වෙලා තිබෙන නිසා රට ඒ විධියට හරි මාර්ගයේ ගෙනියන එක ගැන තමයි ඔබතුමාට පෙන්වා දෙන්න හදන්නේ. ඒ නිසා කරුණාකරලා අපි මේ ආර්ථිකය හදමු. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බිහි කරනවා වාගේම, "big investor and small producer" කියන concept එක පාවිච්චි කරන්න. මේවා තමයි කොරියාවේ, මැලේසියාවේ සාර්ථක වුණේ. ඒ නිසා ඔබතුමන්ලාත් ඒ ගමනට එකතු වෙන්න කියන එක මතක් කරනවා. අපි මේ රටේ දේශපාලනය කරන එක පැත්තකට දමලා "අරයා හෙව්වා. මෙයා හෙව්වා" කියන ඔය ගමන නවත්වමු. රජයේ නිලධාරින් වැඩ කරන්නේ නැත්තේ ඔය නිසායි. මේකේ ලොකු දේවල් තිබෙනවා නම් කමක් නැහැ. මේ සුළු දේවල්, immaterial දේවල් පස්සේ දුවලා වෙලාව නාස්ති කරන්න එපා. ලොකු ප්‍රශ්න තිබෙනවා නම් හොයන්න. මේ තුළින් අපි ඉදිරියට ගමන් කරමු. රටේ ආර්ථිකය නිර්දේශපාලනීකරණය කරලා ආර්ථිකය හරි මාර්ගයට ගෙනෙන්න එකට වැඩ කරන්න ඕනෑ කියන එක මතක් කරමින්, මම නිහඬ වෙනවා.
බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.56]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் பொறுப்பேற்றிருக்கின்ற கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சின் விவாதத்தில் உரையாற்றுவதையிட்டுச் சந்தோஷமடைகின்றேன். குறிப்பாக, கௌரவ அமைச்சர் அவர்கள் மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர் என்ற அடிப் படையிலும், அந்த மாவட்டத்தினுடைய அபிவிருத்தியிலே அவர் காட்டுகின்ற அக்கறைக்கும் முயற்சிகளுக்கும் எமது நன்றிகளையும் பாராட்டுகளையும் நாம் தெரிவித்துக் கொள்கின்றோம்.

இந்த நாட்டைப் பொறுத்தவரையில் இது முக்கியமான ஓர் அமைச்சு ஆகும். குறிப்பாகக் கிழக்கு மாகாணத்தைப் பொறுத்தவரையிலே, அது இயற்கை மற்றும் செயற்கை அனர்த்தங்களினால் மிகவும் பாதிக்கப்பட்ட ஒரு மாகாணம். இந்த மாகாணத்தைக் கட்டியெழுப்புவதற்கு இந்த அமைச்சின் ஊடாகப் பல்வேறுபட்ட பணிகளைச் செய்ய வேண்டும். உண்மையிலேயே இன்று எமது நாடு சர்வதேச ரீதியிலே பொருளாதார நெருக்கடிகளுக்கு முகங்கொடுத்து வருகின்றது. அமெரிக்காவினுடைய வரி விதிப்பு போன்ற பல்வேறுபட்ட பிரச்சினைகளால் நமது - industries - கைத்தொழில்களைப் பாதுகாக்கவேண்டிய காலகட்டத்தில் நாங்கள் இருந்து கொண்டிருக்கின்றோம். இதிலிருந்து நமது நாட்டையும் நமது கைத்தொழில் நிறுவனங்களையும் பாதுகாத்து முன்கொண்டு செல்வதென்பது உங்களுடைய தலைமைத்துவத்தின் கீழ் உள்ள இந்த அமைச்சுக்கு முக்கியமான ஒரு பொறுப்பாக வுள்ளது. ஆகவே, அந்த அடிப்படையிலான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். குறிப்பாக, கிழக்கு மாகாணத்திலே - small and medium enterprises - சிறிய மற்றும் நடுத்தரக் கைத்தொழில்களுக்கான வசதிவாய்ப்புகளை நீங்கள் ஏற்படுத்த வேண்டும்.

மட்டக்களப்பு மாவட்டத்திலே ஏறாவூர், புன்னக்குடாவிலே industrial zone ஒன்று உருவாக்கப்பட்டது. அங்கு ஒரு தொழிற்சாலை மாத்திரம்தான் இருக்கின்றது; வேலைகள் இன்னும் ஆரம்பிக்கப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, அங்கு ஆரம்பிக்கப்பட்ட industrial zoneஇல் இன்னும் பல தொழிற்சாலைகளுக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும்; அதற்கான வசதிகளை ஏற்படுத்த வேண்டும். அங்கு investorsஐக் கொண்டுவந்து முதலீடுகளைச் செய்வதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அதற்குத் தேவையான முழு ஒத்துழைப்பையும் நாங்கள் உங்களுக்குத் தருவதற்கு ஆயத்தமாக இருக்கின்றோம்.

கிழக்கு மாகாணத்தில் கனிய மணல், குறிப்பாக இல்மனைற் அதிகமாகக் காணப்படுகின்றது. இது இந்த நாட்டினுடைய பொருளாதாரத்தில் மிகப் பெரிய தாக்கத்தைச்

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

செலுத்தக்கூடியதாக இருக்கின்றது. அதன்மூலமாகவும் இந்த மாகாணத்தைக் கட்டியெழுப்புவதற்கு நீங்கள் முயற்சி செய்ய வேண்டுமென்று நான் சொல்லிவைக்க விரும்புகின்றேன்.

குறிப்பாக, கிழக்கு மாகாணம் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசமாகும். அங்கு இளைஞர்கள் தொழில்வாய்ப்புகள் இல்லாமல் இருக்கிறார்கள். அரச சேவையில்கூட அதிகமான வர்கள் இல்லை. ஆகவே, அங்குள்ள இளைஞர்களுக்குத் தொழில்வாய்ப்பை வழங்கக்கூடிய தொழில்முயற்சிகளை நீங்கள் உருவாக்க வேண்டும். அதற்கான பயிற்சிகளை அவர்களுக்கு வழங்க வேண்டும். அவர்கள் சிறு தொழில் முயற்சிகளை ஆரம்பிக்கக்கூடிய வகையில் வங்கிகளுக்கூடாக விசேட நிதி உதவிகளை வழங்க வேண்டும். மேலும், தனியார் முதலீடுகளுடனான, தொழில்நுட்பத்தோடு கூடிய வேலைவாய்ப்புகளை உருவாக்கி, அந்தப் பிரதேசத்தை நீங்கள் முன்னேற்ற வேண்டும்.

அதேபோன்று, fully functioning industrial zone ஒன்றை Batticaloaஇல் நிறுவுவதற்கான முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டும். ஏனென்றால், இன்று கிழக்கு மாகாணத்தில் கிட்டத்தட்ட 54% தொழிலாளர்கள் பயிற்சியற்ற, normal labourersஆகத்தான் வேலை செய்து கொண்டிருக்கின்றார்கள். எனவே, நீங்கள் அவர்களுக்குப் பயிற்சி அளிப்பதற்கான முயற்சியை எடுக்க வேண்டும்.

அதேபோன்று, கிழக்கு மாகாணம் agriculture-based industriesக்கு ஒரு முக்கியமான தளம் - ஒரு hub. Agriculture-based manufacturing மூலம் குறிப்பாக, Eastern Province contributes about 5 to 6 per cent of the national GDP. ஆனால், அது போதுமானதாக இல்லை. அதை அதிகரிக்கக்கூடிய வகையில், agriculture, fisheries, tourism, port activities போன்ற துறைகளை முன்னேற்ற முயற்சி எடுக்க வேண்டும். ஒரு காலத்தில் கிழக்கு மாகாணம் handloom industry மூலம் உடுதுணிகளை உற்பத்தி செய்து, முழுநாட்டுக்கும் கொடுத்துக் கொண்டிருந்தது. அதனையும் rice mills, coconut/coir products, fish packaging, palmyrah products போன்ற தொழிற்றுறைகளையும் முன்னேற்றுவதற்கான முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டும். விசேஷமாக இளைஞர்களின் தொழில்வாய்ப்புக்காகப் புதிய தொழில்நுட்ப வசதிகளை - technology - உருவாக்கிக் கொடுப்பதற்குரிய முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டுமெனவும் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர் கௌரவ வாசித் அவர்கள் இங்கே இருக்கின்றார். பொத்துவில் பிரதேசம் விவசாயம், மீன்பிடி மற்றும் அறுகம்பே tourism தலம் போன்ற சகல வளங்களையும் கொண்டதாக அமைந்திருக்கின்றது. அங்கு லகுகல, பாணமை, திருக்கோவில், பொத்துவில் போன்ற நான்கு பிரதேசங்களிலும் மூவின மக்களும் வாழ்கின்றார்கள். அந்தப் பிரதேசத்தில் ஒரு industrial zoneகூட இன்னும் உருவாக்கப்படவில்லை. அந்த வகையில் நீங்கள் அதற்கான முயற்சிகளையும் எடுக்க வேண்டும்.

எங்களுடைய மாவட்டத்தில் இருக்கின்ற Valaichchenai Paper Factory உண்மையிலேயே நீங்கள் அமைச்சராக வந்ததன் பின்னர் சிறப்பான முறையில் இயங்கிக் கொண்டிருக்கின்றது; நீங்கள் அதற்குரிய நடவடிக்கைகளை எடுத்துக் கொண்டிருக் கின்றீர்கள். அதற்காக எங்களுடைய மாவட்ட மக்கள் சார்பில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். ஆனால், அங்கு ஒரேயொரு board machine மாத்திரம்தான் இயங்கிக் கொண்டிருக்கின்றது. அதிலும் முழுமையான board உற்பத்தி செய்யப்படவில்லை. வெறுமனே, lunch paper, tablet cover paper போன்றவற்றில் 15 metric tones தான் ஒருநாளில் உற்பத்தி செய்யப்படுகின்றது. நீங்கள் அதனை renovate பண்ணி, அதன் தரத்தினை இன்னும் அதிகரித்து - board GSMஐ increase பண்ணி - thickness of the board paperஐ உற்பத்தி செய்வதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அது 600 பேருக்கும் மேற்பட்டோர் வேலை புரிந்த ஒரு தொழிற்சாலை; கிட்டத்தட்ட 154 employeesதான் அங்கு இப்போது வேலை செய்கின்றார்கள். இந்த paper factory உருவாக்கப்பட்டு கிட்டத்தட்ட 75 ஆண்டுகளுக்கும் மேலாகின்றது. பாசிக்குடாவுக்கு வருகைதருகின்ற local and foreign tourists இந்த paper factoryஐப் பார்வை யிடுவதற்காகவும் வருகின்றார்கள். இன்று அது ஒரு tourist destinationஆகவும் மாறியிருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon Member, you have only two more minutes.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up in two, three minutes, Madam.

கௌரவ அமைச்சர் அவர்களே, "Development Proposals for Paper City and Surrounding Areas" என்ற முன்மொழிவொன்று சமர்ப்பிக்கப்பட்டிருக்கிறது. அந்த paper factoryக்கு கிட்டத்தட்ட 300 ஏக்கர் காணியிருக்கின்றது. ஆகவே, அந்த இடத்தை நீங்கள் tourist cityஆக மாற்றியமைக்க வேண்டும். நீங்கள் அங்கிருக்கின்ற special development zone, old power house போன்றவற்றைப் பாதுகாக்க வேண்டும். அந்த old power houseஐ ஒரு museumஆக மாற்ற முடியும்; அங்குள்ள இயந்திரங்கள் - machines - German நாட்டுடையவை. அந்த historic power house, அங்குள்ள Old Water Treatment Plant என்பன Renovate செய்யப்பட வேண்டும். அதைவிட, அங்கு கிட்டத்தட்ட 75 வருடங்கள் பழைமை வாய்ந்த 40-50 quarters பாவிக்கப்படாமல் மரங்கள் வளர்ந்து காடாகிக் கிடக்கின்றது. அவற்றைப் புனரமைத்து home stayக்குரிய வசதிகளைச் செய்யலாம். ஏனென்றால், ஆயிரக்கணக்கான foreign tourists அங்கே வருகிறார்கள்; அவர்களுக்கு உரிய வசதிகள் இல்லை. ஆகவே, paper factory வளாகத்தை ஒரு tourist cityஆக மாற்ற முடியுமாகவிருந்தால், அதனூடாக அதிக வருமானத்தைப் பெற முடியும். நான் கூறியபடி Sport activities, museum, homestay, water treatment plant, power house, theme park எனப் பலவற்றைச் செய்யலாம். பாசிக்குடா போன்று, வாகரை, புன்னக்குடா என அங்கு இரண்டு சுற்றுலாத் தலங்கள் இருக்கின்றன.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු මන්ත්‍රීතුමනි, ඒ යෝජනාව වැදගත් යෝජනාවක්. වාලච්චේනයි ප්‍රදේශය සංචාරක ප්‍රදේශයක් හැටියට, විශේෂයෙන් පාසිකුඩා එක්ක සම්බන්ධ කරන්න පුළුවන් නිසා අපේ factory එකේ අක්කර 300ක් විතර ප්‍රමාණයෙන් යම් ඉඩම් ප්‍රමාණයක් අපි හඳුනා ගෙන දැනට රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා, ඒ කටයුතු කරන්න. දැනට මාර්ග සකස් කිරීමට අවශ්‍ය මැනුම් කටයුතු කරමිනුයි යන්නේ. ගරු මන්ත්‍රීතුමා කියන කාරණය හරි. ආයෝජකයින් කැඳවා අපට එම ප්‍රදේශවල සංචාරක කර්මාන්තය දියුණු කරන්නත් පුළුවන්. ඒ වාගේම වගාවන්වලදීත් අපට green houses වාගේ දේවල් එක්ක තවත් පැත්තකට යන්න පුළුවන්. අගය එකතු කරන ක්ෂේත්‍ර ගණනාවකුත් අපි හඳුනා ගෙන තිබෙනවා. ඒකත් අපි කරනවා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා, විශාල මුදලක් වෙන් කරලා ඒ ප්‍රදේශය සංචාරක ප්‍රදේශයක් හැටියට දියුණු කරන්න ගන්නා උත්සාහයට. පාසිකුඩා වාගේම වාකරේ සහ පුන්නක්කුඩා කියලා ගම් දෙකක් තිබෙනවා. ඔබතුමා මඩකලපුව දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා නිසා මේ කටයුත්තට නායකත්වය දීලා මේ ප්‍රදේශත් දියුණු කරන්න පුළුවන්. කාත්තන්කුඩි ප්‍රදේශය ගත්තොත්, දැනට local and foreign touristsලා විශාල පිරිසක් එම ප්‍රදේශයට එනවා. ඒ නිසා ඒ ප්‍රදේශය දියුණු කරන්නත් ඔබතුමාගේ support එක ඉල්ලා සිටිනවා. அதேபோன்று, special train services, railway station development ஆகிய பல அபிவிருத்திகளைச் செய்ய முடியும்.

கௌரவ அமைச்சர் விஜித ஹேரத் அவர்கள், அமைச்சினுடைய செயலாளர், Chairman, Sri Lanka Tourism Development Authority என அவருடைய அமைச்சின் அதிகாரிகள் எல்லோரும் பாசிக்குடா உட்பட Batticaloa District இன் tourism developmentஇல் மிக அதிகமாக அக்கறை காட்டி வருகின்றார்கள். குறிப்பாக, அதன்கீழ் வருகின்ற நிறுவனங் களும் அதில் அக்கறை காட்டி வருகின்றன. நீங்கள் மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர் என்ற அடிப்படையில், உங்களுடைய அமைச்சின் அதிகாரங் களையும் பயன்படுத்தி இந்த விடயங்களைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon Member, please wind up.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Give me one more minute, Madam.

இறுதியாக, PAMA, அதாவது மாதாந்தம் கொடுக்கப் படுகின்ற 'பொதுசன மாதாந்த உதவிப் பணம்' ஒருவருக்கு 250 ரூபாய் தொடக்கம் ஆகக்கூடிய தொகையாக 500 ரூபாய் வரை கொடுக்கப்படுகின்றது. வயது முதிர்ந்தோர்தான் இந்த உதவிப் பணத்தைப் பெறுகிறார்கள். கௌரவ அமைச்சர் அவர்களே, மிக நீண்டகாலமாக 500 ரூபாய்தான் கொடுக்கப்பட்டு வருகின்றது. அவர்கள் அந்த 500 ரூபாயைப் பெறுவதற்காக, கிட்டத்தட்ட 500 ரூபாயை 'ஆட்டோ'வுக்கு செலவழித்து, post officeக்குச் செல்ல வேண்டியிருக்கிறது. இது போதுமானதல்ல. இன்றைய கால கட்டத்தில் 250 ரூபாய் - 500 ரூபாயைப் பெற்றுக்கொண்டு, எதனையுமே செய்ய முடியாது. ஆகவே, குறித்த தொகையைக் கொஞ்சம் அதிகரித்துக் கொடுப்பதற் குரிய நடவடிக்கையை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்று, சமுர்த்தி உத்தியோகத்தர்களுக்கான வெற்றிடங்கள் நாடு முழுவதும் காணப்படுகின்றன. அந்த வெற்றிடங்களை உடனடியாக நிரப்ப வேண்டும். ஏற்கெனவே முன்னாள் அமைச்சினால், அவர்களுக்கு MN-02 levelஇல் சம்பளம் கொடுக்கப்படுமென இணக்கம் காணப்பட்டது. ஆனால், இன்றும் அப்படி வழங்கப்படவில்லை. ஆகவே, இந்த விடயம் தொடர்பாக கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற் கொள்ள வேண்டும். அதேபோன்று, சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களின் கடமைகளுக்குத் தேவையான உபகரணங்கள், தளபாடங்கள், கடந்த காலங்களில் சமுர்த்தி வங்கியால் வழங்கப்பட்டது. ஆனால், இப்பொழுது அவ்வாறு வழங்கப்படுவதில்லை. அதன் காரணமாகக் குறித்த உத்தியோகத்தர்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். அதனால், கௌரவ அமைச்சர் அவர்களே, Samurdhi Officersக்குத் தேவையான furnitureஐ பழையபடி Samurdhi Bank ஊடாகக் கொடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටියන් සම්බන්ධයෙන් ඔබතුමා මොකක්ද කිව්වේ? අපි දැනට රුපියල් 500ක දීමනාවක් දෙන්නේ නැහැ. වැඩිහිටි දීමනාව වශයෙන් අපි එනකොට රුපියල් 3,000ක් තිබුණා. දැන් රුපියල් 5,000ක දීමනාවක් තමයි අපි ලබා දෙන්නේ. මම හිතන්නේ පළාත් සභාව මඟින් ලබා දෙන දීමනාවක් පිළිබඳව වෙන්න ඇති, ඔබතුමා ඔය කිව්වේ. මධ්‍යම රජයෙන් අපි ලබා දෙනවා, රුපියල් 5,000ක දීමනාවක්. රුපියල් 500ක දීමනාවක් අපි ලබා දෙන්නේ නැහැ. මම ඒ ගැන මතක් කරන්න කැමැතියි. That could be from the Provincial Council. We, the Central Government, provide Rs. 5,000 per month. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
දෙනවා, රුපියල් 500ක්.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ඒ දීමනාව දෙනවා ඇත්තේ Provincial Council එකෙන් වෙන්න ඇති.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) THUSHARI JAYASINGHA left the Chair, and THE HON. KAVEENTHIRAN KODEESWARAN took the Chair.*

[අ.භා. 4.09]

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුවක් ලෙස බලයට පත් වෙලා හරියටම වසරක් ගෙවෙන අද වන් දිනක කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී ව්‍යවසායිකාවක් ලෙස මට අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

දශක ගණනාවක් තිස්සේ අපේ රට පාලනය කරපු පාලකයන් අද උපදෙස් දෙන්නන්ගේ සංගමයක් වාගේ අපේ ආණ්ඩුවට උපදෙස් දෙනවා, මේ රට නිවැරදි දිශානතියට ගෙන යන ආකාරය කියමින්. ඔවුන්ට දශක ගණනාවක් තිස්සේ කරන්න නොහැකි වුණු දේ තමයි අපි අද මේ කරමින් ඉන්නේ.

අපි ආණ්ඩුවක් විධියට බලයට පත් වුණේ මේ ක්‍රමය ඉදිරියට පවත්වාගෙන යාමට නම් නොවෙයි. අපේ රටේ පුරවැසියන්ට වුවමනා වුණා, පැවති අඳුරු, අශිෂ්ට, අසුබ ක්‍රමය ඉවත් කර දාලා, ඉතාම සුබවාදී පරිවර්තනයක් බවට එය පත් කරගන්න. මෑත ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි අය වැය පරතරය සැලකිය යුතු මට්ටමකින් අඩු කරන්න අපේ ආණ්ඩුව සමත් වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, අපි ආර්ථිකය ස්ථාවර කරමින් අපේ රට ඉදිරි ඉලක්ක කරා මෙහෙයවන්න කටයුතු සකස් කරලා තිබෙනවා. ඒ වාගේම, අපි කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් සැලසුම් සකස් කරලා අවසන්.

අපේ රටේ අපනයන කාර්ය සාධනය 2015 ඉඳලා 2023 දක්වා පැවතියේ එකම මට්ටමක. වාර්ෂික අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 13, 14, 15 වාගේ level එකක තමයි දිගටම පැවතියේ. එය වර්ධනය කරගන්න අපේ රටේ හිටපු පාලකයෝ සමත් වුණේ නැහැ. ඒ කාලයේ මැති ඇමතිවරු බහිරවයෝ වාගේ කර්මාන්ත අමාත්‍යාංශය බදාගෙන හිටියා. ඔවුන් කර්මාන්ත අමාත්‍යාංශය දැක්කේ මහා ධන නිධානයක් වාගේයි. ඒ ධන නිධානය රටේ ආර්ථිකයට හයියක් කර ගන්නවා වෙනුවට ඔවුන් පෞද්ගලිකව ඔවුන්ගේ මඩිය තර කර ගන්න තමයි මේ අමාත්‍යාංශය පාවිච්චි කළේ. අපි බලයට එන්න පෙරත්, බලයට ආ පසුවත් මේ රටට, මේ රටේ පුරවැසියන්ට කිව්වා, අපි ව්‍යවසායකත්ව සමාජයක් ගොඩනඟනවා, ව්‍යවසායකත්ව උන්මාදයක් ගොඩනඟනවා කියලා. අද ඒක සාර්ථක වෙලා තිබෙනවා.

තුන් බෝධිය ළඟ මල් විකුණන තරුණයෙක් මහජන දිනයේදී ඇවිල්ලා කියනවා, "මට අස්වැසුම තිබෙනවා. හැබැයි මට අස්වැසුම එපා. මට මල් ටික විකුණා ගන්න, ඒක ව්‍යාපාරයක් විධියට කරගෙන යන්න අවස්ථාව ලබා දෙන්න" කියලා. ඔබතුමන්ලා නිර්මාණය කරපු ක්‍රමය වුණේ බඩගින්නක් තිබෙනවා නම් ඒ බඩගින්න නිවා ගන්න එවේලේට මාළුවෙක් දුන්නු එක. නමුත්, අපි දෙන්නේ බිලී පිත්ත. ආර්ථිකයත් ශක්තිමත් කරගෙන, බඩගින්නත් නිවාගෙන ඔවුන්ට සතුටින් ජීවත් වෙන්න පුළුවන් සමාජයක් ගොඩනඟන්න අපි සූදානම්.

ඒ වාගේම, තවත් තරුණියෝ මහජන දිනයේදී ඇවිල්ලා එවැනි දේවල් කියනවා. මේ රටේ ඉන්න අයට දැන් විශ්වාසයක් ගොඩනැඟිලා තිබෙනවා, අපේ ආණ්ඩුව යන මේ ඉදිරිගාමී වැඩ පිළිවෙළ ගැන. අපි භාණ්ඩ, නිකම්ම නිකම් භාණ්ඩ ලෙස විකුණන්න සූදානම් නැහැ. අපේ රටේ නිෂ්පාදන තුළින් “Made in Sri Lanka” කියන නාමය ලෝකයට අරගෙන යන්න අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් ජාතික අපනයන සංවර්ධන ප්‍රවර්ධනයට රුපියල් මිලියන 17.99ක් වෙන් කරලා තිබෙනවා. අපි ඉලක්කයක් තබා ගත්තා, ඉදිරි වසර 5 ඇතුළත අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 36 දක්වා වර්ධනය කරගන්නවා කියලා. වසර ගණනාවක් එකම ඉලක්කම් ටිකක් නඩත්තු කරගෙන ආපු රටකට මේක අභියෝගයක් වෙන්න පුළුවන්. හැබැයි, අපි මේ වසර ඇතුළත එය ඇමෙරිකානු ඩොලර් බිලියන 18 දක්වා වර්ධනය කර ගන්න ඉලක්කයක් තියා ගත්තා. කියන්න සතුටුයි, අද වෙනකොට කාර්තු දෙකක් අවසානයේ අපි, අපේ ඉලක්ක ළඟා කරගෙන තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 13 දක්වා. පෙර වසරවල සියයට 1-2 අතර තිබුණු වර්ධන වේගයේ ප්‍රතිශතය තමයි දැන් අපි සියයට 7 දක්වා වැඩි කරගන්න සමත් වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, මේ අවුරුද්ද තමයි අපි වැඩිම අපනයන ආදායමක් ලබා ගත්ත අවුරුද්ද. ඒ විතරක් නොවෙයි, අපේ රට rebrand කරන්නත් අපි සමත් වුණා. අපේ ආණ්ඩුවේ කොමිස් කාක්කෝ නැහැ. අපේ ආණ්ඩුවේ "Mr. Ten Percent"ලා නැහැ. අපේ ආණ්ඩුව රට ගැන තබා තිබෙන බලාපොරොත්තුව, ඒ නිවැරදි වැඩ පිළිවෙළ, දැඩි මූල්‍ය විනය වැනි වටිනාකම් පද්ධතියක් සමඟ තමයි අපි මේ වනකොට කටයුතු කරමින් ඉන්නේ. අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල සභාවත් ඊට උපකාරී වුණා. 1992න් පස්සේ අවුරුදු 28ක් පුරාවට අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල සභාව රැස් වෙලා තිබුණේ නැහැ. ඒකෙන් පෙනෙනවා, පසුගිය කාලය පුරාවටම අපනයන ප්‍රවර්ධනයට කිසිදු සැලසුමක් තිබුණේ නැහැ කියන එක. මේ වසරේදී ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම සභාව රැස් වෙලා අදාළ කාරණා ගණනාවක් සම්බන්ධයෙන් අපි යෝජනා ස්ථිර කරගත්තා. ඒ වෙලාවේදී විදේශිකයින් ලංකාවට එනකොට ලොකු VAT ප්‍රතිශතයක් ගෙවන්න තිබුණා. අපි ඒ සඳහා VAT refundable system එකක් ඇති කළා. ඒ විතරක් නොවෙයි, පසුගිය මාස අට ඇතුළත ලංකාවේ අපනයන සංවර්ධනයට අදාළ සියලු පාර්ශ්ව -රාජ්‍ය නිලධාරින්, විදේශ ආයෝජකයින්, විදේශ ආයතන, අපනයනකරුවන්- එකතු කරමින් ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සකස් කරමින් යනවා. ඒකට අදාළ මූලික කටයුතු වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

අපි මේ කථා කළේ ගෙවුණු වසර තුළ අපේ රටේ ප්‍රධානතම අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා වූ ආයතනය තම ඉලක්ක සාක්ෂාත් කරගත්ත ආකාරය පිළිබඳවයි. මම මේ

වෙලාවේදී ස්තුතිවන්ත වෙනවා, තිරයේ ඉදිරිපස සහ පිටුපස සිටින සියලුම නිලධාරීන්ට, මේ රටේ ආයෝජකයින්ට, අපනයනකරුවන්ට, සෘජු බදු ගෙවන සියලුම ජනතාවට. කෝච්චියක් නම්, ඔබ තමයි ඒ කෝච්චියේ එන්ජිම.

ඒ වාගේම ඉතිහාසයේ පළමුවැනි වතාවට අපි සියලුම තානාපතිවරුන්ට ඉලක්කයක් දුන්නා, අලුතින් exports හදන්න, සිටින අපනයනකරුවන් හඳුනා ගන්න, ඔවුන්ව දිරිමත් කරන්න කියලා. පසුගිය මාස 10 ඇතුළත අලුතින් අපනයනකරුවන් 482ක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
Please give me one more minute, Sir.

මේක තමයි අපේ රටට අවශ්‍ය කරපු දේ. ඔයගොල්ලන් මෙච්චර කාලයක් නොකරපු දෙයත් මේකම තමයි. රටක විදේශ විනිමය උපයන ආකාර තුනක් තිබෙනවා. එහිදී අපනයන ආදායම, සංචාරක ඉපැයීම් සහ විදේශ ප්‍රේෂණ වැදගත් වෙනවා. මෙයින් වැඩිම ප්‍රතිශතයක් -සියයට 65-70 අතර ප්‍රමාණයක්- උපයා තිබෙන්නේ අපනයන ආදායමින්. මේ වෙනකොට අපි දිස්ත්‍රික් ලේකම්වරුන්ට target එකක් දීලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අලුතින් අපනයනකරුවන් 10දෙනෙක් හඳුන්වා දීලා, ඔවුන්ට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න කියලා. අපි ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරනවා. අපට අවශ්‍ය වෙන්නේ මේ සම්ප්‍රදායික කර්මාන්ත රාමුවෙන් එහාට ගිහිල්ලා, ලෝකයට ගැළපෙන අපනයන ආර්ථිකයක් ගොඩනඟන්නයි. පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් වෙනුවෙන් කර්මාන්ත අමාත්‍යාංශය හඳුන්වා දුන් මේ වැඩ පිළිවෙළට වාගේම මේ අය වැයට විපක්ෂයේ අපට උපදෙස් දෙන්නන්ගේ සංගමයත් පක්ෂපාතීව ඡන්දය දෙයි කියලා අපි හිතනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Hector Appuhamy. You have been allotted 15 minutes.

[අ.භා. 4.17]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද දවසේ විවාද කරන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ, ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රශ්නවලට ඉතාම වැදගත් වන අමාත්‍යාංශයක්. ඒ අමාත්‍යාංශය භාරව කටයුතු කරන්නේ මම බොහොම ගරු කරන අමාත්‍යවරයෙක්. කාලයක් තිස්සේ අපි දෙන්නා ලොකු වැඩ කොටසක් කළා. ඒ දවස්වල පාර්ලිමේන්තුවේදී එතුමා මටත් ගොඩක් දේවල් කියලා දුන්නා. ඒකත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ නේ. හැබැයි, මම අපේ මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියලාට කියන්නේ, ඔය ලියලා දෙන දේවල් හැම එකම කියන්න යන්න එපා කියායි. මොකද, මේ අය වැය විවාදයේදී සම්පූර්ණයෙන්ම අපි දැක්කේ, හැම කථාවකම එක්කෝ හැත්තෑ අවුරුද්දක් ගැන කථා කරනවා. එහෙම නැත්නම් ඉස්සර කළේ නැහැ කියනවා, දැන් කළා කියනවා. ආයෙත් ආයෙත් බොරු කියන්න එපා. එතකොට තව ප්‍රශ්නයක් එනවා. ඒ නිසා මම කියන්නේ, අර කියපු බොරු ටික ඇති. දැන් මේ අය වැයත් එක්ක යන අලුත් වැඩසටහන ගැන කථා කරන්න. අර පරණ දේවල් කථා කරන්න එපා.

ඇත්තටම අපනයන ක්ෂේත්‍රය අරගෙන බලන්න. අපනයන ක්ෂේත්‍රයේ අද වෙනකොට තිබෙන කර්මාන්ත ටික කවුරු ගෙනාපු ඒවාද කියලා කියන්න බලන්න. දැන් ඔබතුමන්ලා අපනයන ක්ෂේත්‍රය ගැන කථා කරනවා. දැනට තිබෙන්නේ කවුරු ගෙනාපු කර්මාන්තද? කර්මාන්තශාලා ටික අරගෙන බලන්න. ඊළඟට, කර්මාන්තපුර ටික අරගෙන බලන්න, කවුරු හදපු ඒවාද කියලා. ඒ නිසා උඩ බලාගෙන කෙළ ගහන්න එපා, එතකොට මුහුණටම වැටෙනවා.

අපේ හිතවත් අමාත්‍යතුමා අලුත් concept එකක් පටන් ගත්තා, "එක බඩුවකට එක කඩයක්" කියලා. ඒ concept එක පටන් ගත්තා. එතුමා ඉතා නිහතමානීව ඒක ගැන මෙතැනදී කථා කළා. සීනි ගැන එතුමාට දාපු නම සම්බන්ධවත් එතුමා කථා කළා. හැබැයි, අමාත්‍යතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා අපට හිතවත් තමයි. ඔබතුමා බොහොම ශ්‍රද්ධාවෙන් කරපු වැඩසටහනක් වෙන්න පුළුවන්. හැබැයි, ඊයේ පෙරේදා දවසක මම දැක්කා, වැඩසටහනකදී දුඹුරු සීනිවල මිල ගැන කථා කරනවා. මෙකේ මිල රුපියල් 275යි, රුපියල් 248ට එළියේ තිබෙනවා. ඊළඟට මම දැක්කා, රුපියල් 350 පැකට් එකක් තිබෙනවා. මම හිතන විධියට, ඒක වෙන විධියකට සකස් කරපු එකක් වෙන්න ඇති. හැබැයි, එතකොට මොකක්ද සිද්ධ වෙන්නේ? ඔබතුමා ගත්ත උත්සාහයේදී, සමස්තයක් හැටියට මේ රටේ පෞද්ගලික ව්‍යාපාර එක්ක හැප්පෙන්න තිබුණු අවස්ථාව යම් විධියකින් මැඟ හැරිලා තිබෙනවා. ඒ නිසා සමහර වෙලාවට ඒක ප්‍රයෝජනයට අරගෙන, ඔබතුමා ගත්ත උත්සාහය සම්බන්ධයෙන් යම් කිසි කතිකාවක් සමාජය තුළ නිර්මාණය කරන්න පුළුවන්. හැබැයි, ඔබතුමා ගත්ත උත්සාහයෙන්, ඒ කඩේ වහන්නේ නැතුව, ඒ කඩේ විවෘතව තියා ගන්න අවශ්‍ය කරන වැඩසටහන සකස් කරන්න කියලායි මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

ඒ වාගේම, ඔබතුමා යටතේ ආයතන රාශියක් සහ ඒ ආයතනවලට බැඳුණු අනෙකුත් අතුරු ආයතන තිබෙනවා. අද මේ රටේ තරුණ තරුණියෝ විදේශගත වෙනවා. ඒ විදේශගත වන තරුණ තරුණියන් සම්බන්ධයෙන් ඔබතුමන්ලා ආණ්ඩුව හැටියට වගකීම භාර ගන්න ඕනෑ වාගේම, ඒ අයව මේ රටේ තියාගෙන, මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලියට ඒ අයගේ දායකත්වය ලබා ගන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදන්න ඕනෑ. ඔබතුමන්ලා 2025දී කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයන්ට සංවර්ධනය සඳහා ණය ලබා දෙන්න රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබුණා. ඒකෙන් ඇත්තටම 2025දී ණය දීලා තිබුණේ 28දෙනෙකුට විතරයි. අද ඔබතුමන්ලා හොඳ වැඩසටහනකට මුදල් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒ අද වෙන් කරන ලද මුදල් ප්‍රමාණය එක්ක අරගෙන බැලුවාම, තමුන්නාන්සේ ඒ මුදල්වලින් වෙන වෙනම විෂයන් සම්බන්ධව ණය ලබා දෙන්න, තරුණ ව්‍යවසායකයින්ට අවස්ථාව ලබා දෙන වැඩසටහනක් හදලා තිබෙනවා. හැබැයි, ඒක මහ පොළොවේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න තිබෙනවා. මොකද, ඒක හැදුවේ නැත්නම්, අර 5,000කට, 10,000කට ණය දෙන්න තිබෙන අවස්ථාව නැවත වතාවක්

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

28කට, 30කට, 40කට, 50කට සීමා වෙනවා. ඒ නිසා ඒ ටික හරියට කරන්න.

ඊළඟ කාරණාව මේකයි. මම අද කථාවේදී රටේ ඉදිරි අනාගතයට අවශ්‍ය කරන වැඩ පිළිවෙළට ඔබතුමාගේ දායකත්වයෙන් කරන්න අවශ්‍ය වැඩසටහන ගැනයි කියන්න හදන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු මන්ත්‍රීතුමනි, ඒ රුපියල් මිලියන 500ක් 28දෙනෙකුට දුන්නා, කියන දත්ත ඔබතුමා ගත්තේ කොහෙන්ද කියලා මට පොඩ්ඩක් දැන ගන්න පුළුවන්ද? මොකද, අපේ අමාත්‍යාංශයෙන් තරුණ ව්‍යවසායකයින්ට කියලා වෙනම දුන්නේ නැහැ. ඒ තොරතුර ඔබතුමා ගත්ත තැන දැන ගත්තොත් මට check කරලා බලන්න පුළුවන්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මම ඒක ඔබතුමාට වෙනම ලැබෙන්න සලස්වන්නම්. එතකොට මම කරපු කථාවේ යම් විධියක අඩුපාඩුවක් හෝ වැරැද්දක් තිබෙනවා නම්, ඔබතුමාගේ කථාවේදී ඒක නිවැරැදි කරන්න පුළුවන්.

මොකද, අපි 2025 අය වැය සම්බන්ධව විශේෂයෙන්ම විමර්ශනයක් කරලා, ඒ සම්බන්ධව තොරතුරු ඒක රාශි කරගෙනයි කථා කළේ. එතැන වරදින්න බැහැ. හැබැයි, අඩුපාඩුවකින් වැරදිලා තිබෙනවා නම්, ඔබතුමාට පුළුවන් ඒක නිවැරදි කරන්න. කෙසේ වෙතත්, කමක් නැහැ, මේ උත්සාහ කරන්නේ වෙන කාරණාවක් නිසා නොවෙයි. *[බාධා කිරීමක්]* ඔබතුමාට ලස්සනට හිනා වෙන්න පුළුවන්. හැබැයි, හිනාවේ ප්‍රතිඵලය වෙන්න ඕනෑ මොකක්ද? රටේ සමස්ත ජනතාවම හොඳ සතුටින් ඉන්න ජනතාවක් වෙන්න ඕනෑ. ඒක නැතුව ගියොත් නම්, ප්‍රශ්නයක් තමයි පුතෝ. මොකද, අද වෙනකොට ජනතාව සතුටින් නම් නැහැ. ඒ ප්‍රශ්නය කියන්න ඕනෑ. ඒක බේරා ගන්න, ජනතාවත් එක්ක.

ඊළඟට, මම කථා කරන්න හදන්නේ, විශේෂයෙන්ම නිෂ්පාදන ටික සම්බන්ධයෙන්. අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, විශේෂයෙන්ම පොල් නිෂ්පාදන තිබෙනවා; කොහු නිෂ්පාදන තිබෙනවා; ලුණු නිෂ්පාදන තිබෙනවා. ඒ වාගේම බතික් කර්මාන්තයත් අපේ ප්‍රදේශයේ තිබෙනවා. ඒ හා සමානවම විශේෂයෙන්ම ඉදි කිරීම් ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත තිබෙනවා. එතකොට ඉදි කිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය කරන කර්මාන්ත ටික වාගේම මතක තියා ගන්න, මේ ධීවර ක්ෂේත්‍රය ඇතුළෙත් තිබෙනවා කර්මාන්ත ටිකක්.

මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, විදේශගත ශ්‍රී ලාංකික අපේ තරුණ තරුණියන් ගැන. සාමාන්‍යයෙන් අපේ ශ්‍රී ලාංකික කොල්ලෝ, කෙල්ලෝ හොඳ හැකියාව තිබෙන කණ්ඩායමක්. නමුත් මේ අය පිටරට යවනකොට අපි ඔවුන්ව පුහුණු කරන්නේ නැහැ. ඒක විශාල අඩුපාඩුවක්. විශේෂයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය එක්ක සම්බන්ධීකරණය කරලා අනිකුත් අමාත්‍යාංශත් ඒක රාශි කරගෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මොකද, මේ මුදල් ව්‍යවසායකත්වයට වෙන් කරද්දී, ණය මුදල් ලබා දෙන වැඩසටහන හදනකොට, ඒ ඇතුළේ විදේශගත වෙන ශ්‍රී ලාංකිකයා වෙනුවෙන්, විශේෂයෙන් තරුණ තරුණියන් වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරන්න. IT ක්ෂේත්‍රයේ ඉඳලා හැම ක්ෂේත්‍රයක්ම ආවරණය වන විධියට මේ අයව පුහුණු කරන වැඩසටහන් සකස් කරන ඒ වැඩ පිළිවෙළ හදන්න. මේ සම්බන්ධව කියයි, අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ වෙනත් අමාත්‍යාංශයකට මේක යොමු වෙන්න ඕනෑ කියලා. නැහැ. මම ඉල්ලනවා, විශේෂයෙන් කර්මාන්ත අමාත්‍යාංශයෙන් ඊට මැදිහත් වෙන්න කියලා. මම එහෙම කරන්න කියන්නේ, ඔබතුමාට මේක බද්ධ කරන්න පුළුවන් ප්‍රායෝගිකව කර්මාන්තත් එක්ක. එතකොට එක පැත්තකින් දේශීය නිෂ්පාදනයට අවශ්‍ය කරන සහායකයා ලැබෙනවා, ඒ පුංචි කාලය තුළ. ඔහු එතැනින් ගන්න පන්නරය, එතැනින් ඉගෙන ගන්න දේට පරිබාහිරව වෙනම අපි උගන්වනවා, විදේශ රටවල ගිහිල්ලා වැඩ කරන වැඩ පිළිවෙළ. එතකොට මේ දෙකම එකතු වුණාම, දැනුමෙන් සන්නද්ධ, හැකියාවෙන් සන්නද්ධ කෙනෙක් විදේශගත වෙනවා. ඒක අපේ රටට කීර්තියක් විතරක් නොවෙයි, අපේ රටට විදේශ විනිමය ලබා ගන්න තිබෙන ප්‍රධානම අංගයක් බවට පත් වෙනවා. මොකද, ඔබතුමන්ලා දන්නවා, 2028 වෙනකොට ඩොලර් බිලියන 9ක, 12ක හෝ ඊට වඩා එහා සංචිතයක් අවශ්‍යව තිබෙන බරපතළ තත්ත්වයක් -වේලාවක්- තමයි අප ඉදිරියේ තිබෙන්නේ කියලා. අපට එතැනට යන්න නම්, විදේශ විනිමය අවශ්‍යයි. විදේශ විනිමය අවශ්‍ය කරන වැඩසටහනේදී විශේෂයෙන්ම ඔබතුමාට මේ පිළිබඳ වැඩ පිළිවෙළ සකස් කරන්න කියා ඉල්ලීමක් කරනවා.

ඊළඟට, කාන්තාවන් සඳහා ණය දෙන වැඩසටහන ගත්තොත්, කාන්තාවන්ට කරන්න පුළුවන් වෙනම කර්මාන්ත තිබෙනවා. බතික් කර්මාන්තයත් අපේ ප්‍රදේශයේ තිබිච්ච ප්‍රධාන කර්මාන්තයක්. හැබැයි, අද වෙනකොට සම්පූර්ණයෙන්ම ඒ කර්මාන්තය කඩාගෙන වැටිලා. විශේෂයෙන්ම ඩයි ආනයනය කරන ප්‍රශ්නයේ ඉඳලා ප්‍රශ්න ගොඩක් තිබෙනවා, මේ කර්මාන්තය සම්බන්ධයෙන්.

ඔබතුමාට වැඩ පිළිවෙළ සකස් කරන්න තිබෙන ඊළඟ කාරණාව තමයි මේ හැම කර්මාන්තයකටම වෙළඳපොළ හොයන එක. මොකද, අපි මොන කර්මාන්ත හඳුන්වා දුන්නත්, මොන විධියේ ණය දුන්නත්, මොන විධියට බදු ගැහුවත්, මතක තියා ගන්න, වෙළඳපොළ නැත්නම් ඒ කර්මාන්තකරුවෝ සම්පූර්ණයෙන් විනාශ වෙනවා; කඩා ගෙන වැටෙනවා. එතකොට ඔවුන්ගේ ඊළඟ පියවර මොකක්ද? තමුන්ගේ ගෙයයි, ඉඩමයි උකස් තියලා හෝ මොනවා හෝ කරලා විදේශගත වෙනවා. මේක තමයි සිද්ධ වෙන කාරණාව. ඒ නිසා මේක සකස් කරද්දී, දම් වැලක් වාගේ වැඩ පිළිවෙළක් හදන්න. මොකද, හේතුව මේ කර්මාන්ත කරන්න යන කෙනාට, ඒකත් එක්ක බැඳිච්ච වෙළඳපොළ හදන වැඩසටහන හදන්න අවශ්‍යයි. ඒ වෙළඳපොළ වැඩසටහන හදනකොට තමුන්නාන්සේට පුළුවන්, ආංශික අධීක්ෂණ කාරක සභාවලින් ගොඩක් තොරතුරු ඒක රාශි කර ගන්න. මේ ඒක රාශි කර ගන්න තොරතුරු එක්ක, යම්කිසි වැඩ පිළිවෙළක් අමාත්‍යාංශ කිහිපයක් එකට එකතු කරගෙන, බද්ධ වෙලා හදන්න පුළුවන්. අන්න, ඒ ටික යෝජනා කරන්න, ගරු මන්ත්‍රීතුමිය. ඔබතුමියලා යෝජනා කරන්න ඕනෑ, මෙන්න මේ ටික. මේ ආණ්ඩුව කරන්න ඕනෑ වැඩ ටික දැන් අපියි කරන්නේ. අපට බණිනවා, හිටපු අයට බණිනවා, අර මිනිහාට බණිනවා, මේ මිනිහාට බණිනවා. ඒ හැම එකම කරන වෙලාවේ, මේ අලුත් යෝජනා ටික කරන්න, මේ රට කරන්න. අපි ඒක තමයි විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

ඊළඟට, ඔබතුමියට කථා කරන්න තිබුණා, විශේෂයෙන්ම නිමි ඇඳුම් සම්බන්ධ කාරණය. අපි දන්නවා, ඇඳුම්වලට කොච්චර ඉල්ලුමක් තිබෙනවාද කියලා. ඒ ඉල්ලුමට, මේ ඇඳුම් නිර්මාණය කරන්න හැකියාව තිබෙන කාන්තාවන් ඉන්නවා. ඒ විතරක්

නොවෙයි, ඒකට අවශ්‍ය කරන මැෂින් ඕනෑ එකක් දැන් ගන්න පුළුවන්. අලුත් තාක්ෂණය තිබෙනවා. අපට පිටරටින් ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, අදටත් අපේ ඇඟලුම් ක්ෂේත්‍රය තමයි ඇමෙරිකාව, එංගලන්තය සහ අනික් රටවල හොඳම brands ටික නිර්මාණය කරන්නේ, මම නමින් නොකිව්වාට. අද මාස් හෝල්ඩින්ග්ස් ආයතනය ඉහළින්ම ඉන්නවා, ලංකාවේ මේ නිෂ්පාදනවල. හැබැයි, ලෝකයේ හොඳම branded ඒවා හදන අපේ කණ්ඩායමට, ගමේ කාන්තාවකට, ඇයි, බැරි මේ නිර්මාණ ටික කරන්න? මේක කරන්න පුළුවන්. හැබැයි, ඒකට අවශ්‍ය කරන අතහිත දෙන එක කරන්න ඕනෑ. කෙනෙකුට ණය මුදලක් දුන්නාට පසුව එයා වැටුණත්, විනාශ වුණත් සමහර වෙලාවට ඔහේ බලාගෙන ඉන්නවා. එයාට කිසිම සහයෝගයක් ලබා දෙන වැඩසටහනක් නැහැ. අද ඔබතුමන්ලා social media පාවිච්චි කරන්නේ වැරදි ක්‍රමවේදයටයි. නමුත්, ආණ්ඩුවට හැකියාව තිබෙනවා, social media හරහා මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා ඉහළට ගෙනෙන්න, ලෝකයේ දැනුම ඒක රාශි කරගන්න. AI තාක්ෂණයත් එක්කාසු කරගෙන අපට පුළුවන් දැනුම ඒක රාශි කර ගන්න. විශේෂයෙන්ම වෙළෙඳ පොළ සම්බන්ධයෙන් විමසීම් කරන්නත් පුළුවන් නිවැරදි විධියට. වෙළෙඳ පොළ නිර්මාණය කරන්න හැකියාව තිබෙන කණ්ඩායම් ඒක රාශි කර ගන්න අවශ්‍ය වැඩසටහන් සකස් කරන්නත් අපට පුළුවන්. ඒ වාගේම, අධ්‍යාපනය ලබා දෙන්නත් පුළුවන්, දැනුම ලබා දෙන්නත් පුළුවන්. ඒ නිසා මේ පිළිබඳ වැඩසටහන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය මඟින් සිදු කරන්න කියන විශේෂ ඉල්ලීම මා කරනවා.

ඒ හා සමානවම, ආහාර නිෂ්පාදනය සම්බන්ධවත් අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම කිරි ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් හදන්න. අපේ පැත්තේ නම් හොඳට කන බොන සෙට් එකක් ඉන්නේ. ඒ අයට හැම තිස්සේම කන්න අවශ්‍යයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොන එකත් කරනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔව්, බොන එකත් කරනවා. දෙකම කරනවා. අපේ ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමාත් ඉන්නවා, එහා පැත්තේ.

කන බොන එක මිනිහෙකුට අත්‍යවශ්‍ය දෙයක්. අපේ ප්‍රදේශ ගත්තාම, විදේශ රටවල් එක්ක සම්බන්ධය වැඩියි. ඒ නිසා ආදායම් ඉපයිය හැකි ක්‍රමවේද වැඩියි. ඒ නිසා එම ප්‍රදේශවල නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා හොඳින් කළ හැකියි. විශේෂයෙන් කාන්තාවන්ට ස්වයං රැකියා හැටියට ආදායම් උත්පාදන මාර්ග හදා ගන්න පුළුවන්. විශේෂයෙන් කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන්න පුළුවන්. මේ කියන ආකාරයට හොඳට මුදල් හම්බ කරන ක්‍රමවේද සකස් කරන්න පුළුවන්.

තමුන්නාන්සේලාට තවත් කාරණයක් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා පරිසරය ආරක්ෂා කරන්න කියලා වැඩ පිළිවෙළක් හැදුවා, සිලි සිලි බෑග් එක -පොලිතින් පොඩි බෑග් එක- සල්ලි දීලා ගන්න කියලා. දැන් ජනතාව මොකක්ද කරන්නේ? අදාළ අමාත්‍යාංශය කැඳවූ වෙලාවේදී මම ඇහුවා, මේ බෑග් හදන කර්මාන්තකරුවන් එක්ක සම්බන්ධතාව තිබෙන කවුරු හරි ඉන්නවාද කියලා. මොකද, මේ බෑග් සල්ලි දීලා ගන්න කිව්වාට පසුව රටේ ජනතාව මොකක්ද දන්නවාද කරන්නේ? ඔවුන් ඒ බෑග් පාවිච්චිය නතර කරන්නේ නැහැ; මිල දී ගනිමින් හරි ඒ බෑග් පාවිච්චි කරනවා. ජනතාව ඒකට පුරුදු වෙන එකයි වෙන්නේ, ඒකට ඇබ්බැහි වෙන එකයි වෙන්නේ. ඒක තමයි මේ රටේ ස්වභාවය. ඒ ක්‍රමවේදය මඟින් ඒ බෑග් පාවිච්චිය නතර වුණේ නැති බව මතක තබා ගන්න. හැබැයි, ෆුඩ් සිටිවල නම් ඒ බෑග් පාවිච්චිය නතර වුණා. මොකද, ඒගොල්ලන් ළඟ තිබෙනවා වෙනම රෙදි බෑග් එකක්. ඒක ඒගොල්ලන්ගේ නිෂ්පාදනයක්. ඒගොල්ලන් මොකක්ද කරන්නේ? ඒගොල්ලන් ඒකෙනුත් business එකක් කරනවා. එතැනදී සල්ලිවලට ඒ බෑග් දෙනවා. ඒ නිසා ඒගොල්ලන්ට කිසි ප්‍රශ්නයක් නැහැ. පාරිභෝගිකයාටයි ප්‍රශ්නය තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ තිබෙන නීති රීති අනුව පාරිභෝගිකයාට භාණ්ඩයක් දෙන කොට යම්කිසි ඇසුරුමක දමා තමයි දෙන්න ඕනෑ. ලෝකයේ අනෙක් රටවල නම් ඒ සඳහා මුදල් අය කර ගන්නා ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, පරිසර හිතකාමී නිෂ්පාදන ටික ලංකාවේ සිදු කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා වන අලුත් සැලැස්මක් මේ කර්මාන්ත වැඩසටහන යටතේ හදන්න ඇයි අපට බැරි? ඇයි අපි අර සිලි සිලි බෑග් සල්ලිවලට ගන්න කියලා කියන්නේ? අපි මොකක්ද දන්නවාද කරන්නේ? අපි ඉස්සෙල්ලාම ක්‍රමය පටන් ගන්නවා. ඊට පසුව හොයනවා ගැටලුවට විසඳුම්. එහෙම කරන්න යන්න එපා. විසඳුම් ටික සොයලා, ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදලා ඒ project report එකත් එක්ක මිනිසුන් සූදානම් කරලා කර්මාන්තකරුවන් ඒක රාශි කරගෙන, ඒකට අවශ්‍ය කරන මුදල් ටික දීලා එම නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළාට පසුව නීතිය දමන්න. දැන් නීතිය දමලා ක්‍රමය හොයනවා. ඒක වැරදියි. ඒ නිසා මේ ක්‍රමය නිවැරදි කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please, wind up.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මෙම මේ අමාත්‍යාංශය ගැන වෙන මොකවත් නොකියා - වදින දේවල් නොකියා - මේ තොරතුරු ටික කියන්න හිතුවේ විශේෂයෙන්ම ඔබතුමා හින්දායි කියන එක මා සඳහන් කරනවා, ගරු ඇමතිතුමනි. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව බෙහෙවින් ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. (Dr.) Ramanathan Archchuna. You have been allotted 11 minutes.

[පි.ව. 4.32]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கார்த்திகை மாதத்தின் இந்த நாட்களில் எங்களுடைய தேசத்தின் விதைகளை, தேச வீரர்களை, தீப்பிழம்புகளை, இன்றுவரை எங்களை வாழ வைத்துக்கொண்டு இருக்கின்ற தெய்வங்களை மனதில் வைத்துக்கொண்டு உரையாற்ற விரும்புகின்றேன். அது யாராக இருந்தாலும் சரியே! நீங்கள்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

என்னை சுட்டாலும் எரித்தாலும் புதைத்து மீண்டும் எழுப்பினாலும் என் தேசியத் தலைவன் பிரபாகரன்தான். நான் அதை திரும்பத் திரும்ப சொல்லவில்லை. இன்றைய தினம் நடைபெறுகின்ற Ministry of Rural Development, Social Security and Community Empowermentஇன் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்கு எனக்கு 11 நிமிடங்கள் தரப்பட்டு இருக்கின்றது.

நான் இங்கு முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். இன்றைய தினம் என்னைக் கொலை செய்வதாகக் கூறிய - "ඔයා පුත්තලම පැත්තට එන්න. මම ඔයාව මරලා දානවා; நீ புத்தளம் பக்கத்தால்தானே போவாய்! உன்னைச் சுடுவேன்; கொல்வேன்" என்று சொன்ன - பாராளுமன்ற உறுப்பினர் இப்போது இங்கு இல்லை. புத்தளம் மக்கள் சார்ந்த ஒரு விடயத்தின் உண்மை நிலையை சுகாதார அமைச்சரிடம் காதில் போட்டதற்காக என்னைக் கொலை செய்வதாகச் சொல்லி யிருக்கிறார். பரவாயில்லை; 39 வருடங்கள் பயப்படாத நாங்கள், இனியா பயப்படப் போகிறோம்.

புத்தளம் வைத்தியசாலையைத் தரமுயர்த்துவதாகச் சொல்லப்பட்டிருக்கிறது; அதையிட்டு சந்தோசம்! ஏன், நான் முஸ்லிம் மக்கள் செறிந்து வாழும் பிரதேசம் பற்றி கதைக்கிறேன் என்றால், இது என்னுடைய தலைவன் விட்டுப்போன ஒரு கடமை! அவ்வளவுதான். என்னுடைய தலைவன் என்றோ ஒரு நாள் யாழ்ப்பாணத்தில் இருந்து அவர்களை அனுப்பி இருக்கிறார் என்றால், அந்தப் பிழையை நிவர்த்தி செய்வது என்னுடைய கடமை! அந்த அடிப்படையில், என்னுடைய இரத்த சகோதரர்களுக்காக நான்கு வசனங்கள் இந்தப் பாராளுமன்றத்தில் கதைக்கிறேன். அவர்களுக்கு உண்மையைச் சொல்கிறேன். அவ்வளவுதான். எங்களுடைய மலையக மக்கள் தொடர்பாகவும் நான் கருத்துத் தெரிவித்து இருந்தமைக்குக் காரணம், அவர்களுக்காக குரல்கொடுப்பதற்கு யாரும் இல்லை. அதாவது, அவர்களுக்காக வந்திருப்பவர்கள் இங்கே கதைப்பதில்லை. அவர்களுக்காக இங்கு வந்திருக்கும் NPP பாராளுமன்ற உறுப்பினர்கள், போகும்போது cabஇல் - தணகொළஐ- புல்லை வெட்டிக்கொண்டு போய் விற்கும் நிலைமையில்தான் இருக்கிறார்கள். ஆகவே, அந்த மக்கள் பற்றி கதைக்க வேண்டிய தேவை எனக்கு இருக்கின்றது.

உண்மையாகவே நான் மிகவும் கவலையோடு ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இப்பொழுது இங்கு எங்களுடைய கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் இருக்கிறார். தமிழீழ நிருவாகம் இருந்த காலத்தில் யாழ்ப்பாணத்தில் பொருண்மிய மேம்பாட்டுக் கழகம் என்று சொல்லி ஓர் அமைப்பு இருந்தது. அது உங்களுக்குத் தெரியுமோ, தெரியாது. நீங்கள் எல்லோரும் எங்களைக் கொலை செய்ய வேண்டும் என்பதற்காக 2005ஆம் ஆண்டு පෙළපාළි சென்றவர்கள். அதாவது, 'போரைத் தொடங்குங்கள்' என்று கூறிய ஆட்கள். ஆகவே, உங்களுக்குத் தெரியாது! தெரிந்தாலும் தெரியாத மாதிரி இருப்பீர்கள். நான் தெளிவாகச் சொல்கிறேன். பொருண்மிய மேம்பாட்டுக் கழகம் ஒன்றை அமைத்து, சிறந்ததோர் அரசாங்கத்தை எங்களுடைய தேசியத் தலைவர் வேலுப்பிள்ளை பிரபாகரன் நடத்தினார். அதில் சகல கட்டமைப்புகளும் இருந்தன. Banks, விவசாயத்துறை உட்பட சகலதும் இருந்தன. KKS Cement Factoryஆக இருக்கட்டும், Oddusuddan Tile Factoryஆக இருக்கட்டும், ஆனையிறவு உப்பளமாக இருக்கட்டும், சகலதும் நிறைந்த ஒரு நாட்டில்தான் நான் பிறந்து வளர்ந்தேன். அங்கு என்னுடைய கால் 1986ஆம் ஆண்டு பதிந்தது.

நான் இப்போது உங்களிடம் இருகரம் கூப்பிக் கேட்கிறேன். இந்த முறை நான் சகலதையும் படித்துப் பார்த்துவிட்டுத்தான் கதைக்கிறேன். சென்றமுறை எங்களுக்கு chance இருந்தது, Budgetஇல் 2 சதவீதம் ஒதுக்கப்பட்டு இருக்கிறது, 3 சதவீதம் ஒதுக்கப்பட்டு இருக்கிறது, 0.02 சதவீதம் ஒதுக்கப்பட்டு இருக்கிறது என்று சண்டைபிடிப்பதற்கு. இந்த முறை ஒன்றுமே இல்லை! உங்களுடைய இந்த Budgetஇனை நான் அக்கு வேறு ஆணி வேறாக வாசித்தேன். நான் என்னுடைய medicine புத்தகங்களைக்கூட இப்படி வாசித்தது இல்லை. இந்த Budgetஇனை ஒவ்வொரு பக்கமாக வாசித்திருக்கிறேன். இதில் வடக்கு மாகாணத்துக்கு ஒன்றுமே இல்லை. எதைப் பற்றி கதைப்பது என்று தெரியாமல் இருப்பதால், நான் இந்த விடயத்தைச் சொல்கிறேன். பொருண்மிய மேம்பாட்டுக் கழகம் வைத்து அரசாங்கம் நடத்திய தமிழினம், இன்று இவர்களுடைய பிச்சைக்கு - groundக்கும் Passport Officeக்கும் - அலைகின்றது. அந்தளவுக்கு கவலையான ஒரு நிலைமைதான் இருக்கின்றது. தயவுசெய்து, நீங்கள் வடக்கு மாகாணத்துக்கு கொஞ்சம் வாருங்கள்! நாங்கள் உங்களுக்கு support பண்ணுகிறோம். உங்களுக்கு DCC Meetingஇல் உதவி செய்கிறோம். நீங்கள் செய்யவேண்டிய வேலைகளை நாங்கள் செய்து தருகிறோம். நீங்கள் விடுகின்ற பிழைகளைச் சுட்டிக் காட்டுகிறோம். பிழைகளைச் சுட்டிக் காட்டுவதால், நான் பெரியவன், நீங்கள் சிறியவன் என்பதல்ல. நான் சிறியவன். அது வயதிலும் சரி, அரசியல் அனுபவத்திலும் சரி. நாங்கள் உங்களுக்கு உதவி செய்கிறோம்.

"வாங்கோ" என்று அழைக்கின்றபோதுகூட, "இல்லை! வேண்டாம்" என்று கூறிவிட்டுச் செல்கின்ற, உங்களுடைய கடற்றொழில் அமைச்சர் மாதிரி யாராவது ஓரிருவரை அழைத்துக்கொண்டு வந்து DCC Meettingஐ நடத்துகிறீர்கள். அந்த Meettingஐ எப்படி நடத்துவது என்று தெரியாது. அதற்கொரு circular இல்லை. அதுபற்றி நான் இங்கு 27(2) இன்கீழ் வினா எழுப்பிய பிறகுதான் circularஐ மாற்றினீர்கள். நான் இன்றைக்கும் உங்களுக்குச் சொல்கிறேன், ஓர் அரசாங்கத்தை வீழ்த்தி, இன்னோர் அரசாங்கத்தை ஆரம்பிக்கின்ற தேவை, சுயேட்சைக் குழுமூலம் தனி ஒரு பாராளுமன்ற உறுப்பினராக வந்த எனக்கு இல்லை. தயவுசெய்து, விளங்கிக் கொள்ளுங்கள்! இன்னும் 4 வருடங்கள் உங்களுக்கு இருக்கின்றது. இந்த Budgetஇல் இல்லாவிட்டாலும், அடுத்த Budgetஇலாவது தயவுசெய்து வடக்கு மாகாணத்துக்கு ஏதாவது செய்யுங்கள்! ஏன் நாங்கள் வடக்கு மாகாணத்துக்கு நிதி ஒதுக்க வேண்டுமெனக் கேட்கிறோம்? ஏன் கிழக்கு மாகாணத்துக்கு நிதி ஒதுக்க வேண்டுமெனக் கேட்கிறோம்? இது இனவாதம் இல்லை. கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களே, நீங்கள் எங்களுடைய பிரதேசத்திலுள்ள பாதைகளையும் வைத்திய சாலைகளையும் சந்தைகளையும் வந்து பார்த்தீர்கள்! நீங்கள் அவற்றைப் பார்த்துவிட்டுச் சென்ற பிறகும், அங்கு addtionalஆக ஒன்றும் செய்யவில்லை என்றால் கவலையாக இருக்கும். மற்றப்படி, உங்களுடன் எந்தக் கோபமோ, உங்களைப் 'பொய்யர்கள்' என்று காட்டவேண்டிய தேவையோ எனக்கு இல்லை. அதனால்தான் நான் இந்த விடயங்களைக் கூறுகின்றேன்.

சென்ற முறை நீங்கள் வடக்கு மாகாணத்தின் அபிவிருத்திக்கென 5,000 மில்லியன் ரூபாயை ஒதுக்கினீர்கள். அதையிட்டு நாங்கள் சந்தோசப்பட்டோம். எல்லோரும் என்னை ஏசும்போதுகூட, நான் சனாதிபதி அவர்களுக்கு வாழ்ந்துச் சொன்னேன். கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்கள்கூட, அர்ச்சுனாவுடைய முகத்தில் சந்தோசம்

இருப்பதாகத் தனது உரையில் சொல்லியிருக்கிறார். அந்த 5,000 மில்லியன் ரூபாயில் நீங்கள் எத்தனை சதவீதத்தைப் பயன்படுத்தினீர்கள் என்று சொல்லுங்கள்? நாங்கள் DCC Meettingஇல் President உடன் கதைத்து, "ஐயா! எங்களுக்குப் பாதைகளை அமைத்துத் தாருங்கள்; அதற்கு 5,000 மில்லியன் ரூபாய் வேண்டும்" என்று நேரடியாகக் கேட்டோம். அவ்வாறு கிடைத்த நிதியிலிருந்து 1,000 மில்லியன் ரூபாய் வீதம், யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களுக்கும் கொடுக்கப்பட்டன. அதில் 10-20 மில்லியன் ரூபாய்கூட செலவழிக்கப்படவில்லை. இந்த முறை 150 மில்லியன் ரூபாயை groundக்காக ஒதுக்கியிருக்கிறீர்கள். அது பற்றி என்னால் கதைக்க முடியாது. தயவுசெய்து, அந்த 150 மில்லியன் ரூபாயையும் பயன்படுத்தச் சொல்லுங்கள்!

சாவகச்சேரியில் பொருளாதார மத்திய நிலையம் ஒன்று இருக்கிறது. அதை வந்து பார்த்து, மேளம் அடித்துத் திறப்பதல்ல உங்களுடைய வேலை! மேளம் அடித்துத் திறப்பது முன்னைய அரசாங்கம்! நீங்கள் சொன்னீர்கள், நாடா வெட்ட மாட்டோம், பூ மாலை போட மாட்டோம் என்று. ஆனால், உங்களுடைய வசந்த சமரசிங்ஹ போன்றவர்கள் பூ மாலைகளைப் போட்டுக்கொண்டு திரிகிறார்கள். அதுவல்ல, உங்களுடைய வேலை! நீங்கள் சொன்ன அபிவிருத்திகளை ஒரு வருடம் கடந்தும் செய்யவில்லை. அடுத்து, நான் ஒருசில விடயங்களைக் கட்டாயம் சிங்களத்தில் சொல்ல வேண்டும்.

ඔබතුමන්ලා සමහර වෙලාවට හිතනවා ඇති, මම ඇවිල්ලා ඔබතුමන්ලාගේ ආණ්ඩුව පහළට වට්ටලා ඔබතුමන්ලා නැති කරන්න යනවා කියලා. එදා ගරු ජනාධිපතිතුමාත් කිව්වා, "අවුස්සන්න එපා. සිංහල, දෙමළ ගැන කථා කරන්න එපා" කියලා. මම ඒක පැහැදිලිවම ආයෙත් කියන්නම්. මම දැනට ඉන්නේ තනිකරම සිංහල මිනිස්සු ඉන්න පැත්තක. ඒ පැත්තේ මිනිස්සු තනිකරම කථා කරන්නේ සිංහල. මමත් කථා කරන්නේ සිංහල. හැමෝම තමන්ගේ ඥාතියාට ආදරය කරන්න ඕනෑ. ඒක දැන ගන්න ඔබතුමන්ලා. ඔබතුමන්ලාට කොන්ද පණ තිබෙන්න ඕනෑ, ඔබතුමන්ලා සිංහල-බෞද්ධ කියලා කියන්න. මටත් කොන්ද පණ තිබෙන්නත් ඕනෑ. ඔයගොල්ලන් හිනා වෙනවා කියලා, ඔයගොල්ලන්ට ආතල් දෙනවා කියලා මට කියන්න බැහැ, "මම බෞද්ධ ආගමට එන්නම්. සිංහල ජාතියට එන්නම්" කියලා. මම දෙමළ. මම කැමති දෙමළ විධියට ඉන්න. කවුරු හරි මුස්ලිම් කෙනෙක් ඉන්නවා නම්, ඔහු මුස්ලිම් විධියට ඉන්නයි කැමති. හැබැයි, අපි මුස්ලිම්, දෙමළ, සිංහල කියලා පිළිගන්න ඕනෑ තමන්ගේ ජාතිය මොකක්ද කියලා. ඊට පස්සේ තමයි ඒ තුළ තමයි අපට කරන්න පුළුවන් දේ අපි එකතු වෙලා කරන්න ඕනෑ. ඔබතුමා සිංහල; මම පිළිගන්නවා. ඔබතුමා දෙමළ; මම පිළිගන්නවා. අපි සිංහල, දෙමළ, මුස්ලිම් ඔක්කෝම එකතු වෙලා මේ රට හදමු. මම පිටරට ගියාම තේරෙනවා ඒ රටවල් තිබෙන හැටි සහ අපේ රට තිබෙන හැටි. සමහර වෙලාවට මේ කථාවත් බලාගෙන ඉන්න මිනිහා ත්‍රීවීල් එක ඇතුළේ ඉඳගෙන පොඩි ෆෝන් එකෙන් විතරයි බලාගෙන ඉන්නේ. එතුමන්ලාගේ ජීවිතේ කවදාවත් වෙනස් වෙන්නේ නැහැ. ඒක දැන ගන්න. මේ වාගේ ආයේ ආයේ බොරු කරලා, බොරු කරලා, බොරු කරලා,- ඔබතුමන්ලා කිව්වා නිර්ධන පන්තිය ගැන බලනවා කියලා. අන්තිමට ඔබතුමන්ලාගේ බඩ බලන්න. නිර්ධන පන්තියේ වාගේද ඔබතුමන්ලාගේ බඩ තිබෙන්නේ? නැහැ. ඔබතුමන්ලාගේ කාර් එක බලන්න. මම නම කියන්නේ නැහැ. මම වාගේ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපේ පිල්ලෙයාර් දෙවියෝ වාගේ එළියට යනවා, අවුරුදු 4න් පස්සේ. ඔයගොල්ලන් කනවා, බොනවා, අඩියක් ගහනවා ඔක්කෝම කරනවා. අන්තිමට, ඔයගොල්ලන්ට කැබ් පවා ඕනෑ. *[බාධා කිරීමක්]* කෑ ගහන්න එපා, බබා. කවුරු හරි බබෙක් කෑ ගහනවා. කවුරු හරි කිරි බෝතලයක් දෙන්න. කරුණාකරලා ඔයගොල්ලන් සල්ලි අරගෙන, සල්ලි හොරකම් කරගෙන එළියේ යන්න. අවුලක් නැහැ. හැබැයි, අර ඡන්දය දාපු මිනිස්සු? අපිත් ඔබතුමන්ලාට ආදරය කළා නේ. ඔබතුමන්ලා වෙනුවෙන් අපිත් කථා කළා නේ. අපට දුක හිතෙනවා, ඒගොල්ලන්ට අවුරුද්දක් ඇතුළත මොනවාවත් කළේ නැහැ නේ කියලා. ඒ නිසා කරුණාකරලා ඉල්ලන්නේ ඔයගොල්ලන් දීපු පොරොන්දු මතක තියා ගන්න කියලායි. ඔක්කෝටම කලින් ඒක මතක තියා ගන්න. රටේ ජනතාව බලාගෙන ඉන්නවා, ඔයගොල්ලන් මොකද කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උගන්ඩාවේ සල්ලි ඕනෑ නැද්ද කියලා ඇහුවා. දුප්පත් මිනිස්සු වාගේ මමත් රැවටුණා. දැන් උගන්ඩා කුමාරි කෝ? අද Parliament එක ඇතුළෙත් නැහැ. ඔයගොල්ලන් කිව්වා, රුපියල් ලක්ෂ 12කට Vitz එකක් දෙනවා කියලා. කෝ, Vitz එක? දැන් ටයර් දෙකක් ගන්න පුළුවන්ද? බැහැ. අද ඔබතුමන්ලා ඇත්ත කියන්න. MPsලා කොච්චර බොරු කළත්, සෞඛ්‍ය ඇමති ඇවිල්ලා හරියට උත්තර දුන්නා, "මල්ලි මෙහෙමයි. මේක දැන් හදන්න වෙන්නේ නැහැ. අවුරුදු 4ක් ඕනෑ. ගොඩනැඟිලි ඕනෑ, මේවාත් ඕනෑ, අපි ඒ සුදුසු දේවල් බලනවා" කියලා. ඒක තමයි හරි උත්තරය. ඒ නිසා ඒ ඇමතිට අපි ආදරෙයි. ඕනෑ වෙලාවක එතුමාගේ office එකේ දොර ඇරගෙන ගිහිල්ලා "අයියේ" කියලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Eight minutes and 30 seconds ගිහිල්ලා තිබෙන්නේ. මට 11 minutes තිබෙනවා. මම stopwatch එක දා ගෙන ඉන්නේ. Thank you.

හැබැයි, අපි ඔයගොල්ලන්ට ආදරෙයි. ඔයගොල්ලන් කියනවා, ජාති භේද නැහැ, ආගම් භේද නැහැ, මොකුත් නැහැ කියලා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ තිබෙන්නේ බුදු පිළිම. පිල්ලෙයාර් දෙවියන්ගේ පිළිමයක් තිබෙනවාද? මට පිල්ලෙයාර් දෙවියන්ගේ පිළිමයක් ගෙනැල්ලා තියන්න පුළුවන්ද? මම පිළිගන්නවා මේ රටේ වැඩිපුරම ඉන්නේ සිංහල ජනතාව කියලා. ඒ නිසා මේක ඔයගොල්ලන්ගේ රට කියලා කියනවා නම්, තියා ගන්න. අපට එපා. ඔයගොල්ලෝ අපට ආදරය නැත්නම් අපි මුහුදට පැනලා මැරෙන්නම්. ඒක ප්‍රශ්නයක් නැහැ. අපි ඔබතුමන්ලාට ආදරෙයි. ඔබතුමන්ලාගේ භාෂාවෙන් කියනවා නම්, අපි කවදාවත් ජාතිවාදය අවුස්සන්නේ නැහැ. දැන් පෙළපාළිය ගියා නේ. ජාතිවාදය අවුස්සන්න කවුරුන් හෝ උත්සාහ කරනවා නම් අපි ඔයගොල්ලන්ගේ පැත්තේ වාඩි වෙලා වෙනවා. හැබැයි, පිළිගන්න මම දෙමළ කියලා. ඔබතුමා මුස්ලිම් කියලා, ඔබතුමා බුද්ධාගමේ කියලා පිළිගන්න. බොරු කියන්න එපා රටට, "අපි හැමෝම එකයි" කියලා. හැම නායකයාම ඇවිල්ලා කිව්වේ මොකක්ද? මේ රටේ සිංහල නැහැ, දෙමළ නැහැ, මුස්ලිම් නැහැ, අපි ඔක්කෝම එකයි කිව්වා. අපි කියන්නේ ඔයගොල්ලන්ට ඒක කරන්න එපා කියලායි.

පළාත් සභා ඡන්දය තියන්න පුළුවන්නම් කියන්න. බැහැ කියනවා නම්, කියන්න. අදත් මට කිව්වා, පුළුවන් නම් ඔබතුමා පළාත් සභා ඡන්දයට ඉදිරිපත් වෙලා Western Province එකෙන් මහ ඇමති ධුරය ඉල්ලන්න, ඔබතුමා දිනයි කියලා. මම දෙමළ නිසා කවුරු හරි ඡන්දය දානවාද? නැහැ. හැබැයි, අපි ආදරෙයි. මේ රටේ ඉන්න සිංහල ජනතාවට අපි ආදරෙයි. මම පැහැදිලිව

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

කියනවා නේ ප්‍රභාකරන් මගේ දෙයියෝ කියලා. මම ඇත්ත කියන්නේ. මෙච්චර MPsලා ඉන්නවා. කාගෙන් හරි අහන්නකෝ ප්‍රභාකරන් දෙයියෝ කියලා කියයි ද කියලා? හැබැයි, ඔබතුමන්ලා එක්ක අඩියක් ගහලා පාර්ලිමේන්තුව,- එදා ෂාණක්කියන් මන්ත්‍රීතුමා mike එක off වුණාට පස්සේ කිව්වා, "අනේ මචං, පොඩ්ඩක් වැඩිපුර ගැහුවා" කියලා. එහෙම කරන්න එපා. ජනතාව බලාගෙන ඉන්නවා. ඔයගොල්ලන්ගේ කථා ඇත්ත කියලා හිතනවා. ඒ නිසා කරුණාකරලා හිතලා බලන්න mike එකට කියන්නේ මොකක්ද, ඔයගොල්ලන් ඇත්තටම කරන්නේ මොකක්ද කියලා. ඔක්කෝම ගිහිල්ලා යාළුවෝ වාගේ කැන්ටිමේ දී කථා කරනවා. හැබැයි, මිනිස්සු ගහ ගන්නවා. ඒක තමයි මම නවත්වන්න කියන්නේ. මිනිස්සු ගහ ගන්නවා, අපේ කථාව අහලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
In 30 seconds, I will wind up, Sir.

මිනිස්සු බලාගෙන ඉඳලා ඔයගොල්ලන්ගේ කථාව ඇත්ත කියලා විශ්වාස කරනවා. ඇත්තටම මට ලජ්ජයි, මෙතැන වාඩි වෙලා ඉන්න. සුනිල් හඳුන්නෙත්ති මහත්මයා මට කියන්නකෝ, මම තරහයිද කියලා? නැහැ නේ. අපි තරහා වෙනවාද? නැහැ නේ. හැබැයි මා පිළිගන්න ජනතාව රණ්ඩු වෙනවා, ඔබතුමා පිළිගන්න ජනතාවත් එක්ක. ඒක වැරදියි. ඒ නිසා කරුණාකරලා ජනතාවට ඇත්ත කියන්න ඔක්කෝටම කලින්. ඊට පස්සේ කරුණාකරලා උතුරටත් එන්න. අපි ඔබතුමන්ලාට සුදුසුකම් හදලා දෙන්නම්. අපි විරුද්ධ වෙන්නේ නැහැ හොඳ දේවල්වලට. කොච්චර කිව්වත් ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ නේ. ඒකෙන් තේරෙනවා ඔබතුමන්ලා පාපිසි කියලා. පාපිසි කියලා යන්න එපා ඒ තැනට. කරුණාකරලා මේ කියන දේ ඔළුවට දාගන්න. අපි ආදරෙයි ඔබතුමන්ලාට. ඒ නිසා එන්න උතුරට. අපි ඔබතුමන්ලාට ඔක්කෝම හදලා දෙන්නම්.

Thank you so much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Wasantha Piyathissa. You have 12 minutes.

[අ.භා. 4.43]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම සතුටක්. ඇත්තටම අදාළ මාතෘකාවට යන්න කලින් මම කියන්න ඕනෑ, මට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරු මතු කළ කරුණු කීපයක් ගැන. විශේෂයෙන්ම රවි කරුණානායක මන්ත්‍රීතුමා දක්වපු අදහස් අනුව අපට හිතෙනවා, ආර්ථිකය, දේශපාලනය පිළිබඳව එවැනි දැනුමක්, මහා ප්‍රඥාවක් තිබෙන එතුමන්ලාට මෙපමණ කාලයක් තිස්සේ මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න බැරි වුණේ ඇයි කියලා. මේ රට බංකොලොත් ආර්ථිකයක් සහිත රටක් බවට පත් වුණේ ඇයි? එතුමා මුදල් ඇමති වශයෙන් කටයුතු කළ කාලයේ තමයි මහ බැංකු බැඳුම්කර වංචාව සිදු වෙලා, මේ රටේ ජනතාවගේ බදු මුදල් අතිවිශාල ප්‍රමාණයක් මේ රටට අහිමි වුණේ. ඒ නිසා එතුමන්ලාගේ අවවාද අනුශාසනා පිළිබඳව අවධානය යොමු කරන ගමන්, අපි ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තවත් මන්ත්‍රීවරයෙක් කිව්වා, ප්‍රජා ශක්ති වැඩසටහන ප්‍රජාතන්ත්‍රවාදී නැහැ කියලා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මොකක්ද? බහුතරයේ කැමැත්ත. ඒ ගැන මම පසුව ආපසු මතක් කරන්නම්. බහුතරයේ කැමැත්තට අනුව ගම් මට්ටමේ, බිම් මට්ටමේ වැඩ කරන්න සූදානමක් තමයි ඒ තුළ තිබෙන්නේ. මන්ත්‍රීවරයාගේ, ඇමතිවරයාගේ, එහෙම නැත්නම් ගමේ හයිහත්තිය ඇති කෙනාගේ බලයට යට වෙලා, ධනයට යට වෙලා, තේජසට යට වෙලා වැඩ කළ කාලය අවසානයි. පොදු ජනතාවගේ පොදු සංයුතියකින් සෑම සංවර්ධන වැඩසටහනක්ම, සෑම ඉදිරි කටයුත්තක්ම සිද්ධ වීමට අදාළ මහා දැවැන්ත වැඩ කොටසක එක් සංවිධාන ව්‍යුහයක් තමයි ප්‍රජා ශක්ති වැඩසටහන විධියට නීත්‍යානුකූලව පිහිටුවා තිබෙන්නේ.

ඒ වාගේම තවත් මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, කාලය ගිහිල්ලා තිබෙනවා, මෙපමණ මුදල් වෙන් කරලා තිබෙනවා, හැබැයි තවම ඒ වෙන් කරපු මුදල්වලට සරිලන විධියටවත් සංවර්ධන වැඩ කටයුතු අවසන් කරන්න බැරි වුණා කියලා. මේ රටේ රාජ්‍ය යාන්ත්‍රණය නිර්මාණය කළේ, පවත්වාගෙන ගියේ කවුද? ඊට අදාළ සංවිධාන ව්‍යුහය, ඊට අදාළ ආදර්ශ ලබා දුන්නේ කවුද? ඒ මීට පෙර පැවැති ඒ ආණ්ඩු. ඒ ආණ්ඩු සමත් වෙලා තිබුණා නම් රාජ්‍ය සේවය පුරප්පාඩු නැතුව පවත්වාගෙන යන්න, ඒ නිලධාරි මහත්ම මහත්මීන්ට වාහනයක් නැත්නම්, කැබ් එකක් නැත්නම් ඒවා සම්පූර්ණ කරලා දෙන්න, ඒ වාගේම කාර්යාලයේ තාක්ෂණික මෙවලම් නැත්නම් ඒවා සම්පූර්ණ කරලා දෙන්න, එහෙම නම් මේ ප්‍රමාදය සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා ඒවාට මේ ආණ්ඩුව කිසිසේත්ම වග කියන්න ඕනෑ නැහැ. නමුත් එය අභියෝගයක් බව අපි දන්නවා. ඒ වාගේ විවිධ අදහස් ඉදිරිපත් කළා.

අපේ දිස්ත්‍රික්කයේ උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා හිඟුරාන සීනි කර්මාන්තශාලාව පිළිබඳව සඳහන් කළා. ඒ ගොවි ජනතාව සම්බන්ධයෙන් එක කරුණක් විතරක් මම මතක් කරන්න ඕනෑ, ඒ සාකච්ඡාවට මමත් සම්බන්ධ වුණු නිසා. ගල්ඔය වැවිලි සමාගම සහ හිඟුරාන උක් ගොවි ජනතාව අතර නිරන්තර ගැටුමක් පවතිනවා, ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව; ඔවුන්ගේ ලාභ පංගුව පිළිබඳව; ඔවුන් විඳින දුක් වේදනාවලට සරිලන විධියේ ආදායමක් උක් කර්මාන්තයෙන් නොලැබීම පිළිබඳව. ඊට අදාළ ක්‍රියාමාර්ග ගොඩක් අපි ඉදිරියට ගෙනාවා. අපේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඊට අදාළව ඉතාම ධනාත්මක මැදිහත් වීමක් කළා. ඒක පළමුවැනි පියවර විතරයි. ඒ පිළිබඳව අපගේ ස්තුතිය පුද කරනවා.

අපි ඊට පසුව ගොවි ජනතාව සහ දිසාපතිතුමා ඇතුළු පාලන අධිකාරය එක්ක පොදු සාකච්ඡාවක් පැවැත්වුවා. එහිදී ගොවි ජනතාවගේ ඉල්ලීමක් තිබුණා. ඒ තමයි, "උක් වගා කරන බිම්වල වර්ෂා කාලයේ අලුතින් උක් සිටවන්න බැහැ. මාස තුනක පමණ කාලයක් වර්ෂාව තිබෙනවා. ණය වෙලා ඉන්න අපට ආදායමක් ලබා ගන්න ඒ මාස තුනේ උක් වගා නොකළ බිම්වල විතරක් වී වගා කරන්න අවස්ථාව දෙන්න" කියලා. මූලාසනාරූඪ ගරු

මන්ත්‍රීතුමනි, මීට පෙර ඉතිහාසයේ එවැනි අවස්ථාවලදී දිසාපතිතුමාගේ එකඟතාව මත, දේශපාලන අධිකාරියේ එකඟතාව මත, සාකච්ඡා කරලා, ඒ සඳහා අවස්ථාවක් දුන්නා. එවැනි අවස්ථාවක් දුන්නොත් මොකද වෙන්නේ? උක් වගාවට කිසිදු බලපෑමක් වෙන්නේ නැහැ. ජනවාරි, පෙබරවාරි මාස වනකොට නැවත උක් සිටවන මොහොතේදී ඒ ගොවි ජනතාවට උක් සිටවන්න පුළුවන්කම තිබෙනවා. අපි එතැනදී යෝජනා කළේ, "රජය විධියට අපි එකඟයි. දේශපාලන අධිකාරිය විධියට අපි එකඟයි. එම ජනතාවගේ දුක් ගැනවිල්ලට තාවකාලික උත්තරයක් විධියට සහ උක් වගාවට කිසිම පාඩුවක් නොවන ලෙස එක්තරා බිම් කොටසක විතරක් වී වගාව කිරීම සුදුසුයි. ඔබතුමන්ලා අධ්‍යක්ෂ මණ්ඩලයේදී තීරණයක් ගන්න" කියලා. නමුත්, අධ්‍යක්ෂ මණ්ඩලයේදී එයට අනුමැතිය ලැබී තිබුණේ නැහැ. ඒ කාරණයේදී සිද්ධ වුණේ එයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතා වැදගත් අමාත්‍යාංශ දෙකක් පිළිබඳවයි අපි සාකච්ඡා කරන්නේ. රටේ ආර්ථිකයේ පදනම සහමුලින්ම දෙදරා තිබුණු මොහොතක, දේශපාලන සංස්කෘතිය සහමුලින්ම වල් වැදිලා තිබුණු මොහොතක තමයි ජාතික ජන බලවේගයේ අපට මේ රටේ ජනතාව ආණ්ඩු බලය, රාජ්‍ය බලය සහ ජනාධිපතිකම ලබා දුන්නේ. මේ ආණ්ඩුව පිහිටුවලා අද වනකොට වසරක් වනවා. අපි ආණ්ඩු බලය ගත් මොහොතේ සිට අපට තිබුණු විශාල දැක්මට අනුව, අපේ වුවමනාවට අනුව මේ වසරක කාලය තුළ විශාල කාර්යභාරයක් මේ මහ පොළොවේ ඉෂ්ට සිද්ධ කරමින් තිබෙනවා. ඒ කා සඳහා ද, ඒ කුමක් සඳහා ද? ඒ, මේ රටේ ස්ථිරසාර සංවර්ධනය උදෙසායි. හැම අතින්ම පොහොසත් අපේ රටේ මහ පොළොව සරුසාරයි. කලට වෙලාවට වැසි ලැබෙනවා. දැනුම, හැකියාව තිබෙන මහා ජන සම්පතක් අපට තිබෙනවා. මේ මහ පොළොවේ ඕනෑම දෙයක් හැදෙනවා; වැවෙනවා. මහා ඛනිජ සම්පත් ප්‍රමාණයක් මේ මහ පොළොවේ තිබෙනවා. මේ රට වාගේ අට ගුණයක් විශාල මහ මුහුදක් අපට තිබෙනවා. මේ වාගේ විශාල සම්පත් ආකරයක් අපට තිබෙනවා. හැබැයි, වසර 76ක් ගත වුණාට පස්සේත් උගත්, බුද්ධිමත්, මහා ප්‍රාඥයන් පාලනය කළ රටට මොකක්ද සිද්ධ වුණේ? ආසියාවේත්, ලෝකයේත් දුප්පත්ම රාජ්‍යයක් බවට, ආර්ථිකය බංකොලොත් වෙච්ච රාජ්‍යයක් බවට පත් වුණා. එසේ වීම මහා ඛේදවාචකයක්.

අපි මුල සිටම කිව්වේ, මේ රට හදන්න පුළුවන්, මේ රට ගොඩනඟන්න පුළුවන් බවයි. ඒ සඳහා පළමුවැනි කොන්දේසිය තමයි, රාජ්‍ය පාලනයේ අයිතිකාරිත්වය, හිමිකාරිත්වය. රට පාලනය කරන්නේ කවුද, ජනතාවාදී දේශපාලන ව්‍යාපාරයක්ද, ඇත්ත වුවමනාවක් තිබෙන දේශපාලන ව්‍යාපාරයක්ද, ජනතාවගේ දුක, වේදනාව හා හැඟීම් තේරුම් ගත්ත දේශපාලන ව්‍යාපාරයක්ද, නැද්ද සහ හොරකම, වංචාව, දූෂණය සහිත දේශපාලන ව්‍යාපාරයක්ද, එහෙම නැත්නම් එය පිටුදකින ලද දේශපාලන ව්‍යාපාරයක්ද, නැද්ද කියන කාරණාව. අප අද ඉතා සතුටු වනවා. ආණ්ඩුවක් විධියට; රජයක් විධියට අපි ඔබේ බලාපොරොත්තු, ඔබේ ප්‍රාර්ථනා ඉටු කරමින්, ඔබේ වටිනා ඡන්දයේ ගෞරවය එලෙසින්ම ආරක්ෂා කරමින් ඉන්නවා කියන එක මේ රටේ ජනතාවට අපි නැවත නැවතත් කියනවා. ඒ වගකීම එලෙසින්ම ඉෂ්ට කරමින් තමයි අපි අමාත්‍යාංශ ගණනාවක් හරහා මේ සියලු සංවර්ධන කටයුතු සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීම ආරම්භ කරලා තිබෙන්නේ. අපේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය අතිශයින් භාරදූර කර්තව්‍යයක් පැවරුණු අමාත්‍යාංශයක්. ඒ වෙනුවෙන් උරදී කටයුතු කරනවා. අපේ අමාත්‍යතුමා, ඒ වාගේම ලේකම්තුමාගේ සිට සියලු කාර්ය මණ්ඩලය බොහෝ වෙහෙස මහන්සියෙන් කටයුතු කරනවා. මුළු රටේම අමාත්‍යාංශයට අදාළ නිලධාරි මහත්ම මහත්මීන් 25,000ක් ඉන්නවා. ඒ වාගේම අපේ පෞද්ගලික කාර්ය මණ්ඩලය මේ වෙනුවෙන් කැප වෙනවා. අපට පැවරුණු කාර්යභාරය කුමක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අවශ්‍ය නැහැ අපේ අය වැයෙන් මෙන්න මේ දේවල් වෙන් කළා, වෙන් කළා කියන්න. අපේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙන්නේ වඩා මානුෂිකවාදී කාර්යභාරයක්. මේ අමාත්‍යාංශය, සංවේදී මිනිසුන් පිළිබඳව තව තවත් සංවේදීව කටයුතු කරන්න වගකීමක් පැවරුණු අමාත්‍යාංශයක්. අපි කවුරුත් වැඩිහිටියන් බවට පත්වෙලා, වැඩිහිටි ජනගහනයට එකතු වෙනවා. අපි දන්නවා මේ රටේ වැඩිහිටි ජනගහනය ලක්ෂ 35ක් පමණ ඉන්න බව. ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් අපි කටයුතු කළ යුතුව තිබෙනවා; ඔවුන් රැක බලා ගත යුතුව තිබෙනවා. අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් අපෙන් කෙරෙන්න ඕනෑ කාර්යභාරයක් තිබෙනවා. මේ වෙනකොට අපි වැඩිහිටියන් 800,000 ගණනකට රුපියල් 5,000 ගාණේ ආධාර මුදල් ලබා දෙනවා. ඒක වැඩි වුණු මුදලක්. කලින් තිබුණාට වඩා විශාල වශයෙන් ඒ මුදල සහ ලබා දෙන අයගේ ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා.

අපි මේ මාස කිහිපය තුළ මුල්ම අවස්ථාවේදී ආබාධිත ප්‍රජාව 135,371කට දීමනා ලබා දුන්නා. ඊට පසුව තවත් 27,217කට ලබා දුන්නා. ඒ කියන්නේ මේ වෙනකොට 162,588කට රුපියල් 10,000 බැගින් ලබා දෙමින් තිබෙනවා. ඒ වාගේම සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා විවිධ වැඩසටහන් අපි ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒකේදී අලුත් අදහසක් විධියට ILO ආයතනයේ අනුග්‍රහය ඇතිව ආබාධ සහිත තරුණ තරුණියන්ට ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා ලබා දීමට, මහන මැෂින් ක්‍රියාකරු පුහුණු පාඨමාලා ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ශ්‍රවණ, කථන ආබාධ සහිත පුද්ගලයන්ට දුම්රිය දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ආදී ස්ථානවලට ප්‍රවේශවීම සඳහා නව QR කේත නිර්මාණයක් ලබා දෙනවා, IFPS ආයතනයේ අනුග්‍රහය යටතේ. එවැනි අලුත් දේවල් තිබෙනවා.

අපි මොනවා කථා කළත්, මොන තරම් මුදල් වෙන් කළත්, එවැනි ආබාධිත ප්‍රජාව ලක්ෂ 15ක් පමණ විශාල දුක් කම්කටුලුවලට මුහුණ දීලා සිටින බව අපි දන්නවා. ඔවුන්ගේ ජීවිත, ඔවුන්ගේ පවුල් සුරක්ෂිත කිරීම සඳහා මේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. එය ඉටු කිරීම සඳහා තව තවත් අපේ යන්ත්‍රණය ශක්තිමත් කරමින්, ව්‍යුහයන් බලගන්වමින් ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, your time is over. Please wind up now.

**ගරු වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
අපි ඉදිරියේ දී ඒ සමස්ත ප්‍රජාව වෙනුවෙන් රජයක් විධියට කටයුතු කරමින් අපෙන් ඉෂ්ට වෙන්න ඕනෑ ඒ වගකීම, යුතුකම, - වැඩිහිටි ජනතාව වෙනුවෙන් සහ අනෙක් පැත්තෙන් ආබාධිත ජනතාව වෙනුවෙන්- ඉෂ්ට කරනවා. ඒ වාගේම ගම් මට්ටමේ සංවර්ධනය උදෙසා නිවැරදි සංවිධාන ව්‍යුහය හරහා විශාල සංවර්ධන වැඩ කොටසක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Rishad Bathiudeen. You have 13 minutes.

[பி.ப. 4.57]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டின் பொருளாதாரத்துக்கு முதுகெலும்பாக இருக்கின்ற முக்கிய அமைச்சான கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு மற்றும் அதனைச் சார்ந்த கைத்தொழிற்றுறை நிறுவனங்களுக்கான நிதி ஒதுக்கீடுகள் மீதான விவாதத்தில் இங்கே பல வகையான கருத்துக்கள், ஆலோசனைகளை எதிர்க்கட்சியினரும் ஆளுங்கட்சியினரும் முன்வைத்திருக்கிறார்கள். சனாதிபதி அவர்களும் தனது உரையின்போது, எமது நாட்டின் கைத்தொழில் துறையின் அபிவிருத்திக்கான முயற்சிகளைத் தான் முன்னெடுக்கவிருப்பதாகக் குறிப்பிட்டிருந்தார். அதிலே ஒரு விடயம்தான் IDB, NEDA, SMED ஆகியவற்றை ஒன்றிணைத்து IDBஇன்கீழ் கொண்டுவருவதற்கான ஒரு வேலைத்திட்டத்தை அடுத்த வருடத்திலிருந்து முன்னெடுப் பதாகச் சொல்லியிருந்தது. நான் அமைச்சராக இருந்த காலத்திலே அதற்கான ஆரம்ப நடவடிக்கைகளை எடுத்து, அது தொடர்பில் Cabinet Paperகூட சமர்ப்பித்திருந்தேன். அதுவொரு பிரயோசனமான வேலைத்திட்டம். நீங்கள் அந்த விடயத்தை அவசரமாக முன்னெடுத்துச் செல்லுங்கள் என்று உங்களிடத்திலே நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

இங்கு கைத்தொழில்கள் Ministry of Industry and Entrepreneurship Development, IDB, BoI ஆகிய மூன்று நிறுவனங்களின்கீழ் இயங்குகின்றன. BoI தவிர, அமைச்சின் கீழும் IDBயின் கீழும் இருக்கின்ற industrial estates இற்கிடையில் ஒருமைப்பாடு கிடையாது. அதைச் சரி செய்வதற்கான சில வேலைத்திட்டங்களை எனது பதவிக் காலத்தில் நாங்கள் செய்தாலும் அது முழுமை பெறாத நிலை இருக்கின்றது. இம்முறை Budgetஇல் IDBக்கு கீழுள்ள industrial estatesக்காக ஒதுக்கப்பட்டிருந்த 4,000 மில்லியன் ரூபாய்க்கு மேலதிகமாக 1,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பதாகச் சொல்லப்பட்டிருக்கின்றது. Ministry of Industry and Entrepreneurship Developmentஇன் கீழும் 25க்கும் மேற்பட்ட industrial estates இருக்கின்றது. அவற்றில் இருக்கின்ற குறைகளையும் நீங்கள் கேட்டறிந்து கொள்ளுங்கள் என்று உங்களிடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

கைத்தொழிலாளர்கள் எதிர்நோக்குகின்ற நிறையப் பிரச்சினைகளை எங்களிடத்திலே சொல்கிறார்கள். இது தொடர்பில் நான் உங்களிடத்தில் நேரடியாகவும் சொன்னேன். உதாரணமாக, batteryஇனை உருக்கி, அதிலிருந்து leadஐ உற்பத்தி செய்கின்ற மூன்று கம்பனிகள் இலங்கையில் இருக்கின்றன. அவர்கள் இலங்கையின் தேவைக்கு மேலதிகமாக அதனை உற்பத்தி செய்கின்றபோது, அதை வெளிநாடுகளுக்கு அனுப்புவதில் பல கஷ்டங்களை எதிர்நோக்குகிறார்கள்; அந்த exportersக்குப் பல வகையான இடையூறுகள் ஏற்படுகின்றன. நீங்கள் அமைச்சராக வருவதற்கு முன்னர் இருந்த அமைச்சர் அதில் கையாடல் செய்யும் நோக்குடனோ - இலஞ்சம் பெறுவதற்காகவோ - என்னவோ அந்த வேலைத்திட்டத்தைச் சிக்கலாக்கி யிருக்கிறார். அதாவது, IDBஇலே இருக்கின்ற குழுவிடம் அனுமதி பெற வேண்டும், பின்னர் அமைச்சுக்கு கீழே இருக்கின்ற குழுவிடம் அனுப்பி அனுமதி பெற வேண்டும், கடைசியில் அதனை அமைச்சர் அனுமதிக்க வேண்டும் என்ற நடைமுறை கொண்டுவரப்பட்டிருந்தது.

அது அமைச்சருடைய கைக்கு வரவேண்டிய தேவை கிடையாது! ஒவ்வொரு மாகாணத்திலும் கைத்தொழில் அமைச்சின் திணைக்களங்களில் Assistant Directors இருக்கிறார்கள். அவர்கள் அந்தப் பொருட்களைப் போய்ப் பார்த்துவிட்டு அதனை recommend பண்ணினால் அமைச்சின் செயலாளர், Additional Secretary போன்றவர்கள் ஒரு கிழமையிலே அனுமதிக்கலாம். இந்தக் காலதாமதத்தினால் ஒவ்வொரு மாதமும் இலங்கைக்கு வரவேண்டிய ஆயிரக்கணக்கான தொன்களுக்குரிய 2-3 மில்லியன் டொலர் பணம் வராமல் இருப்பதாக நான் கேள்விப்படுகிறேன். வெளிநாட்டுச் சந்தைக்கேற்பத்தான் அதன் விலைகளை நிர்ணயிக்கிறார்கள். எனவே, அவர்களால் அந்த industryஐக் கொண்டுசெல்ல முடியாத நிலை இருக்கிறது. இது சம்பந்தமாக நான் கௌரவ அமைச்சரிடத்திலே சொன்னபொழுது, அவருடைய Coordinating Secretary, IDB Chairman உடன் கதைத்ததன் அடிப்படையில், IDB Chairman தான் அதுபற்றி பார்ப்பதாகக் கூறியிருந்தார். கௌரவ அமைச்சரவர்களே, உங்களுடைய சில அதிகாரிகள் telephone callக்கு answer பண்ணுவது கிடையாது! புதிய அரசாங்கம் என்ற வகையில் இந்த வருடத்தில் மட்டும் அரசாங்கத்தை மக்கள் குறை சொல்ல மாட்டார்கள். ஆனால், அடுத்த வருடமும் இதே நிலையை நீங்கள் தொடர்ந்தால் எல்லோரும் அரசுக்கு எதிராக roadக்கு வந்து விடுவார்கள். சில அதிகாரிகளுடைய அசமந்தப்போக்கு இந்த அரசாங்கத்துக்கு ஓர் ஆபத்தைக் கொண்டுவரும் என்பதிலே நீங்கள் கவனம் செலுத்த வேண்டும்.

எங்களுடைய ஆட்சிக் காலத்திலே EDBஉடன் சேர்ந்து Ministry of Industry and Entrepreneurship Development தலைமைதாங்குகின்ற Exporters' Forum ஒன்று இருந்தது. தற்போது EDB உங்களிடம் இருக்கிறதா என்று எனக்குத் தெரியாது. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේද තිබෙන්නේ EDB එක? එහෙනම්, Exporters' Forum එක මාස දෙකකට හෝ මාස තුනකට වතාවක් ඔබතුමා රැස් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* එහෙම කරනවා නම් මේ exportersලාගේ ප්‍රශ්නයට විසඳුමක් එතැනදී එනවා නේ. ගරු ඇමතිතුමනි, දැන් අවුරුද්දක් වෙනවා, මම කියන අර exportersලා ගොඩක් ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒ වාගේ ප්‍රශ්න එනකොට ලේකම්තුමියටත් මම එක වතාවක් කථා කළා. එතුමිය උපදෙස් දීලාත් නිලධාරින් වැඩ කරන්නේ නැහැ. කොතැන හරි පගාව බලාපොරොත්තුවෙන් ඒක delay කරනවාද කියලාත් මම දන්නේ නැහැ. ඒ නිසා මේ ගැන පොඩ්ඩක් සොයා බලලා සතියක්, සති දෙකක් ඇතුළත exportersලාට එවන්න පුළුවන් ක්‍රමයක් ඔබතුමා හදන්න. Exports නැතිව මේ රට හදන්න බැහැ. අපේ ලංකාවේ අපිට වෙන මොනවාද තිබෙන්නේ? ඒ නිසා ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා කරුණාවෙන් ඉල්ලනවා.

அதேபோல, நான் அமைச்சராக இருந்தபொழுது மன்னார் மாவட்டத்திலே கொண்டைச்சி என்ற பிரதேசத்தில் Ministry of Industry and Entrepreneurship Developmentஇன் கீழே කැබිනට් අවසරය பெற்றுக்கொண்டு industrial estate ஒன்றை ஆரம்பிப்பதற்கு நிதி ஒதுக்கினேன். அன்று முதலமைச்சராக இருந்த விக்கினேஸ்வரன் அவர்கள் ஓர் இனவாதச் சிந்தனையோடு அதைச் செய்வதற்குச் சில தடங்கல்களை ஏற்படுத்தினார். அந்த அமைச்சினுடைய 110 மில்லியன் ரூபாய் நிதி, தண்ணீர் வசதிக்காகவும் மின்சாரத் தேவைக்காகவும் ஒதுக்கப்பட்டிருக்கிறது. 25 ஏக்கர் landஉம் அதற்காக ஒதுக்கப்பட்டது. மன்னார் முசலிப் பிரதேச செயலகத்துக்குக் கீழே அந்த இடம் வருகிறது. ஒதுக்கப்பட்ட அந்தப் பணமும் ஒதுக்கப்பட்ட இடமும் இருக்கிறது. எனவே, தயவுசெய்து இந்த வருடம் உங்களிடம் இருக்கின்ற 4,000 -

5,000 மில்லியன் ரூபாயிலே சில மில்லியன்களையாவது கொடுத்து, இன்ஷா அல்லாஹ்! அந்த வேலைகளை start பண்ணுமாறு நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன். அது அந்தப் பிரதேச இளைஞர் யுவதிகளுக்கு வேலை வாய்ப்பைக் கொண்டுவரும்.

நான் அமைச்சராக இருந்தபோது, வெலிஓயா, முல்லைத்தீவு, வவுனியா, மன்னார், புதுக்குடியிருப்பு போன்ற பல்வேறு இடங்களிலே எம்மால் முடிந்தவரை industrial estates உருவாக்கப்பட்டதன் ஊடாக இன்று பல்லாயிரக்கணக்கான ஏழை இளைஞர், யுவதிகள் வேலை வாய்ப்பைப் பெறுகிறார்கள். எனவே, நீங்களும் அதிலே கவனம் செலுத்துங்கள்! அதற்காக முழுமையாக அரச பணத்தைச் செலவழிக்குமாறு நான் சொல்லவில்லை. Public-private partnershipஆக இடத்தை வழங்கி, அடிப்படை வசதிகளை அரசாங்கம் செய்துகொடுக்கின்றபோது, முதலீட் டாளர்கள் வந்து முதலீடுகளைச் செய்வார்கள். அதற்கான ஏற்பாடுகளைச் செய்யுமாறு நான் அன்பாக உங்களிடத்தில் வேண்டுகோள் விடுக்கின்றேன்.

அதுபோல, நான் அமைச்சராக இருந்தபொழுது NEDAஇன் கீழ் குளியாப்பிட்டி University College இல் ஒரு incubator systemஐ நாங்கள் செய்து கொடுத்தோம். அதன்மூலம் பல பல்கலைக்கழக மாணவர்கள் அரச தொழிலை எதிர்பார்க்காமல் சுயமாகத் தொழில் செய்கின்ற திட்டத்தையும் நாங்கள் NEDAஇன் ஊடாக ஆரம்பித்தோம். தற்போதும் அது நடைபெறுகின்றதா, இல்லையா என்பது எனக்குத் தெரியாது. தயவுசெய்து அவ்வாறான திட்டங்களை அதிகரிக்க வேண்டும். சனாதிபதி அவர்களும் ஒரு புதிய வேலைத்திட்டத்தைச் சொன்னார். அதாவது, private sectorஇல் வேலையில் சேர்த்துக் கொள்ளப்படுகின்றவர்களுக்காக அரசாங்கம் 2 வருடத்திற் கான ஒரு கொடுப்பனவைக் கொடுப்பதாகச் சொன்னார். அது நல்லதொரு திட்டம். அவ்வாறான திட்டம் முன்னெடுக்கப் படுகின்றபொழுது, incubator systemஐ வட மாகாணத்திலே University of Jaffna அல்லது கிளிநொச்சியில் இருக்கின்ற Faculty of Engineering உடன் connect பண்ணி அங்கே ஒன்றையும், South Eastern Universityஇல் இருக்கின்ற Faculty of Engineeringஇல் ஒன்றையும் உருவாக்க முடியும். வடக்கு, கிழக்கிலிருந்து வேலைவாய்ப்புக்காக வெளிநாடுகளுக்குச் சென்று பல மில்லியன் கணக்கான பணத்தோடு திரும்பி வருகின்ற பலர் எந்தத் தொழிலில் ஈடுபடுவதென்று தெரியாததால் அந்தப் பணம் வீணடிக்கப்படுகின்றது. எனவே அங்கே incubator system இருப்பது அவர்களுடைய பணத்தை முதலீடு செய்வதற்குத் தேவையான தொழில்களை, சிறு கைத்தொழில்களை, வியாபாரங்களை ஆரம்பிக்க மற்றும் exportஐச் செய்ய ஓர் அடித்தளமாக அது அமையும். ஆகவே, அதிலே கவனம் செலுத்துமாறு உங்களிடம் அன்போடு வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, research and development என்பதை எடுத்துக்கொண்டால், எமது நாட்டிலே எந்தத் துறையிலும் Researchஇற்கான ஒதுக்கீடுகள் மிகக்குறைவு. இங்கு research என்பது போதியளவு இல்லாத காரணத்தால் தொழிற்றுறை முன்னேற்றம் குறைவாகக் காணப்படுகின்றது. இலங்கையில் Ministry of Science and Technologyக்குக் கீழே இருக்கின்ற SLINTEC என்ற நிறுவனம் - அது public-private partnershipஆக ஆரம்பிக்கப்பட்டாலும் - successfulஆக இயங்கிக் கொண்டிருக்கின்றது. அதனூடாகப் பல்வேறுபட்ட research மேற்கொள்ளப்படுகின்றது. அதுபோல, பல பல்கலைக்கழகங்களிலும் உள்ள Engineering Faculty உடன் சேர்ந்து researchஇனை மேற்கொள்ள முடியும். இந்த researchக்காக அரசாங்க முதலீடுகளுக்கு மேலதிகமாக அதிகளவான நிதியை ஒதுக்குவதற்குப் பெரிய கம்பனிகளோடு கதைத்து ஏற்பாடுகளைச் செய்ய முடியும். உதாரணமாக, பெரிய பெரிய industrial நிறுவனங்கள் தமது வருமானத்தில் 33 சதவீதத்தை tax ஆக கட்ட வேண்டுமாக இருந்தால், அவர்கள் researchக்காக முதலீடுகளைச் செய்கின்றபோது, அவர்களுக் கான taxஐ 5 சதவீதம் குறைக்கின்றபோது, அவர்கள் அதற்காக மேலதிக தொகைகளை ஒதுக்குவார்கள். சுவிட்சர்லாந்து, யப்பான், அமெரிக்கா மற்றும் ஐரோப்பிய நாடுகளில் R&D - Research and Developmentக்காக விசேடமான ஒரு திட்டத்தை வைத்திருக்கின்றார்கள். எனவே, இந்தக் கணினி யுகத்தில் உலக மயமாக்கலோடு சேர்ந்து நாங்களும் முன்னேற வேண்டுமாக இருந்தால், R&D - Research and Developmentக்கான வேலைத் திட்டத்துக்கு private sectorஐப் பயன்படுத்தி முதலீடுகளைப் பெற்றுக் கொள்ளும் வகையில் அதற்கு ஈடாக, அவர்களுடைய Income Taxஇல் சில குறைப்பு வசதிகளைச் செய்கின்றபோது, அவர்கள் நிச்சயமாக முன்னேறுவார்கள். தயவுசெய்து Industryக்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையில் நீங்கள் அதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, Valaichchenai Industrial Estate பற்றி நீங்கள் சொன்னீர்கள். அங்கு 300 ஏக்கருக்கும் மேற்பட்ட காணிகள் இருக்கின்றது. அங்குள்ள இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்புக்களை வழங்குகின்ற வகையில், அந்தப் பிரதேசத்தில் இருக்கின்ற முதலீட்டாளர்களுக்கு முன்னுரிமை வழங்கி, சிறிய சிறிய கைத்தொழில்களை - சுற்றுலாத்துறை சார்ந்த கைத்தொழில், அதேபோல அரிசி போன்ற மூலப்பொருட்களைப் பயன்படுத்தி மேற்கொள்ளும் கைத்தொழில்களை - அங்கு ஆரம்பிக்க அதனைப் பயன்படுத்துமாறு வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, Hingurana Sugar Industries Limited சம்பந்தமாக கௌரவ அமைச்சர் வசந்த பியதிஸ்ஸ அவர்கள் உட்பட ஏனைய பாராளுமன்ற உறுப்பினர்களும் பேசினார்கள். அங்கேயிருக்கின்ற விவசாயிகள் மிகவும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; மனமுடைந்திருக்கின்றார்கள். தங்களுடைய காணி சம்பந்தமாக நிவாரணம் அல்லது தங்களுக்கான விஷயங்களுக்காக அலைந்து திரிந்த பலர் இறந்து விட்டார்கள். அவ்விடயம் சம்பந்தமாக நீங்கள் முயற்சி எடுப்பதாக அறிகின்றேன். எனவே, தயவுசெய்து அந்த விஷயத்திலும் கூடிய கவனமெடுத்து, அந்த முயற்சியைத் தொடர்ந்தும் முன்னெடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

கைத்தொழில் அமைச்சு என்னிடத்தில் ஒப்படைக்கப் பட்டிருந்தபொழுது, இலங்கை சீனி நிறுவனம் 1,000 மில்லியன் ரூபாய் நஷ்டத்துடன் இருந்தது. நான் அதனை மீள ஒப்படைக்கின்றபொழுது, Rs. 2.7 billion fixed depositஇல் போட்டுக் கொடுத்தேன். நவின் அதிகாரம் என்ற அமெரிக்காவில் படித்த ஒருவர் Chairmanஆக இருந்து அதனைத் திறமையாக நடத்தினார். அந்தக் காலத்தில், அரசாங்கம் அந்த அமைச்சைத் தேவையில்லாமல் என்னிடமிருந்து எடுத்து, இன்னொரு அமைச்சருக்குக் கொடுத்தபொழுது, அந்த ஊழியர்கள், "றிஸாட் பதியுதீனுக்கு அந்த நிறுவனத்தைக் கொடுங்கள்!" என்று பல நாட்கள் வீதியில் நின்று ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டார்கள். அவர் போன்ற நல்ல அறிவுள்ளவர்களை நீங்கள் அழைத்து ஆலோசனைகளைப் பெற்று, அவர்களையும் இவ்வாறான வேலைத்திட்டங்களுக்குப் பயன்படுத்திக் கொள்ளுங்கள் என்று உங்களிடத்தில் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

கௌரவ அமைச்சர் அவர்களே, இந்த அமைச்சின்கீழுள்ள இன்னுமொரு முக்கியமான நிறுவனம்தான் LMSL. இந்த நாட்டில் இருக்கின்ற ஒரு மிகப்பெரிய சொத்துத்தான் mineral என்பது. இந்த mineralஇனை எடுத்து நாம் சரியாகப் பயன்படுத்தினால் இந்த நாட்டுக்குப் பல பில்லியன் டொலர் கணக்கில் ஆதாயத்தைக் கொண்டு வரலாம். ஆனால், நாம் அதைச் சரியாகப் பயன்படுத்துவதில்லை. இந்த mineral மண்ணை எடுத்து export செய்கின்றவர்களாக மட்டுமே நாங்கள் இருக்கின்றோம். அவ்வாறில்லாமல், அதற்காக investorsஇனை அழைத்து, அம்பாந்தோட்டை போன்ற பகுதியிலே titanium dioxide அல்லது அதற்கு அடுத்த கட்டத்தில் உள்ள தாதுப்பொருள் உற்பத்திக்கான ஒரு factoryஐ அமைப்பதற்கு இடத்தை ஒதுக்கீடு செய்து, இந்த நாட்டின் மூலப்பொருள்களை மட்டுமல்லாது, அருகில் இருக்கின்ற ஏனைய நாடுகளில் இருந்தும் மூலப்பொருள் களைக் கொண்டுவந்து, அங்கு value addition செய்த உற்பத்திகளை export செய்கின்றபொழுது, நாட்டுக்குப் பெருந் தொகைப் பணத்தை வருமானமாகப் பெற்றுக் கொள்ளலாம். இப்பொழுது GSMB உங்களின்கீழ் இருக்கின்றது. எனவே, இது சம்பந்தமான வேலைத்திட்டத்தை இங்கேயிருக்கின்ற அறிஞர்கள், ஆய்வாளர்களை வைத்து முன்னெடுங்கள்!

அத்துடன், புல்மோட்டையில் வேலை செய்கின்ற இளைஞர்களுடைய பிரச்சினை சம்பந்தமாக உங்களிடத்தில் நான் பத்து முறையாவது பேசியிருப்பேன். 2023ஆம் ஆண்டு காலியைச் சேர்ந்த அமைச்சர் ஒருவர், தன்னுடைய ஊரைச் சேர்ந்த 17 பேரை அங்கு நியமனம் செய்து அவர்களுக்குச் சம்பளம் கொடுத்திருக்கின்றார். அதன்பிறகு 34 பேரை நியமித்திருக்கிறார்; அவர்களுக்கு மூன்று மாதம் சம்பளம் கொடுத்தார்; பிறகு கொஞ்ச நாட்களில் அவர்கள் எல்லோரும் போய்விட்டார்கள். அதன் பிறகு கௌரவ அமைச்சர் அவர்களே, 2024ஆம் ஆண்டு 07ஆம் மாதம் 46 பேருக்கு வேலை கொடுக்கப்பட்டது; அதற்குப் பிறகு 11 பேருக்கு வேலை கொடுக்கப்பட்டது. ஆரம்பத்தில் நியமனம் வழங்கப்பட்ட காலியைச் சேர்ந்த 17 பேருக்கும் சம்பளம் கிடைக்கின்றது. அந்த 34 பேருக்கும் மூன்று மாதம் சம்பளம் வழங்கி பிறகு நிறுத்தப்பட்டு விட்டது. ஆனால், பின்னர் நியமனம் பெற்ற அந்த 46 பேரும் இதுவரை சம்பளம் இல்லாமல் வேலை செய்து கொண்டிருக்கின்றார்கள். பிறகு நியமனம் செய்த 11 பேரும் உள்ளே போய்விட்டு வந்திருக்கின்றார்கள். நீங்கள் எனக்குச் சொன்னீர்கள், "நான் கட்டாயம் கொடுப்பேன். ஆனால், Bribery Commissionஇல் case இருக்கிறது" என்று. Bribery Commissionஇல் நான் check பண்ணிப் பார்த்தேன், Case முடிந்து விட்டது. அந்த ஊரில் இருக்கின்ற கனிய வள மண்ணை எடுத்து நாட்டுக்கு வருமானத்தைப் பெற்றுக் கொள்கின்றீர்கள். எவ்வாறு தேயிலைத் தோட்டத் தொழிலாளர்களுக்கு நீங்கள் 5,000 மில்லியன் ரூபாயைக் கொடுத்து அங்குள்ள தொழிலாளர்களை ஊக்கப் படுத்துகின்றீர்களோ, அதேபோல, அந்த ஊரைச் சேர்ந்த அவர்களுக்கும் - அவர்கள் ஏழைகள் - தயவுசெய்து காலந்தாழ்த்தாது சம்பளத்தைப் பெற்றுக்கொடுத்து அவர்களையும் ஊக்கப்படுத்த நடவடிக்கை எடுங்கள்! நிரந்தரமற்ற ஊழியர்கள் கிட்டத்தட்ட 9,000 பேருக்கு permanency வழங்கப்போவதாக அரசாங்கம் அறிவித்திருக் கின்றது. உங்களிடத்தில் இப்பொழுது நான் கேட்கின்றேன் -

ගරු ඇමතිතුමනි, දැන් මම ඔබතුමාගෙන් ඒ ගැන අහනවා. ඒකට ඔබතුමා උත්තරයක් දෙන්න. ඒ ප්‍රදේශයට යන්න බැරිවයි ඉන්නේ අපි. ඒ ප්‍රදේශයේ ළමයි අපෙන් ඉල්ලීමක් කරනවා. ගාල්ලේ ළමයින්ට පඩි දෙනවා. නමුත්, ඒ ප්‍රදේශයේ ළමයින්ට පඩි දෙන්නේ නැහැ. ඇයි ඒ? ඇමති,- *[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි. ඔබතුමා ගාල්ලේ නොවෙයි, මාතර නේ. පසුගිය ආණ්ඩුවේ හිටපු කෙනා ගාල්ලේ නිසා ඔහු දමපු අයට පඩි දෙනවා. මේගොල්ලනුත් ඔහු තමයි පත් කර තිබෙන්නේ. නමුත්, ඒ අය ගමේ මිනිස්සු නිසා ඒ අයට පඩි දෙන්නේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය සම්බන්ධයෙන් විතරක් මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. ඇත්තටම එතැන 97දෙනෙකු විතර ඉන්නවා. ඒ අය සම්බන්ධයෙන් Bribery Corruption එකේ පැමිණිල්ලක් විභාග වුණා, ඒගොල්ලන් පත් කරගෙන තිබෙන්නේ මුදල්වලට කියලා. ඒ පැමිණිල්ල තිබියදී අපට ඔවුන් ස්ථිර කරන්න හෝ බඳවා ගන්න බැහැ. දැන් ඒ කටයුත්ත අපි අවසන් කරලා තිබෙන්නේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඒ ගැන දැනුම් දීලා තිබෙනවා. ඒ cadre එකට ඒගොල්ලන් absorb කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ඉතාම ඉක්මනින් ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන්. ඔක්කොටම අවස්ථාව ලබා දෙන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Ajith P. Perera. You have been allotted three minutes.

[අ.භා. 5.11]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, මම එක විශේෂිත ප්‍රශ්නයක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මම පළමුවෙන්ම ගරු ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමාට වාගේම මිල්ලනිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිනි, ඔෂානි උමංගා හපුආරච්චි මැතිනියට ස්තුතිවන්ත වෙනවා, කළුතර රයිගම හරිත කර්මාන්ත හා තාක්ෂණික සංවර්ධන අධි කලාපය ලෙස නම් කර ඇති මිල්ලනිය කර්මාන්තපුරය සම්බන්ධයෙන් දක්වන උනන්දුව පිළිබඳව. ඒ කර්මාන්තපුරයේ ඉදිකිරීම් කටයුතු අපි ආරම්භ කළා. නමුත්, පසුගිය වසර 5ක කාලය තුළ එහි කටයුතු අඩාළ වුණා. ඔබතුමන්ලා නැවත ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම මූලික කටයුතු දැන් කෙරිලා තිබෙන්නේ. මාර්ග හදලා තිබෙනවා; විදුලිය සපයා තිබෙනවා; ජලය සපයන බව මම දන්නවා. ඒ වාගේම පරිපාලන කාර්යාලය ලස්සනට හදලා ඉවර කර තිබෙනවා. හැබැයි, ප්‍රධාන මාර්ගයේ ඉඳලා එන මාර්ගය හදලා නැහැ. නමුත්, මීට මාස 6කට කලින් ඔබතුමන්ලා වැඩ පටන් ගන්නකොට කිව්වා, 2026 ජනවාරි මාසයේ කර්මාන්ත පටන් ගන්න බව. නමුත්, අද වනකල් එකම කර්මාන්තශාලාවකට අත්තිවාරමක්වත් දාලා නැහැ. මම දන්නවා, මේකේ තිබෙන ගැටලු ගැන. මුල් කැබිනට් පත්‍රිකාවලින් මේවා ලබා දුන් අයගෙන් සමහරු අත්හැරලා ගිහිල්ලා; සමහරු ව්‍යාපාර අත්හැරලා. මගේ ඉල්ලීම මේකයි. විශාල ඉල්ලුමක් තිබෙනවා, මේ ප්‍රදේශයට. ඒ වාගේම රැකියා ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය කරන සම්පත් ප්‍රමාණය එතැන තිබෙනවා. එතැන අක්කර 100ක් තිබෙන්නේ. ඒ අක්කර 100න්, අක්කර 40ක් විතර රක්ෂිතයට අත්හරින්න ඕනෑ. අක්කර 60ක් විතර තමයි සංවර්ධනය කරන්න පුළුවන්. නමුත්, දැනට සංවර්ධනය කරලා තිබෙන්නේ අක්කර 25යි. තවත් අක්කර 100ක් හඳුනාගෙන තිබෙනවා. මම හිතන විධියට, ඔබතුමන්ලා ඒ ගැන දන්නේ නැහැ. නියුවැටල්වත්ත ඉඩමේ එලකට නැති, වගා

කරන්න අමාරු තවත් අක්කර 100ක් හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව කර්මාන්ත සඳහා අවශ්‍ය ඉඩම් කළුතර දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒ නිසා මම ඉතා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පක්ෂ, පාට භේදයක් නැතුව ඉක්මනින්ම අලුත් කර්මාන්තකරුවන් තෝරාගෙන හෝ මේ කර්මාන්ත ඉදිකිරීම් ආරම්භ කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.
බොහොම ස්තුතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු මන්ත්‍රීතුමා, වතු සමාගමත් එක්ක ඉඩම නිරවුල් කර ගැනීමේ ගැටලුවක් තිබුණේ. රබර් ගස් වගයක් ඉවත් කර ගන්න තිබුණා. දැන් අපි ඒ කටයුත්ත ගැන සාකච්ඡා කරලා අවසන් කර තිබෙන්නේ. ඒ නිසා අපට ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන්. මොකද, අපට ඒකට රුපියල් ලක්ෂ හතරහමාරක වාගේ මුදලක් ගෙවන්න තිබුණා. ඒ මුදල ගෙවලා ඉවර කළාම අවසරය අරගෙන ඒ කටයුත්ත කරන්න පුළුවන්. ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රශ්නයක් විතරයි තිබුණේ. අපි ඒ ප්‍රශ්නය විසඳා අවසන් කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඇත්තටම ඒක හොඳයි. නමුත්, දැන් ප්‍රශ්නය තිබෙන්නේ තෝරා ගත් ආයෝජකයින් වැඩ පටන් ගන්නේ නැතිකමයි. ඒ නිසා වැඩ පටන් ගන්නේ නැති අයට සීමිත කාලයක් ලබා දීලා, ඒවා අවලංගු කරන්න. එවැනි විශාල පිරිසක් ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා ඇති, ඔය වාගේ විදුලිය, ජලය, පරිපාලන පහසුකම් තිබෙන හොඳ තැනක ඉඩම් හොයන නියම ආයෝජකයින් ඉන්න බව. ඒ නිසා එවැනි අලුත් අයට අවස්ථාව දෙන්න. එච්චරයි මම කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Dr.) Upali Pannilage. You have been allotted 10 minutes.

Order, please! The Hon. Upul Kithsiri will now take the Chair.

***අනතුරුව ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KAVEENTHIRAN KODEESWARAN left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 5.15]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ප්‍රධාන අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාදය පැවැත්වෙන මේ වෙලාවේදී මම ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් වූ කරුණුවලට පිළිතුරු ලබා දීමට සූදානම්.

මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් එකම විවේචනය හැටියට ඉදිරිපත් වුණේ "ප්‍රජා ශක්ති" කියන ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය පිළිබඳවයි. ඒ නිසා මම කල්පනා කළා, මේ ගරු සභාවට එම ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු, එහි සංයුතිය සහ කාර්යභාරය පිළිබඳව මේ අවස්ථාවේදී යම් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ප්‍රජා ශක්ති" ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය කියන්නේ, ප්‍රධාන අරමුණු කිහිපයක් පෙරදැරි කරගෙන අපේ රජය විසින් හඳුන්වා දෙනු ලබන සංවර්ධන ප්‍රවේශයක්. එහි ප්‍රධානතම අරමුණ තමයි, දිළිඳුකම තුරන් කිරීම සඳහා ජාතික නායකත්වයක් සැපයීම. අපි දැක්කා, අපේ රටේ දිළිඳුකම තුරන් කිරීම සඳහා පසුගිය වසරවල අනුගමනය කරපු ක්‍රියාමාර්ගවල ජාතික නායකත්වයක් තිබුණේ නැති බව. දෙවැනි අරමුණ තමයි, දිළිඳුකම තුරන් කිරීම සඳහා ඒකාබද්ධ සහ අන්තර්කරණීය යන්ත්‍රණයක් - integrated and inclusive mechanism එකක් - ස්ථාපනය කිරීම. තුන්වැනි අරමුණ තමයි, ග්‍රාමීය සංවර්ධනය සඳහා සක්‍රිය ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේදයක් අනුගමනය කිරීම. හතරවැනි අරමුණ තමයි, ග්‍රාමීය සංවර්ධන කටයුතුවල ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව සමාජ විගණනයකට යොමු කිරීම. මෙන්න මේ ප්‍රධාන අරමුණු 4 අනුව තමයි අපි "ප්‍රජා ශක්ති" ජාතික ව්‍යාපාරය ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා නිර්මාණය කර මේ වනකොට ක්‍රියාත්මක කරමින් ඉන්නේ. සමහර වෙලාවට මෙහි සංයුතිය දෙස බලා මේකට වෙන විවේචනයක් ඉදිරිපත් කරනවා, අපි මේ ප්‍රජා සංවර්ධන සභාවලට මුදල් දෙන්න යනවා කියලා. මේක යන්ත්‍රණයක් පමණයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රජා සංවර්ධන සභාවක් අපි සෑම ගමකම හදනවා. ඒ වාගේම තමයි, ජාතික නායකත්වය. අපේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ප්‍රතිපත්ති සභාවක් හදලා තිබෙනවා. අමාත්‍යාංශ 9ක අමාත්‍යවරු එහි සාමාජිකත්වය දරනවා. ඒ වාගේම තමයි, මේ ජාතික සභාවේ ලේකම් ධුරය ජනාධිපති ලේකම්වරයා විසින් දරනවා. ඊළඟට, මම කියපු ඒකාබද්ධ ව්‍යුහය තුළට අපි ඒ අමාත්‍යාංශ පරිපාලනය කරන අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම තමයි, ලංකාවේ තිබෙන පළාත් සභා නවයේම ප්‍රධාන ලේකම්වරු අපි ඒකාබද්ධ මෙහෙයුම් යන්ත්‍රණය තුළට ගෙනැල්ලා තිබෙනවා.

එමෙන්ම, ගමේ හදන ප්‍රජා සංවර්ධන සභාව ප්‍රධාන කොටස් 3කින් සමන්විතයි. ඒ අනුව පළමුවෙන්ම කාරක සභාවක් හදනවා. මෙන්න මේ කාරක සභාවේ ඉන්නවා, ග්‍රාම නිලධාරිවරයා. ඒ වාගේම, එහි ලේකම්වරයා බවට පත් වෙනවා, ඒ ගමේ ඉන්න උපාධිධාරියෙක්; ඒ කියන්නේ, සංවර්ධන නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, ගමේ ඉන්නවා නම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි, ධීවර නිලධාරි වාගේ කෙනෙක්. දැනටමත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල වාගේම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල තිබෙන සංයුතියම තමයි අපි පහළට ගෙනැල්ලා, මේ සංවර්ධන වැඩකටයුතු සැලසුම් කරන්න, ඒ ක්‍රියාත්මක වන දේවල් පිළිබඳව විමර්ශනය කරන්න මේ යන්ත්‍රණය හඳුන්වා දීලා තිබෙන්නේ. අන්න ඒ වෙනුවෙන් තමයි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක් ප්‍රජා සංවර්ධන සභාවේ සභාපති වශයෙන් පත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රජා සංවර්ධන සභාවක කාර්යභාරය කුමක්ද? එහි ප්‍රධාන කාර්යභාරය තමයි, ප්‍රජා දායකත්වයෙන් ග්‍රාම සංවර්ධන සැලසුම් සකස් කිරීම; ඒ වාගේම ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් සම්පාදනය කර ගැනීම. ඒ සම්පත් සම්පාදනය කර ගැනීමට රජයේ තිබෙන අමාත්‍යාංශවලට ඒ වාගේම ආයතනවලට යොමු කරන්න පුළුවන්; පෞද්ගලික අංශයට යොමු කරන්න පුළුවන්; එහෙම නැත්නම්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

රාජ්‍ය නොවන සංවිධානවලට යොමු කරන්න පුළුවන්. ඒ වාගේම ඉතාම වැදගත් දේ තමයි මේ සංවර්ධන වැඩසටහන් නිවැරදිව ක්‍රියාත්මක වෙනවාද කියන එක විමර්ශනය කිරීම. අපි ඒකට කියනවා, social audit කියලා. ඒ කියන්නේ, ජනතාව විසින්ම විගණනයට ලක් කරනවා. ඒක අලුත් සංවර්ධන ප්‍රවේශයක්. ඒ සංවර්ධන ප්‍රවේශය තුළ ජනතාව තමයි තීරණය කරන්නේ, ජනතාව තමයි විමර්ශනය කරන්නේ, මේ සංවර්ධන වැඩසටහන් නිවැරදිව ක්‍රියාත්මක වෙනවාද කියලා. අන්න ඒ ව්‍යූහය තමයි අපි "ප්‍රජා ශක්ති" ජාතික ව්‍යාපාරය තුළ හඳුන්වා දීලා තිබෙන්නේ. එහි මම කලින් කියපු නිලධාරින්ගෙන් සමන්විත කාරක සභාවක් තිබෙනවා. ඊළඟට අපි හඳුන්වා දීලා තිබෙනවා, උපක්‍රමික කණ්ඩායමක්. ඒ උපක්‍රමික කණ්ඩායම කවුද? තමන්ගේ ගම සංවර්ධනය කරන්න කැමැති විද්වතුන් වෙන්න පුළුවන්, උගතුන් වෙන්න පුළුවන්, ව්‍යවසායකයන් වෙන්න පුළුවන්, උපරිම පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් උපක්‍රමික කණ්ඩායමක් වශයෙන් මේ සභාව නියෝජනය කරනවා.

ඊළඟට ඉන්නවා, ප්‍රජා නියෝජිත කණ්ඩායම. ප්‍රජා නියෝජිත කණ්ඩායමේ විශේෂයෙන් ග්‍රාම නිලධාරි වසම නියෝජනය වන විධියට 10දෙනෙකුත්, 15දෙනෙකුත් අතර ප්‍රමාණයක් ඉන්නවා. ස්ත්‍රී පුරුෂභාවය, දුප්පත් පොහොසත් අය, ජනවාර්ගික සංයුතිය කියන මේ සියල්ල බලලා තමයි ප්‍රජා නියෝජිත කණ්ඩායම පත් කරන්නේ. ඒ වාගේ කාරක සභාවක්, උපක්‍රමික කණ්ඩායමක්, ප්‍රජා නියෝජිත කණ්ඩායමක් කියන මේ සමස්තය එකතු වෙලා තමයි ප්‍රජා සංවර්ධන සභාවක් නිර්මාණය කරන්නේ. ඒ අනුව අපි ලංකාවේ මේ වෙනකොට තිබෙන සක්‍රිය ග්‍රාම නිලධාරි වසම් 14,008හිම ප්‍රජා සංවර්ධන සභා ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මට තේරෙනවා, මේ පිළිබඳව විවේචනය ඉදිරිපත් වෙන්නේ කොහෙන්ද කියලා. ප්‍රජා සංවර්ධන සභා නිර්මාණය කළාට පස්සේ ඒ ගම සංවර්ධනය කරන්නේ කොහොමද, ඒ ගමේ ඉදිරි දිශානතිය කොහොමද, ඒ ගම පොහොසත් කරන්නේ කොහොමද කියන එක පිළිබඳව තීරණය කිරීමේ සම්පූර්ණ බලය ගමට යනවා. ගමේ ජනතාව තමයි එය තීරණය කරන්නේ. කලින් දේශපාලකයෝ තීරණය කරපු එක, රාජ්‍ය නිලධාරින් තීරණය කරපු එක, එහෙම නැත්නම් වෙනත් තනි පුද්ගලයින් විසින් තීරණය කරපු ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නතර කරලා ගමේ සංවර්ධනය තීරණය කිරීමේ බලය අපි ගමේ ජනතාව අතට ලබා දෙනවා. ජනතාවාදී ආණ්ඩුවක් විධියට ජනතාවට ඒ බලය ලබා දීමේ ක්‍රියාවලියක් තමයි අපි "ප්‍රජා ශක්ති" ජාතික ව්‍යාපාරය මඟින් හඳුන්වා දීලා තිබෙන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ මීළඟ වසර කිහිපය තුළ විශේෂයෙන් ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමට අපි අනුගමනය කරන ප්‍රධාන වැඩසටහන් අතර එක් ප්‍රධාන වැඩසටහනක් තමයි "ප්‍රජා ශක්ති" නමින් අපි හඳුන්වා දීලා තිබෙන මේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන. සෘජුවම ග්‍රාම සංවර්ධනයට සම්බන්ධ වන අමාත්‍යාංශ නවයක්, ඒ වාගේම පළාත් සභා, පළාත් පාලන ආයතන, ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන ජාතික සභාවක් හරහා මෙහෙයවන මේ වැඩසටහන සඳහා අපි 2026 වසර සඳහා අමතරව රුපියල් මිලියන 25,000ක් මෙවර අය වැයෙන් ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා විධියට වෙන් කරනු ලැබුවා.

මේ විවාදය පුරා ඉදිරිපත් කරපු ඊළඟ කාරණය තමයි අපි මේ සහනාධාර දෙන්න යනවා කියන එක. එක පැත්තකින් කියනවා, සහනාධාරය දෙනවා කියලා. අනෙක් පැත්තෙන් කියනවා, දෙන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. මේ රටේ ජනතාව සවිබලගැන්විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව අපට හොඳ අත්දැකීමක් තිබෙනවා. අපට ඒ පිළිබඳව හොඳ පරිචයක් තිබෙනවා. ඒ වාගේම අපට ඒ පිළිබඳව හොඳ විශ්ලේෂණයක් තිබෙනවා. ලෝකයේ සංවර්ධන වැඩසටහන් අධ්‍යයනය කරලා, ලංකාවේ මෙතෙක් ක්‍රියාත්මක වුණු සංවර්ධන වැඩසටහන් අධ්‍යයනය කරලා තමයි අපි මේ වැඩසටහන් නිර්මාණය කරලා තිබෙන්නේ. ඒ නිසා ප්‍රජා සවිබලගැන්වීමේ අපේ වැඩසටහන් එක පැත්තකින් සුබසාධනය අත්‍යවශ්‍ය අයට සුබසාධනය ලබා දීමට කටයුතු කරනවා වාගේම, අනෙක් පැත්තෙන් ආර්ථික වශයෙන්, මනෝ සමාජයීය වශයෙන්, ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව වශයෙන්, සමාජ ආරක්ෂණය ආදී වශයෙන් ඒගොල්ලන් සවිබලගැන්වීමේ ක්‍රියාදාමයකුත් අපි අනුගමනය කරනවා.

මම විවාදය ආරම්භ කිරීමේදී කිව්වා වාගේ ප්‍රජාවක් යැපුම් මානසිකත්වයේම එක දිගටම තබා ගත යුතුයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. නමුත් එහෙම යැපෙන්න අවශ්‍ය පුද්ගලයන්ට සහනාධාර ලබා දෙන එක අපේ ප්‍රතිපත්තිය. අපි රජයක් විධියට එහෙම සහනාධාර ලබා දෙන ගමන්, ඔවුන් යැපුම් මානසිකත්වයෙන් මුදා ගැනීම සඳහා ඔවුන් ආර්ථික වශයෙනුත්, සමාජීය වශයෙනුත් සවිබලගැන්වීමේ වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරලා තිබෙනවා. එම වැඩසටහන සඳහා 2026 අය වැයෙනුත් අපි සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ සඳහා රජයේ මූල්‍ය ප්‍රතිපාදනවලට අමතරව විශේෂයෙන්ම අපට ලෝක බැංකුවේත්, ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවේත් මුදල් ප්‍රතිපාදන ලැබෙනවා. අපි මේ වෙනකොට ආසියානු සංවර්ධන බැංකුවත් සමඟ ඉදිරි වසර කිහිපය සඳහාත් අලුතින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු පිළිබඳව සාකච්ඡා කරලා අවසන් කරලා තිබෙනවා. ඒ කටයුත්තත් එක්ක අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතුත් කරගෙන යනවා. විශේෂයෙන්ම මේ වැඩ කටයුතු සඳහා අපේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමා, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු ඇතුළු සියලුදෙනාගෙන් ලැබෙන සහායට ස්තුතිය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.25]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දිනයේදී කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් පැවැති විවාදයේ පිළිතුරු කථාව කරන්න තමයි මම බලාපොරොත්තු වෙන්නේ. මෙහිදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු ගණනාවක් අදහස් පළ කළා. එතුමන්ලා ඉතාම සාධනීය, හොඳ යෝජනා ඉදිරිපත් කළා. ඒ වාගේම සාධනීය විවේචනත් ඉදිරිපත් කළා. අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඒ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු මන්ත්‍රීවරු පස්දෙනෙක් විතර සීනි ගැන කථා කළා. එම නිසා මම සීනි ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ. නමුත්,

මම එක දෙයක් පිළිබඳව සතුටු වෙනවා. අපේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ආයතන 28ක් තිබෙනවා. ඒ වාගේම ක්ෂේත්‍ර 20ක් තිබෙනවා. එම ක්ෂේත්‍ර 20ටම, ආයතන 28ටම විවේචන නැහැ. සාමාන්‍යයෙන් අපේ අමාත්‍යාංශය වැඩිම විවේචන තිබෙන්න පුළුවන් අමාත්‍යාංශයක්. හැබැයි, සීනි ගැන හැර වෙන දේකට ප්‍රශ්නයක් ආපු නැති එක ගැන මම සතුටු වෙනවා. සීනි ගැනත් තිබෙන්නේ විවේචනයක් නොවෙයි, යෝජනා.

ඊළඟට, ඇත්තටම මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, අපේ කර්මාන්ත අමාත්‍යාංශයේ සියලුම දෙනා පවුලක් හැටියට වැඩ කරන්නේ. මගේ නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ මැතිතුමා, ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂවරු සහ ආයතන සියල්ලේම සභාපතිවරු සහ අධ්‍යක්ෂක මණ්ඩල කියන සියලුදෙනා ඉතා කැපවීමෙන් එක කණ්ඩායමක් හැටියට වැඩ කරනවා. අපේ අමාත්‍යාංශය යටතේමයි ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයත් තිබෙන්නේ. අපි අපේ අමාත්‍යාංශයෙන්ම ලංකාවේ ඵලදායිතාව පිළිබඳව ආදර්ශය දීලා තිබෙනවා, කාර්යක්ෂමතාව පිළිබඳ ආදර්ශය දීලා තිබෙනවා. ඒක ගැන අපට ගොඩක් සන්තෝෂ වෙන්න පුළුවන්කම තිබෙනවා.

ආසියානු ඵලදායිතා සංවිධානයේ මහ ලේකම්තුමා ඊයේ ලංකාවට ආවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට අපට ආසියානු ඵලදායිතා සහතිකය සහ National Productivity Master Plan එක ලංකාවට ලැබුණා. ඒ National Productivity Master Plan එකට අනුව අපට ඉදිරියේදී කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. ලංකාවේම කර්මාන්ත ව්‍යවසාය විතරක් නොවෙයි, ගම්මාන පවා, අපේ ගරු පන්නිලගේ ඇමතිතුමාගේ "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ යටතේ තිබෙන ගම්මාන පවා අපේ කාර්යක්ෂමතාවට, ඵලදායිතාවට අදාළ කර ගන්න පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශය ගැන කිව්වොත්, විසර්ජන පනත් කෙටුම්පත යටතේ අපට රුපියල් මිලියන 5,829.1ක් වෙන් වුණා. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී අපට අමතරව රුපියල් මිලියන 1,500ක් වෙන් කළා. ඒ නිසා ඉදිරි අවුරුද්ද සඳහා අපට රුපියල් මිලියන 7,329ක් තිබෙනවා. ඒ වාගේම, සියලුම ව්‍යවසායන්ට, කර්මාන්තවලට, සියලු ක්ෂේත්‍රවල අලුත් ව්‍යාපාර ආරම්භ කරන තරුණ ප්‍රජාවට ණය පහසුකම් දෙන්න අපට රුපියල් මිලියන 80,000ක් තිබෙනවා. ඒක අපේ අමාත්‍යාංශයට විතරක් වෙන් වූ මුදලක් නොවෙයි. ධීවර අමාත්‍යාංශය වෙන්න පුළුවන්, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙන්න පුළුවන්, සියල්ල ඒකාබද්ධ කරලා සියලු අමාත්‍යාංශවලින් ඈපකර නැතුව ණය පහසුකම් ලබා දෙන්න වාගේම, විවිධ සහන යටතේ, විවිධ පහසුකම් යටතේ අලුත් ව්‍යාපාරිකයින්ට සහ ව්‍යාපාර වර්ධනය කරන අයට ණය පහසුකම් දෙන්න අපට අවස්ථාව ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන පිළිබඳව කථා කළොත්, අඩු තරමින් එක ආයතනයකට එක විනාඩියක්වත් ඕනෑ. මම උත්සාහ කරනවා, කොහොම හරි හැම ආයතනයක් පිළිබඳවම කෙටියෙන් හෝ අදහස් දක්වන්න. එහිදී ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය තීරණ හැටියට ගත්තොත්, ජාතික ලුණු සමාගම යටතේ තිබෙන කුරුන්වතිවු ලුණු ලේවායේ නිෂ්පාදන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ අපනයනය කිරීම සඳහා වන ව්‍යාපෘතියකට අපි කැබිනට් මණ්ඩලයේ අවසරය ලබාගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඉතා හොඳ අගයක් සහිත ලුණු නිෂ්පාදනය කරලා අපනයනය කරන්න පුළුවන්කම තිබෙනවා. එසේ අපනයනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ආයෝජන කැඳවන්න, EoIs call කරන පුළුවන් මට්ටමට ඇවිල්ලා තිබෙනවා.

ඊළඟට, කහටගහ පතල මිනිරන් සංචිතය සමීක්ෂණය කරලා, ඒ මිනිරන් කැණීම් සහ සැකසීම් සම්බන්ධයෙන් අභිලාෂ කැඳවන්න, ආයෝජන කැඳවන්න අපි EoIs call කරන මට්ටමට කටයුතු කරලා තිබෙනවා. අපි දැන් ඒකේ project committee එක පත් කරලා තිබෙනවා. 2026 අවුරුද්ද ආරම්භ වනකොට අපට ඒ සඳහා ආයෝජකයන් තෝරා ගන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම, උතුරේ පරන්තන්වල -අපේ ගරු අර්චුනා මන්ත්‍රීතුමාලාගේ ප්‍රදේශයේ- කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන් නිෂ්පාදන ව්‍යාපෘතියට ආයෝජන කැඳවන්න අපි සියලු කටයුතු සංවිධානය කර තිබෙනවා. 2026 වර්ෂයේ මුලදී RFPs call කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම එප්පාවල පොස්පේට් නිධියට අදාළව අපි දැනට ආයෝජකයන් කැඳවා තිබෙනවා. EOI call කළාම, ආයෝජකයෝ 14 දෙනෙක් ඇවිල්ලා ඉන්නවා. අපි විශාල වියදමක් දරනවා, Triple Super Phosphate ගෙන්වන්න. ඒ නිසා විශේෂයෙන්ම Single Super Phosphate - SSP - හදන්න ආයෝජන කැඳවන්න අපට දැන් අවස්ථාව ලැබිලා තිබෙනවා. දැන් එහි සියලු කටයුතු අවසන් කරලායි තිබෙන්නේ. ඊළඟට, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් එක, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාර ආයතනයක් හැටියට අගය දාමය වැඩි කරන්න, අගය එකතු කිරීමේ කටයුත්තට ආයෝජන කැඳවන්න 2025.11.11 දින කැබිනට් මණ්ඩලයේ, එනම් පසුගිය දා පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබුණා. මේවා, රටේ ආර්ථිකයේ දියුණු වන ලක්ෂණයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කියූ ආකාරයට අපේ අපනයන ක්ෂේත්‍රය පවතින්නේ අගය එකතු කිරීමත් එක්කයි. එය ජාත්‍යන්තර වෙළෙඳ පොළ සමඟ සම්බන්ධ කරන්න, නවීන තාක්ෂණයත් එක්ක ඒකාබද්ධ කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

අපේ අමාත්‍යාංශයේ වියදම් කළමනාකරණය පැත්ත ගැනත් වචනයක් කියන්න ඕනෑ. අපේ අමාත්‍යාංශය ඉතාම සාර්ථක විධියට ගිය අවුරුද්දේ වියදම් කළමනාකරණය කරලා තිබෙනවා. පසුගිය ආණ්ඩුවේ 2024 මාස 9ත් එක්ක සංසන්දනය කරද්දී, අපි මේ අවුරුද්දේ එම මාස 9ට රුපියල් මිලියන 17කින් වියදම අඩු කරලා තිබෙනවා. අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ කාර්යාලයේ, නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ සහෝදරයාගේ කාර්යාලයේ, කාර්ය මණ්ඩලයේ වියදම අපි රුපියල් මිලියන 17කින් අඩු කරලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ ආණ්ඩුවේ වියදම රුපියල් මිලියන 64යි. අපි ඒක රුපියල් මිලියන 47 දක්වා අඩු කළා. ඒ වාගේම, අපේ අමාත්‍යාංශයේ පරිපාලන වියදම් රුපියල් මිලියන 15කින් අඩු කරලා තිබෙනවා. ඒ, ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ වැඩ ගොඩක් කරන අතරතුරයි. අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අතිරේක ලේකම්තුමන්ලා සහ අධ්‍යක්ෂකවරුන් ඒ අයගේ පරිපාලන වියදම් රුපියල් මිලියන 15කින් අඩු කරලා තිබෙනවා. රජයක් හැටියට අපි මේ ආකාරයට වියදම් කළමනාකරණය කරලා තිබෙනවා. ඒ වාගේම අපි වැඩ කරලාත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයේ භෞතික කාර්ය සාධනය සියයට 78යි. ඒ, ගතවූ මේ මාස 9ට අදාළවයි. අපට තවත් මාස 3ක් තිබෙනවා. මේ සියලුම ගනුදෙනු තිබෙන්නේ සැප්තැම්බර් මාසය දක්වායි. ඉතිරි මාස 3 ගෙවිලා, දෙසැම්බර් අවසානය වන කොට, ඒ කියන්නේ ලබන අවුරුද්ද වනකොට සියයට 100ක භෞතික කාර්ය සාධනයකට සහ මූල්‍ය කාර්ය සාධනයකට අපි යනවා. ඒ සඳහා වන සැලැස්මක් ඇතිව තමයි අපේ අමාත්‍යාංශය කටයුතු කරන්නේ. මට ඉතාම සන්තෝෂයි, අපේ අමාත්‍යාංශයත් එක්ක බැඳිච්ච ආයෝජකයෝ ඉන්නවා, ව්‍යාපාරික ප්‍රජාව ඉන්නවා, වාණිජ සංගම් ඉන්නවා. ඒ සියලු දෙනාගෙන් ලැබෙන සහයෝගයත් මම මේ වෙලාවේදී අමතක

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කරන්නේ නැහැ. ඒ හැම දෙනාටම මම කෘතවේදීව ස්තුතිවන්ත වෙනවා. අපේ අමාත්‍යාංශයේ විශේෂයෙන්ම Sector Advisory Committeesවල, උපදේශන කමිටුවල ඉන්නේ ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන්. ඒ අය, එම ක්ෂේත්‍රයේ දහසක් ගැටලු එක්ක ගැටෙන අයයි. ඒ අයගේ අදහස් හා යෝජනා එක්ක තමයි අපේ අමාත්‍යාංශයේ කටයුතු බොහොමයක් අපි කරගෙන යන්නේ.

සාම්ප්‍රදායික කර්මාන්ත ගත්තොත්, දැන් අප සාම්ප්‍රදායික කර්මාන්තවලට වෙන් කරපු වියදම් ගොඩක් කළමනාකරණය කරලා අවශ්‍යතා සම්පූර්ණ කරගෙන තිබෙනවා. ජාතික ශිල්ප සභාව ගත්තොත්, බතික්, අත් යන්ත්‍ර කර්මාන්තය, අපනයනයට නැඹුරු නිෂ්පාදන, ඒ වාගේම නවෝත්පාදන ආදිය දිරිමත් කරන්න අපි වැඩ කටයුතු කරලා තිබෙනවා. අපි ඒ සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගයෙන් මේ නොවැම්බර් මාසයේ 09 වැනි දා ඉඳලා 15 වැනි දා දක්වා අත්යන්ත්‍ර පේෂකර්ම ශිල්පීන් 30 දෙනෙකු ඉන්දියාවේ කොයිම්බතූර්වල පුහුණුවකට යවා තිබෙනවා. ඒ අය දැන් නවීන තාක්ෂණයත් එක්ක ඉන්දියාවේ පුහුණුව ලබනවා.

තවත් ආයතන ගණනාවක් තිබෙන නිසා මම කරුණු කෙටියෙන් කියන්නම්. අපේ සංවර්ධන අංශයේත් විශාල වැඩ කොටසක් කර තිබෙනවා. කර්මාන්තපුර විශාල ප්‍රමාණයක් දියුණු කරන්න අපි මේ වනකොට කටයුතු කරමින් යනවා. අපි කර්මාන්තපුර වෙනුවෙන් මුදල් වෙන් කිරීම් ගොඩක් කරලා තිබෙනවා. මිල්ලනිය කර්මාන්තපුරයේ පළමුවැනි අදියරේ වැඩ කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම ගම්පහ කර්මාන්තපුරයට රුපියල් මිලියන 97ක් වෙන් කරලා තිබෙනවා. ඉංගිරිය කර්මාන්තපුරය ලබන අවුරුද්ද වනකොට ආරම්භ කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ විධියට අපි කර්මාන්තපුර විශාල ප්‍රමාණයක වැඩ කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අප යොදවා තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 318ක් වනවා. මම කලින් කිව්වා වාගේ, වාලච්චේන කර්මාන්තපුරය රුපියල් මිලියන 1,575ක් වැය කරලා දියුණු කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට -IDB එකට- අදාළව කර්මාන්ත වෙනුවෙන් පසුගිය ආණ්ඩුව පැවැති 2024 මුල් මාස 9ට ලැබී තිබෙන ආදායම රුපියල් මිලියන 73යි; අපේ ආණ්ඩුව යටතේ මේ මාස 9ට ආදායම රුපියල් මිලියන 88යි.

මාස 9යි කියලා මම මේ කියන්නේ, අවුරුද්දේ සැප්තැම්බර් මාසය දක්වා වන කාලයයි. මොකද, ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් කියන කාලයට -අවසන් කාර්තුවට- අදාළව අය වැයේදී ගණන් හැදෙන්නේ නැහැ.

ඒ වාගේම, අපි ඒවායේ කර්මාන්තවල අක්කර ප්‍රමාණය වැඩිදියුණු කරලා තිබෙනවා; වර්ධනය කරලා තිබෙනවා. ඒවායේ කර්මාන්ත ප්‍රමාණය වැඩිදියුණු කරලා තිබෙනවා. ඒ නිසා අපි හිතනවා කර්මාන්තපුරවල ප්‍රගතිය ගත්තත්, අපට සතුටු වෙන්න පුළුවන් ප්‍රගතියක් තිබෙනවා කියලා.

මම දන්නවා කර්මාන්තපුරවල තිබෙන ප්‍රධාන ගැටලුව ගැන. ඒ තමයි, ඒ අයගේ බදු ඔප්පුවල ප්‍රශ්නය. ඒ අය බදු ඔප්පු විශාල ප්‍රමාණයක් අරගෙන තිබෙනවා, ඒවා යාවත්කාලීන කරලා නැහැ, ඉඩම් නිරවුල් කරලා නැහැ. ඒ ගැටලු නිසා ඒ අයට කර්මාන්ත පවත්වාගෙන යන්න බැරි අර්බුදයක් තිබෙනවා. හුඟක් අය අතුරු බදු දීලා තිබෙනවා වෙනත් කර්මාන්තවලට. ඒ නිසා කර්මාන්තපුරවලට යොදවා තිබෙන ඉඩම්වල නිසි ඵලදාව, නිසි ප්‍රතිඵලය රටට ලැබිලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒක වෙනස් කර ගන්න උත්සාහ කරමින් ඉන්නවා.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියත් - NEDA එකත්, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයත් - SEDD එකත්, IDB එකත්, අපිත් එකට වැඩ කරනවා. IDB එක යටතේ තිබෙන ආයතනයක් විධියට නොව NEDA එක, SEDD එක, IDB එක කියන තුනම එක සමාන මට්ටමේ ආයතන බවට පත් කරන්නයි අපි ඉදිරියේදී බලන්නේ. ඒවාට අදාළව එක් අධිකාරියක් හැටියට කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට ඒ අයට මීට වඩා ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව ලැබෙනවා. එම නිසා IDB එක යටතේ තිබෙන ආයතනයක් වෙනුවට, IDB එකත්, NEDA එකත්, SEDD එකත් ඒකාබද්ධ කරලා එක සමාන කටයුතු එක තැනකට ගෙන එන්න අපි උත්සාහ කරමින් ඉන්නවා.

අපේ NEDA එකේ සභාපතිතුමා වන ලක්ෂ්මන් අබේසේකර මැතිතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ කාර්ය මණ්ඩලය ඉතාම කාර්යක්ෂමව වැඩ කරනවා. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අපේ අතිරේක ලේකම්තුමිය වන අනෝජා මහත්මිය ඇතුළු කණ්ඩායමත් ඒ වාගේමයි. ඒ අය හොඳට වැඩකරනවා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපි අලුතින් ආරම්භ කරපු බොහෝ දේවල් තිබෙන බව. මේ අවස්ථාවේදී ඒවා numbers හැටියට කියන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත්, අපි cluster associations ගොඩක් හදලා තිබෙනවා. ඒ වාගේම අපි new business establishments through business clusters ආරම්භ කරලා තිබෙනවා. 2024 අවුරුද්දටම තිබුණේ 3යි. අපි new business clusters 44ක් හදලා තිබෙනවා. The number of expanding existing businesses තිබුණේ 12යි. අපි එම සංඛ්‍යාව 41ක් බවට පත් කරලා තිබෙනවා. The number of MSMEs facilitated through trade fairs - trade fairs හරහා අපි සහයෝගය ලබා දුන් ඒවා - පසුගිය අවුරුද්දේ තිබුණේ 50යි, මේ අවුරුද්දේ 250යි. NEDA එකේ සාර්ථකත්වයට හොඳම උදාහරණ 3ක් තමයි මම ඒ ඉදිරිපත් කළේ.

ඒ වාගේම, ජාතික ශිල්ප සභාවේ ප්‍රගතිය ගත්තොත්, ශිල්පී පුහුණු ව්‍යාපෘති මඟින් පුහුණුව ලැබූ සමස්ත ශිල්පීන්ගේ ප්‍රමාණය 2024 අවුරුද්දේ, 850යි; මේ අවුරුද්දේ 1,272යි. ඒ වාගේම, ක්‍රියාත්මක කරන ලද දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රමාණය 2024 අවුරුද්දේ 4යි; මේ අවුරුද්දේ 11යි. ප්‍රතිලාභී ශිල්පීන් ප්‍රමාණය ගත්තොත්, පසුගිය අවුරුද්ද පුරාවටම හිටියේ 42යි; මේ අවුරුද්දේ 295යි.

අපි ඊයේ පෙරේදා ජනකලා කේන්ද්‍රයේ තිබෙන ජාතික ශිල්ප සභාවේ කෞතුකාගාරය නවීකරණය කරලා නැවත ආරම්භ කළා. එම නිසා මම ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, එතැනට දරුවන් එක්කරගෙන එන්න කියලා. එතැන හොඳ තැනක් බවට පත් කරන්න පුළුවන්. පසුගිය අවුරුද්දේ ශිල්පීන් ලියාපදිංචි වෙලා තිබෙන්නේ 19,677යි; මේ අවුරුද්දේ 20,869යි. පසුගිය අවුරුද්දේ ශිල්ප සමාජ පිහිටුවා තිබෙන්නේ 195යි; මේ අවුරුද්දේ 211යි. එහෙම ගත්තොත්, අපගේ ජාතික ශිල්ප සභාවේ ප්‍රගතියක් තිබෙනවා.

ඒ වාගේම, BMICH එකේ පැවැත්වීමට නියමිතව තිබෙන ප්‍රදර්ශනයේ අළෙවි කුටි ගැන ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා. මම ඒ ගැන ගොඩක් විස්තර කියන්නේ නැහැ. ඒකේ තිබෙන්නේ procurement ප්‍රශ්නයක්. ඒ procurement ප්‍රශ්නය නිසායි ප්‍රමාදය. ඇත්තටම අපි එහි වෙළෙඳ අළෙවි කුටිවලට වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 6.3යි. හැබැයි, වෙළෙඳ අළෙවි කුටි

හඳන්න එන කට්ටිය අපෙන් මිලියන 13ක් ඉල්ලනවා. ඒක අසාධාරණ නිසා තමයි අපි retender කරලා තිබෙන්නේ. නමුත්, අපි බලාපොරොත්තු වෙනවා, 2026 මාර්තු මාසයේ එම ප්‍රදර්ශනය පවත්වන්න. මා හිතන විධියට, ඒක ශිල්පීන්ට ප්‍රශ්නයක් නැහැ. මොකද, ශිල්පීන් වෙනත් ප්‍රදර්ශන බොහොමයකට සම්බන්ධ වෙනවා.

ඒ වාගේම, සිසිර අමරබන්දු සභාපතිතුමා යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් විශාල කාර්යභාරයක් සිදු වෙනවා. 2024 අවුරුද්දේ නව නිර්මාණ සැලසුම් තිබුණේ 280යි. 2025.09.30 වනකොට අපි නව නිර්මාණ සැලසුම් 378ක් කරලා තිබෙනවා. ඒ වාගේම නව නිර්මාණ මූලාශ්‍ර සකස් කිරීම 2024 අවුරුද්දට තිබුණේ 190යි. අපි ඒක මේ අවුරුද්දේ 272ක් කරලා තිබෙනවා.

අදත් මහනුවර Kandy City Centre පරිශ්‍රයේ ලාක්ෂා කර්මාන්තයට අදාළ ප්‍රදර්ශනයක් ආරම්භ කළා, ලාක්ෂා කර්මාන්තය ජාත්‍යන්තර තත්ත්වයට ගෙන ඒමේ අරමුණින්. අපේ ගරු සංචාරක නියෝජ්‍ය ඇමතිතුමාත් එහි ගියා. ලාක්ෂා කියන්නේ, අපේම රටේ අනන්‍යතාවක් සහිත, විශාල හැකියාවක් තිබෙන පාරම්පරික කර්මාන්තයක්. අපේ ලාක්ෂා කර්මාන්තය නවීකරණය කරලා නවීන තත්ත්වයන් යටතේ, අද සිට දවස් තුනක ප්‍රදර්ශනයක් මහනුවර පැවැත්වෙනවා, "ලංකාර - 2025" කියලා. අපි එම කටයුතුත් ඒ ආකාරයට කරගෙන යනවා. ජාතික ශිල්ප සභාවත්, ජාතික මෝස්තර මධ්‍යස්ථානයත්, ලක්සල ආයතනයත්, අපිත් ඒකාබද්ධව විශාල වැඩ කොටසක් මේ වනකොට කරමින් යනවා.

විශේෂයෙන්ම "ලක්සල" ආයතනය ගත්තොත්,2024.09.30 වනකොට sales තිබුණේ රුපියල් මිලියන 681යි. අපි මේ අවුරුද්දේ එය රුපියල් මිලියන 689ක් බවට පත් කරලා තිබෙනවා. අපේ ආදායම, net profit එක, පසුගිය අවුරුද්දේ තිබුණේ රුපියල් මිලියන 10යි, මේ අවුරුද්දේ රුපියල් මිලියන 22යි. අපි ඒක රුපියල් මිලියන 12කින් වැඩි කරලා තිබෙනවා.

මේ ආයතනවල ගොඩක් ප්‍රශ්න තිබෙනවා. පසුගිය අවුරුදුවල ලාභ පෙන්වා තිබෙනවා. නමුත්, VAT එක ගෙවලා නැහැ; 2017 ඉඳලා 2024 වනතුරු VAT එක ගෙවලා නැහැ. ඒ වාගේම, පසුගිය වර්ෂයේ -2024 අවුරුද්දේ- ලබාගෙන තිබූ භාණ්ඩ කොන්ත්‍රාත් සේවාවලට අදාළ රුපියල් මිලියන 100ක් ගෙවලා නැහැ. 2012 අවුරුද්දේ ඉඳලා RDB බැංකුවට ගෙවන්න තිබෙනවා, රුපියල් මිලියන 169ක්. රුපියල් මිලියන 200ක් අරගෙන තිබෙනවා. ඒකේ පොලිය අපට දැන් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඒ ආයතන, කඩා වට්ටලා තිබුණු ආයතන. අපි දැන් ව්‍යාපාරික සැලැස්මක් හදලා ඒ ආයතන පවත්වා ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සළුසල" ආයතනය ගත්තොත්, එය වසා දමන මට්ටමේ තිබුණු ආයතනයක්. නමුත්, 2025 අවුරුද්දේ එය රුපියල් මිලියන 26ක ආදායමක් හොයලා තිබෙනවා. ඒක වැහෙන්න තිබ්බ ආයතනයක්. 34දෙනෙක් වාගේ පුංචි සේවක කණ්ඩායමක් එතැන ඉන්නේ. නමුත් අපි ඒ සභාපතිතුමාගේ සාර්ථකත්වය යටතේ රුපියල් මිලියන 26ක ආදායමක් හොයලා තිබෙනවා. තව ණය ගෙවන්න තිබෙනවා, රුපියල් මිලියන 113ක්. ඒ, පරණ පව්. පරණ ණය ගෙවන්න ඕනෑ, රුපියල් මිලියන 113ක්. ඒ ණයත් ගෙවන ගමන් අපට වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ගැන ගොඩක් කථා කළා. විශේෂයෙන්ම මැණික් ආදායම වැඩි වෙලා තිබෙනවා, ඇත්තටම. මැණික් ආදායම ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ වැඩි වෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ gemsවලින් export income එක විධියට අපට තිබුණේ රුපියල් මිලියන 110යි. මේ අවුරුද්දේ ඒක රුපියල් මිලියන 153ක් වෙලා තිබෙනවා. නමුත් ඒකේ අඩුවක් පේන්නේ gemsවලින් නොවෙයි. අපට ඒ අඩුව පේන පැත්ත මේකයි. මුළු ආදායම ගත්තොත්, අඩු වෙලා තිබෙන්නේ diamondsවලින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද, diamonds පාවිච්චි කරන හුඟක් රටවල් දැන් යුධමය තත්ත්වයක තිබෙන රටවල්. ඒ නිසා diamondsවලින් අපට තිබුණු income එක අඩුවෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ diamondsවලින් රුපියල් මිලියන 166ක් තිබුණා. මේ අවුරුද්දේ ඒක රුපියල් මිලියන 117යි.

ඒ වාගේම, jewellery පැත්ත ගැනත් කථා කළා. Jewellery පැත්තේ ඇත්තටම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා රවි කරුණානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ගැන අපි BoI එකත් එක්ක සාකච්ඡා කරමින් යනවා. ඒ මොකද්ද? ලංකාවට රත්තරන් ගෙනැල්ලා, ලංකාව තුළ refine කරලා පිටරට යවන්න. දැන් ඩුබායිවල ඒ දේ කරනවා, ඉන්දියාවේ ඒ දේ කරනවා. අපි ඒ වෙනුවෙන් ආයෝජන මණ්ඩලයත් එක්ක, ඒ වාගේම Sri Lanka Customs එකත් එක්ක සාකච්ඡා කරමින් යනවා, ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් හැටියට ලංකාවට gold ගෙනැල්ලා gold refine කරන මධ්‍යස්ථාන ආරම්භ කරන්න. එහෙම වුණොත් gold භාවිත කරන අපේ අයටත් ඒ දේ භාවිත කරන්න පුළුවන්. ලංකාව තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ලෝකයෙන්ම handmade gold jewellery නිපදවන්න හොඳම කට්ටිය ඉන්න රට. ඒ කියන්නේ ලංකාවේ goldsmithsලාත් එක්ක තරග කරන්න වෙන අයට බැහැ. අපේ handmade gold jewellery - machine-cut ඒවා නොවෙයි - ඉහළම අගයක තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, රත්නපුරය වාගේම විශේෂයෙන්ම කොළඹ ඒ වාගේ තැන් ආරම්භ කරන්න. ඒ Port City එකේ වෙන්න පුළුවන්. අපි තවම ස්ථානයක් සොයමින් යනවා international gem hub එකක් පටන්ගන්න. පැය 24ම වැඩ කරන ජාත්‍යන්තර gem hub එකක් අපි පටන් ගන්නවා, ලබන අවුරුද්දේ. ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් අපට ඒකට අනුමැතිය දීලා තිබෙනවා. ඒ නිසා මේක අපට විශාල සාර්ථකත්වයක් ලබන්න පුළුවන් ක්ෂේත්‍රයක් බව අපි විශ්වාස කරනවා. නමුත් ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ප්‍රශ්න නැහැ කියලා මම කියන්නේ නැහැ. විශේෂයෙන්ම බැකෝ ප්‍රශ්නය තිබෙනවා. බැකෝ යන්ත්‍රවලින් අද රත්නපුරයේ විශාල විනාශයක් වෙමින් තිබෙනවා.

ඒ වාගේම, rough gems රට යවන එක ගැනත් කථා වුණා. ඒ දත්ත, තොරතුරු මම ඉදිරිපත් කරන්නම්. Auction එකේදී auction වෙන්නේ නැති "කට්ට" කියන model එකේ gems වර්ග කිහිපයක් තිබෙනවා. ඒවා තමයි rough gems හැටියට රට යවන්න යෝජනා වෙලා තිබෙන්නේ. ඒ ගැන අවසාන තීරණයක් අරගෙන නැහැ. නමුත් පසුගිය දවස්වල සමාජ මාධ්‍යවල මම දැක්කා, චතුරංග අබේසිංහත්, මාත් විනාශ කරනවා. අපි ඒ තීරණ මොනවත් අරගෙන නැහැ, තවම. යෝජනා පමණයි තිබෙන්නේ. මොකද, අපි තීරණය කරලා auction එකේදී auction වෙන්නේ නැති ඒවා යැව්වොත්, ඒක ජාතික ගිණුම්වලට එනවා. එහෙම නැතත්, දැනටත් හොරෙන් යවනවා. හොරෙන් යවන එක නීත්‍යානුකූල කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒකට අකමැති පිරිසක් ඉන්න බව අපිට පේනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ගැන කථා කරන්න ඕනෑ. අපේ ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමියත් ඒ ගැන කථා කළා. සාමාන්‍යයෙන් අපේ අපනයන හැකියාව - export potential එක - විධියට පසුගිය කාලයේ තිබුණේ ඩොලර් බිලියන 12ක, 13ක ප්‍රමාණයක්. නමුත් අපි මේ අවුරුද්දේ ඉලක්ක කරගෙන තිබෙනවා, බිලියන 18ක්. ඒ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඩොලර් බිලියන 18න් අපි මේ වෙනකොට ඩොලර් බිලියන 13ක් සම්පූර්ණ කරලා තිබෙනවා. පසුගිය සැප්තැම්බර් මාසය වෙනකොට අපි ඩොලර් බිලියන 13ක අපනයන ආදායමක් සම්පූර්ණ කරලා තිබෙනවා. අපි හරි සතුටු වෙනවා ඒ ගැන. මොකද, අපේ ඉලක්කවලට අපි ගමන් කරමින් ඉන්න නිසා. අපේ ඉලක්කය තමයි, 2030 වෙනකොට ඩොලර් බිලියන 36ක අපනයන අදායමකට යන එක. අපට ඒක ළඟා කරගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. අපේ ආර්ථික වර්ධන වේගය ගත්තාම, 2024ට සාපේක්ෂව 2025 -මේ අවුරුද්දේ- සියයට 7ක අර්ථික වර්ධන වේගයක් අපට තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අපි ඉස්සරහට යද්දි එය තවත් වැඩි කරගන්න පුළුවන් කියලා. විශේෂයෙන්ම ලබන අවුරුද්දේ - 2026 - ජූනි මාසය වෙන් කරගෙන තිබෙනවා, ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික Expo ප්‍රදර්ශනය පවත්වන්න. ඒ වෙනුවෙන් මේ වෙනකොට විදේශ තානාපති සේවා එක්ක සාකච්ඡා කරමින් යනවා. එහිදී ජාත්‍යන්තර ආයෝජකයෝ 1,500කට වැඩි ප්‍රමාණයක් ලංකාවට ගෙන්වන්න බලාපොරොත්තු වෙනවා. අවුරුදු 12කට විතර පස්සේ තමයි මම හිතන හැටියට අපි Expo ප්‍රදර්ශනය ලංකාවේ පවත්වන්නේ. අපනයන සංවර්ධන මණ්ඩලය ඒ වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරමින් යනවා.

විශේෂයෙන්ම පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා ගැන මන්ත්‍රීවරු පස්හය දෙනෙක් කථා කළා. එතුමන්ලාගේ දිස්ත්‍රික්කයේ, එතුමන්ලාගේ ප්‍රදේශවලට අදාළ නිසා ඒ කථා කරන එක සාධාරණයි. උක් මිලදී ගැනීම සම්බන්ධ ප්‍රශ්නයේදී අදාළ ගෙවීම් කරන්න පසුගිය අවුරුද්දේ බිලියනයක මුදලක් භාණ්ඩාගාරයෙන් වෙන් වුණා. අද වෙනකොට ඒ වෙනුවෙන් රුපියල් මිලියන 400ක සහනයක් අපි උක් ගොවීන්ට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, වගා හානි වන්දි වෙනුවෙන් භාණ්ඩාගාරය රුපියල් මිලියන 133ක් වෙන් කළා. මේ වෙනකොට බැංකු ගිණුම්වලට අපි දාලා තිබෙනවා, රුපියල් මිලියන 72ක්. රුපියල් 7,000 ගණනේ හැම උක් ටොන් එකකටම අපි මුදල් දාලා තිබෙනවා.

ඒ වාගේම හිඟ අර්ථසාධක ගැන කථා කළා. පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලා දෙකේම උක් ගොවීන්ට ගෙවන්න තිබෙන සියලු අර්ථසාධක සහ ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ ගෙවීම් නිරවුල් කරනවා, අපි. ඒ වාගේම උක් ඇඹරීම අඩු වෙලා කිව්වා. නැහැ, ඇඹරීම අඩු වෙලා නැහැ. පැල්වත්ත කර්මාන්තශාලාවේ ප්‍රශස්ත මට්ටමින් අපි උක් අඹරනවා. දවසකට මෙට්‍රික්ටොන් 2,800ක් අපි අඹරනවා. මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වේ, 2,000යි කියලා. අපි දවසකට මෙට්‍රික්ටොන් 2,800ක් අඹරනවා. සෙවනගල මෙට්‍රික්ටොන් 1,200ක් වෙලා තිබෙන්නේ අපේ cutter එකක් කැඩිලා තිබෙන නිසා. අපි බලාපොරොත්තු වෙනවා, ඒකෙන් මෙට්‍රික්ටොන් 900ක් තව අඹරන්න පුළුවන් විධියට කටයුතු කරන්න. ඒ නිසා උපරිම ධාරිතාවට යන්න ජාත්‍යන්තර මිලදී ගැනීම්, procurements කරලා ඒ cutter එක මිලදී ගැනීමේ කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා.

Nugegoda outlet එක - සීනි කඩේ - ගැන ගොඩක් දෙනෙක් කථා කළා. මෙතැන හුඟක් දෙනෙක් පටලවා ගත්ත දෙයක් තිබෙනවා. එතැන සීනි packet එකක් අපි විකුණන්නේ, රුපියල් 255ට. හැබැයි වෙනත් ෆුඩ් සිටිවල packet එක විකුණන්නේ රුපියල් 280ට, රුපියල් 350ට. සමහර තැන්වල තිබෙනවා රුපියල් 380ටත්, packet එක. Loose විකුණන එක ගෙනැල්ලා තමයි මේගොල්ලන් මෙහෙම පෙන්වන්නේ. අපේ ගණනට වඩා වෙන තැන්වල ගණන අඩුයි කියන්නේ, loose විකුණන එකට. Loose සීනි හරියට හෝදලා නැහැ, හරියට පිරිසිදු කරලා නැහැ. ඕනෑ නම් අපට loose විකුණන්න පුළුවන් රුපියල් 230ටත් අඩුවෙන්. හැබැයි ඒකේ ප්‍රමිතියක් නැහැ. දැන් loose එකයි, packet එකයි මාරුවෙච්ච එක තමයි මේගොල්ලන්ට මේ වෙලා තිබෙන්නේ. ඒ හින්දා හුඟක් අය අපේ packet එකේ මිලයි පිට තැන්වල loose විකුණන මිලයි තමයි මේ සංසන්දනය කරන්නේ. එහෙම නැතුව අපේ මිල වැඩි නැහැ. අපි විකුණන්නේ හඳුන්වා දෙන මිලකට; promotion එකකට. ඒ promotion එක අනුව අපි රුපියල් 255ට විකුණනවා. අපි අහනවා, අපේ මිලට වඩා අඩුවෙන් packet එකක් ගන්න පුළුවන් නම්, ඒ කොයි කඩේද තිබෙන්නේ කියලා. Packet විකුණන එකේයි, loose විකුණන එකේයි වෙනස තෝරා ගන්න බැරිකමේ ප්‍රශ්නයක් මේ තිබෙන්නේ. නමුත්, ප්‍රශ්නයක් නැහැ අපට. අපි මේ දවස් 9ට කිලෝ තුන්දහස් ගණනක් විකුණා තිබෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, දවසකට කිලෝ 339ක් අපි විකුණනවා. කිලෝ එකේ packets වශයෙන් ගත්තොත්, කිලෝ 339ක් දවසට විකුණනවා; ලක්ෂ අටක අදායමක් අපි ලබා තිබෙනවා. අපට ඒ ගැන සන්තෝෂයක් තිබෙනවා. මොකද, මෙතැනින් අපි බලාපොරොත්තු වෙන්නේ දුඹුරු සීනි විතරක් නොවෙයි, උක් ආශ්‍රිත සියලු දේවල් නිෂ්පාදනය කරලා ලබා දෙන්න. උක් හකුරු, උක් පැණි, උක් කොළවලින් කරන නිෂ්පාදන පවා තිබෙනවා. උක් කොළවලින් කරන නිෂ්පාදන පවා හඳුන්වා දෙන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන්ම මේකට සීනි ආනයනය කරන අයගේ ලොකු විරෝධයක් තිබෙන බව අපි දන්නවා.

මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, අපේ ආණ්ඩුව යටතේ - මේ අවුරුද්දේ - සීනි ගෙනෙන්න ඩොලර් බිලියන එකසිය ගණනක් වියදම් කරලා තිබෙනවා කියලා. හැබැයි ඒ ගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ -2023දී- වියදම් කර තිබෙනවා, ඩොලර් මිලියන 408ක්. ඒ, ඩොලර් එක රුපියල් 334ට තිබෙද්දී. 2022 වියදම් කරලා තිබෙනවා, ඩොලර් මිලියන 219ක්. ඒක නවත්වන්න බැහැ. ඒක නවත්වන්න අපි කැමතියි. මෙතැන මන්ත්‍රීවරු පස්දෙනෙක් කියනවා, මේ වැඩ හොඳයි කියලා. තව පස්දෙනෙක් ඊට විරුද්ධව කථා කරනවා. මට තේරෙන්නේ නැහැ. ඒ, සමගි ජන බලවේගයේ ප්‍රතිපත්තිය වෙන්න ඇති. ඒ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා ඒක හොඳයි කියනකොට අනෙක් මන්ත්‍රීවරු විරුද්ධයි කියනවා. මහ ලේකම්තුමාට කියා ගන්න බැහැ. මොකද, එතුමා සීනි හදන දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආපු නිසා විරුද්ධත් නැහැ, හොඳත් නැහැ, රසත් නැහැ වාගේ ඉන්නවා.

අම්පාර දිස්ත්‍රික්කයේ අපේ උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමාත් කථා කළා, හිඟුරානේ ඉඩම් ප්‍රශ්නය ගැන. ඒක ඇත්තටම විශේෂ ප්‍රශ්නයක්. එතුමා ඉදිරිපත් කරපු ඒ වාර්තාව මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මේක වැදගත් වාර්තාවක්. මීට කලින් ගොවීන්ගේ ඉඩම් පිළිබඳ නිවැරදි සංඛ්‍යා දත්ත තිබුණේ නැහැ. පළමුවෙනි වතාවට තමයි ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරලා හෙක්ටෙයාර 6,646ක ඉඩම් ප්‍රමාණයක් තිබෙන බව හඳුනා ගෙන තිබෙන්නේ. එහිදී ගල්ඔය වැව්ලි සමාගමට තිබෙන ඉඩම් කොච්චරද, ගොවීන්ට තිබෙන ඉඩම් කොච්චරද, ගොවීන්ගේ ගොඩ ඉඩම් කොච්චරද ආදී වශයෙන් සියල්ලම හඳුනා ගෙන තිබෙනවා. ඒවා ලැයිස්තු ගත කර තිබෙනවා. දැන් ඔබතුමන්ලාට ඉදිරියේදී ගොවීන්ගේ ඉඩම් වෙන් කරගෙන, ආයතනවලට අයිති ඉඩම් වෙන් කරගෙන මේ කටයුත්ත ගැටලුවක් නැතුව පවත්වා ගෙන යන්න පුළුවන්.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට තව ආයතන කිහිපයක් ගැන කථා කරන්න තිබෙනවා. කහටගහ පතල කියන්නේ, මිලියන විශාල ප්‍රමාණයක ලාභයක් ලබන ආයතනයක්. ඒ වාගේම ලංකා පිහන් සංස්ථාව, Lanka Mineral Sands Limited ගැනත් මට කථා කරන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අමතර වෙලාවක් ඔබතුමාගෙන් ගන්නවා, කාරණා කිහිපයක් අවධාරණය කරන්න.

Hon. Presiding Member, the Ministry of Industry and Entrepreneurship Development has now made an important call for investors to support the growth and production of several promising industries across our nation. By the year 2030, we aim to achieve an export income of US Dollars 36 billion, a milestone that will mark a new era of economic strength and self-reliance. However, these new investments must not be confined to the Western Province alone. They must reach every corner of our country, empowering communities from the rural heartlands to the urban centres. Global investment, domestic participation and confident negotiations will be the three pillars that drive prosperity into industry and entrepreneurship.

As someone who seeks to be part of the solution rather than the challenge, I have witnessed first-hand that young entrepreneurs in developing communities are not lacking in creativity or ambition. Their ideas are bright, their visions are bold and their determination is remarkable. What they often lack is access, access to the market, investors, information and global networks, which, more often than not, operate in English. When we teach English to the underprivileged youth and hopeful entrepreneurs, we are not merely teaching grammar or vocabulary, but we are also unlocking doors and we are giving them confidence to pitch their ideas, connect across borders, read and understand contracts, access international funding and share their stories with the world. Imagine a young entrepreneur in a rural village with an innovative idea in sustainable, herbal and medicinal plant cultivation or in the local jewellery industry. With English proficiency, that individual could participate in international workshops, attract global investors and market their products to the world. And this, I emphasize, is not charity; it is an investment, an investment in human potential. When we empower entrepreneurs with English, we also strengthen local economies, promote innovation and nurture a new generation of leaders who could compete and collaborate confidently on the global stage. Therefore, at this moment, I humbly appeal to the Hon. (Dr.) Harini Amarasuriya, Minister of Education, Higher Education and Vocational Education to empower the Ministry to initiate a national programme which inspires young people to learn English, not out of obligation, but with passion and purpose, particularly in the field of business and entrepreneurship.

Hon. Members, I myself came from an education system five decades ago, where I was not privileged to learn and master English well. Instead of mocking that struggle, let us be part of a solution.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක විතර කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, please give me a minute and I will conclude.

Therefore, please hear me out, Hon. Members. Instead of mocking one's struggle, let us be part of the solution, let us commit ourselves today to teach English, which is not just a language but a lifeline, to give our young entrepreneurs not just words, but a world of opportunities.

Thank you very much.

## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF RURAL DEVELOPMENT, SOCIAL SECURITY AND COMMUNITY EMPOWERMENT

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 27,400,000,000 |
| මූලධන | රු. 11,200,000,000 |

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"21 වන පිටුවේ, 21 හා 22 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

| | |
|---|---|
| "පුනරාවර්තන | රු. 27,488,500,000 |
| මූලධන | රු. 34,203,000,000' " |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 27,488,500,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 34,203,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“மீண்டுவரும் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 27,488,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவரும் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது

மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 34,203,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 27,488,500,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 34,203,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"124 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 280,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

124 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,

රු.25,500,000

"124 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 25,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

124 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவரும் செலவுக்கான ரூபாய் 280,700,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 25,500,000

“தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 25,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 280,700,000, for Head 124, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 124, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,

Rs. 25,500,000

Question, "That the sum of Rs. 25,500,000, for Head 124, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 124, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන -**
**පුනරාවර්තන වියදම රු. 1,657,700,000;**
**මූලධන වියදම, රු. 6,771,000,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவரும் செலவு, ரூபாய் 1,657,700,000;
மூலதனச் செலவு, ரூபாய் 6,771,000,000

Programme 02.- Development Activities -
Recurrent Expenditure, Rs. 1,657,700,000;
Capital Expenditure, Rs. 6,771,000,000

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 124 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"22 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02

සංවර්ධන වැඩසටහන - රු. 1,746,200,000 රු. 29,774,000,000' "

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 189 - මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා යටතේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය වෙත වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු.88,500,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු.3,000,000ක් ශීර්ෂ අංකය 124 - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යවරයා වෙත මාරු කිරීම, සහ අය වැය යෝජනා අංක 17 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 124 - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා සඳහා රු.23,000,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"124 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,746,200,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

124 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"124 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 29,774,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

124 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 1,746,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 29,774,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 124, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 1,746,200,000, for Head 124, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 124, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 29,774,000,000, for Head 124, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 124, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule

**216 වන ශීර්ෂය.- සමාජ සේවා දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 131,900,000

"216 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 131,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

216 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,

රු. 17,100,000

"216 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 17,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

216 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,697,900,000

"216 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,697,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

216 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන. -සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,

රු. 637,400,000

"216 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 637,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

216 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**331 වන ශීර්ෂය.- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 645,200,000

"331 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 645,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

331 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,

රු. 19,000,000

"331 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 19,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

331 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 22,986,600,000

"331 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 22,986,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

331 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන. -සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 3,730,000,000

"331 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,730,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

331 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 216.- சமூக சேவைகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 131,900,000

"தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 131,900,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 17,100,000

"தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 17,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,697,900,000

"தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,697,900,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 637,400,000

"தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 637,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 216, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 331.- சமுர்த்தி அபிவிருத்தித் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 645,200,000

"தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 645,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 19,000,000

"தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 19,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 22,986,600,000

"தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 22,986,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 3,730,000,000

"தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 3,730,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 331, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 216.- DEPARTMENT OF SOCIAL SERVICES

Programme 01.- Operational Activities - Recurrent Expenditure,

Rs. 131,900,000

Question, "That the sum of Rs. 131,900,000, for Head 216, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 216, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,

Rs. 17,100,000

Question, "That the sum of Rs. 17,100,000, for Head 216, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 216, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure,

Rs. 1,697,900,000

Question, "That the sum of Rs. 1,697,900,000, for Head 216, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 216, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 637,400,000

Question, "That the sum of Rs. 637,400,000, for Head 216, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 216, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 331.- DEPARTMENT OF SAMURDHI DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure,

Rs. 645,200,000

Question, "That the sum of Rs. 645,200,000, for Head 331, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 331, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,

Rs. 19,000,000

Question, "That the sum of Rs. 19,000,000, for Head 331, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 331, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure,

Rs. 22,986,600,000

Question, "That the sum of Rs. 22,986,600,000, for Head 331, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 331, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 3,730,000,000

Question, "That the sum of Rs. 3,730,000,000, for Head 331, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 331, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
## கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 5,500,000,000 |
| මූලධන | රු. 6,000,000,000 |

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"28 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'මූලධන රු. 7,500,000,000' "

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 7,500,000,000ක් දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 7,500,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 7,500,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

149 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,453,800,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

149 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 175,700,000

"149 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 175,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

149 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,453,800,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 175,700,000

"தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 175,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,453,800 ,000,for Head 149, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 149, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 175,700,000

Question, "That the sum of Rs. 175,700,000, for Head 149, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 149, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,655,200,000; මූලධන වියදම, රු. 5,743,700,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,655,200,000; மூலதனச் செலவு, ரூபாய் 5,743,700,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 3,655,200,000; Capital Expenditure, Rs. 5,743,700,000

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 149 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"28 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 3,655,200,000 රු. 7,243,700,000' "

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අය වැය යෝජනා අංක 10 සහ 11 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා සඳහා රු. 1,500,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"149 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,655,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

149 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"149 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 7,243,700,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

149 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 3,655,200,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 7,243,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 149, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs.3,655,200,000, for Head 149, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 149, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 7,243,700,000, for Head 149, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 149, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 303 වන ශීර්ෂය.- පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 391,000,000

"303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 391,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 80,600,000

"303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 80,600,000 මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

303 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 303.- நெசவுக் கைத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 391,000,000

"தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 391,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 80,600,000

"தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 80,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 303, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 303. - DEPARTMENT OF TEXTILE INDUSTRIES

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 391,000,000

Question, "That the sum of Rs. 391,000,000, for Head 303, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 303, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 80,600,000

Question, "That the sum of Rs. 80,600,000, for Head 303, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 303, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 5.58ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 22වන සෙනසුරාදා.***

*பி.ப. **5.58** மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத் தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது **2025** நவம்பர் **22**, சனிக்கிழமை.*

*At 5.58 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Saturday, 22nd November, 2025.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 124 සහ 149 සංශෝධන සහිතවද, ශීර්ෂ අංක 216, 331 සහ 303 සංශෝධන රහිතවද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දැනුම් දෙනු කැමැත්තෙමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

## කින්නියා ප්‍රා.ලේ. කොට්ඨාසයේ ලුණු නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම
## கிண்ணியா பிரதேச செயலாளர் பிரிவில் உப்பு உற்பத்திக்கான வசதிகளை மேம்படுத்தல்
## IMPROVEMENT OF FACILITIES FOR SALT PRODUCTION IN KINNIYA DS DIVISION

[பி.ப. 6.00]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பின்வரும் ஒத்திவைப்புப் பிரேரணையை முன்மொழிகின்றேன்.

"திருகோணமலை மாவட்டத்தில் அமைந்துள்ள கிண்ணியா பிரதேச செயலாளர் பிரிவு உலர் வலயத்தில் அமைந்திருப்பதால் உப்பு உற்பத்திக்குச் சிறந்த இடமாகும். இங்கு பலர் உப்பு உற்பத்தியில் ஈடுபட்டு வருகின்றார்கள். எனினும், சரியான வழிகாட்டல்கள் இன்மை, குறைந்த தொழில்நுட்ப வசதிகள், முறையான அரச அனுசரணை இன்மை என்பன காரணமாக அவர்களால் முறையாக அந்தத் தொழிலை மேற்கொள்ள முடியாதுள்ளது. இதனை முறைப்படுத்த வேண்டிய பொறுப்பு அரசுக்கு இருக்கின்றது. 'சுற்றிலும் கடல் வளத்தை வைத்துக்கொண்டு உப்பை இறக்குமதி செய்து வருகின்றோம்' என நாம் தொடர்ச்சியாகக் கூறி வருகின்றோம். உள்நாட்டு உப்பு உற்பத்திக்கு நாம் எந்தளவு தூரம் முக்கியத்துவம் கொடுக்கின்றோம் என்பது இங்கு கவனிக்க வேண்டிய ஒரு விடயமாகும். எனவே, பின்வரும் விடயங்கள் தொடர்பாக நாம் அதிக கவனம் செலுத்த வேண்டும்.

1. கிண்ணியா பிரதேச செயலாளர் பிரிவில் உப்பு நீரோடைகள் அதிகம் காணப்படுகின்றன. பொருத்த மான இடங்கள் உப்பு உற்பத்திக்கான இடங்களாக அடையாளம் காணப்படல் வேண்டும்.
2. உப்பு உற்பத்தி தொடர்பான நவீன தொழில்நுட்பப் பயிற்சிகள் உற்பத்தியாளர்களுக்கு வழங்கப்பட வேண்டும்.
3. உணவுப் பாதுகாப்பை உறுதிப்படுத்தும் நோக்கோடு, அயடீன் கலப்பு, உப்பைத் துப்புரவு செய்தல், உப்பை அளவாக வெட்டுதல் போன்ற வற்றுக்கு ஆய்வுகூட வசதிகள் ஏற்படுத்தப்பட வேண்டும்.
4. உப்பு உற்பத்திக்கான சந்தை வாய்ப்புகள் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும்.
5. உப்பைக் களஞ்சியப்படுத்துவதற்கான வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும்.
6. உப்புத் தொழிலாளர்களுக்குப் புதிய பயிற்சிகள் வழங்கப்பட வேண்டும்.
7. இத்தொழிலில் ஈடுபடுகின்ற தொழில் முயற்சியாளர் களுக்குப் போதியளவு நிதி உதவிகள் வழங்கப்பட வேண்டும்.
8. கமத்தொழிலில் ஈடுபடுகின்ற விவசாயிகளுக்கு வங்கிக் கடன் வசதிகளை வழங்குவது போன்று, உப்புத் தொழிலை மேற்கொள்கின்றவர்களுக்கும் வங்கிக் கடன் வசதிகளை இலகுபடுத்திக் கொடுக்க வேண்டும்.
9. இளைஞர்களும் இத்தொழிலில் ஈடுபட ஊக்குவிக்கப் படல் வேண்டும்."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று திருகோணமலை மாவட்டத்தின் குச்சவெளிப் பிரதேசத்தில் பாரியளவில் உப்பு உற்பத்தி இடம்பெறுகின்றது. இது நாட்டின் தேசிய உப்பு உற்பத்திக்குப் பாரிய பங்களிப்பை வழங்குகின்றது. இதுபோன்று, கிண்ணியா பிரதேசத்தில் கச்சக்கொடித்தீவு, பொன்னாரந்தீவு, வில்வெளி, முனைச் சேனை, காக்காமுனை ஆகிய இடங்களிலும் சுமார் 60 ஏக்கர் நிலப்பரப்பில் 300 குடும்பங்கள் சிறு தொழில் அடிப்படையில் உப்பு உற்பத்தியில் ஈடுபட்டு வருகின்றன.

இவர்கள் கடற்கரையோர கலப்பு - lagoon - நீரை உபயோகித்து, உப்புக் கோரைகளை அமைத்தே உப்பு உற்பத்தியை மேற்கொள்கின்றனர். மேலும், இவர்கள் இத்துறை சம்பந்தமான போதிய பயிற்சியோ, தொழில்நுட்ப அறிவோ அற்றவர்களாகக் காணப்படுகின்றனர். இவர்களால் உற்பத்தி செய்யப்படுகின்ற உப்பானது, மாவட்டத்தில் கருவாடு உற்பத்திக்காக குறைந்த விலைக்கே விற்பனை செய்யப்படுகின்றது. உற்பத்தி செய்யப்படும் உப்பைக் களஞ்சியப்படுத்தி வைப்பதற்குத் தேவையான களஞ்சிய வசதிகள் இன்மை, உப்பைப் பதப்படுத்தித் தரப்படுத்து வதற்கான இயந்திர வசதிகள் இன்மை, சரியான

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

வழிகாட்டல்கள் இன்மை என்பன இவர்கள் எதிர்நோக்கும் பாரிய பிரச்சினைகளாகும். மேலும், சில அடிப்படை வசதிகள் இன்மையால் இவர்கள் பல சிரமங்களையும் எதிர்கொள்கின்றனர். அந்த அடிப்படையில் இவர்கள் கேட்கின்ற விடயம் என்னவெனில், தேவையான நேரத்தில் நீரை உள்ளெடுப்பதற்கும், தேவைப்படும்பொழுது உள்ளேயுள்ள நீரை வெயேற்றுவதற்கும் ஏற்ற வகையில் வான் கதவுகளுடன்கூடிய வசதிகளை அமைத்துத் தர வேண்டும் என்றுதான். மேலும், அந்த 60 ஏக்கர் நிலப்பரப்பில் இவர்கள் இலகுவாகச் சென்று வருவதற்கு சுமார் 2 கிலோமீற்றர் தூரத்துக்கு உள்ளக வீதிகள் அமைக்கப்பட வேண்டும். அந்த வீதிகளை அமைத்துத்தர வேண்டும் என்ற கோரிக்கை இவர்களால் முன்வைக்கப்படுகின்றது.

மேலும், பகலில் மட்டுமல்லாது இரவு நேரத்திலும் வேலைசெய்வதற்கு மின் விளக்கு வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும். கமத்தொழில் அதிகாரசபையின் நேரடி வழிகாட்டல் மற்றும் கண்காணிப்பின்கீழ், போதிய பயிற்சி, தொழில்நுட்ப உதவிகள், களஞ்சிய வசதிகள் என்பன வழங்கப்பட்டால், இப்பகுதியில் உற்பத்தி செய்யப்படும் உப்பை தேசிய உப்பு உற்பத்தியுடன் நேரடியாக இணைப்பதற்கு வாய்ப்பு ஏற்படும். கைத்தொழில் அமைச்சர் அவர்கள் கிண்ணியா பிரதேசத்தில் உப்பு உற்பத்தியில் ஈடுபடுவோர் எதிர்நோக்கும் பிரச்சினைகளைத் தீர்ப்பதற்கும், அவர்கள் தமது உற்பத்தியை உயர் தரமானதாக மாற்றியமைத்து வர்த்தக சந்தைக்கு விடுவதற்கும் ஏற்ற நடவடிக்கைகளைத் துரிதமாக மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். ஏனெனில், இந்தப் பிரதேசத்தில் இருக்கின்றவர்கள் இந்தத் தொழிலைப் பல்வேறு சிரமங்களுக்கு மத்தியிலே மேற்கொள்கின்றார்கள். இவர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமான ஒரு கட்டுரை ஆங்கிலப் பத்திரிகை ஒன்றில் பிரசுரிக்கப்பட்டு இருக்கின்றது. அதை நான் ***ஹன்சாட்டில்** பதிவதற்காகச் சமர்ப்பிக்கின்றேன்.

நாங்கள் மீண்டும் வலியுறுத்துவது என்னவெனில், உப்பு உற்பத்தியில் ஈடுபடுகின்ற இந்தத் தொழிலாளர்களுக்குத் தமது தொழிலை மேற்கொள்வதற்குச் சரியானதொரு வழிமுறையை ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்றுதான். கடந்த காலத்தில் நாட்டில் உப்புத் தட்டுப்பாடு ஏற்பட்டதுடன், உப்புக்கான தேவைப்பாடும் காணப்பட்டது. எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற அந்த வளங்களைச் சரியாகப் பயன்படுத்த முடியாத காரணத்தால்தான் இன்று நாங்கள் இவ்வாறான பிரச்சினைகளுக்கு முகங்கொடுக்க வேண்டிய சூழ்நிலைக்குத் தள்ளப்பட்டுள்ளோம். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தைச் சிறந்த முறையில் உள்வாங்கி, அந்தத் தொழிலாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகளுக்குச் சிறந்த தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும். அங்கு உப்பு உற்பத்தித் தொழில் சிறந்த முறையில் இடம் பெற்றுக்கொண்டு இருக்கிறது. அவர்கள் அந்தத் தொழிலைப் புதிய தொழில்நுட்பத்தோடு மேலும் சிறந்த முறையில் மேற்கொள்வதற்கான சூழலை அரசாங்கம் உறுதிப்படுத்த வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன். எங்களுடைய கிண்ணியா பிரதேசத்தில் உப்பு உற்பத்தியில் ஈடுபடுபவர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளை ஒத்திவைப்புப் பிரேரணை மூலம் பாராளுமன்றத்தில் முன்வைத்து இருக்கிறேன். கௌரவ அமைச்சர் அவர்கள் இதற்கு சிறந்ததொரு தீர்வை மிக விரைவில் வழங்குவதற்கு ஏற்ற நடவடிக்கைகளை மேற்கொள்வார் என்ற எதிர்பார்ப்பு எங்களுக்குக் காணப்படுகின்றது எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 6.08]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் இம்ரான் மஹ்ரூப் அவர்கள் கொண்டு வந்திருக்கின்ற இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிகின்றேன். காலத்திற்கேற்ற ஒரு பிரேரணையை அவர் கொண்டுவந்திருக்கிறார்.

கிண்ணியா பிரதேசம் என்பது மக்கள் செறிந்து வாழுகின்ற ஓர் இடம். அந்தப் பிரதேசத்திலே உப்பு உற்பத்தித் தொழிலைப் பலர் மேற்கொண்டு வருகிறார்கள். இந்த நாட்டிலே உங்களுடைய ஆட்சிக் காலத்திலே உப்பு இறக்குமதி செய்யப்பட்ட நிலையை நாங்கள் கண்டோம். எனவே, கிண்ணியாவில் மட்டுமல்ல, நாட்டின் பல மாவட்டங்களிலும் காணப்படுகின்ற அவ்வாறான எல்லா இடங்களிலும் அந்தந்தப் பிரதேசங்களில் உள்ளவர்களுக்கு அதற்கான பயிற்சிகளை வழங்கி, உப்பு உற்பத்தியை வளர்த்தெடுக்கின்றபொழுது அந்தப் பிரதேசம் முன்னேற்றமடையும்; இந்த நாட்டினுடைய ஒரு தேசிய தேவை நிறைவேற்றப்படும்; தேவையில்லாத உப்பு இறக்குமதி தடைப்படும்; எங்களுடைய அந்நியச் செலாவணி வருவாயை அதிகரிக்க முடியும்.

நான் இங்கு குறிப்பிட்டதுபோல, கிண்ணியா என்பது பெருந்தொகையான மக்கள் வாழுகின்ற பிரதேசம். அங்கு உப்பு உற்பத்திக்கான பெருமளவு வளம் காணப்படுகின்றது. அந்த வளத்தைச் சரியாகப் பயன்படுத்தி உற்பத்தியை மேற்கொள்வதற்கான பயிற்சிகளை அங்குள்ள மக்களுக்கு வழங்கி, விவசாயிகளுக்கு வழங்குவதைப்போல அவர்களுக்கும் கடன் வசதிகளையும் வழங்குவதன் ஊடாக அந்தப் பிரதேசத்திலே பலர் தொழில்வாய்ப்பைக் பெறக்கூடிய வாய்ப்பும் இருக்கின்றது. எனவே, கௌரவ அமைச்சரவர்கள் கௌரவ உறுப்பினர் இம்ரான் மஹ்ரூப் அவர்கள் கொண்டு வந்திருக்கின்ற காலத்திற்கேற்ற இந்தப் பிரேரணையைக் கருத்திலெடுத்து, விசேடமாக ஒரு குழுவை அனுப்பி ஆய்வுகளைச் செய்து, இந்த விடயம் சம்பந்தமான வேலைத் திட்டங்களை மேற்கொள்ள அடுத்த வருட ஒதுக்கீட்டிலிருந்து நிதியை வழங்கி, அந்தப் பிரதேச உப்பு உற்பத்தியாளர்களுக்கு வேண்டிய அத்தனை விடயங்களையும் முன்னெடுக்க ஆக்கபூர்வமான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்று அன்பாகக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.11]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව මම හිතන්නේ ඉතා කාලෝචිත යෝජනාවක්. මමත් පෞද්ගලිකව දන්නවා, කින්නියා ප්‍රදේශයේ ධීවර කර්මාන්තයෙන් විශාල පිරිසක් ජීවත් වන බව. ඒ අයට වැදගත්ම දෙයක් තමයි, ලුණු. පසුගිය කාලයේ ලුණු නොමැතිකම නිසා ඒ අය ගොඩක් පීඩාවට පත් වුණා. අපි දැනටමත් හඳුනා ගෙන තිබෙනවා, ලුණු නිෂ්පාදනයට අවශ්‍ය ප්‍රදේශ කිහිපයක්. විල්වේලි ගම්මානයේ, කච්චකොඩිතිව් කියන ප්‍රදේශයේ කුඩා පරිමාණයේ ලේවායන් - salterns - ඒ අය දැනටමත් ලුණු නිෂ්පාදනය කරනවා. නමුත්, ඒ අයට අවශ්‍ය කරන තාක්ෂණික සහයෝගය මදිකම ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට තිබෙනවා. එම නිසා ඒගොල්ලන්ට ඒ ක්ෂේත්‍රයේ නිෂ්පාදකයින්ගේ, ප්‍රවීණයින්ගේ උදවු ඕනෑ, මේක හොඳට කරන්නේ කොහොමද කියලා තාක්ෂණික වශයෙන් අලුත් සහයෝගය ලබා ගන්න. අපි දැනටමත් ඒ ගැන කථා කරගෙන යනවා. National Salt Limited එක ඒකාබද්ධ කරලා, ඒ ශිල්පීන් සහ වැඩ කරන අය ගෙනිහිල්ලා විල්වේලි කියන ගමේ අයට තාක්ෂණික සහයෝගය ලබා දීලා, අපිට ලුණු නිෂ්පාදනය කරන්න පුළුවන්. මම ඔබතුමාටත් ආරාධනා කරනවා, තවත් එවැනි ප්‍රදේශ තිබෙනවා නම් ඒවා හඳුනා ගෙන, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් ඒ ගැන කථා කරලා, අපි ඒ වෙනුවෙන් සැලැස්මක් හදා ගනිමු කියලා, ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, ලුණු ආශ්‍රිත නිෂ්පාදන ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් කල් පවත්වා ගැනීම සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, රසායනාගාර පහසුකම් ඒ ප්‍රදේශවල නොමැතිකමයි. එම නිසා ඒ සඳහා අවශ්‍ය කරන රසායනාගාර පහසුකම් ඇති කරන්න අපි සෞඛ්‍ය අමාත්‍යාංශයේත් සහයෝගය ලබා ගන්න ඕනෑ. ඒ කටයුත්ත කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම, ලුණු නිෂ්පාදකයින්ගේ සංගමය අපි ඒකාබද්ධ කර ගන්න ඕනෑ. රිසාඩ් මන්ත්‍රීතුමනි, පුත්තලමේ වුණත් ලුණු නිෂ්පාදකයින්ගේ සංගමයට පිටින් කටයුතු කරන අයට ගැටලු ගොඩක් තිබෙනවා. ඒක අපි කවුරුත් දන්නවා නේ. ඒක නිසා ඒ සංගමයත් මේකට හවුල් කර ගන්න ඕනෑකම තිබෙනවා, වෙළෙඳ පොළ අවස්ථා ඒගොල්ලන්ට හදා ගන්න.

ඊළඟට, ගබඩා පහසුකම් පිළිබඳ ප්‍රශ්නය ආපසු ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලාත් දන්නවා, ලුණු ලේවායන් ආශ්‍රිතව පොල් අතුවලින් හදා ගන්නා තාවකාලික මඩුවල තමයි ඒගොල්ලන් ගබඩා පහසුකම් හදා ගෙන තිබෙන්නේ කියන එක. ඒවා වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අවශ්‍ය වෙනවා.

ඊළඟට, අපට තිබෙන තවත් විශාල ගැටලුවක් තමයි, ලුණු නිෂ්පාදනයේ යෙදී සිටින ශිල්පීන්ගේ ප්‍රශ්නය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කියන්නේ, පුහුණු කම්කරුවන් නැහැ. දැන් අලුතින් අය මේ කර්මාන්තයට බඳවා ගන්න කොච්චර අපි උත්සාහ කළත්, පුහුණු වෙන අය දන්නවා මේක ටිකක් අමාරු රස්සාවක් බව. ඇත්තටම මේක දුෂ්කර රස්සාවක්. අලිමංකඩ ලුණු ලේවාය ගත්තත්, ඒගොල්ලන් බොහොම අමාරු, දුෂ්කරතා මධ්‍යයේ ඉන්නේ. අපි ඒ අයට පහසුකම් ගොඩක් දෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් දැනට යෝජනා ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. අපි ඔවුන්ට ඒ ප්‍රායෝගික පුහුණුව සහ පහසුකම් -ඇඳුම් පැළඳුම් - ලබා දිය යුතුව තිබෙනවා. මොකද, ඒ අයට සාමාන්‍ය ඇඳුම් ඇඳගෙන ඒ අව්වේ ඉන්න බැහැ. එම නිසා ඒ අයට ඇඳුම් පැළඳුම් ලබා දෙන්න ඕනෑකම තිබෙනවා. ඒ පහසුකම් ලබා දුන්නොත් ඔවුන්ට මීට වඩා හොඳින් කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම තමයි, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සහන ණය යෝජනා ක්‍රමය. මේ අය පෞද්ගලිකව ලේවායන් හදා ගන්න ලෑස්ති නම් එහෙම නැත්නම් ඒගොල්ලන්ගේ ප්‍රදේශවල තිබෙන ඉඩම්වල පෞද්ගලික ලේවායන් හදා ගන්න ලෑස්ති නම් ඒ අයට සහනදායී පදනමකින් ණය ලබා දෙන්න අපට පුළුවන්. කින්නියා ප්‍රදේශයේ මෙන්න මේ අය තමයි මේකට සූදානම් කියලා ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් ලැයිස්තුවක් අපට දෙනවා නම්, ඇත්තටම ඒගොල්ලන්ට වැඩි අපහසුවකින් තොරව ප්‍රවාහන ප්‍රශ්නයත් විසඳා ගන්න පුළුවන් වෙනවා. මොකද, ඒ අය කින්නියාවලම හදන කරවලවලට, මාළුවලට ඒ ලුණු ටික දුන්නත් විශාල ප්‍රමාණයක් එයින් සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙනවා. ඒ විධියට ඒ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්.

ඒ වාගේම අපට සියයට 7ක විතර අඩු පොලියට, රුපියල් මිලියන 25ක් දක්වා ණය පහසුකම් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. මම හිතන විධියට රුපියල් මිලියන 25ක් කියන්නේ, ඒගොල්ලන්ට එය සෑහෙන්න ප්‍රමාණවත් ණය පහසුකමක්. ඒ ණය පහසුකම අපට ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම, එම කර්මාන්තයේ යෙදී ඉන්න ව්‍යවසායකයින්ට ණය දෙනවා වාගේම ලුණු කර්මාන්තයේ යෙදී සිටින කම්කරුවන්ටත් කොන්දේසි යටතේ ඒගොල්ලන්ගේ ජීවනෝපාය යම් ප්‍රමාණයකට දියුණු කර ගන්න, ඒගොල්ලන්ට අවශ්‍ය කරන පහසුකම් හදා ගන්න, සමහර අයට ප්‍රවාහනයට අවශ්‍ය කරන සයිකලයක් හරි ගන්න ණය පහසුකම් හැටියට අපට වෙනම පැකේජයක් හඳුන්වා දෙන්න පුළුවන්. ඒ පිළිබඳව යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න.

ඒ වාගේම මේ කර්මාන්තයට තරුණයින් ඉතාම වැදගත් වෙනවා. අපි දන්නවා, කින්නියාවල විශාල තරුණ ප්‍රජාවක් ඉන්නවා කියලා. ඒ ප්‍රදේශයේ රැකියා විරහිත තරුණයින් ගොඩක් ඉන්නවා. ඒ අයත් මේකට ඒකාබද්ධ කරගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ලුණු නිෂ්පාදකයින්ගේ සංවිධානයක් අපට සංගමයක් හැටියට හදා ගන්න පුළුවන් නම් අපිට මේ කටයුතු සැලසුම් කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමාත් ඒ සඳහා මූලික වෙන්න.

ඒක නිසා මේ සභාව කල් තැබීමේ යෝජනාව කාලීන වශයෙන් වැදගත්, හොඳ යෝජනාවක්. විශේෂයෙන්ම කින්නියාවලම මේ ලුණු නිෂ්පාදනය කරන්න පටන් ගත්තොත්, එම ප්‍රදේශයේම විශාල ප්‍රමාණයකගේ ලුණු අවශ්‍යතාව සපුරා ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා විල්වේලි ගමේ අපි ආදර්ශ ඒකකයක් හැටියට මේ වැඩ කටයුතු ආරම්භ කරමු කරලා මම යෝජනා කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 6.15ට, 2025 නොවැම්බර් 13වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 22වන සෙනසුරාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.15 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 22, சனிக்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.15 p.m. until 9.00 a.m. on Saturday, 22nd November, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.